නිරුවත් වානරයා

ඩෙස්මන්ඩ් මොරිස්



පරිවර්තනය - එස්.එම්. බන්දුසීල

Scanned by TapScanner

පටුන

මූලාරම්භය	09
ලිංගික ජීවිතය	42
ඇති දැඩි කිරීම	93
ගවේෂණය	116
සටන් කිරීම	133
ආහාර ගැනීම	169
සැප පහසුව	180
සත්ව සම්බන්ධතා	195
පදමාලාව	221

හැඳින්වීම

අද ලෝකයේ විවිධ වානර විශේෂ (වර්ග) එකසිය අනූතුනක් දක්නට ලැබේ. මෙයින් එකසිය අනූ දෙකකම සිරුර ලෝම වලින් වැසී ඇත. රෝම වලින් නොවැසුණු සිරුරක් ඇති එකම නිරුවත් වානරයා "හෝමෝ සේපියන්" යනුවෙන් තමා විසින්ම තමාට නම් දී ඇති මිනිසායි. අසාමාන්‍ය මෙන්ම ඉතා සාර්ථක සත්ව විශේෂයක් වන මෙම නිරුවත් වානරයා, තම උසස් උදාර අදහස් හැඳෑරීමට බොහෝ කාලයක් ගත කරන අතර, ඔහුගේ මූලික අදහස් හා හැඟීම් යටපත් කිරීමටද එතරම්ම වෙහෙසක් ගනී. අග්‍රේශයන් අතුරෙන් විශාලම මොළය තිබීම ගැන ඔහු ආඩම්බර වෙයි. එහෙත් ලොකුම පුරුෂ ලිංගය ඇත්තේ තමාට බව හැඟවීමට තැත් කරමින්, මෙම ගෞරවය යෝධ ගොරිල්ලාට දීමට හේ කැමති වෙයි. අධික ලෙස මුඛරී, උග්‍ර විමසිලි බවකින් යුත්, වේගයෙන් වැඩිවන, මෙම වානරයාගේ මූලික හැසිරීම් රටාවන් පිරික්සිය යුතු කාලය දැන් එළඹ ඇත.

මා සත්ව විද්‍යාඥයෙකුත්, මෙම නිරුවත් වානරයා සත්වයෙකුත් වන බැවින් ඔහු මගේ පැනට සුදුසු මාතෘකාවකි. ඔහුගේ සමහර හැසිරීම් රටාවන්, සංකීර්ණ හා චමත්කාරී වූ නිසාම ඔහු තවදුරටත් පරීක්ෂාවට භාජනය නොකර සිටීමට මම නොකැමැත්තෙමි. කොතරම් බහුශ්‍රැතයෙකු වුවත් ඔහු තවමත් නිරුවත් වානරයෙකි. ඔහු තුළ අද නව උදාර චින්තනයන් දක්නට ඇති නමුත්, පහත් අදහස් එකක් වත් ඔහුගෙන් තුරන් වී නොමැත. මෙය බොහෝ විට ඔහුගේ ලැජ්ජාවට හේතු වන නමුත්, පැරණි ආවේගයන් අවුරුදු කෝටි ගණනක් තිස්සේ ඔහු තුළ වූ බැවින්, පරිණාමීය අතීතය තුළ එකතු වූ ප්‍රවේණි උරුමයන්, වහා ඉවත දැමීමක් බලාපොරොත්තු විය නොහැක. මෙම කාරණය අවබෝධ කරගන්නේ නම් ඔහුට වඩාත් සතුටින් ජීවත් වීමට හැකි වනු ඇත. සමහර විට මෙය සත්ව විද්‍යාඥයෙකුට සේවයක් කළ හැකි එක් අවස්ථාවක් වීමට ඉඩ තිබේ.

නිරුවත් වානරයා ගේ හැසිරීම පිළිබඳව කලින් කරන ලද අධ්‍යයනයන්හි දැකිය හැකි පුදුම ලක්ෂණයක් නම්, හැම විටම ප්‍රත්‍යක්ෂ ලෙස පෙනෙන දේ ඔවුන්ට මග හැරී තිබීමයි. අපේ ස්වභාවය පිළිබඳ මූලික සත්‍යයන් සෙවීමට, පැරණි මානව විද්‍යාඥයෝ ලෝකයේ සතර

Scanned by TapScanner

දිග් භාගයටම ගියහ. ඔවුන් හැදෑරූ සමාජ කොතරම් නොදියුණුද යත්, ඒවා විනාශ නොවී පැවතුනේද යන්නමිනි. විශ්මයාකාර ලිංගික චාරිත්‍ර, පුදුම නෑකම් පද්දති හා අද්භූත ගෝත්‍ර පිළිවෙත් ආදිය පිළිබඳව ඔවුන් කරුණු රැස් කළේ අපේ වර්ගයාගේ හැසිරීම් රටාවන් අවබෝධ කර ගැනීමට ඒවා නැතිවම බැරි යැයි යන හැඟීමෙනි. මෙම පර්යේෂකයන් ගේ සොයා ගැනීම් ඉතාම සිත් ගන්නා සුළු වූ අතරම නිරුවත් වානරයන් කණ්ඩායමක් සංස්කෘතික වශයෙන් වෙන්වී තනි වූ විට, ඔවුන්ට කුමකින් කුමක් සිදුවන්නේද යන්න, එම අධ්‍යයන මගින් අපට පෙන්වා දෙයි. පූර්ණ සමාජීය බිඳ වැටීම්කින් තොරව අපේ සාමාන්‍ය හැසිරීම් රටාවන් කොතෙක් දුරට වෙනස් කළ හැකිද යන්නත් ඒවායෙන් අපට පැහැදිළි වෙයි. එහෙත් සාමාන්‍ය නිරුවත් වානරයාගේ සාමාන්‍ය හැසිරීම් රටාවන් මොනවාදැයි එයින් අපට දැන ගත නොහැක. මෙය කළ හැක්කේ ප්‍රධාන සංස්කෘතීන්ට අයත්, සාමාන්‍ය පොදු, හැසිරීම් රටාවන් පරීක්ෂා කිරීමෙන් පමණකි. ජීව විද්‍යාත්මකව සලකා බලන විට නියම ක්‍රමය වන්නේත් එයයි. මෙම පරීක්ෂණය සඳහා සරල ගෝත්‍රික කණ්ඩායම්, දියුණු ශිෂ්ටාචාරයන්ට වඩා සුදුසු යැයි පැරණි මානව විද්‍යාඥයෙකුට තර්ක කළ හැකිය. මගේ අදහස නම් එසේ නොවන බවයි.

ගෝත්‍රික කණ්ඩායම් ආදී මිනිසුන් නොව තවදුරටත් දියුණු විය නොහැකි මෝඩයෝය. ඇත්ත වශයෙන් ආදී ගෝත්‍රිකයන් ලෙස සැලකිය හැක්කන් අවුරුදු දහස් ගණනකින් මෙහා මිහිපිට ජීවත් වී නැත. නිරුවත් වානරයා අවශ්‍යයෙන්ම විමසිලිමත් සත්වයෙකු වන බැවින්, දියුණු නොවූ ඕනෑම සමාජයක් යම්කිසි ආකාරයකින් අසාර්ථක වූ එකක් ලෙස සැලකිය යුතුය. අවට ඇති ලෝකය ගැන විමසිලිමත් වීමට ඔහු තුළ ඇති ස්වාභාවික ලැදියාව නැති කිරීමට මෙම සමාජයන්හි යම්කිසි දෙයක් සිදුවී තිබේ. සමහර විට පැරණි මානව විද්‍යාඥයින් මෙම සමාජයන්හි හැදෑරූ ලක්ෂණ, ඒවායේ දියුණුවට බාධා කළ ලක්ෂණම වීමට ද ඉඩ තිබේ.

එහෙයින් මිනිස් වර්ගයාගේ හැසිරීම් රටාවේ පොදු පදනම ලෙස මේවා යොදා ගැනීම ඉතා අනතුරුදායක බව කිව යුතු නොවේ. මානසික විද්‍යාඥයින් හා මනෝ විශ්ලේෂකයින් මෙතරම් දුර නොගොස්

ප්‍රධාන සමාජයන්හි සාමාජිකයන්ගේ සායනික අධ්‍යයනයන් ගැන සිත යොමු කොට ඇත. ඔවුන්ගේ මුල් පර්යේෂණ හා අදහස් වලද එක්තරා පක්ෂපාතී බවක් දක්නට ලැබේ. ඔවුන්, විවිධ මත සනාථ කිරීම සඳහා පර්යේෂණ පවත්වා ඇත්තේ යම්කිසි අතකින් නොමඟ ගිය හෝ අසාර්ථක වූ පුද්ගලයන් පිළිබඳවයි. සාර්ථක ජීවිත ගත කරන සාමාන්‍ය පුද්ගලයන්ට මානසික විද්‍යාඥයන්ගේ පිහිට සොයා යාමට සිදු නොවනු ඇත. මෙම පර්යේෂණවල අගය සුළු කොට තැකීමට මම අදහස් නොකරමි. මගේ අදහස නම්, අපේ වර්ගයාගේ මූලික ස්වභාවය ගැන සාකච්ඡා කිරීමේදී, ඉහතදී කරන ලද මානව හා මානසික පර්යේෂණ පිළිබඳව එතරම් සැළකිල්ලක් යොමු නොකළ යුතු බවයි.

මානව විද්‍යාවේ හා මනෝ විද්‍යාවේ මේ තත්වය වේගයෙන් වෙනස් වෙමින් පවතින බවද මෙහිලා සඳහන් කළ යුතුය. අද මෙම ක්ෂේත්‍රවල නියැලී ඇති පර්යේෂකයෝ මෙම කරුණ අවබෝධ කරගෙන ඇති අතර, වඩ වඩා සමාන්‍ය පුද්ගලයන් ගැන හැදෑරීම ආරම්භ කොට ඇත්තාහ.

මෙම පොතෙහි මා ප්‍රයෝජනයට ගන්නා කරුණු ප්‍රධාන වශයෙන් අංශ තුනකින් ලබාගෙන තිබේ. ඒවා නම්:-

1. අපේ පැරණි මුතුන් මිත්තන් ගේ පාෂාණීභූත ද්‍රව්‍ය ආදිය මත පදනම් වූ, පාෂාණිධාතු විද්‍යාඥයින් විසින් සොයා ගන්නා තොරතුරු.
2. විශේෂයෙන්ම වඳුරන් හා වානරයින් ආදී අපේ කිට්ටුම නෑයන් ඇතුලු සත්ව වර්ගවල, හැසිරීම් අධ්‍යයනය කිරීමෙන් ලබාගත් තොරතුරු හා
3. නිරුවත් වානරයා ගේ වර්තමාන ප්‍රධාන සංස්කෘතින්ට අයත් සාමාන්‍ය පුද්ගලයන් ගේ මූලික හා පොදු හැසිරීම් රටාවන් නිරීක්ෂණය කිරීමෙන් ලබාගත් තොරතුරු ආදියයි.

මෙම කටයුත්තේ විශාලත්වය ගැන සලකන විට, එය යම් කිසි ක්‍රමයකින් ලිහිල් හා සරල කළ යුතු බව පෙනේ. මා මෙහිදී බලාපොරොත්තු වන්නේ ශිල්පීය දැනුම හා වාග් ශක්තිය නිසා ඇතිවී තිබෙන දියුණුව අමතක කොට අනිකුත් සත්ව වර්ග වලද දැකිය හැකි ආහාර ගැනීම, නිදාගැනීම, සටන් කිරීම, සහවාසය හා පැටවුන් ඇති දැඩි කිරීම වැනි අංශ පිළිබඳ පමණක් අවධානය යොමු කිරීමයි. මෙම මූලික ප්‍රශ්න වලට නිරුවත් වානරයා මුහුණ දෙන්නේ කෙසේද? අනිකුත් වානරයන් සමඟ සංසන්දනය කොට බලන කළ ඔහු ප්‍රතික්‍රියා කරන්නේ කෙසේද?

Scanned by TapScanner

ඔහු අද්විතීය සත්වයෙක් වන්නේ කුමන අංශ වලින්ද? ඔහු තුළ දක්නට ඇති විවිධ අනුචිත විකාර ලක්ෂණ ඔහුගේ විශේෂ පරිණාමීය කථාවට සම්බන්ධ වන්නේ කෙසේද?

මෙම ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමේදි බොහෝ අය මා සමඟ අමනාප වීමට ඉඩ ඇතැයි සිතේ. අප තුළ ඇති වානර ස්වභාවය මතක් කර දීම ගැන අකමැති අය සිටීමට පුළුවන. සත්වයන්ට සුදුසු රළු වචන යොදා අප ගැන සාකච්ඡා කිරීමෙන්, අපේ වර්ගයාට මා අවමන් කොට ඇතැයි ද ඔවුන් සිතන්නට පුළුවන. මගේ අරමුණ එය නොවන බව මෙහිදී සඳහන් කළ යුතුය. මා මෙහිදී අනුගමනය කොට ඇති ක්‍රමය කොතරම් අඩුපාඩු තිබුණත්, අවසානයේ ප්‍රයෝජනවත් වන බව් මගේ විශ්වාසයයි. මෙයින් අපේ අති විශේෂ වර්ගයා ගේ සංකීර්ණ ස්වභාවය පිළිබඳව අළුත් (සමහර විට බලාපොරොත්තු නොවූ) ආලෝකයක් විහිදෙනු නොඅනුමානයි..

1 මූලාරම්භය

සත්ව උද්‍යානයක කුඩුවක් තුළ නමක් නොමැති කුඩා සතෙක් වෙයි. පිටත ඇති තහඩුවේ ලියා ඇත්තේ "මේ අලුත් සතෙකි" යන්න පමණි. එය තුළ සිටින කුඩා ලේනා ගේ පාද කළුය. ඌ සොයාගෙන ඇත්තේ අප්‍රිකාවෙනි. විද්‍යාඥයෝ මෙම සතා පිළිබඳ වෙන කිසිවක් නොදනිති.

සත්ව විද්‍යාඥයන්ට මෙය අලුත් අභියෝගයකි. මෙම සතා අනිකුත් ලේනුන් ගෙන් වෙනස් වීමට හේතු වූයේ කුමක්ද? මෙතෙක් සොයාගෙන ඇති හා විස්තර කර ඇති අනෙකුත් ලේන් වර්ග තුන්සිය හැට හයෙන් මෙම සතා වෙනස් වන්නේ කෙසේද? කෙසේ හෝ ලේන් පවුලේ පරිණාමයේ එක්තරා අවස්ථාවකදී මෙම සත්වයාගේ මුතුන් මිත්තන්ට අනික් අයගෙන් වෙන්වී, ස්වාධීනව බෝවෙන කණ්ඩායමක් ලෙස හැඩ ගැසෙන්නට හැකි වූයේ පරිසරයේ කුමන බලපෑමක් නිසාද? මෙම නව නැම්ම ආරම්භ වන්නට ඇත්තේ යම් කිසි ස්ථානයක තිබූ පරිසර තත්වයන්ට හැඩ ගැසීමක් ලෙස ඉතා සුළුවෙනි. මේ අවස්ථාවේදීත් ඔවුන්ට තම නෑයන් සමඟ සම්බන්ධ වී අලුත් සතුන් බෝකළ හැකි විය. මෙසේ පරිසරයට හැඩ ගැසුණු සතුන්ට තරමක් වාසිදායක තත්වයක් ලැබෙනු නොඅනුමානය. කාලයාගේ ඇවෑමෙන් ඔවුන් පරිසරයට වඩා වඩා හැඩ ගැසීමත් සමඟ අනිකුත් වර්ගවල ලේනුන්ගෙන් සම්පූර්ණයෙන් වෙන් වීම, වඩා ප්‍රයෝජනවත් වීමට පුළුවන. මෙම අවස්ථාවේදී ඔවුන්ගේ සමාජීය හා ලිංගික හැසිරීම් රටාවන් හි විශේෂ වෙනස්කම් සිදුවී අනිකුත් ලේනුන් සමඟ සම්බන්ධ වී පැටවුන් බෝකිරීම අපහසු වන තත්වයක් උදාවනු ඇත. පළමුවෙන්ම එම ප්‍රදේශයේ ඇති ආහාරවලට සුදුසු ලෙස ඔවුන්ගේ ශරීර ව්‍යුහය වෙනස් වෙයි. පසුව ඔවුන් ගේ සංසර්ග ක්‍රියාවන්ද වෙනස්කම්වලට භාජනය වී අලුත් වර්ගයේ සහකාරයන් පමණක් ආකර්ෂණය වන ලෙස සකස් වනු ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ අලුත් සත්ව වර්ගයක පරිණාමයයි. නැතහොත් තුන්සිය හැට හත්වෙනි ලේන් වර්ගය

Scanned by TapScanner

බිහිවීමයි.

අලුතෙන් සොයා ගත් ලේනා දෙස බලා අපට මේ සියල්ල අනුමාන වශයෙන් සිතා ගැනීමට පුළුවන. අපට ස්ථීර වශයෙන්ම කිව හැකි එකම දෙය ඌ අලුත් වර්ගයක් බව පමණි. මේ සත්වයා පිළිබඳව හැදෑරීම සඳහා අපට පළමුවෙන්ම ඌ "කළු පාද සහිත අප්‍රිකානු ලේනා" යනුවෙන් නම් කරන්නට පුළුවන. ඊළඟට උගේ හැසිරීම් හා ව්‍යුහයේ සෑම අංශයක්ම නිරීක්ෂණය කොට, ඒවා අනෙකුත් ලේනුන් ගෙන් වෙනස් වන්නේ හෝ සමාන වන්නේ කෙසේදැයි සොයා බැලීමට හැකි වේ. මේ අනුව ක්‍රමයෙන් අපට මෙම අලුත් සතා පිළිබඳව තොරතුරු එක් රැස්කළ හැකි වෙයි.

මේ සතා ගැන හැදෑරීමේදී අපට ඇති එක් වාසියක් නම් අප කළු පාද සහිත ලේනුන් නොවීමයි. මේ නිසා විද්‍යාත්මක පර්යේෂණයකට අවශ්‍ය අපක්ෂපාත බවෙන් යුතුව අපට මේ කාර්යය කළ හැකි වේ. නමුත් මිනිසා නමින් හඳුන්වන සත්වයා ගැන හැදෑරීම මෙයට වඩා කෙතරම් වෙනස්ද ? සත්ව විද්‍යාඥයෙකුට වුවත් තම වර්ගයා පිළිබඳව ඇති අහංකාරය නැති කර ගත නොහැක. පර්යේෂණ සඳහා ඇති අමුතු සත්ව වර්ගයක් ලෙස මිනිසා සැලකීමෙන් අපට මෙය තරමක් දුරට මහ හරවා ගත හැකියි. අප මෙම කාර්යය ආරම්භ කළ යුත්තේ කෙසේද ?

අලුත් ලේනා පිළිබඳව ක්‍රියාකළාක් මෙන් ඔහුට නැකම් දක්වන අනිකුත් සත්ව විශේෂ සමඟ සංසන්දනය කිරීමෙන් අපට මෙම කටයුත්ත ආරම්භ කළ හැකියි. ඔහුගේ දත්, ඇස්, අත් හා අනිකුත් ව්‍යුහමය ලක්ෂණවලින් පෙනී යන්නේ ඔහු යම්කිසි ආකාරයක (වානරයකු) අග්‍රේශයකු බවයි. එහෙත් ඔහු පුදුමාකාර සත්වයෙකි. දැනට ජීවත්ව සිටින වඳුරු හා වානර වර්ග එකසිය අනූ තුනේ සම් එක දිගට තබා ඒ අතර සුදුසු ස්ථානයකට මිනිස් සමක් තැබීමට උත්සාහ කළහොත් මිනිසා කොතරම් පුදුමාකාර ඝතෙකු දැයි ඔබට පෙනෙනු ඇත. මිනිස් සම කොතැනක තැබුවත් එය එතැනට නොගැලපෙන බව

පෙනේ. අවසානයේ අපට එය තැබිය හැකි වන්නේ එක් කෙළවරක ඇති වල්ගා රහිත යෝධ වානරයන් වන චිම්පන්සි හා ගෝරිල්ලාගේ සම අසලයි. මෙතැනට වුවද මිනිස් සම එතරම් ගැලපෙන බවක් නොපෙනේ. අනික් සතුන් සමඟ සසඳන විට, මිනිසාගේ පාද ඉතා දික් වන අතර අත් ඉතා කෙටි වී ඇත. මෙම සත්වයා අනිකුත් අග්‍රේශයන්ට ඉතා වෙනස් සංචරණ ක්‍රමයක් යොදා ගන්නා බව පැහැදිලිව පෙනී යයි. මෙහිදී අපේ අවධානය යොමුවන තවත් ලක්ෂණයක් නම් සම සම්පූර්ණයෙන්ම නිරුවත් වීමයි. හිස, කිහිලි හා ලිංග ප්‍රදේශ හැරෙන්නට, මෙම සත්වයා ගේ සිරුර අනෙක් වානරයන් මෙන් රෝම වලින් වැසී නැත. අනෙකුත් වානරයන් සමඟ සංසන්දනය කරන විට මෙම වෙනස ඉතා විස්මයජනක බව පෙනේ. සමහර වඳුරන්ගේ හා වානර වර්ගවල මුහුණ, පපුව හා පසුපස නිරාවරණය වූ සම දැකිය හැකි නමුත්, මිනිසාගේ තත්වයට සම කළ හැකි සමක්, අනික් වානර වර්ග එකසිය අනුදෙකේම දැකිය නොහැක. මේ නිසා මෙම සත්ව විශේෂය **"නිරුවත් වානරයා"** යනුවෙන් නම් කිරීම සාධාරණ වේ. එය සරල නිරීක්ෂණයක් මත පදනම් වූ සරල විස්තරාත්මක නාමයකි.

මෙම සත්වයා ගේ විශේෂ ලක්ෂණවල ඇති වැදගත්කම ගැන සිත යොමුකරන විද්‍යාඥයාට, තම කටයුත්ත ආරම්භ කිරීමට සිදුවන්නේ අනිකුත් සතුන් සමඟ සංසන්දනය කිරීමෙනි. වෙනත් කිසිම අග්‍රේශයෙක් නිරුවත් බවක් නොපෙන්වයි. දැනට ලෝකයේ ඇති ක්ෂීරපායි සත්ව විශේෂ 4,237 අතරින් රෝම නැත්තේ ඉතා කිහිපදෙනෙකුට පමණි. ඝන පරිවාරකයක් ලෙස ක්‍රියා කරන රෝම තට්ටුවක් ශරීරය පුරා තිබීම ක්ෂීරපායින්ට ස්ථීර ශරීර උෂ්ණත්වයක් පවත්වා ගැනීමට ආධාර වේ. සූර්ය රශ්මියෙන් සිරුර රත්වීම එයින් වැළකෙන අතර සමට හානි සිදුවීමද වැළැක්වෙයි. මේ නිසා රෝම ඉවත් කිරීමට ප්‍රබල හේතූන් තිබිය යුතුය. අවස්ථා කිහිපයකදී හැරෙන්නට, ක්ෂීරපායින් මෙම පියවර ගෙන ඇත්තේ අලුත් පරිසරයක හෝ නව මාධ්‍යයක ජීවත් වීමට සිදුවූ විට පමණි. වවුලන් වැනි පියාසර කරන ක්ෂීරපායින් ගේ අත්තටුවල රෝම නැති නමුත්, ශරීරයේ අනිකුත් කොටස්වල ඇති බැවින්, ඔවුන් නිරුවත් ලෙස

Scanned by TapScanner

සැළකිය නොහැක. පොළොව හාරන සමහර ක්ෂීරපායින් ගේ රෝම ප්‍රමාණය අඩුවී ඇති බවක් පෙනේ. තල්මසුන්, ඩොල්ෆින් හා හිපොපොටේමස් වැනි සත්වයන් ජලජ පරිසරයට හැඩ ගැසී ඇති නිසා ඔවුන්ගේ රෝම දක්නට නොලැබේ. එහෙත් ගොඩබිම වාසය කරන සියලුම ක්ෂීරපායින්ට ඝන රෝම තට්ටුවක් තිබේ. මේ නිසා **"නිරුවත් වානරයා"** ඔහුගේ නිරුවත් බව නිසා සියලුම ක්ෂීරපායීන් ගෙන් වෙනස් වෙයි.

මෙම සත්වයා ජලයේ හෝ පොළොව යට ජීවත්වන සත්වයකු ලෙස හෝ එසේ නැත්නම් පුදුම පරිණාමීය ඉතිහාසයක් සහිත සතෙකු ලෙස හෝ තීරණය කිරීමට මේ නිසා සත්ව විද්‍යාඥයන්ට සිදුවෙයි. මෙහිදී පළමුවෙන්ම කළ යුතු දේ වන්නේ නිරුවත් වානරයාගේ අතීතය ගැන සොයා බැලීමයි. පාෂාණීභූත කොටස් හා ජීවත් වන සමීපතම නෑයන් ගැන හැදෑරීමෙන් මෙම අලුත් සත්වයා පරිණාමය වූ ආකාරය දැන ගැනීමට අපට හැකි වනු ඇත.

මෙම විෂය පිළිබඳව පසුගිය ශතවර්ෂය මුළුල්ලේ එකතු කරන ලද කරුණු සියල්ල මෙහි සඳහන් කිරීම අපහසුය. මෙහිදී ඒවායින් එළඹුණු නිගමන පමණක් පිඩුකොට දැක්වීමට මම අදහස් කරමි.

අපේ නිරුවත් වානරයා අයත් වන, අග්‍රේශයන් ලෙස හඳුන්වනු ලබන, සත්ව කණ්ඩායම මුලින්ම ඇතිවුයේ ආදී කෘමිභක්ෂක ක්ෂීරපායීන් ගෙනි. යෝධ උරගයන් ලෝකය රජ කළ යුගයේ ජීවත් වූ මෙම ක්ෂීරපායිහු කුඩා සත්වයෝ වූහ. මීට අවුරුදු කෝටි 8ටත් 5 ටත් පෙර කාලයක උරගයන්ගේ යුගය අවසාන වීමත් සමඟ පැතිරෙන්නට වූ කෘමි භක්ෂකයෝ විවිධ හැඩ රුව ඇති සත්වයන් ලෙස වර්ධනය වූහ. ශාක භක්ෂකයන් වූ සමහරු ආරක්ෂාව තකා පොළොව යට ජීවත්වන්නට වූහ. තවත් සමහරු දිහු නිය හා තියුණු දත් සහිත මාංශ භක්ෂකයන් ලෙස දියුණු වූහ.

මේ අතර වනාන්තරවල ආරක්ෂාව යටතේ ජීවත්

වුවෝද ක්‍රමයෙන් විකසනය වූහ. මුල් කෘමි භක්ෂකයෝ ක්‍රමයෙන් කොළ, ගෙඩි හා පලතුරු ආහාරයට ගැනීම ඇරඹුහ. මොවුන් ආදී අග්‍රේශයන් බවට පරිණාමය වීමත් සමඟ ඇස්, මුහුණේ ඉදිරියට ඒමෙන් මොවුන්ගේ පෙනීම වඩා දියුණු විය. දත්, ආහාර අල්ලා ගත හැකි ආකාරයට සකස් වූ අතර, මොළයද ක්‍රමයෙන් විශාල වීම නිසා මෙම සත්තු ලෝකය රජ කරන්නට පටන් ගත්හ.

මීට අවුරුදු කෝටි තුන හමාරටත්, දෙක හමාරටත් පෙර කාලයක මෙම සත්වයන්ගෙන් වඳුරන් පරිණාමය වීම ආරම්භ විය. දිහු වලිග සමඟ ශරීර ප්‍රමාණයද ක්‍රමයෙන් වැඩිවනු දක්නට ලැබුණි. සමහරු කොළ වර්ග පමණක් අනුභව කරන්නට වූහ. වැඩි දෙනෙකු මිශ්‍ර ආහාරයට හුරු වූ අතර කාලය ගත වීමත් සමඟ සමහරු අධික බරෙන් යුත් විශාල සත්වයන් බවට පත්වූහ. දුව පැන ඇවිදීම වෙනුවට ගස් අතුවල යටි පැත්ත අල්ලා ගෙන පැද්දීමට ඔවුහු ක්‍රමයෙන් පුරුදු වූහ. ඔවුන්ගේ විශාල ශරීර නිසා ගස් මත රැඳී සිටීම අපහසු වුවත්, බිම කෙරෙන සටන්වලට මේ නිසා හොඳින් මුහුණ දීමට ඔවුනට හැකි විය.

මෙම වානර අවස්ථාවේත් ඔවුන් ජීවත්වූයේ ආහාර හා පළතුරුවලින් පිරි වනාන්තරවල සැප පහසු ජීවිත ගත කරමිනි. විවිධ පරිසරයන්ට සංක්‍රමණය වූ මුල් ක්ෂීරපායීන් මෙන් නොව අවුරුදු ලක්ෂ ගණනක් තිස්සේ මෙම ජීවිතයට හැඩ ගැසුණු වානරයෝ වනාන්තර අතහැර එළිමහන් බිම්වලට ගියේ නම් ඔවුන්ට එහි ජීවත් වූ සර්ව භක්ෂකයන් මෙන්ම, මාංශ භක්ෂයන් සමඟද තරග කරන්නට සිදුවන බවට කිසිදු සැකයක් නැත.

යම්කිසි හේතුවක් නිසා මෙම වානර පරිණාමය පැරණි ලෝකයේ පමණක් සිදුවූ බව මෙහිදී සඳහන් කළ යුතුය. පැරණි හා අලුත් ලෝකයන්හි වඳුරන් ගේ පරිණාමය සිදුවූ නමුත් ඇමෙරිකානු මහද්වීපවල වානරයෝ ඇති නොවූහ. මේ අතර පැරණි ලෝකයේ බටහිර අප්‍රිකාවේ සිට ගිනිකොණ දිග

Scanned by TapScanner

ආසියාව දක්වා වානරයන්ගේ ව්‍යාප්තිය සිදු විය. මෙම වර්ධනයේ නෂ්ටාවශේෂ ලෙස අද දකින්නට ඇත්තේ අප්‍රිකානු චිම්පන්සියා හා ගෝරිල්ලාත්, ආසියානු ගිබන් සහ ඔරන්ඔටන් සත්වයාත් පමණි. මෙම අන්ත දෙක හැරෙන්නට අද ලෝකයේ රෝම සහිත වෙනත් වානරයන් දක්නට නැත. මෙයට හේතුව සරුවට වැවුණු ඝන වනාන්තර තවදුරටත් දක්නට නොලැබීමයි.

මුල් වානරයන්ට සිදුවූයේ කුමක්ද ? දේශගුණය ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරන්නට වීමත් සමඟ මීට අවුරුදු කෝටි එක හමාරකට පමණ පෙර වනාන්තරවල ප්‍රමාණයද බෙහෙවින් අඩු වන්නට විය. මේ නිසා මුල් වානරයන්ට කුඩා වනාන්තරවල රැඳී සිටීමට හෝ එයින් පිටවී ජීවිතය ඇරඹීම යන දෙකින් එකක් තෝරා ගැනීමට සිදුවිය. චිම්පන්සි, ගෝරිල්ලා, ගිබන් හා ඔරන්ඔටන් ආදී සතුන් ගේ මුතුන් මිත්තන් එසේ වනාන්තරවල නැවතී සිටීමට තීරණය කළ අතර එදා සිට ඔවුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවන්නට විය. දැනට දක්නට ඇති අනිත් එකම වානරයා වන, නිරුවත් වානරයා ගේ මුතුන් මිත්තන්, වනාන්තර අතහැර දමා එළිමහනට පැමිණ, එහි සිටි අනික් සතුන් සමඟ තරග කරමින් නව ජීවිතයක් ඇරඹීමට පටන් ගත්හ. මෙය ඉතා අනතුරුදායක කටයුත්තක් වූවත් පරිණාමීය අතින් බලන විට එය ඉතා සාර්ථක පියවරක් විය.

මෙතැන් සිට නිරුවත් වානරයාගේ කතාව කවුරුත් හොඳින් දන්නා එකකි. නමුත් මෙම සත්වයාගේ හැසිරීම ගැන හොඳ අවබෝධයක් ලබා ගැනීමට මින් පසුව ඇති වූ සිද්ධීන් වැදගත් වන බැවින් ඒ පිළිබඳව කෙටි සාරාංශයක් මෙහි දක්වමු.

එළිමහන් බිම්වලට පැමිණි අපේ මුත්තන්ගේ අනාගතය ඉතා අඳුරු බව පෙනෙන්නට තිබුණි. ඔවුන් එක්කෝ පළපුරුදු මාංශ භක්ෂකයන්ට වඩා දක්ෂ අයුරින් සතුන් මරා කෑ යුතු විය. නැතිනම් පළපුරුදු ශාක භක්ෂකයන්ට වඩා කාර්යක්ෂම

ලෙස උලාකෑ යුතු විය. මේ අංශ දෙකෙන්ම ඔවුන් සාර්ථක වූ බව අපි දනිමු. අප කතාකරන්නේ අවුරුදු ලක්ෂ ගණන්වලින් බවත් කෘෂිකර්මාන්තයේ වයස අවුරුදු දහස් ගණනක් බවත්, මෙහිදී මතක තබා ගත යුතුය. එළිමහන් බිම් වල ගොවිතැන් කිරීම අපේ ඒ ආදී මුතුන් මිත්තන්ට, කළ හැකි දෙයක් නොවීය. තණබිම් ආශ්‍රයෙන් ලබාගත හැකි ආහාර ඔවුන්ගේ ජීරණ පද්ධතියට නොගැලපුණි. වනයේ පලතුරු හා ගෙඩි වෙනුවට මුල් හා අල වර්ගවලින් සමන්විත ආහාරයකට හැඩ ගැසීමට හැකි වුවත් ඒවා සොයාගැනීම පලතුරු කඩා ගෙන කෑම තරම් පහසු නොවීය.

කෙසේ වෙතත් ඔහුගේ වනයේ ආහාර සම්පූර්ණයෙන්ම පලතුරු හා ගෙඩිවලින් පමණක් සමන්විත වූ එකක් නොවුණි. සත්ව ප්‍රෝටීන් වර්ග ද ඔහුට නිසැකයෙන්ම වැදගත් වූ බව කිව යුතු නොවේ. මුල් කෘමි භක්ෂකයන් ගෙන් විකාශනය වූ ඔහුට, විවිධ කෘමි වර්ගද ආහාරයට ගත හැකි විය. මේ නිසා ඔහුගේ ජීර්ණ පද්ධතිය ද අමුතු ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු නොවීය. වනාන්තරයෙන් එළියට ආ වානරයාට කළ හැකි එක් දෙයක් වූයේ, ආහාරයේ මෙම කොටස වැඩි කිරීමයි. පළපුරුදු මාංශ භක්ෂක සතුන් සමඟ ඔහුට තරහ කළ නොහැකි වුවත්, කුඩා හෝ දුර්වල සතුන් මරා ගෙන කෑම සඳහා ඉක්මනින් ක්‍රියාත්මක වන දිහු පාද ඔහුට අවශ්‍ය වූ බව කිවයුතු නොවේ.

දැන් අප පැමිණ ඇත්තේ විස්මයජනක පරිවර්තන හා විපර්යාසයන් මාලාවක් සිදුවූ නිරුවත් වානරයාගේ පරම්පරා ඉතිහාසයේ අවසාන අවුරුදු දස ලක්ෂයටයි. සිදුවීම් කිහිපයක්ම එක විට සිදු වූ අතර, මෙය අවබෝධ කර ගැනීමද ඉතා වැදගත් වේ. බොහෝ අවස්ථාවලදී මෙම සිද්ධීන් දක්වා ඇත්තේ එකක් නිසා තව එකක් ඇතිවූ ලෙසයි. මෙය ඉතා නොමඟ යවන සුළුය. ආදී බිම් වානරයාට තරමක් විශාල මොළයක්ද තියුණු දෑසක්ද යමක් අල්ලා ගත හැකි දැතක්ද තිබුණි. ගොදුරු දඩයම් කර ගැනීමේ ශක්තිය වැඩි දියුණු කිරීමට තිබූ අවශ්‍යතාව හේතුකොට ගෙන ඉතා වැදගත් පරිවර්තන රැසක් සිදුවන්නට විය.

Scanned by TapScanner

කෙළින් සිටීමට පුරුදු වූ ඔහුට, වඩා වේගයෙන් දුවන්නට ද හැකි විය. ගමන් කිරීමේ ක්‍රියාව සඳහා තවදුරටත් අත් අවශ්‍ය නොවූ අතර ඒවා ආයුධ හසුරුවන, වඩා ශක්තිමත් කාර්යක්ෂම අවයව බවට පත්විය. වඩා සංකීර්ණ වූ මොළය නිසා ඔවුන්ට ඉක්මන් තීරණ ගැනීමට හැකි විය. මෙම විපර්යාසයන් සිදුවූයේ එක්තරා පිළිවෙළකට, එකකට පසුව එකක් ආදී වශයෙන් නොවේ. එක් ලක්ෂණයක් මඳක් දියුණු වන විට තවත් අලුත් ලක්ෂණයක් ඇතිවීමෙන් මේ සියල්ලම පාහේ එක විටම සිදුවන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ දඩයම් වානරයකු බිහිවීමයි.

දත් හා නිය දිගුවීම වැනි සරල ක්‍රියාවලියක් මගින් වානර බල්ලකු හෝ බළලකු වැනි දඩයම්කාර සතකු පරිණාමය වීම මීට වඩා පහසු දෙයක් වන්නට නොතිබුණේ දැයි කෙනෙකු තර්ක කරන්නට පුළුවන. එහෙත් මෙවැන්නක් සිදුවූයේ නම්, ආදී බිම් වානරයාට කෙළින්ම බල්ලන් හා බළලුන් සමඟ තරඟ කිරීමට සිදුවන බවට සැකයක් නැත. මෙහි ප්‍රතිඵලය වන්නේ වානරයාට ඉතා අවාසිදායක තත්වයකි. (ඇත්ත වශයෙන්ම මෙවැන්නක් සිදුවන්නට ඇත. එය කෙතරම් අසාර්ථක විද යත්, එවැන්නක් සිදුවූ බවට සාක්ෂියක් වත් සොයාගත නොහැක.) ස්වාභාවික ආයුධ සාක්ෂියක් වත් සොයාගත නොහැක.) ස්වාභාවික ආයුධ වෙනුවට කෘත්‍රිම ආයුධ භාවිතයට ගන්නා නවතම මහක් අත්හදා බලන ලද අතර එය බලාපොරොත්තු නොවූ විරූ තරම් සාර්ථක විය.

ආයුධ භාවිතයට පුරුදු වීමෙන් පසු ඊළඟ පියවර වූයේ ආයුධ තැනීමයි. මේ සමගම දඩයම් ක්‍රම ආයුධ අතින් පමණක් නොව, සමාජීය සහයෝගීතාව අතින්ද දියුණුවක් පෙන්වීය. දඩයම් වානරයන්, රංචු වශයෙන් දඩයම් කරන්නන් වූ බැවින්, දඩයම් ක්‍රම දියුණු වීමත් සමඟ සමාජීය සංවිධාන ක්‍රමද දියුණු විය. වෘකයන් වැනි සතුන්ද රංචු ලෙස එකතු වී දඩයම් කරන නමුත් දඩයම් වානරයාගේ විශාල මොළය හේතු කොටගෙන ඔවුන්ට වෘකයන්ට වඩා හොඳින් අදහස් හුවමාරු කර

ගැනීමටත්, සහයෝගයෙන් ක්‍රියා කිරීමටත් හැකි වූයේය. මේ නිසා වඩ වඩා සංකීර්ණ උපායන් දියුණු කළ හැකි වූ අතර මොළයේ වර්ධනය ද නොනවත්වාම සිදුවිය.

දඩයම් කණ්ඩායම ප්‍රධාන වශයෙන් පිරිමි සතුන්ගෙන් සමන්විත විය. ගැහැණු සතුන් කුඩා පැටවුන් රැක බලා ගත් බැවින්, දඩයම් කිරීමේදී ඔවුන් ගෙන් එතරම් සේවයක් ඉටු නොවීය. දඩයම් ක්‍රම වඩාත් සංකීර්ණ වීමත් සමඟ දඩයම් වානරයාට ඔහුගේ තැනින් තැනට යෑමේ සිරිත අත්හැර දැමීමට සිදුවූයේ පැටවුන් හා ගැහැණු සතුන් සමඟ ආහාර බෙදා හදාගෙන කෑ හැකි ස්ථිර නිවාසක් තිබීම අවශ්‍ය වූ බැවිනි. මෙම පියවර නිරුවත් වානරයාගේ හැසිරීම් රටාවේ විවිධ අංශවලට විශාල බලපෑමක් කළ බව පසු පරිච්ඡේදවලදී ඔබට පෙනී යනු ඇත.

මේ අනුව දඩයම් වානරයා කිසියම් ප්‍රදේශයකට හිමිකම් කියන වානරයකු බවට පත්විය. තැනින් තැන යමින් පලතුරු කමින් ගත කළ ජීවිතය ක්‍රමයෙන් අභාවයට ගිය අතර ඔහු දැන් නියම වශයෙන්ම වනාන්තරයෙන් පිටට පැමිණි වානරයෙකි. සෙවණ ලබාදෙන ස්ථාන සෑදීම, ආහාර ගබඩා කිරීම හා ගින්න නිපදවීම වැනි දේ කිරීමට ඔහුට හැකිවිය. දැන් ඔහු ජීව විද්‍යාත්මක ක්ෂේත්‍රයෙන් සංස්කෘතික ක්ෂේත්‍රයට ඇතුළු වන බැවින් අපි මෙහිදී මඳක් නතර විය යුත්තෙමු. මෙම නව දියුණුවේ ජීව විද්‍යාත්මක පදනම වූයේ ක්‍රමයෙන් විශාලත්වයෙන් හා සංකීර්ණ බවෙන් වැඩි වූ මොළයයි. වනගත වානරයා, බිම් වානරයකු බවටත්, ඔහු දඩයම් වානරයකු බවටත්, දඩයම් වානරයා බිම් ප්‍රදේශයට හිමිකම් කියන වානරයෙකු බවටත් පත්ව අවසානයේ සංස්කෘතික වානරයෙකු බවට පරිණාමය විය.

මෙතැන් සිට සිදුවූ අති විශාල සංස්කෘතික දියුණුව පිළිබඳව මෙම පොතෙන් සාකච්ඡා නොකරන බව නැවතත් සඳහන් කිරීමට කැමැත්තෙමි. අවුරුදු පත් ලක්ෂයක් පමණ කාලයක් තුළදී, ගිනි නිපදවීමේ සිට අභ්‍යවකාශ යන්ත්‍රයක්

Scanned by TapScanner

තැනීම දක්වා සිදුවී ඇති දියුණුව ගැන නිරුවත් වානරයා අද ඉතා ආඩම්බර වෙයි. එය ඉතා රසවත් කතාවක් නමුත්, එයින් මුලාවී, පිටින් ඇති ඔපයට යටින්, තමා තවමත් වානරයෙකු බව අමතක වීමේ අනතුරට අද නිරුවත් වානරයා මුහුණ පා සිටී.

අපේ අති විශේෂ පැවැත්ම පිළිබඳව නියම තුලනාත්මක අවබෝධයක් ලබාගත හැක්කේ, අපේ වර්ගයාගේ හැසිරීම් රටාවේ ජීව විද්‍යාත්මක අංශ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් හා අපේ මූලාරම්භය පිළිබඳව හොඳින් සොයා බැලීමෙන් පමණි.

මෙහි සඳහන් කරන ලද ආකාරයට අපේ පරිණාමය සිදුවූයේ යයි පිළිගන්නේ නම්, එක් කරුණක් පැහැදිලිවම පෙනෙන්නට තිබේ. එනම්, අප දියුණු වී ඇත්තේ මුලික වශයෙන් විලෝපිය අග්‍රේශයන් ලෙස බවයි. මේ නිසා වඳුරන් හා වානරයන් අතර අප කැපී පෙනෙන නමුත් මේ ආකාරයේ පරිවර්තන වෙනත් සත්ව කොට්ඨාශවල ද දකින්නට ඇති බව අමතක නොකළ යුතුය. අප මාංශ භක්ෂකයන් බවට පත්වූ ශාක භක්ෂකයන් වන අතර "යෝධ පැන්ඩා" ශාක භක්ෂකයකු බවට පත්වූ මාංශ භක්ෂකයෙකි. මේ නිසා පැන්ඩාද අප මෙන්ම අද්විතීය හා අති විශේෂ සත්වයෙක් වෙයි. මෙවැනි ප්‍රධාන ගණයේ වෙනස් කමක් නිසා බිහිවන්නේ ද්විත්ව චරිතයක් ඇති සතෙකි. පැරණි ජීවන ක්‍රමයේ සීමාවන් ඉක්ම වීමෙන් පසුව ඔහුගේ නව ජීවන රටාව අති මහත් පරිණාමීය ශක්තියකින් යුතුව ක්‍රියාත්මක වීමට පටන් ගනී. මේ සමඟ පැරණි ජීවිතයේ ලක්ෂණ කිහිපයකුත් අලුත් ජීවිතයට ගෙන යනු ලබයි. අලුත් ලක්ෂණ හා ගතිගුණ ලබා ගන්නා තරම් වේගයෙන්, පැරණි ඒවා ඉවත නොදැමේ. පැරණි මත්ස්‍යයන් ගොඩබිම ජය ගැනීමෙන් පසුවත් ඔවුන් ගේ ජලජ ලක්ෂණ බොහෝ කාලයක් තිස්සේ මුල් උභයජීවීන් තුළ දක්නට තිබිණි. අඩු ලුහුඬුකම් වලින් තොර සම්පූර්ණ නව සත්වයකු ඇතිවීමට අවුරුදු කෝටි ගණනක් ගත වේ. මේ නිසා අලුත් සතෙකුගේ පරිණාමයේ මුල් අවස්ථාවලදී දක්නට ලැබෙන සතා, විවිධ ලක්ෂණවල මිශ්‍රණයක් වන විකාරයකි. නිරුවත්

වානරයාද මෙවැනි මිශ්‍රණයකි. ඔහුගේ ශරීරයත්, ජීවන ක්‍රමයත් වනාන්තරයේ ජීවත් වීම සඳහා සකස් වූවකි. (පරිණාමීය වශයෙන් සලකන විට) හදිසියේම, ආයුධ භාවිත කරන සත්වයෙකු ලෙස පමණක් ජීවත් විය හැකි පරිසරයකට ඔහු ඇද දමා තිබේ. මෙම විපර්යාසය ඔහුගේ සිරුරට පමණක් නොව, හැසිරීම් රටාවටද බලපෑවේ කෙසේද යන්නත්, මෙම උරුමය අද අපට බලපාන්නේ කෙසේද යන්නත් විමසුමට ලක් කළ යුතු වේ.

මෙය කළ හැකි එක් ක්‍රමයක් නම් පලතුරු ආහාරයට ගන්නා අග්‍රේශයකුගේ හා "පිරිසිදු" මාංශ භක්ෂකයෙකුගේ ජීවන ක්‍රමය හා ව්‍යුහය සංසන්දනය කිරීමයි. මෙම එකිනෙකට වෙනස් ආහාර ක්‍රම දෙකට මෙම සත්වයන් හැඩ ගැසී ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමෙන් පසු නිරුවත් වානරයා බිහිවීමේදී මෙම ලක්ෂණ කෙසේ මිශ්‍ර වී ඇත්දැයි අපට පරීක්ෂා කළ හැකි වේ.

මාංශ භක්ෂක පවුලේ දීප්තිමත් තරු ලෙස එක් අතකින් කැලෑ බල්ලන් හා වෘකයන් ද, අනික් අතින් සිංහයන්, කොටියන් හා දිවියන්ද ඉදිරිපත් කළ හැකිය. ඉතා දියුණුවූ සංවේද ඉන්ද්‍රියන් මෙම සත්වයන් තුළ දක්නට ලැබේ. ඕනෑම සුළු ශබ්දයක් පවා පැහැදිලිව අසා ගතහැකි ලෙස ඔවුන්ගේ බාහිර කන් ඒ මේ අතට නැමේ. මාංශ භක්ෂකයන්ගේ දෑස් වර්ණ හඳුනා ගැනීම අතින් දුර්වල නමුත් ඉතා සුළු චලනවලට පවා අධි සංවේදී බවක් දක්වයි. අපට අවබෝධ කර ගැනීමට අපහසු තරම් තියුණු බවක් ඔවුන්ගේ ආඝ්‍රාණ සංවේදී ඉන්ද්‍රියන් හි දක්නට ලැබේ. ඔවුන්ට විවිධ ගන්ධයන් නිවැරදිව හඳුනා ගත හැකිවා පමණක් නොව, සංකීර්ණ ගන්ධයක විවිධ කොටස්ද පැහැදිලිව තෝරා බේරා ගැනීමට පුළුවන. බල්ලන්ගේ ගඳ සුවඳ දැනීමේ හැකියාව අපට වඩා සිය ගුණයක් පමණ බව බොහෝ පර්යේෂකයෝ පිළිගනිති.

මෙම ඉස්තරම් සංවේදී උපකරණවලට අමතරව පුදුමාකාර දේහ ශක්තියකින් යුත් සිරුරක්ද මාංශ භක්ෂයන්ට

Scanned by TapScanner

තිබේ. බළලා වැනි සතුන් වේගයෙන් පැන ගොදුරු දඩයම් කරන්නන් ලෙසද අනුවර්තනය වී තිබේ. එපමණක් නොව, ඔවුන්ට ප්‍රබල හනු, තියුණු දත්, උල් නිය හා මාංශපේශීන් ගෙන් පිරුණු පූර්ව ගාත්‍රවල පිහිටද මේ සඳහා ලැබේ.

ගොදුරක් දඩයම් කිරීම හෝ මරා ගැනීම මෙම සතුන්ට එක්තරා ආශාවක් සංසිඳුවා ගැනීමකි. එය ජීවිතයේ අභිමතාර්ථයක් ඉටුකර ගැනීමකි. ඔවුන් අනවශ්‍ය ලෙස හෝ අපතේ දැමීමට හෝ සතුන් නොමරන බව සත්‍යයකි. සීමා රහිතව මස් දීමෙන් මාංශ භක්ෂකයෙකු තුළ දඩයම් කිරීමට ඇති ආශාව සංසිඳවිය නොහැක. කොතරම් හොඳ ආහාර දී ඇතිකරන බළලකු හෝ බල්ලකු වුවත් ඉඳහිටවත් දඩයමක් කිරීමට පෙළඹෙන්නේ මේ නිසාය.

මොවුන්ගේ ජීරණ පද්ධති සෑදී ඇත්තේ දීර්ඝ කාලයකට පසු ආහාර ලැබුණු විට, බඩ පුරා කෑ හැකි ලෙසයි. (උදාහරණයක් වශයෙන් වෘකයෙකුට උගේ බරින් පහෙන් පංගුවක් පමණ මස් එකවර කා දැමීමට පුළුවන. මෙය ඔබ හෝ මා එක වේලකට මස් රාත්තල් 30ක් හෝ 40ක් ගිල දැමීමට සමාන වේ.) ඔවුන්ගේ ආහාර ඉතා පෝෂ්‍යදායී වන අතර එයින් අපතේ යන්නේ ඉතා ස්වල්පයකි. ඔවුන්ගේ අසූචි අධික දුර්ගන්ධයකින් යුක්ත වන බැවින් මල පහ කිරීම සඳහා විශේෂ ක්‍රම දියුණු වී තිබේ. සමහර සතුන් ඒවා පොළොව යට වළලන අතර තවත් සමහර සත්තු ජීවත් වන තැනින් ඉතා ඈතට ගොස් මෙම ක්‍රියාව කරති. කුඩා පැටවුන් ගුහාව අපිරිසිදු කළ විට සමහර අවස්ථාවලදී මව එම අසූචි කා ගුහාව පිරිසිදුව තබා ගනී.

සුළු වශයෙන් ආහාර ගබඩා කරන මෙම සත්තු දඩයම් කිරීමේදී ඉතා ක්‍රියාශීලීව කටයුතු කරතත් ඒ අතරතුර කාලය බොහෝ විවේකීව ගත කරති. මොවුන් සතුව ඇති දඩයම් කිරීමට යොදා ගන්නා අවයවවලින් තම වර්ගයේ සතුන්ට අනතුරු සිදුවීම වැළැක්වීමට යම්කිසි ප්‍රවේණි ක්‍රියාවලියක් උපකාරී වන බව පෙනෙන්නට තිබේ. බලවත් සතුන් සතුටු

කරවන හෝ ඔවුන්ගේ කෝපය සංසිඳුවන හෝ අවනත භාවය පළ කරන, ශරීර ඉරියව් මේ සඳහා දියුණු වී ඇත. මේ සංඥා, මාංශ භක්ෂක සතුන්ගේ ජීවන රටාවේ ඉතා වැදගත් තැනක් ගනී. දඩයම් කිරීමේ ක්‍රමය සත්ව වර්ගයෙන් වර්ගයට වෙනස් වෙයි. දිවියා තනිව හැංගී ගොදුර වෙත කඩා පනින අතර සිංහයෝ කණ්ඩායම් ලෙස දඩයම් කරති. වෘකයෝ කණ්ඩායමක් ගොදුර වටකොට ඒ මතට පනිති. අප්‍රිකානු දඩයම් බල්ලෝ, ගොදුර දුර්වල වන තුරු පසුපසින් ලුහුබැඳ දඩයම් කරති.

මැතකදී අප්‍රිකාවේ කරන ලද අධ්‍යයනයන්ගෙන් පෙනී ගොස් ඇත්තේ, නිත් සහිත හයනියා රාත්‍රී කාලයේදී කණ්ඩායමක් ලෙස සතුන් දඩයම් කරන බවයි. ඔවුන් එක් මධ්‍යස්ථානයක් වටා ජීවත් වන අතර, මෙවැනි කණ්ඩායමක දහයේ සිට සියයක් පමණ දෙනා සිටින්නට පුළුවන. ගැහැණු සතුන් වැඩි දුර නොයනත්, වෙනත් කණ්ඩායම් වල පිරිමි සතුන් අතර කලහ හෝ සටන් ඇති විය හැකි නමුත්, එකම කණ්ඩායමේ සතුන් අතර මෙවැන්නක් සිදුවන්නේ ඉතා කලාතුරකිනි.

ආහාර බෙදා හදා ගෙන කෑමේ සිරිත, සත්ව වර්ග ගණනාවකම දකින්නට පුළුවන. විශාල ගොදුරක් දඩයම් කරගත් විට, කණ්ඩායමටම ප්‍රමාණවත් වන බැවින් ආරවුල්වලින් තොරව එය බෙදා ගත හැකි වේ. සමහර අවස්ථාවල මීටත් වඩා දියුණු සිරිත් දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් අප්‍රිකානු දඩයම් බල්ලා සමහර විට ආහාර වමාරා අන් අයට කෑමට දෙයි.

මාංශ භක්ෂකයෝ ඔවුන්ගේ දරුවන්ට කෑම සැපයීමට විශාල වෙහෙසක් ගනිති. සිංහ ධෙනුව දඩයම් කොට සොයා ගන්නා මස්, ලෙන තුළට රැගෙනවිත් පැටවුන්ට දෙයි. සමහර විට පිටතදී විශාල මස් කැබලි ගිල දමන ඈ ලෙන තුළදී ඒවා වමාරා පැටවුන්ට කවයි. පිරිමි සිංහයන්ද සමහර අවස්ථාවන්හිදී මෙම කටයුතුවලට ආධාර කරන බව වාර්තා වී

Scanned by TapScanner

ඇතත්, එය සාමාන්‍ය සිරිත නොවන බව පෙනේ. පිරිමි වෘකයන් සමහර විට පැටවුන්ට කෑම සෙවීමට කිලෝමීටර 20ක් පමණ දුර ගමන් කරන බව වාර්තා වී ඇත. ගොදුර මරා ගත් තැනදී ගිල දමන මස්, ලෙන තුළදී වමාරා පැටවුන්ට දීමට ඔවුහු පුරුදු වී සිටිති.

මස්වලින් සමන්විත ආහාරයකට හා දඩයම් කිරීමේ ජීවන ක්‍රමයකට හැඩ ගැසුණු මාංශ භක්ෂකයන්ගේ ඉහතින් දැක්වූ ලක්ෂණ පලතුරු බුදින වඳුරන් හා වානරයන් ගේ ජීවන ක්‍රමය සමඟ සංසන්දනය කර බලමු.

උසස් අග්‍රේශයන්ගේ (වඳුරන්ගේ හා වානරයන්ගේ) සංවේදී ඉන්ද්‍රියන් අතරින් ආඝ්‍රාණ සංවේදනයට වඩා දියුණු වී ඇත්තේ දෘෂ්ටියයි. ගස්වල ජීවත්වන ඔවුන්ට, වඩා වැදගත් ගඳ සුවඳ දැන ගැනීම නොව පෙනීමයි. හොම්බ කෙටි වී ඇස් ඉදිරියට ඒම නිසා පෙනීම දියුණු වී ඇත. පලතුරුවල වර්ණ හඳුනා ගැනීමද ඔවුන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. නිශ්චල වස්තු සොයා ගැනීමට ඔවුන්ගේ දැස් ඉතා දක්ෂය. වානරයාට වඩා වැදගත් වන්නේ, සුළු චලනයන් හඳුනා ගැනීම නොව, හැඩය හා වර්ණයේ සියුම් වෙනස්කම් හඳුනා ගැනීමයි. ශබ්ද හඳුනා ගැනීම, මාංශ භක්ෂකයන්ට තරම් වැදගත් නොවන බැවින්, ඔවුන්ගේ බාහිර කන්පෙති කුඩා වී ඇති අතර මාංශ භක්ෂකයන්ට මෙන් ඒවා චලනය කළ නොහැක. වානරයන්ගේ ආහාරය වඩා රසවත් දේවලින් සමන්විත වන අතර ඔවුහු පැණි රස දේවලට වැඩි ළැදිකමක්ද දක්වති.

අග්‍රේශයන්ගේ ශරීරය ගස් නැගීමට මිස, දුර දිවීමට හෝ වේගයෙන් දිවීමට සුදුසු නැත. දෑත් හැඩගැසී ඇත්තේ යමක් තදින් අල්ලා ගැනීමට මිස, මස් ඉරා ගැනීමට හෝ පහර දීමට හෝ නොවේ. හනු හා දත් මාංශ භක්ෂකයන්ගේ තරම් ශක්තිමත් නැත. සතුන් මැරීම අග්‍රේශයන්ගේ ජීවිතයේ මූලික අංගයක් නොවේ. ආහාර ගැනීම හැම විටම කෙරෙන අතර මාංශ භක්ෂකයන්ට මෙන් නිරාහාරව දිගු කලක් සිටීමට වානරයන්ට නුපුළුවන. ඔවුන්ගේ ආහාර ඉතා පහසුවෙන්

ලබාගත හැකි ඒවා වන අතර ඒ සඳහා අවශ්‍ය වන්නේ එක් ප්‍රදේශයක ආහාර අවසන් වූ විට තවත් ප්‍රදේශයකට යාම පමණි. මේ නිසා මොවුන්ගේ ආහාර ගබඩා කිරීමක්ද දක්නට නොලැබේ.

වානරයා ගේ අසූචි, මාංශ භක්ෂකයන් ගේ තරම් දුර්ගන්ධයකින් යුක්ත නොවන බැවින්, ඒවා ඉවත් කිරීමට විශේෂ ක්‍රම දියුණු වී නැත. මොවුන් කණ්ඩායම් වශයෙන් තැනින් තැන යන බැවින්, එක් තැනක් අපිරිසිදුවීමේ ප්‍රශ්නයද පැන නොනඟී. නිදා ගැනීමට විශේෂ ස්ථාන පිළියෙළ කර ගන්නා වානරයෝ පවා සෑම රාත්‍රියකම අලුත් ස්ථානයක් සකස් කර ගනිති. මේ නිසා මාංශ භක්ෂකයන්ට මෙන් "නිවසේ" සෞඛ්‍යාරක්ෂාව ගැන වෙහෙසීමට වානරයන්ට සිදු නොවේ.

ආහාර පහසුවෙන් ලබාගත හැකිවීම නිසා වානරයන් කණ්ඩායම කොටස්වලට බෙදී ඒවා සෙවීමට යා යුතු නැත. හොඳින් එකට බැඳුණු කණ්ඩායමක් මෙන් ඔවුහු එදිනෙදා ජීවිතයේ කටයුතු කරති. ඕනෑම මොහොතක අන් අය කරන්නේ කුමක්ද යන්න පිළිබඳව සෑම කෙනෙකුටම අවබෝධයක් තිබේ. මොවුන් තනිව වාසය කිරීමක් දක්නට නොලැබේ. මාංශ භක්ෂකයන්ගේ දක්නට ඇති ප්‍රබල ස්වාභාවික ආයුධ වානරයන්ට නැති බැවින්, ඔවුන් පහසුවෙන් අනෙකුත් සතුන්ට ගොදුරු විය හැකිය.

එහෙත් වෘකයන් වැනි දඩයම්කාරී සතුන් තුළ දක්නට ඇති සහයෝගීතාව අග්‍රේශයන් තුළ දක්නට නොලැබේ. ඔවුන් තුළ දක්නට ඇති පොදු ලක්ෂණය නම්, ප්‍රමුඛතාව හා තරඟකාරී බවයි. අග්‍රේශයන්ට ආහාර සපයා ගැනීම සඳහා සංකීර්ණ වූ සම්බන්ධීකරණ ක්‍රියාවලියක් අවශ්‍ය නොවේ. වානරයන් අතර මාංශ භක්ෂකයන් ගේ තරම් සහයෝගීතාවක් දක්නට නොලැබෙන්නේ ඕනෑම වේලාවක ඉතා පහසුවෙන් ආහාර සපයා ගත හැකිවීම නිසාය.

Scanned by TapScanner

තවද ආහාර සෑම තැනකම ඇති බැවින් ඒවා සොයා වැඩි දුර ගමන් කිරීමක්ද අවශ්‍ය නොවේ. දැනට ජීවත්වන විශාලම අග්‍රේශයා වන ගෝරිල්ලාගේ කණ්ඩායම්වල හැසිරීම, ඉතා පරික්ෂාවෙන් යුතුව අධ්‍යයනය කර ඇති අතර ඒවායින් පෙනී ගොස් ඇත්තේ ඔවුන් සාමාන්‍යයෙන් දිනකට කිලෝමීටර භාගයකට වඩා ගමන් නොකරන බවයි. සමහර දිනවල ඔවුන් ගමන් කරන්නේ අඩි සිය ගණනක් පමණි. නමුත් මාංශ භක්ෂකයෙකුට දිනකට කිලෝ මීටර ගණනාවක් ගමන් කරන්න සිදුවෙයි. කෑම සොයා දින ගණනක් තිස්සේ තම ගුහාවේ සිට කිලෝ මීටර පනහක් පමණ ගමන් කළ සතුන් පිළිබඳවද වාර්තා වී තිබේ. ස්ථිර නිවසක් වෙත ආපසු ඒම මාංශ භක්ෂකයන්ගේ ලක්ෂණයක් වන අතර මෙවැනි සිරිතක් වානරයන් අතර එතරම් දක්නට නොලැබේ. වානරයන් කණ්ඩායමක් සාමාන්‍යයෙන් ජීවත් වන්නේ එක්තරා නියමිත ප්‍රදේශයක නමුත්, දවසේ කටයුතු අවසානයේ සිටි තැන්වලම නිදා ගැනීමට ඔවුහු පුරුදු වී ඇත.

තවද, වානරයන් කණ්ඩායම් දෙකක් මුණ ගැසුණ විට, මාංශ භක්ෂකයන් අතර මෙන් සටනක් සිදු නොවේ. ප්‍රදේශයකට හිමි කම් කියන සතුන් තම ප්‍රදේශ ආරක්ෂා කරන බැවින්, වානරයන් එවැනි සතුන් ලෙස සැලකිය නොහැක.

මෙහිදී වැදගත් වන තවත් එක් කරුණක් නම්, මාංශ භක්ෂකයන්ගේ සිරුරේ මැක්කන් සිටීමත්, අග්‍රේශයන්ගේ සිරුරේ ඔවුන් දක්නට නොලැබීමත්ය. වඳුරන් හා වානරයන් ගේ වෙනත් පරපෝෂිතයන් දැකිය හැකි මුත්, මැක්කන් දක්නට නොලැබේ. මෙයට හේතුව අවබෝධ කර ගැනීම සඳහා මැක්කාගේ ජීවන රටාව ගැන සොයා බැලිය යුතුය. මෙම කෘමියා බිත්තර දමන්නේ, ධාරකයාගේ සිරුරේ නොව, නිදන ස්ථානයේ ඇති කුණු කසල මතය. බිත්තරවලින් එළියට එන පණුවන් ආහාරයට ගන්නේ ධාරකයා ගේ රුධිරය නොව මෙම කසළයි. සති දෙකකට පමණ පසු කෝෂයක් සාදා ගන්නා මෙම පණුවා එය තුළට වී පිළවකු බවට පත්වේ. සම්පූර්ණයෙන්ම වැඩුණු සතෙකු ලෙස කෝෂයෙන් පිටවීමට

තවත් සති දෙකක් පමණ ගතවේ. මැක්කා අලුත් ධාරකයෙකු ගේ සිරුරේ ජීවිතය අරඹන්නේ ඉන් පසුවයි. මෙයින් පෙනී යන්නේ උගේ ජීවිතයේ පළමුවැනි මාසය ගත කරන්නේ ධාරකයාගෙන් පිටත බවයි. මේ අනුව, ස්ථිර වාසස්ථානයක් නැති තැනින් තැනට යන සතුන් වන වඳුරන් හා වානරයන්ගේ මැක්කන් දක්නට නොලැබෙන්නේ ඇයිද යන්න පැහැදිලි වේ. හදිසියේ මැක්කෙකු හෝ දෙන්නෙකු වානරයෙකුගේ සිරුරේ ජීවත් වුවත්, ඔවුන්ගේ බිත්තර නිදාගත් තැන තිබියදී වානරයා වෙනත් තැනකට යන බැවින්, මැක්කාගේ ජීවන චක්‍රය දිගටම පවත්වා ගැනීමට ධාරකයෙක් නොලැබේ. මේ අනුව මැක්කා ස්ථිර නිවාසයක් ඇති මාංශ භක්ෂකයන් වැනි සතුන් ගේ පමණක් දක්නට ලැබෙන පරපෝෂිතයෙකි. මෙහි වැදගත්කම ඔබට පසුව පැහැදිලි වනු ඇත.

මාංශ භක්ෂකයන් ගේ හා අග්‍රේශයන් ගේ ජීවන ක්‍රම සංසන්දනය කිරීමේදී මගේ සැළකිල්ල යොමු වූයේ විවෘත බිම් ප්‍රදේශවල වාසය කරන දඩයම් සතුන් හා ඝණ කැලෑවල සිටින පලතුරු බුදින්නන් වෙතය. මෙම දෙවර්ගයේම ඉහත දැක්වූ සාමාන්‍ය පිළිවෙළින් වෙනස් වන සත්තු දක්නට ලැබෙති. නමුත් අපේ අවධානය යොමු විය යුත්තේ මෙම සත්ව කොටස් දෙකෙන්ම වෙනස් වන නිරුවත් වානරයා ගැනයි. ඔහුට උරුමයෙන් ලැබුණු පලතුරු කෑමේ සිරිතත් සමඟ, අලුතෙන් පුරුදු වූ මාංශ අනුභව කිරීමේදී ඔහු කොතරම් අනුවර්තනය වූයේද ? මේ නිසා ඔහු කුමන ආකාරයේ සතෙකු බවට පත් වූයේද?

ආරම්භයේදී ඔහුට, බිම් ජීවිතයක් සඳහා සුදුසු ආකාරයේ, සංවේදී ඉන්ද්‍රියයන් නොතිබිණි. ඔහුගේ නාසය ඉතා දුර්වල වූ අතර කන් එතරම් තියුණු නොවීය. ඔහුගේ ශරීරය, හදිසියේ වේගයෙන් දිවීම සඳහාත්, දුෂ්කර ශාරීරික කාර්යයන් සඳහාත් යෝග්‍ය වූවක් නොවීය. ඔහු තුළ වැඩිපුර දක්නට ලැබුණේ සහයෝගීතාවට වඩා තරඟකාරී බවයි. නමුත් වාසනාවකට මෙන් අනිකුත් මාංශ භක්ෂකයන්ට වඩා සාමාන්‍ය බුද්ධියෙන් යුත් විශිෂ්ට මොළයක් ඔහු සතු විය.

Scanned by TapScanner

ශරීරය කෙළින් පිහිටුවා ගැනීමෙන්ද අත් එක් ආකාරයකටත්, පාද තවත් ආකාරයකටත් විකරණය කිරීමෙන්ද මොළය හැකි තරම් දුරට ප්‍රයෝජනයට ගැනීමෙන්ද, ඔහුට ලෝකයේ හිස ඔසවා සිටීමට අවස්ථාවක් ලැබුණි.

මෙය ඉතා පහසු දෙයක් ලෙස පෙනුණත් ඒ සඳහා ඉතා දීර්ඝ කාලයක් ගත වූ බව කිව යුතු නොවේ. එපමණක් නොව, මෙම විපර්යාසයන් හේතු කොට ගෙන ඔහුගේ එදිනෙදා ජීවිතයේ විවිධ අංශවල නොයෙක් ආකාරයේ වෙනස්කම් රාශියක්ම සිදුවිය. අප මෙහිදී අවධානය යොමු කරන්නේ මේවා සිදු වූ ආකාරය හා ඔහුගේ දඩයම් කිරීමේ හා ආහාර ගැනීමේ ක්‍රියාවලියට එය බලපෑ ආකාරය පිළිබඳවයි.

සටන ජය ගත යුතු වන්නේ ශක්තියෙන් නොව, බුද්ධියෙන් හෙයින් ඔහුගේ බුද්ධිය හැකි තරම් දියුණු කිරීම සඳහා යම්කිසි පරිණාමීය පියවරක් ගත යුතු විය. ඇත්ත වශයෙන්ම සිදුවූ දෙය අනුචිත විකාරයකි. මෙම පියවර නම් දඩයම් වානරයා, ළදරු වානරයෙකු බවට පත් කිරීමයි. මෙම පරිණාමීය උපක්‍රමය මිනිසාට පමණක් විශේෂ වූවක් නොවේ. එය සත්ව පරිණාමයේ විවිධ අවස්ථාවල දී සිදු වී ඇත්තකි. සරල ලෙස කිවහොත් මෙයින් අදහස් කරන්නේ ළදරු ලක්ෂණ වැඩිහිටි අවස්ථාව තෙක් පවත්වා ගැනීමයි. (සත්ව විද්‍යාවේදී මෙම ක්‍රියාවලිය චිරශිශුකතාව යනුවෙන් හඳුන්වනු ලැබේ.) මෙයට හොඳ උදාහරණයක් නම් ඇක්සොලොට්ල් යනුවෙන් හඳුන්වන උභයජීවියායි. ඉස්ගෙඩියෙකු ලෙස මුළු ජීවිත කාලයම ගත කරන ඌ ඒ තත්වයේම සිට ප්‍රජනනය කරයි.

සාමාන්‍ය වඳුරකුගේ නූපන් ළදරු පැටියෙකු පරීක්ෂාවට භාජනය කිරීමෙන්, මෙම ක්‍රියාවලිය නිසා නිරුවත් වානරයාගේ මොළය වර්ධනය වන ආකාරය අවබෝධ කර ගත හැකි වේ. උත්පත්තියට පෙර වඳුරු කළලයේ මොළය, ප්‍රමාණයෙන් හා සංකීර්ණත්වයෙන් ඉතා ශීඝ්‍රයෙන් වැඩි වේ. උපදින විට උගේ මොළය, අවසාන වැඩිහිටි ප්‍රමාණයෙන් සියයට 70 ක් පමණ වේ. මොළයේ ඉතිරි කොටසේ වර්ධනය

වීම මුල් හය මාසය තුළදී ඉතා වේගයෙන් සිදුවී, අවසන් වේ. චිම්පන්සියා පවා ඉපදී අවුරුද්දක් තුළදී උගේ මොළයේ වැඩීම සම්පූර්ණ කරයි. නමුත් අපේ වර්ගයේ ළදරුවකුගේ මොළය, උපදින විට එහි වැඩිහිටි ප්‍රමාණයෙන් සියයට 23 ක් පමණි. මුල් අවුරුදු හය තුළ එය වේගයෙන් වර්ධනය වන අතර අවුරුදු 23 ක් පමණ වන තෙක් එහි වර්ධනය සම්පූර්ණ නොවේ.

මේ අනුව අප ලිංගික වශයෙන් වැඩීමෙන් පසුවත් අවුරුදු දහයක් පමණ අපේ මොළයේ වැඩීම දිගටම සිදුවේ. නමුත් චිම්පන්සියා, ලිංගිකව ක්‍රියාකාරී වීමට අවුරුදු හයකට හෝ පහකට පෙර උගේ මොළයේ වර්ධනය සම්පූර්ණ වේ. අප ළදරු වානරයෙකු වී ඇතැයි කීමෙන් අදහස් කරන්නේ මෙයයි. අපි (ඇත්ත වශයෙන්ම අපේ මුතුන් මිත්තන් වන දඩයම් වානරයෝ) සමහර අංශවලින් ළදරුවන් වූ නමුත්, සෑම අතින්ම එසේ නොවීමු. අපේ ප්‍රජනන පද්ධතිය ඉතා වේගයෙන් වර්ධනය වූ නමුත් මොළයේ වර්ධනය සිදුවූයේ ඉතා සෙමිනි. වෙනත් වචනවලින් කිවහොත් ළදරු වානරයෙකු බවට පත්වීම අසම ක්‍රියාවලියක් විය. මෙම නැම්ම ක්‍රියාත්මක වීමෙන් පසුව, දුෂ්කර නව පරිසරයෙහි ජීවත්වීමට උපකාරීවන, විවිධ අංශවල වර්ධනයක් අවශ්‍ය ලෙස අඩු වැඩි කිරීම ස්වභාවික වරණයෙන් සිදුවනු ඇත. මෙම ක්‍රියාවලියේ බලපෑමට හසුවූ එකම කොටස මොළය පමණක් නොවේ. ශරීරයේ ඉරියව්වද මේ ආකාරයට වෙනස් විය. නොඉපදුණු ක්ෂීරපායි සතෙකුගේ හිසෙහි අක්ෂය පිහිටා ඇත්තේ ශරීර අක්ෂයට ලම්බකවයි. මෙලෙස ඉපදුණහොත් කකුල් හතරෙන් ගමන් කරන විට ඔහුගේ හිස බිමට මුහුණලා පිහිටනු ඇත. නමුත් උප්පත්තියට පෙර හිස කරකැවීමෙන් එහි අක්ෂය ශරීර අක්ෂය සමඟ කෙළින් පිහිටයි. මේ නිසා උත්පත්තියෙන් පසු හතර ගාතයෙන් ඇවිදින සතාගේ හිස ඉදිරියට මුහුණලා පිහිටා ඇත. මෙවැනි සත්වයෙකු කෙළින් සිට පසුපස ගාත් දෙකෙන් පමණක් ගමන් කිරීම ආරම්භ කළහොත්, ඔහුගේ හිස අහසට මුහුණලා පිහිටනු ඇත. දඩයම් වානරයා වැනි සිරස් සතෙකුට මේ නිසා හිස, සිරුරට ලම්බකව තබා ගැනීම අවශ්‍ය වේ. ඇත්ත වශයෙන්ම අපේ පරිණාමයේදී මෙය සිදුවී ඇති අතර මෙය උත්පත්තියට පෙර

Scanned by TapScanner

අවස්ථාවක්, උත්පත්තියෙන් පසුවත් පවතින "විරශිශුකතාව" පිළිබඳ හොඳ උදාහරණයකි.

දඩයම් වානරයා ගේ අනිකුත් විශේෂ ශරීර ලක්ෂණ බොහෝමයක්ම මේ ආකාරයට පැහැදිලි කළ හැකිය. ඒවා නම් දිග, සිහින් බෙල්ල, මුහුණේ පැතලි බව, දත්වල කුඩා බව හා ඒවා පසුව ඇතිවීම හා නළලේ ඝන රැලි නොමැති වීමයි.

දඩයම් වානරයාට තම නව ජීවිතයට අවශ්‍ය වූ පරිණාමීය පියවර වූයේ, කලල ලක්ෂණ ගණනාවක්ම ප්‍රයෝජනවත් ඒවා වීමයි. මේ අනුව කලල ලක්ෂණ කිහිපයක් වැඩිහිටි අවස්ථාව දක්වා පවත්වා ගැනීමෙන් අවශ්‍ය වූ ආකාරයේ මොළයක් හා ඒ සමඟ යන සිරුරක් ලබා ගැනීමට ඔහු සමත් විය. කෙළින් සිට ගෙන දෙපාවලින් දිවීමට හැකි වූ ඔහුගේ දැත්වලින් ආයුධ අල්ලා ගතහැකි වූයේ ඒවා තවදුරටත් ගමනා ගමනය සඳහා අවශ්‍ය නොවූ බැවිනි. මේ අතර සිදුවූ මොළයේ වර්ධනය නිසා ආයුධ තව තවත් දියුණු කර ගත හැකිවිය. මේ අනුව ඔහු වඩා බුද්ධිමත් වූවා පමණක් නොව, දෙමාපියන් හා අනිකුත් වැඩිහිටියන්ගෙන් විවිධ දේ ඉගෙන ගත හැකි දීර්ඝ ළමා කාලයක්ද ඔහුට ලැබුණි. ළදරු වානරයන් හා චිම්පන්සීන් තුළ ගවේෂණාත්මක හා විමසිලිමත් බව දක්නට ලැබෙන නමුත් එය ඉතා ඉක්මණින් තුනී වී යයි. මේ අනුව බලන විට නිරුවත් වානරයාගේ ළදරු කාලය ඔහුගේ වැඩිහිටි ලිංගික ජීවිතය දක්වා විහිදෙයි. කලින් ජීවත් වූ අය විසින් දියුණු කළ හා සකස් කළ විවිධ දේ ඉගෙන ගැනීමටත් අනුකරණය කිරීමටත් මේ නිසා සැහෙන කාලයක් ලැබේ.

දඩයම්කරුවකු හැටියට ඔහු තුළ දක්නට ලැබුණු දුර්වලතාවයන් ඔහුගේ බුද්ධිය හා අනුකරණ දක්ෂතාවය නිසා මැකී ගියේය. මීට පෙර කිසිදාක සත්ව ඉතිහාසයේ නොවූ විරූ ලෙස මෙම සතාට විවිධ දේ ඉගැන්වීමට ඔහුගේ දෙමාපියන්ට හැකි විය.

ඉගෙන ගැනීම පමණක් ප්‍රමාණවත් නොවූ බැවින්

ප්‍රවේණි අංශයේ ආධාරයද අවශ්‍ය වූයේය. ඒ සමඟම දඩයම් වානරයාගේ ස්වභාවයේ මූලික ජීව විපර්යාසයක්ද සිදුවිය යුතු විය. කලින් විස්තර කළ ආකාරයේ, වනාන්තරයේ ජීවත්වන, පලතුරු බුදින වානරයෙකුට, විශාල මොළයකුත් දඩයම් කළ හැකි සිරුරකුත් ලැබුණ පමණින් සාර්ථක දඩයම් වානරයෙකු බිහි නොවේ. ඒ සඳහා වෙනත් අනුවර්තනයන්ද අවශ්‍ය වේ. ඔහුගේ මූලික හැසිරීම් රටා අලුත් ජීවිතයට නොගැලපුණි. හොඳින් සිතා බලා නිවැරදිව සැලසුම් කිරීමට ඔහුට හැකි වූවත්, වඩා මූලික වූ සත්ව ආශාවෝ වැරදි ආකාරයේ ඒවා වූහ. ඉගෙන ගත් දේ ස්වාභාවික ආශාවන්ට විරුද්ධ විය. ආහාර ගැනීමේ ක්‍රියාවලියේ පමණ නොව, සාමාන්‍ය සමාජීය, සටන්කාමී හා ලිංගික හැසිරීම් රටාවේ ද මෙය දක්නට ලැබේ. ප්‍රවේණි විපර්යාසයන්ගෙන් තොරව තරුණ දඩයම් වානරයා පුහුණු කිරීම පහසු කටයුත්තක් නොවීය. මොළයේ උසස් මධ්‍යස්ථාන කොතරම් දක්ෂ වූවත් පහළ කොටස්වලින් ද එයට සැහෙන ආධාරයක් ලැබීම අත්‍යවශ්‍ය විය.

ශුද්ධ මාංශ භක්ෂකයෙකු හා ශුද්ධ අග්‍රේශයකු අතර ඇති වෙනස්කම් ගැන සලකා බැලීමෙන් මෙය සිදු වූයේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට පුළුවන. දියුණු මාංශ භක්ෂකයාට ආහාර සපයා ගැනීමත්, ආහාර අනුභවයත් එකිනෙකට වෙනස් ක්‍රියාවන් දෙකක් වෙයි. එයට හේතුව සම්පූර්ණ ක්‍රියාවලිය ඉතා දුෂ්කර මෙන්ම දීර්ඝ එකක් වන බැවිනි. බළලුන් සමඟ කරන ලද පර්යේෂණවලින් පෙනී ගොස් ඇත්තේ ගොදුර ඇල්ලීම, මැරීම හා පිළියෙළ කිරීම එකිනෙකට ස්වාධීන ක්‍රියා පද්ධති බවයි. මෙයින් එක් ආශාවක් තෘප්තිමත් වීමෙන් අනෙක් ආශාවෝ තෘප්තිමත් නොවෙති.

පලතුරු බුදින අග්‍රේශයාගේ තත්වය මෙයට හාත්පසින්ම වෙනස්ය. පළමුවෙන් සොයාගත් ආහාරය ඒ අවස්ථාවේදීම අනුභව කරන බැවින්, එය විවිධ ක්‍රියාවන්ට වෙන් කළ නොහැක. දඩයම් වානරයා පරිණාමය වීමේදී ඔහුගේ ජීවන රටාවේ වෙනස් විය යුතු එක් දෙයක් වූයේ මෙයයි. දඩයම් කිරීම තෘප්තියක් ලබා දෙන කටයුත්තක් වීමද,

Scanned by TapScanner

දඩයම් කිරීම, මැරීම හා ආහාර පිළියෙළ කිරීම එකිනෙකට ස්වාධීන අභිමතාර්ථයන් සහිත ක්‍රියාවලි වීමද අවශ්‍ය වේ. වර්තමාන නිරුවත් වානරයාගේ ආහාර සපයා ගැනීමේ ක්‍රියාවලිය විමසිල්ලට භාජනය කිරීමේදී පෙනී යන්නේ, මෙවැනි දෙයක් සිදුවී ඇති බවයි.

දඩයම්කරුවෙකු වීමට අමතරව දඩයම් වානරයාට ඔහුගේ ආහාර අනුභව කිරීමේ කාල වේලාවන්ද වෙනස් කිරීමට සිදුවිණි. නිතර ටික ටික කෑමේ සිරිත අතහැර දමා විශාල ආහාර ප්‍රමාණයක් දවසකට කීපවරක් පමණක් අනුභව කිරීමට ඔහුට සිදුවිය. මේ සමහම ආහාර ගබඩා කොට තැබීමද ආරම්භ විය. ස්ථිර නිවාසයක් වෙත ආපසු ඒමේ ක්‍රියාවලියේද දියුණුවක් දක්නට ලැබිණි. මළ පහකිරීම විශේෂයෙන් සංවිධානය වූ ක්‍රියාවලියක් වූ අතර එය සමූහ (අග්‍රේශ) ක්‍රියාවක් නොව, පෞද්ගලික (මාංශ භක්ෂක) ක්‍රියාවක් බවට පත් විය.

ස්ථිර වාසස්ථානයක් තිබීම නිසා මැක්කන් බෝවීමට ඉඩ ඇති බව මම කලින් සඳහන් කළෙමි. එපමණක් නොව, මාංශ භක්ෂකයන් ගේ මැක්කන් දැකිය හැකි බවත් අග්‍රේශකයන්ගේ මැක්කන් නොමැති බවත් ඔබට මතක ඇතැයි සිතමි. ස්ථිර නිවසක් තිබීම නිසා දඩයම් වානරයා අනිකුත් අග්‍රේශයන්ගෙන් වෙනස් වන්නේ නම්, ඔහුගේ සිරුරේ, මැක්කන් දැකිය හැකි විය යුතුය. නියම තත්වය මෙයයි. අපේ වර්ගයාගේ, අප සමහම පරිණාමය වූ මැක්කන් වර්ගයක් සිටින බව අපි දනිමු. අලුත් විශේෂයක් ලෙස දියුණු වීමට නම් මේ මැක්කා සැහෙන කාලයක් අප සමඟ ජීවත් විය යුතුය. මෙම පරපෝෂිතයා, අපේ දඩයම් වානර මුතුන් මිත්තන් ගේ කාලයේ සිටම අප සමඟ සිටි බව එයින් අනුමාන කළ හැකි වේ.

තම සගයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමත්, අදහස් හුවමාරුව වැඩි දියුණු කර ගැනීමත්, සමාජීය වශයෙන් දඩයම් වානරයාට වැදගත් විය. මුහුණෙන් හා ශබ්දවලින්

හැඟීම් ප්‍රකාශ කිරීම වඩා සංකීර්ණ විය. අලුත් ආයුධ නිපදවා ගැනීමත් සමඟ තම කණ්ඩායම තුළ සටන් වැළැක්වෙන සංඥා ක්‍රම දියුණු කර ගත යුතු විය. අනික් අතට ආරක්ෂා කළ යුතු නියමිත මධ්‍යස්ථානයක් තිබීම නිසා අනික් කණ්ඩායම්වල සාමාජිකයන් කෙරෙහි ආක්‍රමණකාරී වණ්ඩ හැඟීම් හා ප්‍රතිචාරයන් දියුණු කිරීමද අවශ්‍ය වන්නේය.

නව ජීවන ක්‍රමයේ අවශ්‍යතාවයන් හේතු කොට ගෙන කණ්ඩායම අතහැර නොයැමේ අග්‍රේශ සිරිත, ක්‍රමයෙන් අඩු කිරීම ද අවශ්‍ය විය. පහසුවෙන් හා ඒකාකාරීව ආහාර නොලැබීමත්, අලුතෙන් ඇති වූ සහයෝගීතාවත් නිසා ආහාර බෙදා ගැනීමට ඔහු පුරුදු විය. කලින් සඳහන් කළ වෘකයන් මෙන් කිරි දෙන ගැහැණු සතුන් හා සෙමින් වැඩෙන ළදරුවන් සඳහා පිරිමි වානරයා, ආහාර ගෙදරට ගෙන ආ යුතුය. අග්‍රේශයන් අතර සාමාන්‍යයෙන් දක්නට ඇත්තේ මාතෘ සෙනෙහස පමණක් හෙයින්, මේ ආකාරයට පීතෘ සෙනෙහස ඇතිවීම අලුත් පියවරක් ලෙස සැලකිය හැකියි.

කුඩා පැටවුන් බොහෝ කාලයක් යන තුරුම මවගේ ආරක්ෂාව යටතේ ජීවත් වීමට පටන් ගැනීම නිසා, ගැහැණු සතාගේ කටයුතු බොහෝ දුරට නිවසටම සීමාවීමක් දක්නට ලැබුණි. මෙම නව ජීවන රටාව නිසා අනිකුත් මාංශ භක්ෂකයන් තුළ දක්නට නැති, ගැහැණු හා පිරිමි සතුන්ගේ කටයුතු පිළිබඳ, අලුත් ප්‍රශ්නයකට මුහුණ දීමට දඩයම් වානරයාට සිදුවිය. දඩයම් කිරීම, පිරිමින් විසින් පමණක් කළ යුතු වූ කටයුත්තක් වූ බැවින්, එය අග්‍රේශ (වානර) සිරිත් විරිත්වලට නුහුරු දෙයක් විය. පිටස්තර පිරිමි සතුන්ගෙන් ගැහැණු සතුන්ට කරදර සිදුවීම අග්‍රේශයන් අතර කිසිවිටක සිදු වූවක් නොවේ. එහෙත් දඩයම් වානරයාගේ ගැහැණු සතුන් ගෙදර නතර වීමට පටන් ගැනීම නිසා මෙය සිදු වන්නට හොඳට ඉඩ තිබිණි. මෙය වැළැක්වීම සඳහා සමාජීය හැසිරීම් රටාවේ වෙනසක් සිදුවීම අවශ්‍ය විය.

මෙයට පිළිතුර වූයේ යුගල බැම්මක් වර්ධනය කිරීමයි.

Scanned by TapScanner

එනම්, පිරිමි හා ගැහැණු දඩයම් වානරයන් ආදරයෙන් වෙළී එකිනෙකාට විශ්වාසවන්තව සිටීමයි. මෙය වෙනත් සත්ව කොට්ඨාශ ගණනාවකම දක්නට ලැබෙන සිරිතක් නමුත් අග්‍රේශයන් අතර දුර්ලභ ලක්ෂණයකි. ඒ නිසා එක පහරින් ප්‍රශ්න තුනක් විසඳීමට හැකි විය. පළමුව පිරිමි සතුන් දඩයම් කරන අතර ගැහැණු සත්තු ඒ ඒ පිරිමියාට බැඳී විශ්වාසවන්තව සිටියහ. දෙවනුව පිරිමින් අතර ලිංගික තරගකාරී බව අඩු වීමෙන් ඔවුන් අතර සහයෝගීතාව වැඩි විය. කණ්ඩායමක් ලෙස සාර්ථකව දඩයම් කිරීමට ශක්තිමත් මෙන්ම දුර්වල වානරයන්ගේ උපකාරය අවශ්‍යයි. එහෙයින් වෙනත් අග්‍රේශ වර්ගවල සිදුවන ආකාරයට දුර්වල සතුන් සමාජයෙන් එළවා දැමිය නොහැක. එපමණක් නොව, අලුතෙන් සාදා ගන්නා ලද ආයුධ නිසා කණ්ඩායම තුළ ගැටුම් ඇතිවීම වැළැක්වීම ද ඉතා අවශ්‍ය විය. තුන්වැන්න වූයේ එක් පිරිමියකුගෙන් හා එක් ගැහැනියකගෙන් සෑදුණු ඒකකය, පැටවුන්ට ඉතා වාසිදායක වීමයි. සෙමෙන් වැඩෙන පැටවුන් හදා වඩා ගැනීමත්, පුහුණු කිරීමත් සඳහා දැඩි ලෙස බැඳුණ පවුලක් අවශ්‍ය වෙයි. වෙනත් සත්ව වර්ගවලද ගැහැනු සතාට මෙම කටයුතු තනිව කර ගත නොහැකි අවස්ථාවන්හිදී, විශේෂයෙන්ම පැටවුන් බිහිවන කාලයේදී පිරිමි හා ගැහැනු සතුන් එකට බැඳ තබන බලවත් යුගල බන්ධනයක් ඇතිවන බව පෙනේ. දඩයම් වානරයා පිළිබඳව සිදුවී ඇත්තේත් මෙයයි.

මේ ක්‍රමය නිසා පිරිමියා ගේ ආධාර උපකාර ගැහැනු සතාට ලැබුණ අතර, ඇයට මවක ගේ යුතුකම් හා කටයුතුවලට මුළු කාලයම කැප කළ හැකි විය. ගැහැණුන්ගේ පක්ෂපාතීභාවය පිළිබඳ සැකයක් නොවූ බැවින්, ඒ පිළිබඳ ආරවුල් ඇති කර නොගත් පිරිමි, සහයෝගයෙන් දඩයම් කටයුතුවල නිරත වූහ. කුඩා පැටවුන් රැක බලා ගැනීමද මේ නිසා හොඳින් කෙරුණි. මෙය ඉතාම හොඳ විසඳුම ලෙස පෙනුණත්, මේ සඳහා වානරයා ගේ සමාජීය හා ලිංගික හැසිරීම් රටාවේ ප්‍රධාන පෙළේ වෙනසක් සිදුවිය යුතුය. නමුත් මෙම කටයුත්ත කිසිදාක කිසිසේත් සම්පූර්ණ පරිවර්තනයක් නොවූ බව ඔබට පසුව පෙනී යනු ඇත.

මෙම මූලික වෙනස සිදුවී ඇත්තේ අර්ධ වශයෙන් බව අපේ වර්ගයා ගේ අද හැසිරීම් රටාවෙන් පැහැදිලි වන අතර, විටින් විට අපේ මුල් වානර ආශාවන් මතුවන බව ද දක්නට ලැබේ.

දඩයම් වානරයා තම වානර ගති වෙනස් කරමින් භයානක මංශ භක්ෂකයකු බවට පත් වූයේ මේ ආකාරයටයි. මේවා සංස්කෘතිමය වෙනස්කම් නොව, මූලික ජීවමය විපර්යාසයන් බව පෙනේ. නව සත්වයා, ප්‍රවේණි ලක්ෂණවලින් අනිකුත් වානරයන් ගෙන් වෙනස් විය. මෙය එතරම් පිළිගත නොහැකි හුදු අනුමානයක් පමණකැයි ඔබට සිතෙන්නට පුළුවන. මෙම විපර්යාසයන් සිදු වූයේ සංස්කෘතියේ බලපෑම් හේතු කොට ගෙන යැයි යමෙකුට තර්ක කළ හැකියි. එහෙත් අද අපේ වර්ගයා ගේ හැසිරීම් රටාව දෙස පරීක්ෂාවෙන් බැලීමේ දී එම තර්ක වැරදි බව හොඳින් පැහැදිලි වේ. සංස්කෘතික දියුණුව නිසා අද අප ඉතා උසස් අඩියකට පත්ව ඇතත්, ඒවා අපේ මූලික ජීව ලක්ෂණ සමඟ ගැටෙන හැම අවස්ථාවකම ප්‍රබල විරුද්ධතාවන් හට ගනී. අපේ කටයුතු කොතරම් උසස් යයි සම්මත ඒවා වූවත්, දඩයම් වානරයකු ලෙස මුල් යුගයේ ඇති වුණු හැසිරීම් රටාවෝ ඒ සියල්ලේම දක්නට ලැබෙති. අපේ ආහාර ගැනීමේ ක්‍රම, චණ්ඩභාවය, බිය, ලිංගික කටයුතු, දරු සෙනෙහස ආදිය සංස්කෘතිය නිසා ඇති වූ ඒවා නම්, වත්මන් කාර්මික සමාජයේ අවශ්‍යතාවන්ට අනුව ඒවා හැඩ ගස්වා ගැනීමට අපට හැකි විය යුතුය. නමුත් මෙවැන්නක් සිදුවී නැත. අපේ සත්ව ස්වභාවය ඉදිරියේ අපි නැවත නැවතත් හිස නමා ඇත්තෙමු. අපි අවංක නම් මෙම තත්වය නැති කිරීමට තව අවුරුදු කෝටි ගණනක් ගතවන බව පිළිගත යුතුයි. අපේ සංකීර්ණ ශිෂ්ටාචාරයට තවදුරටත් ඉදිරියට යා හැක්කේත්, දියුණු විය හැක්කේත්, අපේ මූලික සත්ව ස්වභාවය යටපත් නොවන ආකාරයට එය සැලසුම් කිරීමෙන් පමණි. අවාසනාවකට මෙන් අපේ හැඟීම් හා බුද්ධිය එකට යන බවක් නොපෙනේ. මෙවැනි වැරදීම් සිදුවූ අවස්ථාවන් පිළිබඳව කොතෙකුත් උදාහරණ දැක්විය හැකි

Scanned by TapScanner

අතර මෙවැනි දේ හේතු කොටගෙන මිනිස් සමාජයන් සම්පූර්ණයෙන්ම විනාශ වී ගිය අවස්ථා ද දක්නට ලැබේ.

මෙය සිදු වූයේ කෙසේදැයි අපි ඊළඟ පරිච්ඡේදවල දී සොයා බලමු. පළමුව මෙම පරිච්ඡේදය ආරම්භයේදී ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට අප පිළිතුරු සෙවිය යුතුය. මිනිස් වර්ගයා අනිකුත් වානර වර්ගවලින් වෙන් කරන එක් ලක්ෂණයක් තිබූ බව අපි දුටුවෙමු. මෙම ලක්ෂණය නම් නිරුවත් බවයි. මෙම සත්වයා "නිරුවත් වානරයා" ලෙස නම් කිරීමට, සත්ව විද්‍යාඥයෙකු වන මා පෙළඹවූයේත් එයයි. සිරස් වානරයා, ආයුධ සාදන වානරයා, බුද්ධිමත් වානරයා ආදී වශයෙන් ඔහුට තවත් නම් කීපයක් දීමට පුළුවන. එහෙත් සත්ව විද්‍යාත්මක ආදර්ශයක් ලෙස ගත් කල හා අනිකුත් වානරයන් සමඟ සසඳන විට අප එක් වරම දකින්නේ ඔහුගේ නිරුවත් බවයි. මෙම අපූරු ලක්ෂණයේ ඇති වැදගත්කම කුමක්ද? දඩයම් වානරයා, නිරුවත් වානරයකු බවට පත් වූයේ ඇයි?

අවාසනාවකට මෙන් සම හා රෝම ගැන කථා කරන විට පාෂාණීභූත ද්‍රව්‍යවලින් කිසිම උපකාරයක් බලාපොරොත්තු විය නොහැකි බැවින්, රෝම නැතිවීම කුමන කාලයක සිදු වූයේ දැයි කිව නොහැක. අපේ මුතුන් මිත්තන් වනාන්තර අත හැර එළිමහන් බිම්වලට ඒමට පෙර මෙය සිදු නොවූ බව පමණක් අපට ස්ථිරවම කිව හැකියි. එය, එළිමහනට පැමිණීමත් සමඟ සිදු වූ විශාල පෙරළියේ කොටසක් ලෙස සැලකීමට පුළුවන. නමුත් ඇත්ත වශයෙන්ම එය සිදු වූයේ කෙසේ ද? නැඟී එන අලුත් වානරයාට එය උපකාරී වූයේ කුමන ආකාරයකින් ද?

මෙය බොහෝ කාලයක් තිස්සේ විශේෂඥයින් ගේ හිසට වද දුන් ප්‍රශ්නයක් වූ අතර ඒ සඳහා විවිධ ආකාරයේ මත ඉදිරිපත් කොට තිබේ. බොහෝ දුරට පිළිගත හැකි එක් මතයකට අනුව කියවෙන්නේ මෙය කලින් විස්තර කරන ලද "චිරශිශුකතාව" නම් ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් බවයි. චිම්පන්සි පැටියා උපදින විට උගේ හිසේ කෙස් ඇති නමුත් ශරීරය

සම්පූර්ණයෙන්ම නිරුවත්ය. චිම්පන්සියා ගේ ළදරු අවස්ථාව දිගටම පැවතුනහොත් වැඩිහිටි චිම්පන්සියාගේ පෙනුම අපට සමාන වන බවට කිසිම සැකයක් නැත.

අපේ වර්ගයා ගේ රෝම වැසීම යටපත් කිරීමේ ක්‍රියාවලිය ඉතා සාර්ථක වී තිබේ. මව තුළ වැඩෙන කලලය මාස 6ත් 8ත් අතර කාලයේදී සම්පූර්ණයෙන්ම රෝමවලින් වැසී යයි. ඉපදීමට ළංවන තුරුම මෙම රෝම දක්නට ලැබේ. නියම කාලයට පෙර උපදින සමහර ළදරුවන්ගේ මේවා දකින්නට ලැබුණත්, ඉතා දුර්ලභ අවස්ථාවන්හිදී හැරෙන්නට ඒවා සම්පූර්ණයෙන්ම හැලී යයි. වානරයකු මෙන් රෝමවලින් වැසුණු, මිනිස් වැඩිහිටියන් තිස් දෙනෙකුට වඩා සිටි බවට වාර්තා වී නැත.

එනමුත් අපේ වර්ගයා ගේ සිරුරේ රෝම ඉතා විශාල ගණනක් දක්නට ලැබේ. ඇත්ත වශයෙන්ම සංඛ්‍යාව අතින් මෙය, චිම්පන්සියාගේ සිරුරේ ඇති රෝම ගණනට වඩා ඉතා වැඩිය. මෙහිදී සිදුවී ඇත්තේ පූර්ණ රෝම නැති වී කුරු රෝම ඇතිවීමයි. මේ නිසා අපේ වර්ගයා නිරුවත් සතෙකු ලෙස සැලකිය නොහැකිය යන්න සමහර විද්‍යාඥයන්ගේ අදහස වී තිබේ. මෙය විකාර කතාවකි. එය අන්ධයකුට ඇස් යුගලයක් ඇති බැවින් ඔහු අන්ධ නැතැයි කීමට සමානය. අපේ සම බාහිර ලෝකයට සම්පූර්ණයෙන්ම නිරාවරණය වී ඇති බැවින් අපි නිරුවත් සත්ව වර්ගයක් වෙමු. ලොකුකර පෙන්වන කණ්ණාඩියක් තුළින් අපේ රෝම කීපයක් ගණන් කළ හැකි වුවත්, අපේ නිරුවත් බව එයින් වැසිය නොහැක.

චිරශිශුකතා මතයෙන් කියවෙන්නේ නිරුවත් බව ලැබුණ ආකාරය පමණි. සතුරු පරිසරයක ජීවත් වීමට, නිරුවත් වානරයාට එය කොතරම් උපකාරී වූයේද යන්න පිළිබඳව එයින් කිසිවක් නොකියැවේ. නිරුවත් බව, එතරම් වැදගත්කමක් නැති, මොළයේ වර්ධනය වැනි වඩා ප්‍රධාන වූ අනිකුත් විපර්යාසවල අතුරු ඵලයක් ලෙස යමෙකුට තර්ක කළ හැකිය. නමුත් චිරශිශුකතා ක්‍රියාවලියේ දී එක් එක් අංගවල

Scanned by TapScanner

වර්ධනය එක් එක් ආකාරයට අඩු වැඩි වන බව අපි දනිමු. මේ නිසා නිරුවත් බව අනතුරුදායක වූයේ නම් අනිකුත් අංගවල වර්ධනය පමා වූ නිසාම රෝමවල වර්ධනය ද පමා විය යුතු නැත. අලුත් සත්වයාට මෙහි විශේෂ ප්‍රයෝජනයක් නොවූයේ නම් ස්වාභාවික වරණය මගින් එය ඉක්මණින්ම නැති කර දමනු නොඅනුමානයි.

එසේ නම් නිරුවත් සමේ වටිනාකම කුමක්ද? එක් මතයක් නම් දඩයම් වානරයා තැනින් තැන යෑමේ සිරිත අත්හැර ගුහාවල පදිංචිය ඇරඹීමත් සමඟ ඔහුගේ සමේ විවිධ පරපෝෂිතයන් ඇති වූ බවයි. එකම තැන නිදා ගැනීම නිසා මකුණන්, මැක්කන් හා කිනිතුල්ලන් වැනි විවිධ සතුන්ට ලෙහෙසියෙන් බෝවීමට හැකි විය. රෝම හැලීම මෙම ප්‍රශ්නය විසඳීමේ එක් මහක් ලෙස සැලකිය හැකිය.

මෙම අදහසේ සත්‍යයක් තිබිය හැකි නමුත්, එය ප්‍රධානම හේතුව වූයේ යැයි සිතිය නොහැක. ගුහාවල ජීවත් වන රෝම සහිත ක්ෂීරපායින් සිය ගණනක් අතුරෙන් මෙවැනි පියවරක් ගෙන ඇත්තේ සත්ව වර්ග කිහිපයක් පමණි. කෙසේ වෙතත්, වෙනත් හේතුවක් නිසා නිරුවත් බව ඇති වූයේ නම් කරදරකාරී පරපෝෂිතයන්ගෙන් මිදෙන්නට එය ආධාර වූ බවට කිසිම සැකයක් නැත.

ඉදිරිපත් කොට ඇති මේ සමාන තවත් මතයක් නම් දඩයම් වානරයාගේ රෝම සහිත සිරුරේ ආහාර කැබලි ආදිය රැඳී විවිධ රෝග පැතිරීමට ඉඩ තිබූ බැවින් එය නැති කිරීමට නිරුවත් ලක්ෂණය ඇති වූ බවයි. සතුන්ගේ මළකුණු කා දමන පක්ෂීන් ගේ හොට හා හිසෙහි පිහාටු .දක්නට නොලැබේ. දඩයම් වානරයාගේ මෙය සිරුර පුරාම සිදුවී ඇත. නමුත් මරණීය ආයුධ සෑදීමේ හැකියාව ලැබීමට පෙර ශරීරය පිරිසිදු කරගැනීමේ හැකියාව දඩයම් වානරයාට නොලැබුණේ යයි සිතිය හැකිද? මළපහ කිරීමේදී දුෂ්කර අවස්ථාවකට පත් වූ විට විම්පන්සි පවා සමහර විට කැලෑ කොළ ප්‍රයෝජනයට ගනිති.

රෝම සහිත පිටවැස්ම නැති වීමට හේතු වූයේ ගිනි නිපදවීමය යනුවෙන්ද මතයක් ඉදිරිපත් වී ඇත. මෙම තර්කයට අනුව දඩයම් වානරයාට සීතල දැනුණේ රාත්‍රී කාලයේදී පමණි. රාත්‍රියේ ගිනි ගොඩක් අසල සිටීමට හැකිවීම නිසා රෝම අනවශ්‍ය වූ අතර ඒවා නොමැති වීම නිසා දිවා කාලයේ උණුසුමටද වඩා හොඳින් මුහුණ පෑ හැකි විය.

රෝම හැලීම පැහැදිලි කිරීමට ඉදිරිපත් කර ඇති තවත් මතයක් නම් දඩයම් වානරයකු වීමට පෙර මුල් වානරයා වනාන්තර අතහැර ජලජ වානරයකු ලෙස දිගු කලක් ගත කළ බවයි. ආහාර සොයා මුහුදු වෙරළට ආ මෙම වානරයාට එහිදී වඩා රසවත් ආහාර ලැබෙන්නට ඇත. මුලින් නොගැඹුරු දියෙහි සැරි සැරූ මෙම වානරයා පසුව ආහාර සොයා ගැඹුරු දියෙහි ද කිමිදෙන්නට ඇත. මෙම ක්‍රියාවලියේදී මුහුදට ගිය තල්මසා වැනි අනිකුත් ක්ෂීරපායින්ගේ මෙන් ඔහුගේද රෝම හැලෙන්නට ඇත. ජලයෙන් උඩ තිබූ හිස පමණක් සූර්ය රශ්මියෙන් ආරක්ෂාවීම සඳහා රෝම ඉතිරි වූ බව පෙනේ. අනතුරුව (මුලින් මුහුදු සතුන්ගේ කටුබිඳීම සඳහා) ආයුධ සාදා ගැනීමෙන් පසුව, නැඟී එන දඩයම් කරුවකු ලෙස ඔහු නැවතත් ගොඩබිම ආක්‍රමණය කරන්නට ඇත.

අපේ කිට්ටුම නෑයා වන චිම්පන්සියා වතුරේදී ඉක්මණින් ගිලෙන නමුත් අපේ වර්ගයා ජලයේදී මෙතරම් හුරු පුරුදු බවක් පෙන්වන්නේ මන්ද යන්න මේ මතයෙන් පැහැදිලි වේ. අපේ ශරීරයේ හැඩයත්, සිරස් ඉරියව්වත්, ගැඹුරු දියට ක්‍රමයෙන් යෑමේ ප්‍රතිඵලයක් ලෙස පැහැදිලි කළ හැකියි. අපේ සිරුරේ රෝම පිහිටා ඇති පුදුම ආකාරය පැහැදිලි කළ හැක්කේ ද මේ මතයෙන් පමණි. අපේ පිට පැත්තේ රෝම පිහිටා ඇත්තේ අනිකුත් වානරයන්ට වෙනස් ආකාරයකිනි. ඒවා දක්නට ලැබෙන්නේ පිහිනන විට හැකිතාක් දුරට රෝමවලින් කෙරෙන ප්‍රතිරෝධය අඩුවන ආකාරයෙනි. එපමණක් නොව, සමට යටින් ඝන මේද තට්ටුවක් ඇති එකම අග්‍රේශයාද මිනිසා වෙයි. මෙය සීල් ගේ හා තල්මසා ගේ දක්නට ඇති මේද තට්ටුවට සමාන වේ. අපේ අත්වල දක්නට

Scanned by TapScanner

ඇති අධික සංවේදී බවද මෙම මතය සනාථ කරයි. සමාන්‍ය රළු අතකින් ගලක් හෝ කෝටුවක් අල්ලා ගත හැකි නමුත් ජලය යට ආහාර සොයා ගැනීමට ඉතා සංවේදී අතක් අවශ්‍ය වේ. මෙම සංවේදී දැත ජලජ වානරයාගෙන් දඩයම් වානරයාට ලැබෙන්නට ඇත. අපේ පරිණාමයෙහි නැතිවුණ පුරුක සොයන විද්‍යාඥයින්, අවුරුදු දස ලක්ෂයකට පමණ පෙර අප්‍රිකානු මුහුදු වෙරළ වූ ප්‍රදේශය හාරා බැලුවහොත්, ප්‍රයෝජනවත් යමක් සොයා ගත හැකි බව මෙම මතය අවසාන වශයෙන් පෙන්වා දෙයි.

අවාසනාවකට මෙන් මෙවැන්නක් තවම කර නැති බැවින්, ජලජ වානරයා පිළිබඳ මතය පිළිගැනීමට අවශ්‍ය තරම් සාධක නොමැත. මෙම මතයෙන් අපේ වර්ගයාගේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කිහිපයක් පැහැදිලි වන නමුත්, එවැනි සතෙකු ජීවත් වූ බවට ස්ථිර සාධකයක් තවම හමුවී නැත. (මෙවැන්නක් සොයා ගනු ලැබුවත්, නිරුවත් වානරයාගේ පරිණාමය පිළිබඳ අපේ මූලික අදහස්වල වෙනසක් සිදු නොවේ.)

මේ අදහස් හා මත සියල්ලටම වඩා වෙනස් තවත් මතයකට අනුව, රෝම නැතිවීම භෞතික පරිසරයේ අවශ්‍යතාවන් නිසා සිදු වූවක් නොව, සමාජීය අවශ්‍යතාවන් නිසා සිදු වූවකි. වෙනත් වචනවලින් කිවහොත් එය යාන්ත්‍රික උපකරණයක් නොව, සංඥා නිකුත් කරන දෙයක් ලෙස දියුණු වූවකි. වෙනත් අග්‍රේශයන් කීප දෙනෙකුගේද රෝම රහිත ශරීර කොටස් දැකිය හැකි අතර තම වර්ගයාට අයත් හා අයත් නොවන අනිකුත් වානරයන් හඳුනා ගැනීමේ ලක්ෂණයක් ලෙස මේවා ක්‍රියාකරන බව පෙනේ. මෙම මතයට අනුව දඩයම් වානරයාගේ රෝම නැතිවීම ඉබේ සිදුවූ දෙයක් වන අතර පසුව, එය වර්ගයා හඳුනා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වී නිබේ. සම්පූර්ණයෙන්ම නිරුවත් වීම නිසා නිරුවත් වානරයා හඳුනා ගැනීම පහසු වූ බවට කිසිම සැකයක් නැති නමුත් අගනා පරිවාරකයක් ලෙස ක්‍රියා කළ රෝම ඉවත් නොකොට මෙම ප්‍රතිඵලයම ලබාගත හැකි නොයෙකුත් ක්‍රම තිබූ බව අප

අමතක නොකළ යුතුය.

තවත් මතයකට අනුව රෝම නැතිවීම ලිංගික සංඥාවන් දැක්වීමේ එක් මහක් වෙයි. සාමාන්‍යයෙන් ක්ෂීරපායින්ගේ පිරිමි සතාගේ රෝම වැඩිපුර දක්නට නොලැබේ. මෙම වෙනස වැඩි කිරීමෙන් ගැහැනු නිරුවත් වානරයා, පිරිමි සතාට ලිංගික වශයෙන් වඩාත් ප්‍රියංකර වී ඇත. රෝම නැතිවීම පිරිමි සතාට බලපා ඇත්තේ අඩුවෙන් වන අතර රැවුල් වැනි විශේෂ කොටස් නිසා ඔවුහු වඩාත් හොඳින් හඳුනා ගත හැකි වෙයි.

මේ ආකාරයට රෝම ඇති නැති බව හා ලිංගික වෙනස්කම් පැහැදිලි කළ හැකි නමුත්, කාමුක පෙනුමක් ලබා ගැනීමට ශරීර උෂ්ණත්වය රඳවා ගැනීමේ ක්‍රමය කැප කිරීමක් සිදුවිය හැකිද? ලිංගික වශයෙන් වැදගත් වූයේ පෙනුම නොව, ස්පර්ශයට සංවේදී වීමය යන්න මෙම මතය ආශ්‍රයෙන් ඉදිරිපත් වූ තවත් අදහසකි. ලිංගික ක්‍රියාවලදී නිරුවත් සම එකට ස්පර්ශ වීම නිසා මොවුන්ගේ ලිංගික උත්තේජනයන්හි ඉතා උග්‍ර සංවේදීතාවක් දක්නට ලැබේ. මෙයින් ලිංගික ක්‍රියාවලදී ලබන තෘප්තිය වැඩිවී දෙදෙනා අතර ඇති බැඳීම වඩාත් ශක්තිමත් කෙරේ.

රෝම නැතිවීමේ හේතු ලෙස සාමාන්‍යයෙන් පිළිගෙන ඇති මතය නම් ශරීරය සිසිල් කිරීමේ ක්‍රමයක් ලෙස එය පරිණාමය වූ බවයි. සෙවණ ඇති වනාන්තරවලින් එළියට ආ දඩයම් වානරයාට කලින් අත්දැක නොතිබූ අන්දමේ උෂ්ණත්වයන්ට මුහුණදීමට සිදු වූ විට, වැඩියෙන් රත්වීම වැළැක්වීමට ඔහු තම රෝම කබාය ඉවත් කළේය. බැලූ බැල්මට මෙය පිළිගත හැකි මතයක් ලෙස පෙනුණත් පරීක්ෂාවෙන් බැලීමේදී එහි සත්‍යයක් නැති බව පෙනේ. පළමුවෙන්ම විවෘත එළිමහන් බිම්වල ජීවත්වන (අපේ ප්‍රමාණයේ) වෙන කිසිම සතෙකු මෙවැනි පියවරක් ගෙන නැත. මේ මතයේ සත්‍යයක් වේ නම් අපට ලොම් රහිත සිංහයෙන් ද හමුවිය යුත්තුය. නිරුවත් සම වාතයට නිරාවරණය කිරීමෙන්

Scanned by TapScanner

තාපය පිටවීම පහසු වන නමුත්, ඒ නිසාම තාපය උරා ගැනීමද වැඩිවන බව අප අමතක කළ යුතු නොවේ.

ඇත්ත වශයෙන්ම මෙය ඉතා සංකීර්ණ ගැටලුවකි. මෙහිදී බොහෝ වැදගත් වන්නේ පරිසරයේ උෂ්ණත්ව මට්ටම හා ලැබෙන හිරු එළිය ප්‍රමාණයයි. දේශගුණය මඳක් උණුසුම් වූ විට රෝම නැතිව ජීවත්වීම වඩා පහසු වූයේයයි අප විශ්වාස කළත්, විවෘත බිම්වල ජීවත්වන අනිකුත් මාංශ භක්ෂකයන් ගේ රෝම හැලී නැත්තේ ඇයිද යන්න අපට පැහැදිලි කිරීමට සිදුවෙයි.

අපේ නිරුවත් බව පිළිබඳ ප්‍රශ්නය විසඳිය හැකි එක් මහක් තිබේ. දඩයම් වානරයාත් අනිකුත් මාංශ භක්ෂකයනුත් අතර ඇති මූලික වෙනස නම්, දඩයම් කිරීමට හෝ වේගයෙන් දිවීමට දඩයම් වානරයාට හැකි නොවීමයි. නමුත්, කෙසේ හෝ දඩයම් කළ යුතු විය. තම දියුණු මොළය ප්‍රයෝජනයට ගෙන ආයුධ නිපදවා ගැනීමෙන් හා වඩා බුද්ධිමත් ලෙස කටයුතු කිරීමෙන් ඔහුට සාර්ථකව දඩයම් කළ හැකි වූ නමුත්, මෙම කටයුතුවලදී ඔහුට විශාල ශාරීරික වෙහෙසක් දැරීමට සිදුවිය. දඩයම් කිරීමේ කටයුතුවලදී ඔහුගේ ශරීර උෂ්ණත්වය අධික ලෙස වැඩි වන්නට ඇත. ඔහුගේ අනාගත පැවැත්ම රඳා පැවතුණේ මෙම ප්‍රශ්නය විසඳා ගන්නා ආකාරය මතයි. රෝම සහිත දඩයම් වානරයෙකුගෙන් නිරුවත් වානරයෙකු බිහිවීමට හේතු වූ ප්‍රධාන සාධකයන් මෙයයි. විරශිශුකත්වයේ ආධාරයත්, අනිකුත් සුළු ප්‍රයෝජනත් හේතු කොට ගෙන මෙම පියවර සාර්ථක විය. රෝම නැතිවීමත් සමග ශරීරය සෑහෙන දුරට සිසිල් කළ හැකි වේ. වාතයට නිරාවරණය වන අත් පා ආදියේ, වාෂ්පීකරණය වන ඩහදිය පටලයක් ඇති කිරීමෙන් මෙය සිදුකරන ලදී.

පරිසරය බොහෝ උණුසුම් වුයේ නම් මෙම ක්‍රියාවලිය සාර්ථක නොවනු ඇත. මන්ද යත්, නිරාවරණය වූ සමට උෂ්ණත්වයෙන් අතතුරු සිදුවිය හැකි බැවිනි. මේ සමහම සමට යටින් මේද තට්ටුවක් ඇති වීමෙන් පෙනී යන්නේ, අනිකුත්

අවස්ථාවන්හි ශරීරය උණුසුම්ව තබා ගැනීමට අවශ්‍ය බවයි. සීතල අවස්ථාවන්හි ශරීර උෂ්ණත්වය රැක ගැනීමට මේද ස්ථරය උපකාරී වන අතරම, උෂ්ණත්වය වැඩි වූ විට ඩහදිය වාෂ්පීකරණය වීමට එයින් බාධාවක්ද නැත. ඔවුන්ගේ නව ජීවිතයේ වැදගත්ම දෙයක් වූයේ දඩයම බව සලකන විට, රෝම අඩුවීමත්, ස්වේද ග්‍රන්ථ වැඩිවීමත්, මේද ස්ථරයක් ඇතිවීමත්, අපේ මුතුන් මිත්තන්ට නැතිවම බැරි වූ දේවල් බව පෙනේ.

පරම්පරාවෙන් අග්‍රේශයකුද, සිරිත් විරිත්වලින් මාංශ භක්ෂකයකුද වන අපේ සෘජු කාය සහිත දඩයම්කාරී, ආයුධ සන්නද්ධ, බුද්ධිමත් නිරුවත් වානරයා දැන් ලෝකය ජය ගැනීමට සුදානම්ය. නමුත් ඔහු ඉතාම අලුත් අත්හදා බැලීමක් පමණි. අලුත් නිෂ්පාදනවල බොහෝ අඩුපාඩු ඇති බව අප අමතක නොකළ යුතුය. ඔහුට විවිධ ප්‍රශ්න හා ගැටලුවලට මුහුණ දීමට සිදුවී ඇත්තේ, සංස්කෘතික දියුණුවට සමාන දියුණුවක් ප්‍රවේණි අංශයේ සිදු නොවීමේ හේතුවෙනි. ඔහුගේ ජාන හා ප්‍රවේණි ලක්ෂණවල එතරම් වේගයෙන් ඉදිරියට යෑමක් දක්නට නොලැබේ.

පරිසරය තමන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමේ දක්ෂතා සියල්ල මැද, ඔහු තවමත් මූලික වශයෙන් නිරුවත් වානරයෙකු බව මේ නිසා ඔහුට නිරතුරුවම සිහිපත්වනු ඇත.

දැන් ඔහුගේ අතීතය ගැන කථා කිරීම නවතා අද ඔහු ක්‍රියා කරන ආකාරය විමසිල්ලට භාජනය කළ හැකියි. වත්මන් නිරුවත් වානරයා හැසිරෙන්නේ කෙසේද? ආහාර ගැනීම, සටන් කිරීම, පැටවුන් ඇති දැඩි කිරීම වැනි ප්‍රශ්න ඔහු විසඳා ගන්නේ කෙසේද? ඔහුගේ ක්ෂීරපායී ආශාවන් ප්‍රතිසංවිධානය කිරීමට පරිගණක යන්ත්‍රයක් බඳු ඔහුගේ මොළය කෙතරම් දුරට සමත් වී ඇද්ද? සමහර විට ඔහු පිළිගැනීමට කැමති ප්‍රමාණයට වඩා පරිත්‍යාගයන් හා වරදානයන් කිරීමට ඔහුට මෙහිදී සිදු වී ඇති බව පෙනී යයි.

Scanned by TapScanner

2 ලිංගික ජීවිතය.

ලිංගික වශයෙන් සලකන විට අද නිරුවත් වානරයා වැටී ඇත්තේ තරමක් අවුල් සහගත තත්වයකටයි. ඔහුට අග්‍රේශයකු ලෙස එක් ආකාරයකටත්, මාංශ භක්ෂකයකු ලෙස තවත් ආකාරයකටත්, ශිෂ්ටාචාර සමාජයක සමාජිකයකු ලෙස මේ දෙකටම වෙනස් ආකාරයකටත් ක්‍රියා කිරීමට සිදු වී තිබේ.

ආරම්භයේදී ඔහු තුළ වූ ලිංගික ලක්ෂණ, ඔහුට ලැබුණේ පලතුරු බුදින වනාන්තරගත වානර මුතුන්මිත්තන් ගෙනි. ඉන් පසුව එළිමහන් බිම්වල දඩයම්කාරී ජීවිතයට සරිලන සේ මෙම ලක්ෂණ බොහෝදුරට වෙනස් කරන ලදී. මෙය ඉතා දුෂ්කර කටයුත්තක් විය. ශීඝ්‍රයෙන් දියුණු වූ, සංකීර්ණ හා සංස්කෘතික වශයෙන් නිර්ණය කරනු ලැබූ, සමාජීය ව්‍යුහයකට සරිලන සේ මෙම ලක්ෂණ නැවතත් වෙනස් කිරීම කොතරම් අපහසු වූයේද යන්න කිවයුතු නොවේ.

මෙම පරිවර්තනයන් ගේ පළමු වැන්න වූ ලිංගික පලතුරු බුදින්නකුගෙන්, ලිංගික දඩයම්කරුවකු බිහිවීමට ඉතා දීර්ඝ කාලයක් ගතවූවත්, එය බොහෝදුරට සාර්ථක වූ කටයුත්තක් විය. එය ඉතා ඉක්මණින් සිදුවී ඇති අතර එයට පදනම් වී ඇත්තේ ජීව විද්‍යාත්මක විකරණයන් නොව, ඉගෙන ගත් දේ හා බුද්ධියයි. ලිංගික හැසිරීම් රටාවන්, ශිෂ්ටාචාරයට බලපා ඇති තරමට ශිෂ්ටාචාරය ලිංගික හැසිරීම් වලට බලපා නැති බව පෙනේ. මෙය ඉතා බරපතළ ප්‍රකාශයක් ලෙස ඔබට පෙනේ නම්, පළමුව මගේ අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.

පළමුවෙන්ම ලිංගික ක්‍රියාවන් හි යෙදීමෙදී නිරුවත් වානරයා හැසිරෙන්නේ කෙසේදැයි නිවැරදිව දැන ගැනීම වැදගත් වෙයි. ඒ ඒ සමාජයන් අතර හා ඒ ඒ සමාජ තුළ මේ පිළිබඳව දක්නට ඇති වෙනස්කම් හා විවිධත්වය ගැන සලකන විට, මෙය එතරම් පහසු කටයුත්තක් නොවන බව පෙනේ. මෙහිදී අපට ඇති එකම විසඳුම වන්නේ වඩාත් සාර්ථක සමාජයන්හි සාමාන්‍ය තත්වය සැලකිල්ලට ගැනීමයි. කුඩා

නොදියුණු හා අසාර්ථක වී ඇති සමාජයන් මෙහිදී අමතක කර දැමිය හැක. මෙම සමාජයන්හි ඉතා චිත්තාකර්ෂණීය හා අරුම පුදුම ලිංගික චාරිත්‍ර තිබිය හැකි නමුත් ජීව විද්‍යාත්මකව සලකන විට, ඔවුහු තවදුරටත් පරිණාමයේ ප්‍රධාන මහ නියෝජනය නොකරති. සමාජීය කණ්ඩායම් ලෙස ඔවුන් අසාර්ථක වී ඇත්තේ සමහර විට මෙම අමුතු ලිංගික හැසිරීම් නිසාම වන්නට පුළුවන.

මෙහිදී ප්‍රයෝජනයට ගන්නා තොරතුරු බොහෝමයක්ම ලබාගන්නා ලද්දේ මෑතක දී උතුරු ඇමරිකාවේ කරන ලද අධ්‍යයනයන් කීපයකිනි. වාසනාවකට මෙය විශාල මෙන්ම සාර්ථක සංස්කෘතියක් වන බැවින්, එය වර්තමාන නිරුවත් වානරයා හොඳින් නියෝජනය කරන්නක් ලෙස සැලකිය හැකියි.

අපේ වර්ගයා ගේ ලිංගික හැසිරීම් රටාවේ ප්‍රධාන අවස්ථා තුනක් වේ. ඒවා නම්, යුගල සෑදීම, පුර්ව සංසර්ග කටයුතු හා සංසර්ගයයි. අනිකුත් සතුන් සමඟ සසඳන විට යුගල සෑදීමේ අවස්ථාවට ඉතා දීර්ඝ කාලයක් ගතවේ. එය සති ගණනක් හෝ මාස ගණනක් හෝ විය හැකියි. අනිකුත් බොහෝ සතුන්ගේ මෙන් බිය, අහිංසක බව හා ලිංගික ආකර්ෂණය ආදියේ ගැටීම්වලින් සමන්විත අස්ථිර හැසිරීම් රටාවක් මෙම කාලය තුළ දක්නට ලැබේ. අන්‍යෝන්‍ය ලිංගික සංඥා ප්‍රබල නම් බයාදුබව හා දෙගිඩියාව ක්‍රමයෙන් අඩුවේ. මේ සඳහා මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කිරීමේ සංකීර්ණ ක්‍රම, ශරීර ඉරියව් හා ශබ්ද ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම ශබ්ද ඉතා විශේෂ හා සංකේතාත්මක ධ්වනි සංඥාවන් වන අතර විරුද්ධ ලිංගික සත්වයාට වඩා වැදගත් වන්නේ, ඒවායේ දක්නට ඇති විශේෂ ශබ්ද ලීලාවයි.

දෘෂ්ටිමය හා ධ්වනි සංඥාවලින් සමන්විත වන මුල් අවස්ථාවෙන් පසුව සරල ශරීර ස්පර්ශය සිදුවෙයි. යුගල එක්වූ විට වැඩිපුර කෙරෙන ගමන් බිමන්වලද මෙය බොහෝ විට දක්නට ලැබේ. අත්වලින් ඇරඹෙන මෙම ස්පර්ශ ක්‍රියා, පසුව

Scanned by TapScanner

මුහුණ හා මුඛය දක්වා විහිදේ. නිශ්චලව සිටීමේදී එකිනෙකා වැළඳ ගැනීම සිදුවෙයි. දිවීම, එලවීම, පැනීම, නැටීම වැනි ක්‍රියාවන් මේ අවස්ථාවේ දැකිය හැකි අතර මෙය ළමා කෙළි සෙල්ලම් නැවත සිදුවීමක් ලෙස පෙනේ.

මෙම යුගල සෑදීමේ ක්‍රියාවලිය බොහෝ විට ප්‍රසිද්ධියේ කෙරෙන නමුත්, එය පූර්ව සංසර්ග අවස්ථාවට එළඹී විට, එම කටයුතු, වර්ගයේ අනිකුත් සත්වයන්ගෙන් වෙන්ව රහසිගතව සිදුකෙරේ. පූර්ව සංසර්ග අවස්ථාව එළඹීමත් සමඟ, ශරීරය තිරස් ඉරියව්වෙන් තබා ගැනීම වැඩිවේ. ශරීරයේ ස්පර්ශයේ ප්‍රබලතාවද වැඩිවෙන බව පෙනේ. මුලින් දක්නට ලැබෙන්නේ දෙදෙනාගේ සිරුරේ පැති ගැටෙන, අඩු තීව්‍රතාවයෙන් යුත් ස්පර්ශයන්ය. මෙය අධික තීව්‍රතාවයෙන් යුත් මුහුණට මුහුණලා කෙරෙන ස්පර්ශයන් දක්වා ක්‍රමයෙන් වර්ධනය වේ. මෙම ශරීර ඉරියව් මිනිත්තු ගණනක් හෝ පැය ගණනක් පැවතීමට පුළුවන. මේ වන විට ශබ්ද හා දෘෂ්ටිමය සංඥාවල වැදගත්කම ක්‍රමයෙන් අඩුවී ගොස් ස්පර්ශ සංඥා වඩා වැදගත් තැනක් ගනී. විශේෂයෙන්ම ඇඟිලි, අත්, තොල් හා දිව වැනි කොටස් ඇතුළු ශරීරයේ විවිධ කොටස් මත විවිධ ප්‍රමාණයේ පීඩනයන් ඇතිකිරීම මෙහිදී දැකිය හැක. ඇඳුම් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවත් කෙරෙන අතර සමෙන් සමට කෙරෙන ස්පර්ශක උත්තේජනය හැකිතාක් දුරට වැඩි කෙරේ.

මුවෙන් මුව ස්පර්ශ කිරීම වැඩිපුරම කෙරෙන්නේත්, ඒ සඳහා ගතවන කාලය ඉතාමත් වැඩි වන්නේත්, මේ අවස්ථාවේදීය. තොල්වලින් ඇතිකරන පීඩනය අතිශය මෘදු බවේ සිට ඉතාම සැහැසි ස්වරූපයන් දක්වා වෙනස් විය හැකියි. අධික තීව්‍රතාවයෙන්, ප්‍රතිචාර දැක්වීමේ දී තොල් විවර කොට සහකරුගේ මුව තුළට දිව ඇතුළු කරනු ලැබේ. ඉන්පසු දිව චලනය කිරීමෙන් මුඛය අභ්‍යන්තරයේ ඇති සංවේදී සම උත්තේජනය කරයි. විශේෂයෙන්ම කන් පෙති, බෙල්ල හා ලිංගේන්ද්‍රියන් ඇතුළු ශරීරයේ විවිධ කොටස් තොල් හා දිවෙන් ස්පර්ශ කෙරේ. පිරිමියා, ගැහැනියගේ පියයුරු හා තන පුඩුවලට අවධානය යොමු කරන අතර මෙය ක්‍රමයෙන් උරාබීම දක්වා දියුණු වේ. මේ සමගම පිරිමියා ගැහැනියගේ භගමණියද, ගැහැනිය පුරුෂයාගේ ශිශ්නය ද කෙරෙහි අවධානය යොමු කරති. සිප ගැනීම, ලෙව කෑම හා උරාබීමට අමතරව සහකරුගේ ශරීරයේ විවිධ කොටස් සපාකන ආකාරයට මුඛය භාවිතා කෙරේ. සාමාන්‍යයෙන් මෙය මෘදු කෙනිත්තීමක් පමණක් වන නමුත් සමහර විට ඉතා වේදනා ගෙන දෙන සපාකෑමක් දක්වා එය වර්ධනය විය හැකියි. සහකරුගේ ශරීරය මුඛයෙන් උත්තේජනය කරන අතරම නිරුවත් සමද අත් හා ඇඟිලිවලින් පිරිමදිනු ලැබේ. සාමාන්‍යයෙන් මුහුණත්, තීව්‍රතාව වැඩි වූ විට නිතඹ හා ලිංග ප්‍රදේශයත් මෙසේ පිරිමදිනු ලැබේ. මෙහිදී පුරුෂයා ස්ත්‍රියගේ පියයුරු හා තනපුඩුවලට තම විශේෂ අවධානය යොමු කරන අතර, වරින් වර ඇඟිලිවලින් ඒවා මිරිකීම ද කරයි. ස්ත්‍රිය පුරුෂයාගේ ලිංගය රිද්මයානුකූලව පිරිමදින අතර පුරුෂයා, සහකාරියගේ භගමණිය රිද්මයානුකූලව උත්තේජනය කරනු දක්නට ලැබේ.

මෙම මුඛ හා අත් හා ශරීර ස්පර්ශයන්ට අමතරව, පූර්ව සංසර්ග කටයුතුවලදී, ලිංගේන්ද්‍රියන් සහකරුගේ ශරීරයට තදකොට රිද්මයානුකූලව පිරිමැදීම ද සිදුවේ. මේ අතරම අත් හා පා පටලවා ගෙන මාංශපේශී සංකෝචනය කොට ශරීරයම ආතතික අවස්ථාවකට පත්කිරීම ද සිදුවේ.

සංසර්ගය සිදුවිය හැකි ලෙස ප්‍රමාණවත් කායික, ලිංගික පිබිදීමක් ඇතිකිරීම සඳහා පූර්ව සංසර්ග ක්‍රියාවන්හිදී සහකරුට ලබාදෙන ලිංගික සංඥා ඉහතින් දැක්වූ ඒවායි. සංසර්ගය ඇරඹෙන්නේ ස්ත්‍රී යෝනිය තුළට පුරුෂ ලිංගය දැමීමෙනි. මෙය බොහෝවිට කෙරෙන්නේ දෙදෙනාම තිරස්ව මුහුණට මුහුණලා පුරුෂයා ස්ත්‍රියට ඉහළින් සිටින ඉරියව්වෙනි. මෙහි නොයෙක් අනුවර්තන තිබිය හැකි වුවත් ඉතා සරල මෙන්ම බොහෝ විට භාවිතා කෙරෙන ක්‍රමය මෙයයි. පුරුෂයා මින් අනතුරුව රිද්මයානුකූල ශ්‍රෝණී තෙරපීම් අරඹයි. මේවායේ ප්‍රබලතාවය හා වේගය සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් විය හැකි අතර මේවා වේගවත් හා තදින් ඇතුළට කා වැදෙන ඒවා

Scanned by TapScanner

වේ. මේ සමහ මුඛයෙන් හා අත්වලින් කෙරෙන උත්තේජනයත් ගේ සංකීර්ණ බව හා සියුම් බව අඩුවේ. කෙසේ වෙතත් සංසර්ග ක්‍රියාවලිය අවසන් වන තෙක්ම මෙම උත්තේජන ක්‍රියාවෝ එක්තරා ප්‍රමාණයකට සිදුවෙති.

පූර්ව සංසර්ග අවස්ථාව සමහ සසඳන විට සංසර්ගීය අවස්ථාවට ගතවන්නේ ඉතා කෙටි කාලයකි. වුවමනාවෙන් ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් නොයෙදුවහොත්, පුරුෂයාගේ ශුක්‍රාණු විසර්ජක පරිපූර්ණ ක්‍රියාව මිනිත්තු කීපයක දී සිදුවෙයි. අනෙකුත් අග්‍රේශයන්ගේ ගැහැනු සතුන් ලිංගික ක්‍රියාවේදී උච්චාවස්ථාවකට පත් නොවන නමුත් නිරුවත් වානරයා මේ අතින් අසාමාන්‍ය වේ. දීර්ඝ වේලාවක් පුරුෂයාට සංසර්ගයේ යෙදිය හැකි නම් අවසානයේ ස්ත්‍රිය ද කායික අතින් පූරුෂයාට සමාන වන ප්‍රබල උද්වේගකර අත් දැකීමක් සහිත පරිපූර්ණ අවස්ථාවකට පත්වෙයි. වෙනසකට ඇත්තේ ශුක්‍රාණු පහ නොවීම පමණි. සමහර ස්ත්‍රීන් ඉතාම ඉක්මණින් මෙම අවස්ථාවට පත්වන අතර, සමහරුන්ට කිසිම විටක මෙවැන්නක් සිදු නොවේ. සාමාන්‍යයෙන් සංසර්ගය ආරම්භ වී මිනිත්තු දහයත් විස්සත් අතර කාලයකදී මෙය සිදුවෙයි.

ලිංගික ක්‍රියාවලියේ උච්ච අවස්ථාව එළඹීමට ගතවන කාලය අතින් ස්ත්‍රී පූරුෂ දෙපක්ෂය අතර වෙනසක් දැක්නට ලැබීම පුදුමයට හේතුවකි. විවිධ ලිංගික රටාවන්හි වැදගත්කම ගැන ලියැවෙන විට මේ පිළිබඳව සාකච්ඡා කෙරෙනු ඇත. පූර්ව සංසර්ගී උත්තේජනය වැඩි කිරීමෙන් හෝ තම උච්ච අවස්ථාවට පත්වීම පමා කිරීමෙන් හෝ ශුක්‍රාණු නිකුත් වීමෙන් පසු නැවත වරක් සංසර්ගයේ යෙදීමෙන් හෝ පුරුෂයාට මෙම ප්‍රශ්නය විසඳිය හැකි බව සඳහන් කිරීම මෙහිදී ප්‍රමාණවත්ය. ඔහු මඳ වේලාවක් විවේක ගෙන නැවතත් සංසර්ගයේ යෙදුණහොත් අඩු වූ රාගික ශක්තිය හේතු කොට ගෙන ඔහු උච්චාවස්ථාවට පැමිණීමට වැඩි වේලාවක් ගතවන බැවින්, ස්ත්‍රියට එම තත්වයට පැමිණීමට අවශ්‍ය තරම් කාලය ලැබෙනු ඇත. දෙදෙනාම මෙසේ උච්චාවස්ථාවට පත්වීමෙන් පසුව සාමාන්‍යයෙන් විඩාවට පත්ව විවේක ගනිමින් නින්දට වැටෙති.

ලිංගික උත්තේජන ගැන සලකා බැලීමෙන් අනතුරුව ලිංගික ප්‍රතිචාරය ගැන අපේ සැලකිල්ල යොමු කළ යුතුව ඇත. ශරීරය මෙම උත්තේජනයන්ට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද ? මෙම ක්‍රියාවේදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම නාඩි වැටීම, රුධිර පීඩනය හා ආශ්වාස ප්‍රශ්වාස වේගය ඉතා වැඩිවේ. මෙම විපර්යාසය, පූර්ව සංසර්ග ක්‍රියාවලියේදී ආරම්භ වන අතර සංසර්ගීය උච්චාවස්ථාවේ දී ඒවා ඉහළම මට්ටමට නගී. සාමාන්‍යයෙන් 70-80 ත් අතර වන නාඩි වැටීමේ වේගය, ලිංගික ක්‍රියාවලිය ආරම්භයේදී 100ක් පමණ වී උච්චාවස්ථාවේ දී 150ක් පමණ වෙයි. 120 ක් පමණ වන රුධිර පීඩනය, පරිපූර්ණ ලිංගික තෘප්තිය ලබන උච්චාවස්ථාවේදී 250ක් පමණ වේ. ආශ්වාස ප්‍රශ්වාස කිරීම ද වේගයත් වන අතර අවසානයේ දී ඉතාම අපහසුවෙන් හුස්ම ගන්නා බව පෙනේ.

ලිංගික පිබිදීමේ දී සිදුවන තවත් ප්‍රධාන විපර්යාසයක් නම් ශරීරය මතු පිටට ලේ ගලා ඒමයි. සම මතු පිටට ලේ ගලා ඒම නිසා කැපී පෙනෙන සිද්ධීන් කිහිපයක් සිදුවේ. ඒ හේතුකොට ගෙන ශරීරය, ස්පර්ශයට උණුසුම් වන අතර විශේෂ කොටස්වල විවිධ වෙනස්කම් දක්නට ලැබේ. ලිංගික පිබිදීමත් සමග ලිංගික රතුවීමක් දැකිය හැකිවේ. ස්ත්‍රියගේ වැඩිපුර දක්නට ලැබෙන මෙය, ශරීරයේ පහළ කොටස්වලින් පටන් ගෙන පියයුරුවල යට පැත්ත දක්වා විහිදේ. සමහර පිරිමින්ගේ ද මෙවැනි රතුවීමක් දැකිය හැකියි.

මෙම රතුවීමටත්, රුධිර නාලිකා මහත් වීමටත් අමතරව විශාල විය හැකි විවිධ කොටස්වල රුධිරය ඒකරාශි වීමක් සිදුවේ. හේතුව ශිරාවලින් පිටතට ගෙන යෑමට හැකි වේගයට වඩා වේගයකින් ධමනි මගින් මෙම කොටස් තුළට රුධිරය ගෙන ඒමයි. මෙය පිරිමි ගැහැණු දෙවර්ගයේම තොල්, නාස්, කන්පෙති, තනපුඩු හා ලිංගේන්ද්‍රිය ආදියේත්, ස්ත්‍රිය ගේ පියයුරු යුවලේත් සිදුවේ. තොල් පිම්බී, රතුවී වෙනත් කිසිම අවස්ථාවකටත් වඩා ඉදිරියට නෙරා සිටී. නාසයේ මෘදු

Scanned by TapScanner

කොටස් ද පිම්බෙන අතර නාස්පුඩු ප්‍රසාරණය වේ. කන්පෙති ද ඉදිමී වැඩි සන බවක් දක්වයි. තනපුඩු විශාල වී ප්‍රාණවත් වන අතර මෙය වැඩිපුරම දැකිය හැක්කේ ස්ත්‍රියගේයි. (මෙහිදී ලේ පිරීම පමණක් නොව තනපුඩුවල මාංශපේශී සංකෝචනය වීමද මෙයට හේතු වේ.) මේ නිසා ස්ත්‍රී තන පුඩුවල දිග සෙන්ටි මීටරකින් පමණද විෂ්කම්භය සෙන්ටි මීටර භාගයකින් පමණද වැඩිවේ. ස්ත්‍රියගේ තනපුඩු වටා ඇති වර්ණවත් පෙදෙසේ වර්ණය වැඩි වන අතර එයද වඩා දැඩි බවක් පෙන්වයි. මෙවැන්නක් පුරුෂයාගේ සිදු නොවේ. ස්ත්‍රියගේ පියයුරුවල ප්‍රමාණයද සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. සංසර්ගීය ක්‍රියාවලියේ උච්චාවස්ථාවට එළඹෙන විට, සාමාන්‍යයෙන් පියයුරුවල ප්‍රමාණය සියයට 25කින් පමණ වැඩිවන බව පෙනේ.

ලිංගික පිබිදීමත් සමඟ දෙවර්ගයේම ලිංගේන්ද්‍රියන්හි සැහෙන විපර්යාසයක් සිදුවේ. ස්ත්‍රියගේ යෝනි මාර්ගයේ රුධිර නාලවල ලේ ඒකරාශී වීම නිසා, යෝනි නාලය ඉක්මණින් ස්නේහනය වෙයි. සමහර විට මෙය, පුර්ව සංසර්ග කටයුතු ආරම්භ වී තත්පර කීපයක් තුළදී සිදුවිය හැකිය. උච්ච ලිංගික පිබිදීමකදී යෝනියේ ඇතුල් කොටසේ දික්වීම නිසා, එහි දිග සෙන්ටි මීටර දහයකින් පමණ වැඩිවේ. උච්චාවස්ථාවට ළංවත්ම යෝනි නාලයේ ඉතිරි කොටසද පිම්බෙන අතර, උච්චාවස්ථාවේ දී තත්පර දෙකේ සිට හතර පමණ කාලයක් තුළ පේශී ස්ංකෝචනය සිදුවේ. අනතුරුව තත්පර 0.8 ක කාල අන්තරයක් ඇතිව සංකෝචන මාලාවක් සිදුවේ. එක් උච්චාවස්ථාවකදී මෙවැනි සංකෝචන තුනේ සිට පහළොහක් පමණ සිදුවිය හැකියි.

ලිංගික පිබිදීමේදී ස්ත්‍රියගේ බාහිර ලිංගේන්ද්‍රිය ද සැහෙන ප්‍රමාණයකින් ප්‍රසාරණය වෙයි. බාහිර අධර විවෘතව, ප්‍රමාණය දෙතුන් ගුණයකින් වැඩි වේ. අභ්‍යන්තර අධර ද දෙතුන් ගුණයකින් දික්වී බාහිර අධර තුළින් ඉදිරියට නෙරා සිටී. මේ නිසාඃ යෝනි දිග තවත් සෙන්ටි මීටර් කීපයකින් වැඩි වේ. ලිංගික පිබිදීම වැඩිවත්ම අභ්‍යන්තර අධර දීප්තිමත් රතු

පැහැයකට හැරේ.

භගමණිය ද (පුරුෂ ශිශ්නයේ, ස්ත්‍රී ලිංගික ප්‍රතිරූපකය) ලිංගික පිබිදීමත් සමඟ විශාල වී ඉදිරියට නෙරා සිටී. සංසර්ගීය ක්‍රියාවලිය උච්චාවස්ථාව දක්වා දියුණු වෙත්ම අධරවල මහත් වීම නිසා භගමණිය වැසී යයි. මේ අවස්ථාවේ කෙළින්ම පුරුෂයාගේ ශිශ්නයෙන් (ලිංගය) භගමණිය උත්තේජනය කළ නොහැකි නමුත්, ඒ ප්‍රදේශයට යොදන රිද්මයානුකූල පීඩනය මගින් එය උත්තේජනය කළ හැකි වේ.

පුරුෂයාගේ ශිශ්නය (ලිංගය) ද, ලිංගික පිබිදීමත් සමඟ විස්මයජනක විපර්යාසයන්ට භාජනය වෙයි. එහි අධික ලෙස රුධිරය ඒකරාශීවීම නිසා ප්‍රසාරණය වී දැඩි වී, සෘජු ස්වභාවයක් ගනී. සාමාන්‍ය අවස්ථාවේ එහි දිග සෙන්ටි මීටර නමයක් පමණ නමුත්, පිබිදීමත් සමඟ මෙය තවත් සෙන්ටි මීටර හත අටකින් වැඩි වෙයි. විෂ්කම්භය ද සැහෙන ප්‍රමාණයකින් වැඩිවීම නිසා, ජීවත්වන අග්‍රේශයන් අතුරෙන් විශාලම ප්‍රාණවත් ශිශ්නය ඇති සත්වයා අපි වෙමු.

පුරුෂයාගේ ලිංගික උච්චාවස්ථාවේදී ශිශ්නයේ ප්‍රබල පේශී සංකෝචනය මගින් යෝනි මාර්ගයට ශුක්‍ර තරලය යවනු ලැබේ. වඩා බලවත් ඒවා මුල් සංකෝචනයන් වන අතර, ඒවා ද ස්ත්‍රියගේ යෝනි සංකෝචන සිදුවන වේගය වන තත්පර 0.8 ක කාල අන්තරයක් ඇතිව සිදුවේ.

ලිංගික සංසර්ගයේදී වෘෂණ කෝෂ ඉහළට එසවී ඒවායේ සචලතාව අඩු කරයි. ශුක්‍රාණුක රජ්ජුව කෙටි වීමෙන් වෘෂණ ශරීරයට තදින් අල්ලා තබා ගැනීමට හැකිවේ.

මේ පෙදෙසේ රුධිරවාහිනී ප්‍රසාරණයවීම හේතු කොට ගෙන වෘෂණවල ප්‍රමාණය සියයට පනහේ සිට සියය පමණ දක්වා ප්‍රමාණයකින් වැඩි වේ.

ලිංගික ක්‍රියාවන්හි දී පුරුෂ හා ස්ත්‍රී ලිංගික ශරීරවල සිදුවන ප්‍රධාන විපර්යාස මේවායි. උච්චාවස්ථාවට පත්වීමෙන්

Scanned by TapScanner

පසු මෙම විපර්යාස අනික් අතට සිදුවීගෙන යද්දී විවේකයෙත් පසුවන සත්වයා ඉක්මණින් සාමාන්‍ය කායික තත්වයට පත්වේ. මෙහිදී සඳහන් කළ යුතු තවත් එක් ප්‍රතිචාරයක් වෙයි. එනම්, ලිංගික උච්චාවස්ථාවෙන් පසුව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අධික ලෙස ඛහදිය පිටවීමයි. පිටවන ඛහදිය ප්‍රමාණය සංසර්ගීය ක්‍රියාව සඳහා ගත් වෙහෙසට සම්බන්ධතාවක් නොදක්වන නමුත්, උච්චාවස්ථාවේ තීව්‍රතාවයට සුළු සම්බන්ධතාවක් පෙන්වයි. සමහර අවස්ථාවන්හිදී මුළු ශරීරයම ඛහදියෙන් නැහැවී යයි. අල්ලේත්, පතුල්වලත්, නළලේත්, උඩු තොලේත් ඛහදිය දැකිය හැකි වේ.

අපේ පරම්පරා කථාව හා ජීවන ක්‍රමය සම්බන්ධයෙන් ලිංගික හැසිරීම් රටාවේ වැදගත්කම සාකච්ඡා කිරීමේ පදනම ලෙස ඉහතින් දැක්වූ අපේ වර්ගයාගේ ලිංගික උත්තේජනයත් හා ඒවාට දක්වන ප්‍රතිචාරයන් පිළිබඳ සාරාංශය සැලකිය හැකියි. නමුත් මෙහිදී සඳහන් කරන ලද විවිධ උත්තේජන හා ප්‍රතිචාර සෑම අවස්ථාවකම සිදු නොවන බව සඳහන් කළ යුතුය. මෙයින් සමහරක් ලිංගික කටයුතු සඳහා පුරුෂයෙකු හා ස්ත්‍රියක එක්වූ හැමවිටම සිදුවන අතර සමහරක් දැකිය හැක්කේ යම් යම් අවස්ථාවන්හි දී පමණි. කෙසේ වෙතත් මේවා "වර්ගීය ලක්ෂණ" ලෙස සැලකිය හැකි තරම් නිතර නිතර සිදුවන බව පෙනේ.

ලිංගික රතුවීම් ගැහැණුන්ගේ සියයට 75 ක හා පිරිමින්ගේ සියයට 21 ක පමණ දක්නට ලැබේ. තනපුඩු ප්‍රාණවත් වීම ගැහැණුන් සියල්ලටම පොදු දෙයක් වන අතර, පිරිමින්ගෙන් සියයට 60ක පමණ දැකිය හැකි වේ. සංසර්ගයෙන් පසු අධික ලෙස ඛහදිය දැමීම, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම සියයට 35 ක පමණ දක්නට ලැබේ.

මෙම විශේෂ සිද්ධීන් හැරෙන්නට ඉහත සඳහන් කළ අනිකුත් ප්‍රතිචාරයන් සෑම අවස්ථාවකදීම පාහේ සිදුවේ. ඒවායේ තීව්‍රතාව හා ගතවන කාලය ඒ ඒ තත්වයන් අනුව වෙනස් වෙයි.

පැහැදිලි කළ යුතු තවත් කරුණක් නම්, පුද්ගලයෙකු ගේ ජීවිත කාලය පුරා මෙම ලිංගික කටයුතු පැතිරී ඇති ආකාරයයි. ජීවිතයේ මුල් දශකයේ නියම ලිංගික ක්‍රියාවන් සිදුවිය නොහැක. "ලිංගික ක්‍රීඩා" ලෙස හැඳින්විය හැකි දේ කුඩා ළමයින්ගේ දැකිය හැකි නමුත්, ගැහැනුන් ඩිම්බ හා පිරිමින්, ශුක්‍රාණු මෝචනය ආරම්භ කරන තෙක් නියම ක්‍රියාත්මක ලිංගික රටාවක් දැකිය හැකි නොවේ. සමහර ගැහැනු ළමයින්ගේ ඔසප් වීම වයස දහයේදී පමණ ආරම්භ වන අතර වයස 14 වන විට ගැහැනු ළමයින්ගේ සියයට 80 ක් පමණ දෙනාගේ මෙම ක්‍රියාවලිය ආරම්භ වී ඇත. වයස දහනමය වන විට ඔසප් නොවන ගැහැනියක් නැත. ලිංගික ප්‍රදේශවල රෝම ඇතිවීමත්, උකුල් පෙදෙස පුළුල් වීමත්, පියයුරු විශාල වීමත්, ඒ සමග සිදුවේ. සිරුරේ සාමාන්‍ය වර්ධනය ද ඉතා සුළු ප්‍රමාණයකින් කෙරෙන අතර වයස විසිදෙක පමණ වන තෙක් එය සම්පූර්ණ නොවේ.

පිරිමි ළමයි අවුරුදු 11 පමණ වනතුරු ශුක්‍රාණු පිට නොකරති. මෙයින් පෙනීයන්නේ ඔවුන් ලිංගික වශයෙන් ක්‍රියාත්මක වීම අතින් ගැහැනු ළමයින්ට වඩා ප්‍රමාද වන බවයි. වයස 12 වන විට සියයට 25 ක් පමණ පිරිමි ළමයින් ශුක්‍රාණු පිටවීම අත් දැක ඇති අතර වයස 14 වන විට සියයට 80 කට පමණ එය සිදුවෙයි. පළමුවැනි ශුක්‍රාණු පිටවීම සිදුවන සාමාන්‍ය වයස අවුරුදු 13 මාස 10 කි. ගැහැනුන්ගේ මෙන් පිරිමි ළමයින්ගේ ද මේ සමඟ ශරීර විපර්යාස කීපයක් සිදුවේ. ලිංගික ප්‍රදේශ, කිහිලි, උඩු තොල, කම්මුල්, නිකට වැනි ස්ථානයන්හි රෝම ඇතිවේ. උකුල පුළුල් වීම වෙනුවට උරහිස් පුළුල් වේ. කටහඬ වඩා ගැඹුරු වෙයි. ගැහැනුන්ගේද කටහඬ වෙනස් වන නමුත්, ඒ ඉතා සුළු ප්‍රමාණයකි. මේ කාලයේදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම ලිංගේන්ද්‍රියන්ගේ වර්ධනය වේගවත් වේ.

ලිංගික ක්‍රියාකාරීත්වයේ ප්‍රබලත්වය උච්චාවස්ථාවට පැමිණෙන වාර ගණන අනුව මනින්නේ නම්, පිරිමි,

Scanned by TapScanner

ගැහැනුන්ට කලින් ක්‍රියාකාරීත්වය අතින් ඉහළම අවස්ථාවට පැමිණෙති. පිරිමි ළමයින්ගේ ලිංගික වර්ධනය ගැහැනුන්ට වඩා අවුරුද්දකට පමණ පසුව ඇරඹෙන නමුත්, ඔවුහු තරුණ වයසේදීම මේ අතින් ඉහළම පෙත්තට පැමිණෙති. එහෙත් ගැහැනුන් මෙම තත්වයට පත්වන්නේ වයස විසි ගණන් වලදීයි. වයස 15 පිරිමි ළමයෙකුට ලිංගික ක්‍රියාකාරීත්වය අතින් සමවීමට ගැහැනියකගේ වයස 29 ක් පමණ විය යුතුය. වයස අවුරුදු 15 ගැහැනු ළමයින්ගෙන් ලිංගික උච්චාවස්ථාව අත්දැක ඇත්තේ සියයට 25ක් පමණ වන අතර වයස 20 වන විට මෙය සියයට 53 ක් පමණ වේ. වයස 35 වන විට ගැහැනුන්ගෙන් සියයට 90ක් පමණ මෙම අත්දැකීම ලබා ගනිති.

වැඩිහිටි පුරුෂයෙක් සාමාන්‍යයෙන් සතියකට දෙතුන් වරක් පමණ ලිංගික උච්චාවස්ථාවට පැමිණෙයි. පිරිමින්ගෙන් සියයට 7ක් පමණ දෙනාගේ දිනපතාම ශුක්‍රාණු පිටවන බව පෙනේ. පිරිමින් උච්චාවස්ථාවට පත්වන වාර ගණන ඉතාම අධික වන්නේ වයස 15 ත් 30 ත් අතර කාලයේදීය.

එනැන් සිට මෙය ක්‍රමයෙන් පහත බසී. එක් විටම කීප වරක් ශුක්‍රාණු පහකිරීමේ හැකියාවද අඩු වෙයි. තරුණ කාලයේදී පුරුෂ ලිංගයේ ප්‍රාණවත් බව පැයක් පමණ වේලා පවත්වා ගත හැකි නමුත් අවුරුදු 70දී මෙය මිනිත්තු 7කට සීමා වේ. කෙසේ වෙතත් අවුරුදු 70වේ පිරිමින් ගෙන් සියයට 70 කට පමණ ලිංගික වශයෙන් ක්‍රියාකාරී විය හැකි බව පෙනේ.

මේ ආකාරයටම වයස්ගත වීමත් සමඟ ස්ත්‍රීන්ගේද ලිංගික කටයුතු වල අඩුවීමක් දක්නට ලැබේ. වයස 50 දී පමණ හිටි හැටියේ ඩිම්බ මෝචනය නතරවීම නිසා, ලිංගික ක්‍රියාකාරීත්වයෙහි අඩුවක් දක්නට නොලැබෙන නමුත්, ස්ත්‍රීන්ගේ ලිංගික හැසිරීම් රටාවට එය විවිධ ආකාරයෙන් බලපාන බව පෙනී ගොස් තිබේ.

අප මෙතෙක් සාකච්ඡා කළ සංසර්ගීය ක්‍රියා වැඩි වශයෙන් සිදුවන්නේ සහකරුවන් අතර යුගල බැඳීමක් ඇති විටයි. මෙම යුගල බන්ධනය, නිල වශයෙන් පිළිගනු ලැබූ විවාහය හෝ එතරම් විධිමත් නොවූ සම්බන්ධතා වුව විය හැකියි. විවාහයෙන් පිට සංසර්ගීය ක්‍රියා වැඩි වශයෙන් සිදුවීම, කිසිම වග විභාගයක් නැතිව ඕනෑම කෙනෙකු සමඟ ලිංගික ක්‍රියාවල නියැළීමක් ලෙස සැලකිය නොහැක. මෙහිදී සාමාන්‍ය යුගල සෑදීමේ ක්‍රියාවලිය සිදුවන නමුත් යුගල බන්ධනය වැඩි කල් නොපවතී. සාමාන්‍යයෙන් ජනගහණයෙන් සියයට 90 ක් පමණ යුගල වශයෙන් බැඳෙන නමුත්, ස්ත්‍රීන්ගෙන් සියයට 50 ක් හා පුරුෂයින්ගෙන් සියයට 54 ක් විවාහයට පෙර ලිංගික සංසර්ගයේ යෙදෙති. වයස 40 වන විට විවාහක ස්ත්‍රීන්ගෙන් සියයට 26 ක්ද විවාහක පුරුෂයින් ගෙන් සියයට 50 ක් ද, විවාහයෙන් පිට සංසර්ගයේ යෙදෙන බව පෙනී ගොස් ඇත. විවාහයෙන් තහවුරු කරනු ලැබූ යුගල බන්ධන සමඟර අවස්ථාවලදී බිඳ වැටේ. (උදාහරණයක් වශයෙන් 1956 දී ඇමරිකාවේ මෙම සංඛ්‍යාව සියයට 0.9 ක් විය.) අපේ වර්ගයාගේ යුගල බන්ධන ක්‍රියාවලිය ඉතා ප්‍රබල නමුත්, සර්ව සම්පූර්ණ නොවන බව මෙයින් පෙනී යයි.

දැන් අවශ්‍ය කරුණු සියල්ලම අප ඉදිරියේ ඇති බැවින් අපට ප්‍රශ්න ඇසීම ආරම්භ කළ හැකිය. අපේ වර්ගයාගේ ලිංගික හැසිරීම් රටාව, අපේ පැවැත්මට ආධාර වන්නේ කෙසේද? අපේ හැසිරීම වෙනත් ආකාරයක් නොගන්නේ ඇයි? අපට මෙහිදී ප්‍රයෝජනවත් විය හැකි තවත් ප්‍රශ්නයක් නම්, අනිකුත් ජීවත්වන අග්‍රේශයන් සමඟ සංසන්දනය කළ විට, අපේ ලිංගික රටාව ඔවුන්ගෙන් වෙනස් වන්නේ කෙසේද යන්නයි.

අපේ කිට්ටුම නෑයන් ඇතුළු වෙනත් කිසිම අග්‍රේශයකුගේ දැකිය නොහැකි තරම් ප්‍රබල ලිංගික ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබෙන්නේ අපේ වර්ගයාගේ පමණි. මෙතරම් දීර්ඝ කාලීන යුගල බන්ධනයක් වෙන කිසිම වඳුරකු හෝ වානරයකුගේ දක්නට නොලැබේ. අනෙකුත් වානරයන්ගේ

Scanned by TapScanner

පූර්ව සංසර්ග කටයුතුවලට ගත වන්නේ ඉතා කෙටි කාලයක් වන අතර ඒවා සරල ශබ්ද කීපයක් හා මුහුණින් හැඟීම් ප්‍රකාශ කිරීම් කිහිපයකට සීමාවේ. සංසර්ගය සඳහා ගත වන්නේ ද ඉතා සුළු කාලයකි. (උදාහරණයක් වශයෙන් ,බැබුන්, නම් වඳුරන්ට මේ සඳහා ගත වන්නේ තත්පර හත අටක් පමණ වන අතර, ඒ සඳහා ඔහුට අවශ්‍ය වන්නේ ශ්‍රෝණි, තෙරපීම් පහළොවකටත් අඩු ප්‍රමාණයකි.) මෙහිදී ගැහැනු සතා උච්චාවස්ථාවකට පත්වන බවක් නොපෙනේ. උච්චාවස්ථාවක් ලෙස සැලකිය හැකි යමක් වේ නම්, අපේ වර්ගයාගේ ලිංගික අත්දැකීම සමඟ සසඳන විට, එය ඉතා සුළු දෙයකි.

වඳුරන්ගේ හා වානරයන්ගේ ගැහැනු සතා ලිංගික වශයෙන් ග්‍රාහකත්වය දක්වන කාලය සීමාසහිත වේ. මෙය සමාන්‍යයෙන් ඔවුන්ගේ මාසික චක්‍රයේ, සතියක් පමණ කාලයක් තුළ පවතී. ලිංගික ග්‍රාහකත්වය ඩිම්බ මෝචනය කරන අවස්ථාවට පමණක් සීමා වී ඇති පහත් ක්ෂීරපායින් සමඟ සසඳන විය මෙය ද දියුණුවකි. අපේ වර්ගයාගේ පරිණාමයේදී මෙහි අවසාන සීමාව දක්වා දියුණුවීමෙන් අපේ ස්ත්‍රීහු සෑම අවස්ථාවකම ග්‍රාහක බවක් දක්වති. වඳුරන් හා වානරයන්ගේ ගැහැනු සත්තු ගැබ්ගත් විට හෝ පැටවුන්ට කිරි දෙන කාලයේ හෝ ලිංගික වශයෙන් ක්‍රියාකාරී නොවෙති. අපේ වර්ගයා මෙම කාලවලදී ලිංගික ක්‍රියාවන්හි යෙදෙන අතර ඒවා සිදුනොවන්නේ ප්‍රසූතියට පෙර හා පසුව ඉතා කෙටි කාලයක් තුළ පමණි.

ජීවත්වන අග්‍රේශයන් අතුරෙන් ඉතාම කාමුක සතා නිරුවත් වානරයා බව මෙයින් පැහැදිලිවම පෙනේ. මෙයට හේතුව කුමක්දැයි සෙවීම සඳහා, නැවතත් ඔහුගේ මූලාරම්භයට යා යුතුය. පළමුවෙන්ම ජීවිතය රැකගැනීම සඳහා ඔහුට දඩයම් කිරීමට සිදුවිය. දෙවනුව ඔහුගේ සිරුර දඩයම් කටයුතු සඳහා යෝග්‍ය නොවූ බැවින්, වඩා හොඳ මොළයක් අවශ්‍ය විය. තුන්වෙනුව මෙම මොළයේ වර්ධනය සඳහා දිගු ළමා කාලයක් තිබිය යුතු විය. සිව්වෙනුව කිසිවක් කරගත නොහැකි මෙම ළදරුවන් හදා වඩා ගැනීමට ස්ත්‍රීන් ගෙදර නතර විය යුතු වූ අතර, දඩයම් යෑම පිරිමින්ගේ කාර්යයක් විය. පස්වෙනුව, දඩයම් කිරීමේ දී සියලුම පිරිමින් එකතුව සහයෝගයෙන් වැඩ කිරීම සඳහා කෙළින් සිට ආයුධ භාවිතා කළ යුතු විය. මා මෙයින් අදහස් කරන්නේ මේවා ඒ ආකාරයටම එකකට පසුව එකක් සිදු වූ බව නොවේ. නිසැකවම මේ සියල්ලම පාහේ එක විට සිදුවන්නට ඇත. එක් පියවරක් අනිත් ඒවායේ දියුණුවට උපකාරයක් වන්නට ද ඇත. මා මෙහිදී සඳහන් කොට ඇත්තේ දඩයම් වානරයාගේ පරිණාමයේ දී සිදු වූ ප්‍රධාන විපර්යාස හයයි. අපේ වර්තමාන ලිංගික සංකීර්ණත්වයට පදනම් වූ සියළුම සාධක මෙම විපර්යාසයන් තුළ අන්තර්ගතව ඇති බව පෙනේ.

ආරම්භයේදී ම දඩයමේ ගිය විට ස්ත්‍රීන් තමන්ට විශ්වාසවන්තව සිටින බවට, පිරිමින් සහතික වශයෙන් දැන සිටිය යුතු විය. මේ නිසා යුගල සෑදීමේ කැමැත්තක් ගැහැනුන් තුළ වර්ධනය වීම අවශ්‍ය වූයේය. දඩයම් කටයුතුවලදී දුර්වල පිරිමින්ගේ ද සහයෝගය ලබා ගැනීමට නම් ඔවුන්ට ද සමාන ලිංගික අයිතිවාසිකම් ලබා දිය යුතුවේ. ස්ත්‍රීන් බෙදාගෙන ලිංගික සංවිධානය වඩා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පවත්වා ගැනීම මේ නිසා වැදගත් විය. දැන් පිරිමින් සතුව භයානක ආයුධ ඇති බැවින්, ඔවුන් අතර ලිංගික කරුණු නිසා ගැටුම් ඇතිවීම වැළැක්වීම අවශ්‍ය විය. මෙය සිදුකළ හැකි හොඳම ක්‍රමය වූයේ, එක් පිරිමියෙකු එක ගැහැනියකගෙන් තෘප්තිමත් වීමයි. මේ සියල්ලටම ඉහළින් දෙමාපිය දෙන්නා එකතුව සෙමින් වැඩෙන දරුවා රැකබලා ගත යුතු විය. දරු සෙනහසත්, දෙමාපියන් ලෙස නව හැඟීම් රටාවකුත් දියුණු වූ අතර, එම කටයුතු මව හා පියා අතර බෙදා ගන්නා ලදී. ශක්තිමත් යුගල බන්ධනයක් පැවැතීමට තවත් හේතුවක් වූයේ එයයි.

මෙම තත්වය ආරම්භය ලෙස ගෙන අනිකුත් ලක්ෂණ එයින් දියුණු වූයේ කෙසේදැයි දැන් අපට සලකා බැලිය හැකි වෙයි. යුගල බන්ධනයේ පරිණාමය සඳහා, එක් අයෙකු පමණක් ලිංගිකව අවශ්‍ය වන ආකාරයට, ප්‍රේමයෙන් බැඳී සිටීමේ හැකියාව නිරුවත් වානරයා තුළ දියුණු වීම අවශ්‍ය

Scanned by TapScanner

විය. ඔහු මෙය කළේ කෙසේද? පැය කීපයක් හෝ දින කීපයක් පවතින මෙවැනි සම්බන්ධතාවන් ඇතිකර ගැනීමට අග්‍රේශයකු ලෙස ඔහුට මූලික හැකියාවක් තිබිණි.

මෙය දැන් තව තවත් වර්ධනය කළ යුතු ලක්ෂණයක් විය. මේ සඳහා ඔහුට උපකාරී වූ එක් දෙයක් නම් ඔහුගේ දීර්ඝ ළමා කාලයයි. මෙම වර්ධන කාලය තුළදී ළදරුවා දෙමාපියන් සමඟ ඉතා ගැඹුරු පෞද්ගලික සම්බන්ධතාවක් ඇතිකර ගනී. එය තරුණ වඳුරකු හෝ වානරයකු ලබන අත්දැකීමට වඩා, දීර්ඝ කාලයක් පවතින, ප්‍රබල සම්බන්ධතාවකි. වැඩිවියට පත්වීමත්, වඩා ස්වාධීනවීමත් සමඟ දෙමාපිය බැමිම ලිහිල් වීමෙන් "සම්බන්ධතා හිස් බවක්" ඇති වේ. මෙය කිසියම් ක්‍රමයකින් පිරවිය යුතුය. මේ නිසා එතරම් බලවත්, අලුත් බැමිමක් ඇතිකර ගැනීමට ඔහු දැන් සූදානම්ය.

අලුත් යුගල බැමිමක් ඇතිකර ගැනීමට මෙය ප්‍රමාණවත් වුවත්, එය පවත්වා ගැනීම සඳහා අතිරේක ආධාර ලැබිය යුතු විය. පවුලක් ඇතිවීමේ දීර්ඝ ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් වන තරම් කාලයක් එය පැවතීමත්, එතරම් කාලයක් දෙදෙනා ආදරයෙන් බැඳී සිටීමත් අවශ්‍ය විය. දීර්ඝ වූත්, ප්‍රියජනක වූත්, එකිනෙකා හඳුනා ගැනීමේ කාලයක් ඇති කිරීමෙන් මෙය ඉටුකර ගතහැකි වුවද, ඉන්පසුව එයට වැඩි යමක් අවශ්‍ය වෙයි. මේ සඳහා සරලම විසඳුම වන්නේ හවුල් කටයුතු වඩා සංකීර්ණ කිරීම හා ඒවා වඩා ප්‍රියජනක කිරීමයි. වෙනත් වචනවලින් කිවහොත් කාමුක බව, තව තවත් රාගික කිරීමයි.

මෙය කරන ලද්දේ කෙසේද? මීට පිළිතුර වනුයේ හැකි සෑම ආකාරයකින්ම එය සිදුවුණු බවයි. වර්තමානයේ නිරුවත් වානරයාගේ හැසිරීම් රටාව දෙස බැලුවහොත් මෙය සිදුවූ ආකාරය දැකිය හැකිය. ස්ත්‍රියගේ ග්‍රාහකතාව වැඩිවීම, උත්පත්ති සංඛ්‍යාව වැඩි කිරීම සඳහා පමණක් සිදුවූ දෙයක් ලෙස පැහැදිලි කළ නොහැක. මවක ලෙස දරුවන් හදා වඩා ගන්නා කාලයේත්, සංසර්ගයේ යෙදීමට හැකි වීමෙන් උත්පත්ති

සංඛ්‍යාව වැඩිවන බව සත්‍යයකි. දරුවකු ඇති දැඩි කිරීමට ගතවන කාලය ගැන සලකන විට, එය එසේ නොවූයේ නම් මහා විපත්තියක් වන්නට තිබිණි. නමුත් මාසික චක්‍රය පුරාම ඇයට ලිංගික වශයෙන් පිබිදී, ලිංගික ක්‍රියාවල නිරත වීමට හැකි වූයේ මන්ද යන්න මෙයින් පැහැදිලි නොවේ. ඩිම්බ නිකුත් වන්නේ මෙම චක්‍රයේ එක් අවස්ථාවක දී පමණක් වන අතර අන් අවස්ථාවල සිදුවන සංසර්ගයෙන් බෝවීමේ කාර්යය ඉටු නොවේ. අපේ වර්ගයාගේ සංසර්ගීය ක්‍රියාවල පරමාර්ථය බොහෝ විට දරුවන් ඇති කිරීම නොව, ලිංගික සහකරුවන් එයින් ලබන අන්‍යොන්‍ය සතුට මඟින්, යුගල බැම්ම ශක්තිමත් කිරීමයි.

මේ නිසා මිනිස් යුවලක් නැවත නැවත ලිංගික සංසර්ගයේ යෙදීමෙන් තෘප්තිමත්වීම, වර්තමාන ශිෂ්ටාචාරයේ අවලම් සිරිතක් නොව, ජීව විද්‍යාත්මක පදනමක් ඇති, ඉතා අවශ්‍ය වූත් පරිණාමීය වශයෙන් නිවැරදි වූත් ක්‍රියාවක් වෙයි.

ඇගේ මාසික ක්‍රියාවලිය සිදුවීම නතර වීමෙන් පසුව හෙවත් ගැබ් ගැනීමෙන් පසුවත් අපේ ස්ත්‍රී වර්ගයා පුරුෂයාට ග්‍රාහක බවක් දක්වයි. එක් පුරුෂයෙකුට එක් ස්ත්‍රියක් ලැබෙන මෙම ක්‍රමය යටතේ, දීර්ඝ කාලයක් පුරුෂයා තෘප්තිමත් නොකිරීම අනතුරුදායක වන බැවින්, මෙය විශේෂයෙන්ම වැදගත් වේ. මෙසේ නොවූයේ නම් යුගල බන්ධනය බිඳ වැටීමට ඉඩ තිබිණි.

ලිංගික කටයුතු සිදුවිය හැකි කාලය දීර්ඝ කිරීමට අමතරව, ඒවා වඩා විස්තීර්ණ වීමක්ද සිදුව ඇත. අපට නිරුවත් සම හා සංවේදී දත් ලබා දුන් දඩයම් ජීවිතය, ලිංගික වශයෙන් උත්තේජකයක් වන සිරුරු සම්බන්ධය වැඩි කිරීමේ ඉඩ ද ලබා දී ඇත. මෙය පුර්ව සංසර්ග ක්‍රියාවලදී ප්‍රධාන තැනක් ගනී. වෙනත් කිසිම අග්‍රේශ වර්ගයක දැකිය නොහැකි තරම් අතගෑම, පිරිමැදීම, තෙරපීම හා සුරතල් කිරීමක් අපේ වර්ගයාගේ දක්නට ලැබේ.

Scanned by TapScanner

ශෘංගාරාත්මක ස්පර්ශ උත්තේජයන්ට ඉතා සංවේදී ස්නායු අග්‍ර තොල්, කන්පෙති, තනපුඩු, පියයුරු හා ලිංගේන්ද්‍රියයන්ගේ දක්නට ලැබේ. කන් පෙති පරිණාමය වී ඇත්තේ මේ සඳහාම බව පෙනේ. ව්‍යුහ විද්‍යාඥයන් මේවා හඳුන්වා ඇත්තේ, අනවශ්‍ය කිසිම ප්‍රයෝජනයක් නොමැති අංග ලෙස වන අතර සාමාන්‍යයෙන් මේවා විස්තර කරනු ලබන්නේ කලින් තිබූ විශාල කන්වල නෂ්ටාවශේෂ හැටියටය. එහෙත් අනෙකුත් අග්‍රේශයන්ගේ මස් සහිත කන් පෙති දක්නට නොලැබේ. ඇත්ත වශයෙන්ම අපේ කන් පෙති නෂ්ටාවශේෂයක් නොව ඉන්ද්‍රියයක් බව පෙනේ. ලිංගික පිබිදීමත් සමඟ එය ලේ වලින් පිරී පිම්බී ඉතා සංවේදී බවක් පෙන්යි. මේ අනුව එය පරිණාමය වී ඇත්තේ තවත් ශෘංගාරාත්මක අවයවයක් ලෙස බව පෙනේ. (කන් පෙති උත්තේජනය කිරීමෙන් ලිංගික උච්චාවස්ථාවට පත් වූ ගැහැනුන් හා පිරිමින් පිළිබඳව වාර්තා වී ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය.)

අපේ වර්ගයාගේ ඉදිරියට නෙරා ඇති නාසය, ව්‍යුහ විද්‍යාඥයාට පැහැදිලි කළ නොහැකි තවත් ලක්ෂණයකි. මෙතරම් පැහැදිලිව පෙනෙන අවයවක් එයට හිමි කිසියම් කාර්යකින් තොරව පරිණාමය වූයේ යැයි සිතිය නොහැක. ලිංගික පිබිදීමේදී ලේ පිරීමෙන් නාසය විශාල වීමට හේතුවන පටකයක් එහි ඇතුල් පැත්තේ තිබීම අපේ පුදුමයට හේතු නොවන්නේද?

ස්පර්ශ සංවේදය තරම්ම අති දියුණු වූ, අද්විතීය දෘෂ්ටිමය වර්ධනයක්ද අපට නිරුවත් වානරයා තුළ දැකිය හැකියි. මුහුණෙන් සංකීර්ණ වූ හැඟීම් ප්‍රකාශ කිරීම මෙහි ඉතා වැදගත් තැනක් ගනී. අග්‍රේශයන් අතුරෙන් වඩා දියුණු වූ මෙන්ම, ඉතාම සංකීර්ණ වක්ත්‍ර පේශීන් ඇත්තේ නිරුවත් වානරයාටයි. ඇත්ත වශයෙන්ම සියලුම සතුන් අතුරෙන් ඉතාම සියුම් මෙන්ම, සංකීර්ණ ලෙස මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කිරීමක් දැකිය හැක්කේ නිරුවත් වානරයාගේයි. අපේ මුඛයේ, නාසය, ඇස හා නළලේ ඇති මාංශපේශීන්ගේ චලනය මගින් අපට

ඉතා සංකීර්ණ වූ හැඟීම් මාලාවක් ප්‍රකාශ කළ හැකි වේ. ලිංගික කටයුතුවල මුල් අවදියේදී මේවා ඉතා වැදගත් වේ. (මේ පිළිබඳව පසු පරිච්ඡේදයක ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කෙරෙනු ඇත.) ලිංගික පිබිදීමේ දී කණිනිකාව විශාලවීම කෙරෙන්නේ සුළු වශයෙන් නමුත්, අප සිතනවාට වැඩියෙන් එය ප්‍රතිචාර දක්වන බව පෙනේ. මේ සමඟම ඇසේ මතුපිට ද දිළිසෙන්නට පටන් ගනී.

කන් පෙති හා නාසය මෙන්ම අපේ වර්ගයාගේ තොල්ද වෙනත් කිසිම අග්‍රේශයකුගේ දක්නට නොලැබෙන අද්විතීය ලක්ෂණයකි. අනිකුත් අග්‍රේශයන්ගේද තොල් දැකිය හැකි නමුත්, ඒවා අපේ මෙන් ඇතුල් පැත්ත පිටට හැරුණු ඒවා නොවේ. චිම්පන්සියාට තොල් පිටට හරවා ගෙන සිටිය හැකි වුවද, ඒ ඉතා ටික වේලාවක් පමණි. චිම්පන්සියකුට අප පෙනෙනු ඇත්තේ නිරන්තරයෙන්ම තොල් පිටට හරවා ගෙන සිටින සතෙකු ලෙසයි.

චිම්පන්සියාට සිප ගැනීම, ලිංගික ක්‍රියාවකට වඩා ආචාර කිරීමේ සංඥාවක් වෙයි. අපේ වර්ගයා මෙය අවස්ථා දෙකේ දීම යොදා ගන්නා අතර පූර්ව සංසර්ග ක්‍රියාවලියේ දී එය වැඩි වැඩියෙන් සිදුවේ. චුම්බනය කිරීම සඳහා ගත කරන දීර්ඝ කාලය තුළ තොල් පිටට හරවා ගෙන සිටීමේ අපහසුව මඟ හරවා ගත හැකි එකම ක්‍රමය වූයේ එවා ස්ථිරව පිටට හරවා තිබීමයි. නමුත් මේ සම්පූර්ණ කථාවම නොවේ. නිරාවරණය වූ තොල් නියම හැඩයක් තිබෙන සේ පරිණාමය විය. වටේ ඇති මුහුණු සමඟ එය මුසු නොවී ඇති අතර, ඒ දෙක වෙන්කරන සීමා රේඛාවක් දක්නට ලැබේ.

මේ නිසා තොල්, වැදගත් දෘෂ්ටි සංඥා නිකුත් කරන්නා වූ උපකරණයක් බවට පත්ව තිබේ. ලිංගික පිබිදීමේ දී තොල් පිම්බී රතු වන බව අපි දනිමු. මුහුණේ අනිකුත් කොටස්වලින් තොල් වෙන්වී තිබීම නිසා, එහි සියුම් වෙනසක් පවා පහසුවෙන් හඳුනාගත හැකි වේ. සාමාන්‍ය අවස්ථාවේ පවා ඒවා මුහුණේ අනික් කොටසට වඩා රතු පාට වන බැවින්, එය

Scanned by TapScanner

ස්පර්ශක ලිංගික අවයවයක් ලෙස අවධානය ලබාගනී.

අපේ වර්ගයා සතුව ඇති මෙම අසාමාන්‍ය තොල් ගැන අදහස් දක්වන ව්‍යුහ විද්‍යාඥයෝ, ඒවායේ පරිණාමය ගැන තවම හරි හැටි සොයා ගෙන නැතැයි කියා සිටිති. ඔවුන් ඉදිරිපත් කොට ඇති එක අදහසක් නම්, මවගේ පියයුරුවලින් කිරි උරාබීම සඳහා තොල් පරිණාමය වී ඇති බවයි. මුහුණත්, තොලුත්, අපේ මෙන් වෙන්වී නැති ළදරු විම්පන්සියාද මවගෙන් හොඳින් කිරි උරා බොන බැවින්, අපේ තොල්වල විශේෂ පරිණාමය එයින් පැහැදිලි කළ හැකි නොවේ. එපමණක් නොව, ලා පැහැති හා තද පැහැති සමක් අවශ්‍ය වීම නිසා, තොල්වල කැපී පෙනෙන ලක්ෂණය නැති වී යන බැවින්, වෙනත් කිසියම් දෙයක් සිදුවිය යුතුය. ඇත්ත වශයෙන්ම නිග්‍රෝ ජාතිකයන්ගේ තොල්වලට සිදුවී ඇත්තේ මෙයයි. වඩා විශාල වීමෙන් හා ඉදිරියට නෙරා නිබීමෙන් ඒවායේ කැපී පෙනෙන ලක්ෂණය පවත්වා ගෙන ඇත. මෙහිදී වර්ණය අතින් කැපී පෙනීමේ අඩුව, ප්‍රමාණයෙන් හා හැඩයෙන් මැකී තිබේ.

මෙයට අමතරව තවත් දෘෂ්ටිමය ලිංගික සංඥාවෝ කොතෙකුත් දක්නට ලැබෙන්. වැඩිවියට පත්වීමත් සමඟ ලිංගික ප්‍රදේශ හා කිහිල්ලේ රෝම ඇතිවීමට පටන් ගනී. පුරුෂයාගේ මුහුණේ ද මේ සමඟ රෝම ඇතිවන අතර ස්ත්‍රියගේ පියයුරු ද වේගයෙන් වර්ධනය වේ. පුරුෂයාගේ සිරුරේ උරහිස් ප්‍රදේශයද, ස්ත්‍රියගේ උකුළු ප්‍රදේශයද, පුළුල් වෙයි. මෙම විපර්යාසයන් නිසා ලිංගික වශයෙන් වැඩුණු සත්වයා නොවැඩුණු සත්වයාගෙන් වෙන්කර හඳුනා ගත හැකි අතර, ඒ නිසාම වැඩුණු පිරිමියා, වැඩුණු ගැහැනියගෙන්ද වෙන්කර හඳුනා ගත හැකි වෙයි. මේ නිසා මේවා ලිංගික පද්ධතියේ ක්‍රියාකාරී බව දක්වන සංඥාවන් පමණක් නොව, සත්වයා කුමන ලිංගයට අයත් දැයි දක්වන සංඥාවෝ ද වෙති.

ස්ත්‍රීන්ගේ විශාල පියයුරු මූලික වශයෙන් ලිංගික වර්ධනයක් නොව, මාතෘභාවයේ සංකේතයක් ලෙස බොහෝ විට සලකනු ලැබුවත්, මෙය සනාථ කිරීමට ප්‍රමාණවත් තරම්

සාක්ෂි නොමැත. වෙනත් වානරයන්ද තම ළදරුවන්ට ප්‍රමාණවත් තරම් කිරි සපයන නමුත්, ඔවුන්ගේ මෙවැනි අර්ධගෝලීය පියයුරු දක්නට නොලැබේ. අපේ ස්ත්‍රී වර්ගයාට, මේ අතින් අග්‍රේශයන් අතර අද්විතීය ස්ථානයක් හිමි වෙයි. ගෝලාකාර හැඩයෙන් යුත්, ඉදිරියට නෙරා යන පියයුරු පරිණාමය වීම, ලිංගික සංඥාවක් දීමේ නවත් ක්‍රමයක් ලෙස සැලකීමට සිදුවෙයි. නිරුවත් සම නිසා මෙය වඩාත් පහසු වී ඇත. රෝමවලින් පිරුණු සතකුගේ මෙවැන්නක් තිබුණත්, සංඥා උපකරණයක් ලෙස එය එතරම් සාර්ථක නොවේ. හැඩයට අමතරව ලිංගික පිබිදීමේ දී ප්‍රාණවත් වන තනපුඩු හා ඒ වටා ඇති තද වර්ණයෙන් යුත් ප්‍රදේශය ද මේ සඳහා ආධාර කරයි.

සමේ නිරුවත් බව නිසා වර්ණ විපර්යාස මගින් සංඥා නිකුත් කිරීමට හැකි වී තිබේ. අනිකුත් සතුන්ගේ රෝම රහිත නිරුවත් කොටස්වල මේවා සිදුවන අතර, අපේ වර්ගයාගේ මෙවැනි වර්ණ විපර්යාසයන් බෙහෙවින් දක්නට ලැබේ. ලැජ්ජාවෙන් රතුවීම, ලිංගික හැසිරීමේ මුල් අවස්ථාවල වරින් වර සිදුවන අතර, ලිංගික ක්‍රියාවන්හි තීව්‍රතාව වැඩිවීමත් සමඟ එය වැඩි වැඩියෙන් දක්නට ලැබේ. (තද වර්ණයෙන් යුත් සම සහ සහිත ජාතීන්ට දේශගුණික හේතු නිසා මෙම ලිංගික සංඥා ක්‍රමය කැප කිරීමට සිදුවී ඇත. නමුත් ඔවුන්ගේ සම, ලිංගික ක්‍රියාවලියේ දී විපර්යාසයන්ට භාජනය වන බවත්, ඔවුන්ගේද අදෘශ්‍යමාන වර්ණ විපර්යාසයන් සිදුවන බවත් අපි දැන් දනිමු.)

දෘෂ්ටිමය ලිංගික සංඥාවන් පිළිබඳ සාකච්ඡාව අවසන් කිරීමට පෙර, ඒවායේ පරිණාමයේ අසාමාන්‍ය අංගයක් ගැන අපේ අවධානය යොමු කළ යුතු වෙයි. මේ සඳහා අපේ ඥාති සහෝදරයන් වන වඳුරන්ගේ ශරීරවල සිදුවී ඇති පුදුමාකාර විපර්යාසයන් ගැන සොයා බැලිය යුතුය. ජර්මනියේ කරන ලද අලුත් පර්යේෂණවලින් පෙනී ගොස් ඇති කරුණක් නම්, සමහර සත්ව විශේෂ, තමන්ම අනුකරණය කිරීමට පටන් ගෙන ඇති බවයි. "මැන්ඩ්‍රිල්" නම් වඳුරා ද, ගෙලඩා නම් බැබුන් ද

Scanned by TapScanner

මෙයට හොඳ උදාහරණ වෙති. පිරිමි මැන්ඩ්‍රිල් ගේ රතුපාට ශිශ්නයක් හා ඒ දෙපැත්තේ නිල් පැහැති වෘෂණ කෝෂ දෙකක් දක්නය ලැබේ. මෙම වර්ණ සංකලනය මැන්ඩ්‍රිල් ගේ මුහුණේ ද එම ආකාරයටම දක්නට ඇත. උගේ පිම්බුන නාසය රතු පාට වන අතර, ඒ දෙපැත්තේ ඇති නිරුවත් කම්මුල් තද නිල් පාට වේ. එකම ආකාරයේ දෘෂ්ටිමය සංඥාවන් නිකුත් කිරීමෙන්, මුහුණ ලිංගික ප්‍රදේශය අනුකරණය කිරීමක් ලෙස මෙය සැලකිය හැකිය. පිරිමි "මැන්ඩ්‍රිල්" වානරයකු තවත් සතකු ඉදිරියට එන විට උගේ ශරීර ඉරියව්ව නිසා ලිංගික ප්‍රදේශය නොපෙනෙන නමුත්, ඌට තම මුහුණෙන් ලිංගික සංඥාවන් නිකුත් කිරීමට හැකිවේ. ගැහැනු ගෙලඩා බැබුන්ගේද මෙවැනි දෙයක් දක්නට ඇත. ඇගේ ලිංගික ප්‍රදේශය වටා ඇති සම රතුපාට වන අතර, එය වටා සුදු පැහැති පිටිකා දක්නට ලැබේ. මෙම ප්‍රදේශයේ මැද ඇති භගයේ තොල් තද රතු පැහැයක් ගනී. මෙවැනිම වර්ණ සංයෝජනයක් මෙම සතාගේ පපුවේ ද දක්නට ලැබේ. එහි මැද ඇති තද රතු තනපුඩු, ඉතා ළංව තිබීම නිසා, භගයේ තොල්වලට බොහෝ සමානකමක් දක්වයි. (ඒවා කොතරම් ළඟින් ඇද්ද යත්, කුඩා පැටියා තනපුඩු දෙකින්ම එකවර කිරි උරා බොයි.) නියම ලිංගික ප්‍රදේශයේ මෙන්, පපුවේ ඇති වර්ණ සංයෝජනයේ ද, ඇගේ මාසික ලිංගික චක්‍රයේ විවිධ අවස්ථා අනුව වර්ණයේ තීව්‍රතාව අඩු වැඩි වේ.

මෙයින් අපට එළඹිය හැකි එකම නිගමනය නම්, මැන්ඩ්‍රිල් හා ගෙලඩා බැබුන් යම්කිසි හේතුවක් නිසා තම ලිංගික (ප්‍රජනක) සංඥාවන් ශරීරයේ ඉදිරිපසට ගෙනැවිත් ඇති බවයි. මැන්ඩ්‍රිල් ගේ මෙවැන්නක් සිදුවීමට හේතුව කුමක්දැයි කීමට තරම් අපි උගේ ජීවිතය ගැන නොදන්නා නමුත්, අනිකුත් වඳුරන් සමඟ සසඳන විට, ගෙලඩා බැබුන් වැඩි කාලයක් කෙළින් වාඩිවී සිටින ඉරියව්වකින් පසුවන බව අපි දනිමු. මේ නිසා පපුවේ, ලිංගික ප්‍රදේශයට සමාන වර්ණ සංයෝජනයක් තිබීමෙන්, ඔහුට තම ලිංගික සංඥා නිකුත් කිරීම පහසු වෙයි. බොහෝ අග්‍රේශයන්ගේ දීප්තිමත් වර්ණයෙන් යුත් ලිංගේන්ද්‍රියයන් දක්නට ලැබෙන නමුත්, ශරීරයේ ඉදිරිපස

මෙවැනි අනුකරණයෝ ඉතා දුර්ලභ වෙති.

අපේ වර්ගයා ගේ ද ශරීර ඉරියව්ව අතින් මුලික පරිවර්තනයක් සිදුවී ඇත. ඉහත සඳහන් කළ ගෙලඩා බැබුන් මෙන් අපත් වැඩි කාලයක් කෙළින් වාඩිවී සිටින ඉරියව්වකින් පසුවෙමු. සමාජීය වශයෙන් එකිනෙකා හමුවීමේ දී අපි කෙළින් එකිනෙකාට මුහුණලා සිට ගනිමු. එසේ නම් ගෙලඩා බැබුන්ගේ සිදුවී ඇති දෙයට සමාන දෙයක් අපේ වර්ගයාට සිදු වූයේ නැතැයි කිව හැකිද? අපේ සිරස් ඉරියව්ව ලිංගික සංඥා නිකුත් කිරීමේ ක්‍රියාවලියට බලපාන්නට ඇද්ද? මෙම ප්‍රශ්නයට පිළිතුර ඇත්ත වශයෙන්ම "ඔව්" යන්නයි. අනෙකුත් සියලුම අග්‍රේශයන්ගේ සංසර්ග ඉරියව්ව වන්නේ පිරිමි සතා ගැහැණු සතාගේ පසු පසින් සිටීමයි. පසු භාගය ඉහළට ඔසවන ගැහැණු සතා එය පිරිමියා දෙසට එල්ල කරයි. එය දකින පිරිමි සතා, ඇගේ පසුපසින් සංසර්ගයේ යෙදේ. සංසර්ගීය ක්‍රියාවලිය තුළදී සිරුරුවල ඉදිරිපස ගැටීමක් සිදු නොවන අතර, පිරිමියාගේ ලිංගික ප්‍රදේශය ගැහැණු සතාගේ නිතඹට තෙරපී සිටී. අපේ වර්ගයා ගේ තත්වය මෙයට හාත්පසින්ම වෙනස්ය. පූර්ව සංසර්ග කටයුතු ඉතා දීර්ඝ වේලාවක් මුහුණට මුහුණලා කෙරෙනවා පමණක් නොව, සංසර්ගය පවා මූලික වශයෙන් මුහුණට මුහුණලා කෙරෙන ක්‍රියාවලියකි.

මෙම අවසාන කරුණ පිළිබඳව විවිධ තර්ක ඉදිරිපත් වී ඇත. අපේ වර්ගයාගේ ස්වාභාවික සංසර්ගීය ක්‍රමය, මුහුණට මුහුණලා කෙරෙන සංසර්ගය යයිද, අන් සියලුම ක්‍රම එහි අනුවර්තන යයිද, යන අදහස බොහෝ කලක් තිස්සේ පැවති අදහසකි. මෑතක සිට මේ අදහස ගැන සැක පහළ කළ විද්‍යාඥයන් අපේ වර්ගයාට සංසර්ගය සඳහා මූලික ඉරියව්වක් නැතැයි පවසා ඇත. ගවේෂණාත්මක සත්ව වර්ගයක් ලෙස විවිධ ඉරියව් අත්හදා බැලීම ස්වාභාවික යැයිද, ඒවා ලිංගික ක්‍රියාවලියේ සංකීර්ණත්වය වැඩිකර, වැඩි තෘප්තියක් ලබා දෙන බැවින්, එම ක්‍රම වඩා සුදුසු යැයිද යන්න ඔවුන්ගේ මතය වී තිබේ. මෙම තර්කයේ සත්‍යයක් ඇති නමුත් එය ඉදිරිපත් කිරීමේ දී ඔවුන් වූවමනාවට වඩා දුර ගොස් ඇති බව පෙනේ.

Scanned by TapScanner

ඇත්ත වශයෙන්ම ඔවුන් විරුද්ධ වූයේ විවිධ ආකාරයට සංසර්ගයේ යෙදීම වරදක්ය යන මතයටයි. එම මතය බිඳ හෙළීම සඳහා විවිධ අනුවර්තනවල අගය ඔවුහු විදහා දැක්වූහ. යුගලක සාමාජිකයන් දෙදෙනා ලබන ලිංගික තෘප්තිය වැඩි වූ විට, යුගල බැම්ම ශක්තිමත් කිරීමට එය බොහෝ දුරට ආධාර වේ. ජීව විද්‍යාත්මකව මෙම අනුවර්තන හා විකරණවල කිසිම වරදක් දැකිය හැකි නොවේ. නමුත්, පැරණි දුර්මතය බිඳ දැමීමට ක්‍රියා කිරීමේදී, අපේ වර්ගයාට මූලික වූ ස්වාභාවික සංසර්ගීය ඉරියව්වක් ඇති බව ඔවුන්ට අමතක වී තිබේ. එය මුහුණට මුහුණලා සිටින ඉරියව්වයි. බැලූ බැල්මට මුහුණ, තොල් තනපුඩු, පියයුරු, ලිංගේන්ද්‍රිය ආදී ශෘංගාරාත්මක ප්‍රදේශ සියල්ලක්ම ඇත්තේ ශරීරයේ ඉදිරිපසය. සංසර්ගීය පූර්ව අවස්ථාවන්හිදී මුහුණට මුහුණලා සිටීමෙන් මෙම ඉන්ද්‍රියයන් ගේ ක්‍රියාකාරීත්වය හේතු කොට පිබිදීමෙන් පසුව, පුරුෂයාට ස්ත්‍රියගේ පසුපසින් සංසර්ගයේ යෙදිය හැකි යයි තර්ක කළ හැක. නව අත්හදා බැලීමේ ක්‍රමයක් ලෙස යොදා ගත හැකි නමුත් එහි අවාසි කීපයක්ම තිබේ. පළමුවෙන්ම යුගල වශයෙන් බැඳෙන අපේ වර්ගයාට ලිංගික හවුල්කරුගේ අනන්‍යතාව ඉතා වැදගත් වේ. මුහුණට මුහුණලා සිටීම නිසා ලිංගික සංඥාවන්ගෙන් ලැබෙන තෘප්තිය ඒ ඒ සහකරු සමඟ බැඳී පවතී. ශෘංගාරාත්මක ප්‍රදේශවලින් එන පූර්ව සංසර්ග ස්පර්ශ සංවේදයන් මුහුණට මුහුණලා සංසර්ගයේ යෙදීමෙන් සංසර්ගීය අවදියේදීත් ලබාගත හැකිවේ. වෙනත් ඉරියව්වක් යොදාගැනීම නිසා මෙම සංවේදයන් බොහෝමයක්ම නොලැබී යනු ඇත. එපමණක් නොව, ශ්‍රෝණී තෙරපීම්වලින් ස්ත්‍රියගේ භගමණිය වඩාත් උත්තේජනය කළ හැකි වන්නේ මුහුණට මුහුණලා සංසර්ගයේ යෙදීමෙනි.

වෙනත් ක්‍රමවලට සංසර්ගයේ යෙදීමෙන් ද භගමණිය උත්තේජනය වන නමුත්, මුහුණට මුහුණලා කරන සංසර්ගයේ දී එම උත්තේජනය ඉතා අධික වෙයි. අවසාන වශයෙන් සඳහන් කළ යුතු වන්නේ අනිකුත් වානර වර්ග සමඟ සසඳන විට, අපේ ස්ත්‍රීන්ගේ යෝනි මාර්ගය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉදිරිපසට නැමී ඇති බවයි. කෙළින් ගමන් කිරීම නිසා සිදුවිය

හැකි ප්‍රමාණයට වැඩියෙන් එය ඉදිරියට පැමිණ ඇත. පසුපසින් සංසර්ගයේ යෙදීම වඩාත් ප්‍රයෝජනවත් වූයේ නම්, ස්වාභාවික වරණයේ ක්‍රියාකාරීත්වයෙන් යෝනි මාර්ගය මෙයට වඩා පසු පසින් පිහිටන ලෙස කටයුතු සිදුවනු ඇත.

මුහුණට මුහුණ ලා සිදු කරන සංසර්ගය මේ නිසා අපේ වර්ගයාගේ මූලික සංසර්ගීය ක්‍රමය ලෙස සැලකිය හැකිය. බොහෝ විට මෙය ගැහැනියට ඉහළින් පිරිමියා සිටින ආකාරයට සිදු වුවද, ගැහැනිය ඉහළින් හෝ පැත්තෙන් ආදී වශයෙන් විවිධ අනුවර්තන තිබිය හැකි වේ. ඇමරිකානු සමීක්ෂණවලින් පෙනී යන්නේ, ජනගහණයෙන් සියයට හැත්තෑවක් පමණ යොදා ගන්නේ මෙම ඉරියව්ව බවයි. ඉරියව්ව වෙනස් කරන අය පවා වැඩි වශයෙන් මෙම මූලික ඉරියව්ව යොදා ගනිති. පසුපසින් සංසර්ගයේ යෙදෙන්නේ සියයට දහයටත් අඩු ප්‍රමාණයකි. ලෝකය පුරා විවිධ සමාජ දෙසීයක් පමණ ගෙන කරන ලද සමීක්ෂණයක දී පෙනී ගියේ, ස්ත්‍රියගේ පසුපසින් පුරුෂයා සංසර්ගයේ යෙදීම සාමාන්‍ය භාවිතයක් ලෙස සිදු නොවන බවයි.

මෙම මූලික කරුණ ගැන එකඟ විය හැකි නම් අපට දැන් ලිංගික ස්වයංඅනුකරණය පිළිබඳ මුල් ප්‍රශ්නය ගැන සාකච්ඡා කළ හැකියි. නිරුවත් වානර ගැහැනිය ගේ ඉදිරිපස ගැන පුරුෂයා උනන්දු කරවීමට නම් එය වඩා හොඳ උත්තේජනයක් සපයන ආකාරයට එහි පරිණාමීය වෙනසක් සිදුවිය යුතුය. අපේ පරිණාමීය ඉතිහාසයේ එක් අවස්ථාවක අපිත්, අනිකුත් වානරයන් මෙන් පසුපසින් සංසර්ගයේ යෙදෙන්නට ඇත. ඒ කාලයේ ගැහැනිය පිරිමියාට ලිංගික සංඥා දක්වන්නට ඇත්තේ, (අනෙක් අග්‍රේශයන් ගේ දැකිය නොහැකි) මස් පිරුණු අර්ධ ගෝලාකාර නිතඹින් හා දීප්තිමත් රතු පැහැයෙන් යුත් ලිංගික අධර වලිනි. මෙම සංඥාවන්ට ප්‍රතිචාර දැක්වීමට පිරිමියා පුරුදුව සිටින්නට ඇත. පරිණාමයේ මේ අවස්ථාවේ දී අපේ වර්ගයා, වඩා කෙළින් ඇවිදීමටත්, එකිනෙකා හමුවීමේදී මුහුණට මුහුණලා සිටීමටත් පටන් ගත්තේ නම්, ගෙලඩා බැබුන් ගේ දක්නට ලැබෙන

Scanned by TapScanner

ආකාරයේ ස්වයංඅනුකරණයක් අපට ද සිදුවිය යුතුය. අපේ ස්ත්‍රී වර්ගයාගේ අර්ධ ගෝලාකාර නිතඹ හා රතු අධරවල අනුකරණ ශරීරයේ ඉදිරිපස දැකිය හැකිද? ඉදිරියට නෙරා ඇති අර්ධ ගෝලාකාර පියයුරු හා රතු තොල්, නිතඹ හා රතු අධරවල අනුකරණයක් බවට කිසිම සැකයක් නැත. ලිංගික පිබිදීමේදී මුඛයේ තොල් මෙන් යෝනි අධර ද පිම්බී දීප්තිමත් වර්ණයක් ගන්නා බැවින්, ඒවායේ පෙනුම එක සමාන වනවා පමණක් නොව, ලිංගික පිබිදීමේදී එකම ආකාරයට හැසිරෙන බවද පෙනේ.

නිතඹේ හා අධරවල පිටපතක් ශරීරයේ ඉදිරිපස ඇති කිරීමෙන්, පසුපසින් ලිංගික ප්‍රතිචාර දැක්වීමට පුරුදුව සිටි පුරුෂයා ඉදිරිපසින් ආකර්ෂණය කර ගැනීමට මේ නිසා හැකිවී තිබේ. (තොල් සායම් හා තනපට භාවිතය ගැන මෙහිදී මතකයට නැගෙන නමුත් වර්තමාන ශිෂ්ටාචාරයේ විශේෂ ලිංගික උපක්‍රම ගැන ලියැවෙන විට, ඒ ගැන සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.)

ඉතා වැදගත් දෘෂ්ටිමය සංඥාවන්ට අමතරව, ලිංගික කාර්යයක් ඉටුකරන ගන්ධ උත්තේජනයන්ද දක්නට ලැබෙයි. අපේ පරිණාමයේදී ආඝ්‍රාණ සංවේදිතාව බොහෝ අඩුවී ඇතත්, එය සැලකිය යුතු තරමට කාර්යක්ෂම වන අතර ලිංගික ක්‍රියාවල දී වැඩිපුර ක්‍රියාත්මක වෙයි. එක් එක් අයට විශේෂ වූ ශරීර ගන්ධයන් ඇති අතර යුගල සෑදීමේ හා ආදරයෙන් බැඳීමේ ක්‍රියාවලියේ එක් කොටසක් සමන්විත වන්නේ හවුල්කරුගේ ශරීර ගන්ධයට ආකර්ෂණය වී එයට ස්ථිර වශයෙන් බැඳී සිටීම හෙවත් ආඝ්‍රාණ කා වැදීමකින් යයි අදහසක් ඉදිරිපත්වී තිබේ. මෙය හා සම්බන්ධ තවත් සොයා ගැනීමක් නම්, වැඩිවියට පැමිණීමත් සමඟ ආඝ්‍රාණ අභිප්‍රේතයන්හි පැහැදිලි වෙනසක් සිදුවීමයි. වැඩිවියට පත්වීමට පෙර පැණි රස හා පලතුරු ආඝ්‍රාණයන්ට වැඩි කැමැත්තක් දක්වන නමුත්, ලිංගික වර්ධනය සම්පූර්ණවීමත් සමඟ පුෂ්පමය, තෙලමය හා කස්තුරි සුවඳට වැඩි කැමැත්තක් දක්වන බව පෙනේ. වාතය කොටස් අසූ ලක්ෂයක කස්තුරි

කොටසක් තිබුණේ නම් එය අපේ වර්ගයාගේ වැඩි දෙනෙකුට හඳුනා ගත හැකි වේ.

අපේ සිරුරේ එතරම් විශාල ගන්ධ නිපදවන ග්‍රන්ථීන් නැතත් අපසර්ග ග්‍රන්ථී නම් කුඩා ඒවා විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ. මේවා සාමාන්‍යයෙන් ස්වේද ග්‍රන්ථීවලට සමාන වන නමුත්, එහි ස්‍රාවයේ ඝන ද්‍රව්‍ය කොටස් වැඩිපුර දක්නට ලැබේ. ශරීරයේ කොටස් කීපයකම මේවා දැකිය හැකි අතර වැඩිපුර ඇත්තේ කිහිලි හා ලිංග ප්‍රදේශවලය. මෙම ස්ථානවල වැඩෙන රෝම හේතුකොට ගෙන මෙම ප්‍රදේශවල ගන්ධ නිෂ්පාදනය වැඩි වෙතැයි අදහසක් ඉදිරිපත් කොට ඇතත් ඒ පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් කර නැත. කෙසේ වෙතත් අපේ ස්ත්‍රී වර්ගයාගේ, පුරුෂයන්ට වැඩියෙන් අපසර්ග ග්‍රන්ථී සියයට 75 ක් පමණ ඇති බව දනිමු. පහත් ක්ෂීරපායීන් ගේ ලිංගික ක්‍රියාවලදී, ගැහැණු සතා පිරිමි සතාගේ ඉව අල්ලනවාට වැඩියෙන්, පිරිමි සතා ගැහැණු සතාගේ ඉව ඇල්ලීම ද මෙහි දී සඳහන් කළ යුතු කරුණකි.

අපේ විශේෂ ගන්ධ නිපදවන ප්‍රදේශවල පිහිටීම, ඉදිරිපසින් ලිංගික සංසර්ගය සඳහා වූ තවත් අනුවර්තනයකි. අනිකුත් සත්වයන්ගේ මෙන් ලිංගික ප්‍රදේශවල මේවා දක්නට ලැබීම පුදුමයට කරුණක් නොවන නමුත්, කිහිලිවල මෙම ග්‍රන්ථී තිබීම බලාපොරොත්තු විය නො හැක්කකි. අපේ වර්ගයාගේ දක්නට ලැබෙන ශරීරයේ ඉදිරිපසට විවිධ ලිංගික උත්තේජන මධ්‍යස්ථාන එක් කිරීමේ පොදු ලක්ෂණයට මෙය සම්බන්ධ බව පෙනේ. මේ නිසා පූර්ව සංසර්ග හා සංසර්ග ක්‍රියාවන්හි වැඩි කාලයක් තුළදී සහකරුගේ නාසය ප්‍රධාන ගන්ධ නිපදවන ප්‍රදේශයකට ආසන්නව තැබීම සිදුවී ඇත.

මේ දක්වා අප සලකා බැලුවේ යුගල බැම්මෙන් බැඳුණු නිරුවත් වානරයන් දෙදෙනාගේ යුගල බැම්ම ශක්තිමත් වන ලෙස ලිංගික හැසිරීම් රටාව දියුණු වූ ආකාරය පිළිබඳවයි. ලිංගික කටයුතු පරිපූර්ණ අවස්ථාවකින් අවසන්වන බැවින්, මෙහිදී ද යම් යම් වෙනස්කම් කළ යුතු වෙයි. මොහොතකට

Scanned by TapScanner

ආකාරයේ ස්වයංඅනුකරණයක් අපට ද සිදුවිය යුතුය. අපේ ස්ත්‍රී වර්ගයාගේ අර්ධ ගෝලාකාර නිතඹ හා රතු අධරවල අනුකරණ ශරීරයේ ඉදිරිපස දැකිය හැකිද? ඉදිරියට නෙරා ඇති අර්ධ ගෝලාකාර පියයුරු හා රතු තොල්, නිතඹ හා රතු අධරවල අනුකරණයක් බවට කිසිම සැකයක් නැත. ලිංගික පිබිදීමේදී මුඛයේ තොල් මෙන් යෝනි අධර ද පිම්බී දීප්තිමත් වර්ණයක් ගන්නා බැවින්, ඒවායේ පෙනුම එක සමාන වනවා පමණක් නොව, ලිංගික පිබිදීමේදී එකම ආකාරයට හැසිරෙන බවද පෙනේ.

නිතඹේ හා අධරවල පිටපතක් ශරීරයේ ඉදිරිපස ඇති කිරීමෙන්, පසුපසින් ලිංගික ප්‍රතිචාර දැක්වීමට පුරුදුව සිටි පුරුෂයා ඉදිරිපසින් ආකර්ෂණය කර ගැනීමට මේ නිසා හැකිවී තිබේ. (තොල් සායම් හා තනපට භාවිතය ගැන මෙහිදී මතකයට නැගෙන නමුත් වර්තමාන ශිෂ්ටාචාරයේ විශේෂ ලිංගික උපක්‍රම ගැන ලියැවෙන විට, ඒ ගැන සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.)

ඉතා වැදගත් දෘෂ්ටිමය සංඥාවන්ට අමතරව, ලිංගික කාර්යයක් ඉටුකරන ගන්ධ උත්තේජනයන්ද දක්නට ලැබෙයි. අපේ පරිණාමයේදී ආඝ්‍රාණ සංවේදිනාව බොහෝ අඩුවී ඇතත්, එය සැලකිය යුතු තරමට කාර්යක්ෂම වන අතර ලිංගික ක්‍රියාවල දී වැඩිපුර ක්‍රියාත්මක වෙයි. එක් එක් අයට විශේෂ වූ ශරීර ගන්ධයන් ඇති අතර යුගල සෑදීමේ හා ආදරයෙන් බැඳීමේ ක්‍රියාවලියේ එක් කොටසක් සමන්විත වන්නේ හවුල්කරුගේ ශරීර ගන්ධයට ආකර්ෂණය වී එයට ස්ථිර වශයෙන් බැඳී සිටීම හෙවත් ආඝ්‍රාණ කා වැදීමකින් යයි අදහසක් ඉදිරිපත්වී තිබේ. මෙය හා සම්බන්ධ තවත් සොයා ගැනීමක් නම්, වැඩිවියට පැමිණීමත් සමඟ ආඝ්‍රාණ අභිප්‍රේතයන්හි පැහැදිලි වෙනසක් සිදුවීමයි. වැඩිවියට පත්වීමට පෙර පැණි රස හා පලතුරු ආඝ්‍රාණයන්ට වැඩි කැමැත්තක් දක්වන නමුත්, ලිංගික වර්ධනය සම්පූර්ණවීමත් සමඟ පුෂ්පමය, තෙලමය හා කස්තුරි සුවඳට වැඩි කැමැත්තක් දක්වන බව පෙනේ. වානය කොටස් අසූ ලක්ෂයක කස්තුරි කොටසක් තිබුණේ නම් එය අපේ වර්ගයාගේ වැඩි දෙනෙකුට හඳුනා ගත හැකි වේ.

අපේ සිරුරේ එතරම් විශාල ගන්ධ නිපදවන ග්‍රන්ථීන් නැතත් අපසර්ග ග්‍රන්ථී නම් කුඩා ඒවා විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ. මේවා සාමාන්‍යයෙන් ස්වේද ග්‍රන්ථීවලට සමාන වන නමුත්, එහි ස්‍රාවයේ ඝන ද්‍රව්‍ය කොටස් වැඩිපුර දක්නට ලැබේ. ශරීරයේ කොටස් කීපයකම මේවා දැකිය හැකි අතර වැඩිපුර ඇත්තේ කිහිලි හා ලිංග ප්‍රදේශවලය. මෙම ස්ථානවල වැඩෙන රෝම හේතුකොට ගෙන මෙම ප්‍රදේශවල ගන්ධ නිෂ්පාදනය වැඩි වෙතැයි අදහසක් ඉදිරිපත් කොට ඇතත් ඒ පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් කර නැත. කෙසේ වෙතත් අපේ ස්ත්‍රී වර්ගයාගේ, පුරුෂයන්ට වැඩියෙන් අපසර්ග ග්‍රන්ථී සියයට 75 ක් පමණ ඇති බව දනිමු. පහත් ක්ෂීරපායින් ගේ ලිංගික ක්‍රියාවලදී, ගැහැණු සතා පිරිමි සතාගේ ඉව අල්ලනවාට වැඩියෙන්, පිරිමි සතා ගැහැණු සතාගේ ඉව ඇල්ලීම ද මෙහි දී සඳහන් කළ යුතු කරුණකි.

අපේ විශේෂ ගන්ධ නිපදවන ප්‍රදේශවල පිහිටීම, ඉදිරිපසින් ලිංගික සංසර්ගය සඳහා වූ තවත් අනුවර්තනයකි. අනිකුත් සත්වයන්ගේ මෙන් ලිංගික ප්‍රදේශවල මේවා දක්නට ලැබීම පුදුමයට කරුණක් නොවන නමුත්, කිහිලිවල මෙම ග්‍රන්ථී තිබීම බලාපොරොත්තු විය නො හැක්කකි. අපේ වර්ගයාගේ දක්නට ලැබෙන ශරීරයේ ඉදිරිපසට විවිධ ලිංගික උත්තේජන මධ්‍යස්ථාන එක් කිරීමේ පොදු ලක්ෂණයට මෙය සම්බන්ධ බව පෙනේ. මේ නිසා පූර්ව සංසර්ග හා සංසර්ග ක්‍රියාවන්හි වැඩි කාලයක් තුළදී සහකරුගේ නාසය ප්‍රධාන ගන්ධ නිපදවන ප්‍රදේශයකට ආසන්නව තැබීම සිදුවී ඇත.

මේ දක්වා අප සලකා බැලුවේ යුගල බැම්මෙන් බැඳුණු නිරුවත් වානරයන් දෙදෙනාගේ යුගල බැම්ම ශක්තිමත් වන ලෙස ලිංගික හැසිරීම් රටාව දියුණු වූ ආකාරය පිළිබඳවයි. ලිංගික කටයුතු පරිපූර්ණ අවස්ථාවකින් අවසන්වන බැවින්, මෙහිදී ද යම් යම් වෙනස්කම් කළ යුතු වෙයි. මොහොතකට

Scanned by TapScanner

නැවතත් පැරණි අග්‍රේශයන් දෙස හැරී බලමු. වැඩිහිටි පිරිමි සතාට, ශුක්‍රාණු නිකුත් කළ විගසම හැරෙන්නට, සාමාන්‍යයෙන් අන් හැම වේලාවකම ලිංගික වශයෙන් ක්‍රියාකාරී විය හැකිය.

මේ නිසා නැවතත් ශුක්‍රාණු සෑදෙන තෙක් ලිංගික ආශාව හීන කරන පරිපූරණ උච්චාවස්ථාවක් තිබීම ඔහුට ප්‍රයෝජනවත් වේ. අනිත් අතට ගැහැණු සතා ලිංගික වශයෙන් ක්‍රියාකාරී වන්නේ ඩිම්බ මෝචනය සිදුවන කාලයක් තුළ පමණි.

මෙම කාලය තුළ ඕනෑම වේලාවක පිරිමි සතා පිළිගැනීමට ඇය සූදානම්ය. වැඩි වැඩියෙන් සංසර්ගයේ යෙදීම සංසේචනය සිදුවන බව සහතික කළ හැකි එකම ක්‍රමයයි. උච්චාවස්ථාවකට පත්වී, ලිංගික තෘප්තියක් ලබා, ආශාවන් හීනවීමක් ඔවුන් තුළ දක්නට නොලැබේ. මේ කාලය තුළදී ඔවුන් සෑම මොහොතකින්ම හැකි තරම් ප්‍රයෝජන ගත යුතුය. ඇයද පිරිමි සතා මෙන් උච්චාවස්ථාවකට පත්වූවා නම්, සංසර්ගයේ යෙදිය හැකි කාලය අඩුවනු ඇත. සංසර්ගය අවසානයේ ශුක්‍රාණු පිට කර, පිරිමි සතා බිමට බැසීමෙන් පසු වැදිරිය හැඟීම් අතින් වෙනසක් නොපෙන්වා කිසිවක් නොවූවා සේ අනිකුත් කටයුතුවල යෙදෙයි.

යුගල වශයෙන් බැඳෙන අපේ වර්ගයාගේ තත්වය මෙයට හාත්පසින්ම වෙනස්ය. ගැහැණිය ලිංගික ක්‍රියාවල යෙදෙන්නේ එක් පිරිමියෙකු සමඟ පමණක් බැවින්, පිරිමියා ලිංගික වශයෙන් ක්‍රියාකාරී නොවන අවස්ථාවල, ගැහැනිය ලිංගික ග්‍රාහකත්වයක් පෙන්වීමේ විශේෂ වාසියක් නැත. මේ අනුව ස්ත්‍රිය උච්චාවස්ථාවකට පත්වීමෙන් පාඩුවක් සිදු නොවේ. එකක් නම්, සහකරු සමඟ ලිංගික වශයෙන් සහයෝගයෙන් ක්‍රියාකිරීමෙන්, ලබන අතිමහත් සතුටයි. මෙය පවුල් ඒකකය පවත්වා ගැනීමටත්, යුගල බන්ධනය ශක්තිමත් කිරීමටත් උපකාරී වනු ඇත. අනික් හේතුව නම්, මේ නිසා සංසේචනය වීමේ ඉඩ කඩ සැලකිය යුතු ප්‍රමාණයකින්

වැඩිවීමයි. මෙය සිදුවී ඇත්තේ අපේ වර්ගයාට පමණක් විශේෂ වූ ක්‍රමයකිනි. මේ කරුණු අවබෝධ කර ගැනීම සඳහා, නැවතත් අපි අපේ අග්‍රේශ නෑයන් දෙස බැලිය යුතු වෙමු. වැදිරියකගේ සිරුරට වඳුරකු ශුක්‍රාණු ඇතුල් කළ විට, එය ඇගේ යෝනි මාර්ගයේ ඇතුළු කොටසේ රැඳෙන බැවින්, ආපසු පිටතට ඒමක් ගැන බිය විය යුතු නැත. වැදිරිය කකුල් හතරෙන් ගමන් කරන බැවින්, ඇයගේ යෝනි මාර්ගය බොහෝ දුරට තිරස්ව පිහිටා තිබේ. අපේ ස්ත්‍රී වර්ගයා, වැදිරිය මෙන් සංසර්ගීය ක්‍රියාවේදී උච්චාවස්වකට පත් නොවූවා නම්, ඇය ද එය අවසන් වූ වහාම වැදිරිය මෙන් නැගිට ගමන් කරනු ඇත. කකුල් දෙකෙන් කෙළින් ගමන් කරන ඇ, ඇවිදින විට යෝනි මාර්ගය පිහිටන්නේ සිරස් අතටයි. සාමාන්‍ය ගුරුත්වය හේතුකොට ගෙන ශුක්‍රාණු ද්‍රව්‍ය පහළට ගලා ඒමෙන්, එයින් විශාල කොටසක් මේ නිසා අපතේ යනු ඇත. පිරිමියාගේ ශුක්‍රාණු මෝචනයෙන් පසුව ස්ත්‍රිය තිරස්ව තබා ගන්නා ඕනෑම ක්‍රියාවක් මේ නිසා ප්‍රයෝජනවත් වන බව කිවයුතු නොවේ. ස්ත්‍රිය ලිංගික වශයෙන් තෘප්තිමත් වී, විඩාවට පත්වන උච්චාවස්ථාවකට එළඹීමේ ප්‍රතිඵලය වන්නේ, ඇය සෑහෙන කාලයක් තිරස් ඉරියව්වේ පසුවීමයි. එහෙයින් අපේ වර්ගයාගේ ස්ත්‍රිය උච්චාවස්ථාවකට පත්වීමේ, ද්විත්ව වටිනාකමක් ඇති බව පෙනේ.

අපේ වර්ගයා ගේ ස්ත්‍රීන්, ලිංගික උච්චාවස්ථාවකට පත්වීම අග්‍රේශයන් අතර අද්විතීය ලක්ෂණයක් වීමත්, එය පුරුෂයාගේ උච්චාවස්ථා රටාවට කායික වශයෙන් සමාන වීමත් යන කරුණු නිසා, පරිණාමීය වශයෙන් සලකන විට, එය ව්‍යාජ පුරුෂ ප්‍රතිචාරයක් ලෙස සැලකිය හැකිය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය තුළම, අනික් වර්ගයාට අයත් වන ගුප්ත ලක්ෂණ පිහිටා ඇත. අවශ්‍ය නම් මෙම ගුප්ත ලක්ෂණ ඉදිරියට ගෙන දියුණු කිරීමට (වැරදි ලිංගයේ) පරිණාමීය ක්‍රියාවලියට හැකි බව අනිකුත් සත්ව කණ්ඩායම්වල සංසන්දනාත්මක අධ්‍යයනයන් ගෙන් පෙනී ගොස් තිබේ. අපේ වර්ගයාගේ ස්ත්‍රියගේ භගමණියද, ලිංගික වශයෙන් උත්තේජනය කළ හැකි බව අපි දනිමු. මෙය පුරුෂ ශිශ්නයේ සම්ප්‍රභවය හෝ

Scanned by TapScanner

ප්‍රතිරූපකය බව සිතන විට, අඩුම වශයෙන් ආරම්භයේදී වත් ස්ත්‍රී ලිංගික උච්චාවස්ථාව, පුරුෂ ලිංග රටාවෙන් ණයට ගත්තක් බව පෙනේ.

අපේ පුරුෂයන්ට අග්‍රේශයන් අතුරෙන් විශාලම පුරුෂ ලිංගය (ශිශ්නය) ඇත්තේ මන්ද යන්න, මෙයින් පැහැදිලි කිරීමට පුළුවන. එය ප්‍රාණවත් වූ විට ඉනාම දිහු එකක් වනවා පමණක් නොව, අනිකුත් සතුන් සමඟ සසඳන විට, ඉතා මහත් අවයවයක් ද වේ. ශිශ්නය මහත්වීමේ ප්‍රතිඵලය වන්නේ ස්ත්‍රියගේ බාහිර ලිංගේන්ද්‍රියන්, ශ්‍රෝණි තෙරපීම්වල දී බොහෝ ඇදීම් තෙරපීම්වට භාජනය වීමයි. ශිශ්නය ඇතුළට තෙරපීමේ දී, භගමණිය පහළට ඇදෙන අතර, එය පිටතට ගැනීමේදී එම ප්‍රදේශය ඉහළට ඇදේ. ඉදිරිපසින් සංසර්ගයේ යෙදෙන පිරිමියාගේ ශ්‍රෝණි ප්‍රදේශයෙන් භගමණිය නැවත නැවතත් පිරිමැදීමට භාජනය වේ. ඈ පිරිමියෙකු නම්, මෙය ස්වයං මෛථුනයේ යෙදීමකට සමාන වනු ඇත.

මේ අනුව නිරුවත් වානරයාගේ කාමුක බව වැඩි කිරීමටත් යුගල සෑදීම වැනි මූලික රටාවක් සාර්ථක ලෙස පරිණාමය වීම සහතික කිරීමටත්, හැකි සෑම දෙයක්ම කර ඇතැයි සඳහන් කරමින් මෙම තත්වය පිඬුකොට දැක්විය හැකිය. වෙනත් ක්ෂීරපායි කණ්ඩායම්වල මෙවැනි යුගල සෑදීමක් දක්නට නොලැබේ. නමුත් මෙම නව නැම්ම ආරම්භ කිරීමේ දුෂ්කරතා තවම සම්පූර්ණයෙන් මඟ හරවා ගෙන නැත. එකිනෙකාට ආධාර කරමින් දරුවන් හදා වඩාගෙන, එකට ජීවත්වන, අපේ නිරුවත් වානර යුගල දෙස බැලූ විට, සියල්ල හොඳින් සිදුවී ඇතැයි පෙනේ. නමුත් ළදරුවන් ක්‍රමයෙන් වැඩිවියට පත්වනු ඇත. පැරණි අග්‍රේශ රටාවන් වෙනස් නොකොට තිබුණේ නම් පිරිමි සතා, තරුණ පිරිමින් එලවා, තරුණ ගැහැණුන් සමඟ සහවාසයේ යෙදෙනු ඇත. දූවරු ද මේ අනුව පැටවුන් ඇතිකරන අලුත් ඒකක ලෙස පවුලට එකතු වෙති. තවද, තරුණ පිරිමි වෙනත් අග්‍රේශ වර්ගවල මෙන් සමාජයේ පහත් තත්වයකට පත් වන්නන් නම්, පිරිමින් ගෙන් පමණක් සෑදුණු දඩයම් කණ්ඩායමේ සහයෝගිතා සමූපකාර

ස්වභාවයට හානි සිදුවන බව කිව යුතු නොවේ.

මේ නිසා නිරුවත් වානරයාගේ ප්‍රජනන ක්‍රියාවලියේ යම්කිසි අතිරේක අනුවර්තනයක් සිදුවීම අවශ්‍ය වූ බව පැහැදිලිව පෙනේ. යුගල බන්ධන ක්‍රමයේ පැවැත්ම සඳහා පුතුන්ද, දූවරුන්ද, පිටස්තර සහකරුවන් සොයා ගත යුතුය. යුගල සාදන වර්ගයකට මෙය එතරම් අසාමාන්‍ය දෙයක් නොවන අතර, මෙවැනි උදාහරණ පහත් ක්ෂීරපායීන් ගේ කොතෙකුත් දක්නට ලැබේ. නමුත් අග්‍රේශයන් ගේ සමාජ සංවිධානය හේතුකොට ගෙන, එය වඩා දුෂ්කර වී ඇත. බොහෝ යුගල සාදන සත්ව වර්ගවල පැටවුන් වැඩුණු විට ඔවුහු විසිරී යති. නමුත් සමූපකාර සමාජීය හැසිරීම් රටාව නිසා නිරුවත් වානරයාට මෙසේ විසිර යා නොහැක.

මෙම ප්‍රශ්නය විසඳා ඇත්තේ ද මූලික වශයෙන් එකම ආකාරයකටයි. අන් සියලුම යුගල සාදන සත්වයන් මෙන් අපේ ද දෙමාපියෝ එකිනෙකා පිළිබඳ අයිතියක් දක්වති. මවට ලිංගික වශයෙන් පියා අයිති වන අතර, පියාට මව අයිති වේ. පැටවුන් වැඩිවියට පත්වූ විට, ඔවුන් තම ලිංගික සංඥා නිකුත් කිරීම ඇරඹීමත් සමඟ පුත්තු පියාගේත්, දූවරු මවගේත් ලිංගික විරුද්ධවාදීන් බවට පත්වෙති. මේ නිසා දූවරුන් හා පුතුන් යන දෙගොල්ලම පවුලෙන් ඵලවීමට කටයුතු කෙරෙනු ඇත. පැටවුන්ට ද මේ සමඟම තමාගේ නිවසක් සහිත ප්‍රදේශයක් අවශ්‍ය වනු ඇත. පැටවුන් ඇති කිරීමටත්, නිවසක් පිහිටුවීමටත් දෙමාපියන් තුළ ද මෙයට සමාන ආශාවක් නිබෙන්නට ඇත. දැන් සිදුවන්නේ මෙම ක්‍රියාදාමය නැවතත් සිදුවීමකි. දෙමාපිය නිවස, මව හා පියාට අයිති තැනක් හා ඔවුන් ප්‍රමුඛත්වය දරන තැනක් වන බැවින්, එය තරුණ පැටවුන්ට නොගැලපේ. වැඩිවියට පත්වන දරුවෝ මෙයින් පිටව අලුත් ස්ථානයක් පිහිටුවා ගනිති.

මෙය, ප්‍රදේශයන්ට අයිතිය පෙන්වන තරුණ මාංශභක්ෂකයන් ගේ ලක්ෂණයක් වන නමුත්, තරුණ අග්‍රේශයන් ගේ දක්නට නොලැබෙන්නකි. නිරුවත් වානරයාට

Scanned by TapScanner

තම හැසිරීම් රටාවේ කිරීමට සිදුවූ මූලික විපර්යාසයක් වූයේ මෙයයි.

තම පවුලෙන් පිට සතුන් සමඟ පමණක් සහවාසයේ යෙදීම ව්‍යභිචාරී තත්ත්වයක් ලෙස දැක්වීම අවාසනාවන්ත දෙයකි. මේ නිසා එය මෑතක දී සිදුවූ, සංස්කෘතික වශයෙන් පාලනය කරනු ලැබූ සංසිද්ධියක් බවට හැඟීමක් ඇතිවේ. නමුත් මෙය ඊට බොහෝ කලින් ජීවමය අවශ්‍යතාවන් නිසා ඇති වූවක් විය යුතුය. එසේ නැතිව අග්‍රේශ පසුබිමෙන් ඉදිරියට ගොස් දියුණු වීමට අපේ වර්ගයා ගේ අභිජනන පද්ධතියට කිසිදාක හැකි නොවනු ඇත.

අපේ වර්ගයා ගේ පමණක් දක්නට ලැබෙන තවත් මේ හා සම්බන්ධ ලක්ෂණයක් නම්, ස්ත්‍රියගේ කුමාරිච්ඡදය හෙවත් කන්‍යා භාවය රැඳී තිබීමයි. පහත් ක්ෂීරපායීන්ගේ මෞත්‍ර-ලිංගික පද්ධතිය, පරිණාමයේදී කලල අවස්ථාවක් ලෙස මෙය ඇති වන නමුත්, නිරුවත් වානරයාගේ විරශිශ්‍රකතාවයේ එක් කොටසක් වශයෙන් වැඩිහිටි කාලය දක්වා එය පවතී. මේ නිසා ස්ත්‍රියගේ, ජීවිතයේ මුල් සංසර්ගය තරමක් දුෂ්කර වනු ඇත. ගැහැනිය ගේ ලිංගික ග්‍රාහකතාව වැඩි කිරීමට හැකි සෑම දෙයක්ම පරිණාමීය ක්‍රියාවලියෙන් සිදු වෙද්දී, ප්‍රති-සංසර්ග උපකරණයක් ලෙස හැදින්විය හැකි යමක් තිබීම පුදුමයට කරුණක් බව බැලූ බැල්මට පෙනේ. නමුත් මෙය පෙනෙන තරම් පරස්පර විරෝධී තත්වයක් නොවේ. මුල් සංසර්ග ක්‍රියාව දුෂ්කර මෙන්ම වේදනාකාරී එකක් කිරීමෙන් පහසුවෙන් හෝ වැඩි සිතා බැලීමකින් තොරව එහි නියැළීම මේ නිසා වැළකේ. වැඩිවියට පත්වීමත් සමඟ සුදුසු සහකරුවන් සොයා ලිංගික අත්හදා බැලීම්වල යෙදෙන කාල පරිච්ඡේදයක් ඇති බව පෙනේ. පූර්ණ සංසර්ගයෙන් හැර ඊට අඩු දෙයකින් තෘප්තිමත් වීමට තරුණ පිරිමින්ට හේතුවක් නැත. යුගල බැම්මක් ඇති නොවූවහොත් ඔවුන්ට සුදුසු සහකාරියක ලැබෙන තුරු මෙය කළ හැකි වේ. නමුත් තරුණ ස්ත්‍රීන් යුගල නොසෑදී මේ ආකාරයට ලිංගික ක්‍රියාවල යෙදුන හොත්, ඔවුන්ට සහකරුවකු නොමැතිව තනිවම මවක ලෙස කටයුතු කිරීමට

සිදුවේ. මුල් ශාරීරික අපහසුව විඳ දරාගත හැකි තරම් ප්‍රබල හැඟීමක් වර්ධනයවීම අවශ්‍යතාවක් බවට පත්කිරීමෙන්, කුමාරිච්ඡදය ස්ත්‍රියට මෙවැනි තත්වයක් ඇතිවීම වළක්වා තිබේ.

"ඒක භාර්යා" හා බහු භාර්යා" සේවනය පිළිබඳ ප්‍රශ්නය ගැනද මෙහිදී වචනයක් සඳහන් කළ යුතුය. අපේ වර්ගයාගේ දක්නට ඇති යුගල බන්ධනය "ඒක භාර්යා" සේවනයට අනුග්‍රහ දක්වන නමුත්, යුගල බන්ධනය සඳහා එය අත්‍යවශ්‍යම දෙයක් නොවේ. භයානක දඩයම්කාරී ජීවන රටාව හේතුකොට ගෙන පිරිමියකු ගැහැනුන් කීප දෙනෙකු සමඟ යුගල බන්ධන ඇතිකරනු ඇත. වැඩිපුර ඇති ගැහැනුන්ගේ ප්‍රශ්නය ද විසඳමින් උත්පත්ති සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩිකිරීමට එය උපකාරී වෙයි. යුගල සෑදීමේ ලක්ෂණය ඉතා ප්‍රබල වී මෙවැන්නක් සිදුවීම වැළැක්වූයේ නම්, මෙම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව අඩුවන බව කිවයුතු නොවේ. ස්ත්‍රීන් තුළ ඇති, අයිතිකර ගැනීමේ ආශාව නිසා මෙවැන්නක් සිදුවීම පහසු කටයුත්තක් නොවන්නට ඇත.

එවැන්නකට විරුද්ධ වූ අනික් කරුණ වන්නට ඇත්තේ, විශාල පවුලක් පවත්වා ගැනීමේ මූලික ආර්ථික ප්‍රශ්නයයි. මේ නිසා බහු භාර්යා සේවනය සුළු වශයෙන් තිබිය හැකි නමුත් බොහෝ දුරට සීමා කෙරෙනු ඇත. කුඩා සංස්කෘතීන් කීපයක මෙවැන්නක් තවම දැකිය හැකි නමුත්, ප්‍රධාන සමාජ සියල්ලම, ඒක භාර්යා සේවනයට හැඩ ගැසී තිබේ. "බහු භාර්යා" සේවනයට ඉඩ දෙන සමාජයන්හි පවා එහි යෙදෙනුයේ පුරුෂයන්ගෙන් ඉතා සුළු කොටසක් පමණි. ප්‍රධාන සංස්කෘතීන් සියල්ලම එය අතහැර දැමීම, එම සමාජවල වර්තමාන සාර්ථකභාවයට ප්‍රධාන හේතුවක් වූයේද යන්න ගැන සොයා බැලීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. නොදියුණු ගෝත්‍රික සමාජවල කුමක් දක්නට තිබුණත්, අද අපේ වර්ගයා ගේ ප්‍රධාන කොටස දීර්ඝ කාලීන "ඒක භාර්යා" සහවාසයේ යෙදෙමින්, යුගල සෑදීමේ ලක්ෂණයේ අන්තයටම ගොස් ඇති බව පෙනේ.

Scanned by TapScanner

මේ අනුව නිරුවත් වානරයා යනු, ඉතා කාමුක, යුගල සාදන අග්‍රේශ පෙළපත් ලක්ෂණ, මාංශභක්ෂක අනුවර්තන සමඟ මිශ්‍ර වූ ශෘංගාරාත්මක වශයෙන් සංකීර්ණ වූ සත්වයෙකු බව පෙනේ. දැන් මෙයට තුන්වැනි හා අවසාන අංගය එක් කළ යුතුය. එනම්, වර්තමාන ශිෂ්ටාචාරයයි. වනාන්තරගත සතකු සමූපකාරී දඩයම්කරුවකු බවට පත් කළ විශාල මොළය, ඊළඟට කාර්මික හා ශිල්පීය දේ කෙරෙහි යොමුවන්නට විය. කලින් වූ සරල ගෝත්‍රික වාසස්ථාන, යෝධ නගර හා නුවර බවට පත්විය. ගල් යුගය, අභ්‍යවකාශ යුගය දක්වා දියුණු විය. මේ සියල්ල අපේ වර්ගයා ගේ ලිංගික ක්‍රියාවලිය කෙරෙහි ඇති කළ බලපෑම කුමක් ද? පිළිතුර එය ඉතාම සුළු බලපෑමක් පමණක් බවයි. මේ සියල්ල ඉතා ඉක්මණින්, ඉතා හදිස්සියේ සිදුවූ බැවින්, මූලික ජීවමය වෙනසක් සිදුවීමට තරම් කාලයක් නොවීය. මතුපිටින් බැලූ බැල්මට එවැන්නක් සිදුවූ බව පෙනුණත්, එය රැවටිල්ලකි. වර්තමාන නාගරික ජීවිතය නම් වූ වෙස්මුහුණට යටින් ඇත්තේ, පැරණි සුපුරුදු නිරුවත් වානරයායි. වෙනස් වී ඇත්තේ, නම පමණකි. "දඩයම් කිරීම" "වැඩ කිරීම" යනුවෙන්ද, "දඩයම් බිම" "ව්‍යාපාරික ස්ථානය" යනුවෙන්ද, "යුගල බන්ධනය" "විවාහය" යනුවෙන්ද වෙනස් වී ඇත.

සමකාලීන ලිංගික රටාවන් පිළිබඳ ඇමරිකානු අධ්‍යයනයන්ගෙන් පෙනී ගොස් ඇත්තේ, අපේ වර්ගයාගේ පැරණි කායික හා ව්‍යුහමය උපකරණවලින් තවමත් පූර්ණ ප්‍රයෝජන ගන්නා බවයි. පූර්ව ඓතිහාසික නෂ්ටාවශේෂ හා ජීවත්වන මාංශභක්ෂකයන් ගේ හා අනිකුත් අග්‍රේශයන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයන්ගෙන්, අතීතයේ දී නිරුවත් වානරයා, තම ලිංගික උපකරණ කෙසේ භාවිතා කළේද යන්න ගැන අදහසක් අපට ලබාගත හැකි වේ. "සදාචාරය" නම් පිටපොත්ත ඉවත් කිරීමෙන් පසු, වර්තමාන නිරුවත් වානරයා ගේද අපට දැකිය හැක්කේ ඒ මූලික තත්වයමයි. මෙම පරිච්ඡේදයේ ආරම්භයේදී සඳහන් කළ ආකාරයට

ශිෂ්ටාචාරයේ සමාජීය ව්‍යුහය සකස් කරන ලද්දේ සත්වයාගේ ජීවමය ස්වභාවය මඟින් මිස, අනික් අතට නොවේ.

මූලික ලිංගික පද්ධතිය බොහෝ නොදියුණු ආකාරයටම පවත්වාගෙන ඇති නමුත්, සුළු ප්‍රමාණයේ පාලනයන් හා සීමාවන් අලුතෙන් යොදාගෙන තිබේ. (විශාල සමාජයකට සරිලන ආකාරයට කාමය, පොදු දෙයක් බවට පත්වී නැත.) මෙම වෙනස්කම් අවශ්‍ය වූයේ අපේ පරිණාමයේ දී අප ලබාගත් කායික හා ව්‍යුහමය ලිංගික සංඥාවන් හා ප්‍රබල ලිංගික ප්‍රතිචාරයන් දැක්වීමේ හැකියාව හේතු කොට ගෙනයි. මෙම ලිංගික සංඥා ක්‍රම සකස් කරන ලද්දේ කුඩා ගෝත්‍රික ඒකකයක භාවිතය සඳහා මිස, විශාල නගරවල ජීවිතය සඳහා නොවේ. නගරවලදී අපට විවිධ උත්තේජනයන්ගෙන් පිරුණු අමුත්තෝ මුණ ගැසෙති. මෙය අලුත් තත්වයක් වූ අතර, එයට මුහුණ දීම සඳහා යමක් කළ යුතු විය.

සංස්කෘතික සීමාවන් ඇතිවූයේ අමුත්තන් පිළිබඳ ප්‍රශ්නය ඇතිවීමට බොහෝ කලින් විය යුතුය. සරල ගෝත්‍රික ඒකකයේ වූවද සහවාසයේ යෙදෙන යුවලේ සමාජිකයන් දෙදෙනාට, අන් අය සමඟ හැසිරෙන විට, තම ලිංගික සංඥාවන් සීමා කිරීමට සිදුවන්නට ඇත. යුගලය එක්ව තබා ගැනීම සඳහා කාමුක බව වැඩි කිරීම අවශ්‍ය වූයේ නම්, දෙදෙනා වෙන් වූ විට එය හීන කිරීම සඳහා පියවර ගත යුතු විය. තුන්වැන්නකු නිසා ලිංගික උත්තේජනයක් සිදුවීම වැළැක්විය යුතු විය. අනිකුත් යුගල සාදන සමාජීය සත්ව වර්ගවල මෙය කරනු ලබන්නේ වණ්ඩ සංඥා මඟිනි.

නමුත් අප වැනි සහයෝගිතාවෙන් කටයුතු කරන වර්ගයකට, වඩා සාමකාමී ක්‍රම යොදා ගැනීමට සිදුවෙයි. මෙය අපේ මොළයට, අපට ආධාර කළ හැකි අවස්ථාවක් විය. කථාවෙන් කෙරෙන අදහස් හුවමාරුව මෙහිදී ප්‍රධාන තැනක් ගන්නා නමුත්, වෙනත් පියවරද අවශ්‍ය වේ.

නිරුවත් වානරයාගේ සිරස් ඉරියව්ව නිසා ඔහුට ලිංග

Scanned by TapScanner

දර්ශනය නොකොට, තවත් කෙනෙකු ඉදිරියට යා නොහැක. කකුල් හතරෙන් ගමන් කරන අශ්ලේශයන්ට මෙවැනි ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු නොවේ. ඔවුන්ට ලිංග ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වූ විට, විශේෂ ඉරියව්වක් ගත යුතුය. නමුත් අපි කුමන කාරියක යෙදී සිටියත්, හැම මොහොකම මෙම ප්‍රශ්නයට මුහුණ දිය යුතු වෙමු. මේ නිසා ලිංග ප්‍රදේශ යම්කිසි සරල ඇඳුමකින් ආවරණය කර ගැනීම මූල්ම සංස්කෘතික වර්ධනයක් වන්නට ඇත. අපේ වර්ගයා එතරම් හිතකර නොවූ දේශගුණික තත්වයන් සහිත ප්‍රදේශවලට පැතිරීමත් සමඟ ශරීරය සීතලෙන් ආරක්ෂා කරගැනීම සඳහා ඇඳුම් භාවිතයට ගැනීම මේ ඇසුරෙන් දියුණු වූවක් බවට කිසි සැකයක් නැත. නමුත් එය පසුව වූ දෙයකි.

විවිධ සංස්කෘතික තත්වයන් යටතේ ප්‍රති ලිංගික ඇඳුම් විවිධ ආකාරයට පැතිරී තිබේ. සමහර අවස්ථාවන්හිදී මේවා අනිකුත් ලිංගික සංඥා නිකුත් කරන ප්‍රදේශවලට ද යෙදූ බව පෙනේ. (පියයුරු ආවරණ හා තොල් ආවරණ) සමහර අවස්ථාවන්හිදී ස්ත්‍රියගේ ලිංගේන්ද්‍රිය හැකි තරම් සැඟවීමට උත්සාහයක් ගත්තා පමණක් නොව, එයට කිසිසේත් ළංවිය නොහැකි ලෙස ද ආරක්ෂා කෙරුණි. පතිව්‍රතා පටි හා යෝනි මාර්ග මැසීම ආදිය මේ පිළිබඳ හොඳ උදාහරණ වේ. සෑම සංසර්ගයකටම පසුව, යෝනියේ අධර හිල් කොට, ඉබි යතුරක් දැමූ අයෙකු පිළිබඳව, ඉතා මෑත දී වාර්තා වී ඇත. මෙවැනි දේ ඉතා දුර්ලභ නමුත්, ලිංගේන්ද්‍රියන් ඇඳුමකින් වසා ගැනීම අද පොදු සිරිතක් බවට පත්ව තිබේ.

තවත් වැදගත් දියුණුවක් ලෙස දැක්විය හැක්කේ, ලිංගික ක්‍රියා රහසිගතව සිදු කිරීමයි. ලිංගේන්ද්‍රිය රහස් අංග වූවා පමණක් නොව, ඒවා රහසේ ප්‍රයෝජනයට ගත යුතු ඒවාද විය. අද නිදාගැනීමත්, සහවාසයේ යෙදීමත් අතර ඉතා බලවත් සම්බන්ධතාවක් දක්නට ලැබේ. කිසිවකු සමඟ නිදා ගැනීම යනුවෙන් අදහස් වන්නේ ඔහු හෝ ඇය සමඟ සහවාසයේ යෙදීමයි. මේ අනුව අද ලිංගික ක්‍රියාවලින් වැඩි කොටසක් බොහෝ විට රාත්‍රී කාලයට පමණක් සීමා වී තිබේ.

සිරුර ස්පර්ශය ලිංගික කටයුතුවලට ඉතා වැදගත් අංගයක් වන බැවින්, සාමාන්‍ය එදිනෙදා කටයුතුවල දී මෙය බොහෝ දුරට අඩු කළ යුතුය. මිනිසුන්ගෙන් පිරුණු අපේ වර්තමාන කලබලකාරී වාතාවරණයේ, ශරීර ස්පර්ශයන් තහනම් කළ යුතු විය. වැරදීමකින් හෝ යම්කිසිවෙකුගේ සිරුරේ ස්පර්ශවීම සමාව ඉල්ලිය යුතු වරදක් ලෙස සැලකේ. සමාව ඉල්ලීමේ ප්‍රබලතාව ස්පර්ශ වූ කොටසේ ලිංගිකත්වයට සමානුපාතික වේ. අමුත්තන් සමඟ ස්පර්ශ නොවීමේ ක්‍රියාවලිය බිඳ වැටෙන්නේ, අධික ලෙස මිනිසුන් පිරී ඉතිරී ඇති තත්වයන් යටතේ හෝ ස්පර්ශ කිරීමට අවසර ලැබී ඇති (වෛද්‍යවරුන්, සන්නාලියන් හා කරණවැමියන්) විශේෂ පුද්ගලයන් සම්බන්ධයෙන් හෝ පමණි.

කිට්ටුම මිත්‍රයන් හෝ නෑයන් ස්පර්ශ කිරීම වැළැක්වීමට එතරම් උත්සාහයක් දරනු නොලැබේ. මෙම ස්පර්ශයන් ලිංගික නොවන බව තහවුරු වී ඇති බැවින්, එහි අනතුරක් නැත. එසේ වූවත්, ආචාර කිරීම අද ඉතා ශෛලිගත දෙයක් වී තිබේ. අතට අතදීම සිදුවන්නේ නියම රටාවකට අනුවයි. පිළිගැනීමේ චුම්බනය විශේෂ චාරිත්‍ර ආකාරයක් ලෙස දියුණු වී (කම්මුලට මුඛ තැබීම) මුඛය, මුඛය තබා කෙරෙන ලිංගික චුම්බනයෙන් වෙනස් වී ඇත.

ශරීර ඉරියව් ද සමහර අවස්ථාවන්හි කාමුක බව අඩු කරන ආකාරයට සකස් වී තිබේ. කකුල් පළල් කොට තබා ගැනීමේ, ස්ත්‍රී ලිංගික ආරාධනා ඉරියව්වෙන් හැකිතාක් වළකිනු දක්නට ලැබේ. වාඩිවන විට කකුල් තදින් එකට තබා ගැනීම හෝ එකපිට එක දැමීම කරන්නේ මේ නිසාය.

ලිංගික ප්‍රතිචාරයන්ට යම්කිසි ආකාරයකින් සමාන වන ඉරියව්වක්, මුඛයෙන් දැක්වූවහොත්, එය වහාම අතින් වසා ගැනීමක් දක්නට ලැබේ. එක්තරා ආකාරයකට සිනහවීම හඳුනාගැනීමේ අවදියේ ලක්ෂණයක් වන අතර, වෙනත් අවස්ථාවන්හි මෙවැන්නක් සිදුවූ විට, මුඛ ප්‍රදේශය වසා

Scanned by TapScanner

ගැනීම සඳහා අත ඉහළට එසවේ.

බොහෝ සමාජයන්හි පිරිමි තම උඩු රැවුල් කපා දැමීම ආදිය මගින් සමහර ද්විතියික ලිංගික ලක්ෂණ ඉවත් කරති. ස්ත්‍රීහු කිහිලිවල ඇති රෝම ඉවත් කරති. ලිංගික ප්‍රදේශවල රෝම ඇඳුම්වලින් වැසී ඇති බැවින් ඒවා ඉවත් කිරීම අවශ්‍ය නොවේ.

මෙයට අමතරව ශරීර ගන්ධයන් නැති කිරීමද බොහෝ දුරට සිදු කෙරේ. සෞඛ්‍ය හේතූන් අනුව, අවශ්‍ය වන ප්‍රමාණයට වඩා ශරීරය නිතර නිතර සෝදනු හා නාවනු ලැබේ. ශරීර ගන්ධ යටපත් කරන විවිධ රසායනික ද්‍රව්‍යවල අලෙවියද ඉතා ඉහළ ගොස් තිබේ.

මෙම සීමාවන් හා පාලනයන් බොහෝ විට පවත්වා ගනු ලබන්නේ, එසේ නොකිරීම සුදුසු නොවන හෝ යෝග්‍ය නොවන දෙයක් බව කීමෙනි. මේවායේ ඇති ප්‍රති - ලිංගික ස්වභාවය ගැන සඳහන් කරනු නොලැබේ. කෘත්‍රිම සදාචාර භාවිත ක්‍රම හා ලිංගික නීති රීති මගින් වඩා කෙළින්ම හා පැහැදිලි ලෙස මෙවැනි පාලනයක් කෙරේ මේවා සංස්කෘතියෙන් සංස්කෘතියට හා සමාජයෙන් සමාජයට වෙනස් වුවත්, ප්‍රධාන අරමුණ එකම දෙයකි. එනම්, අමුත්තන් ලිංගික වශයෙන් පිබිදවීම වැළැක්වීමත්, යුගල බන්ධනයෙන් පිටස්තර ලිංගික කටයුතු සීමා කිරීමත්ය. සදාචාරවාදීන් විසින් ද දුෂ්කර කටයුත්තක් ලෙස පිළිගෙන ඇති මෙම කාර්යයට ආධාර වශයෙන් විවිධ උපක්‍රම යොදාගනු ලැබේ. උදාහරණයක් වශයෙන්, පාසල් ක්‍රීඩා ආදී දුෂ්කර ශාරීරික කටයුතුවලට ළමයින් උනන්දු කරවනු ලබන්නේ, මේ හේතු කොටගෙන කාමුක ආශාවන් අඩුවෙනැයි යන බලාපොරොත්තුවෙනි. මෙය සම්පූර්ණයෙන්ම අසාර්ථක ප්‍රයත්නයක් බව ඒ දෙස විමසිල්ලෙන් බැලීමේදී පෙනී යයි. ක්‍රීඩකයන්ගේ කාමුක බව අන් අයට වඩා අඩු හෝ වැඩි බවක් නොපෙනේ.

මේ සඳහා ප්‍රයෝජනයට ගත හැකි එකම ක්‍රමය වරදට

දඬුවම් දීමේ හා හරි දෙයට සැලකීමේ පැරණි ක්‍රමය බව පෙනේ. නමුත් මෙයින් සිදුවන්නේ ආශාවන් හීන කිරීම නොව, ඒවා යටපත් කිරීමකි.

අස්වාභාවික ලෙස විශාල වී ඇති අපේ සමාජයන්හි යුගල බන්ධනයෙන් පිට ලිංගික කටයුතු සිදුවීම වැළැක්වීමට යම්කිසි පියවරක් ගත යුතු බව පැහැදිලිව පෙනේ. නමුත්, නිරුවත් වානරයා පරිණාමය වී ඇත්තේ අධික ලෙස කාමුක අග්‍රේශයකු ලෙසටයි. මෙම ජීව ස්වභාවය වැළැක්වීමට දරණ හැම ප්‍රයත්නයකටම විරුද්ධව ඔහු සටන් කරයි. එක අතකින් කෘත්‍රිම පාලනයක් යෙදීමත් සමඟම වෙනත් අතකින් එහි ප්‍රතිඵල යටපත් කරන දියුණුවක් සිදුවේ. බොහෝ අවස්ථාවල මේ නිසා ඉතාම හාස්‍යජනක පරස්පර විරෝධී තත්ව දක්නට ලැබේ.

පියයුරු ආවරණය කර ගන්නා ගැහැනිය තන පටකින් එහි නියම හැඩය විදහා දක්වයි. මෙම ලිංගික උපකරණයේ හැඩය ලිංගික පිබිදීමේදී සිදුවන ආකාරයටම පුම්බා දැක්වීමට මේ නිසා හැකි වී තිබේ. එල්ලෙන පියයුරු ඇති සමහර ගැහැනු ඒවායේ නියම හැඩය ලබාගැනීම සඳහා ඉටි ඇතුළු කිරීමේ ශල්‍යකර්ම පවා කරවා ගනිති.

ලිංගික වශයෙන් ප්‍රමාණය විශාල කොට දැක්වීම ශරීරයේ අනෙකුත් කොටස්වල ද දක්නට ලැබේ. මෙයට උදාහරණ නම්, පිරිමින් ගේ කබාවල උරහිස් මහත් කිරීම හා ගැහැණුන්ගේ නිතඹ විශාල කොට දැක්වීමත්ය. අඩි උස් පාවහන් පැලඳීමෙන් ගමන් කිරීමේ දී නිතඹ ප්‍රදේශයේ පැද්දීම වැඩිකිරීමක් දක්නට ලැබේ.

ඉනට තද පටි යෙදීමෙන් උකුල හා පියයුරු පෙදෙස උලුප්පා දැක්වීමට හැකි වී තිබේ. මේ නිසා සිහින් ඉහක් ලබාගැනීම ඉතා අවශ්‍ය දෙයක් ලෙස සැලකිණි. මීට අර්ධ ශතවර්ෂයකට පමණ පෙර, අපේ ස්ත්‍රී වර්ගයා මේ අතින් කොතරම් දුර ගියේ ද යන්න ශල්‍යකර්ම මහින් පහළ ඉලඇට

Scanned by TapScanner

ඉවත්කර ගැනීමෙන් පෙනීයයි.

තොල් සායම් හා සුවඳ විලවුන් වර්ගද, කාමුක ස්වභාවය වැඩිකර ගැනීමට යොදා ගැනීම, තවත් පරස්පර විරෝධී තත්වයකි. තම ජීවමය ගන්ධ සෝදා හරින ගැහැනිය, ඒ වෙනුවට වාණිජ "කාමුක" සුවඳ වර්ග යොදා ගනී. නමුත් මේවා අපට නෑ සම්බන්ධකමක් නොදක්වන, ක්ෂීරපායී සත්වයන් ගේ ගන්ධ ග්‍රන්ථීන් ගේ නිෂ්පාදනවල තනුක ද්‍රාවණයෝ වෙති.

ලිංගික සීමාවන් හා කෘත්‍රිම ප්‍රති ආකර්ෂණයන් ආදිය ඇති නොකර, මුල් ආරම්භක තත්වයම පවත්වා ගැනීම වඩා පහසු වන්නට නොතිබුණේ දැයි යන්න ඇසිය යුතු ප්‍රශ්නයකි. කාමරයක් වායුසමනය කොට, ඒ තුළ ගින්නක් දැල්වීමේ තේරුම කුමක්ද? මා කලින් විස්තර කළ පරිදි සීමාවන් හා පාලනයක් ඇතිකිරීමේ හේතුව නම්, යුගල බන්ධනයට බාධා පමුණුවන, විවිධ ලිංගික උත්තේජනයන්ගෙන් වැළකීමයි. එසේ නම් ඒවා ප්‍රසිද්ධියේ දක්නට තිබීම සම්පූර්ණයෙන්ම නවත්වා නොදැම්මේ ඇයි? ජීවමය හා කෘත්‍රිම ලිංගික ප්‍රදර්ශන, යුවළ එක්ව සිටින අවස්ථාවලට පමණක් සීමා නොවූයේ ඇයි? මෙම ප්‍රශ්නයට දිය හැකි පිළිතුරේ එක් කොටසක් වන්නේ නිරතුරුව පිටවීමේ මහක් සොයන අපේ අධික කාමුක බවයි. මෙය වර්ධනය වූයේ යුවළ එකට තබාගැනීමට නමුත්, අද සමාජයේ දක්නට ඇති සංකීර්ණ උත්තේජක වතාවරණයේ, යුගල බන්ධනයෙන් පිටස්තර අවස්ථාවල දී ද එය ක්‍රියාත්මක වෙයි. කෙසේ වෙතත් මෙය ඉහත කී ප්‍රශ්නයට දිය හැකි පිළිතුරේ එක් කොටසක් පමණි. කාමුක බව තරාතිරම දක්වන ලක්ෂණයක් ලෙස අනිකුත් අග්‍රේශයන් ගේ ද දක්නට ලැබේ.

වණ්ඩ වඳුරකු ළඟට ලිංගික නොවන කාර්යයක් සඳහා යාමේදී, වැදිරියක ලිංගික ඉරියව්වක් ප්‍රදර්ශනය කිරීමට පුළුවන. ඈ මෙසේ කරන්නේ ඇයට ඔහු සමඟ සංසර්ගයේ යෙදීම අවශ්‍ය නිසා නොව, එසේ කිරීමෙන් ඔහුගේ ලිංගික ආසාවන් පුබුදුවා, වණ්ඩ හැඟීම හීන කිරීමටයි. මෙහිදී

සිදුවන්නේ ලිංගික උත්තේජනයක් මඟින් ලිංගික නොවන වාසියක් ලබා ගැනීමයි. මෙවැනි උපක්‍රම අපේ වර්ගයා ද ප්‍රයෝජනයට ගනිති. කෘත්‍රිම ලිංගික සංඥා බොහෝ දුරට යොදාගනු ලබන්නේ මේ ආකාරයෙනි. විරුද්ධ ලිංගික සත්වයන්ගේ, මන බඳනා ආකාරයට සැරසීමෙන්, ඔවුන් තුළ ඇති විරුද්ධවාදී හැඟීම බොහෝ දුරට අඩු කළ හැකි වේ.

යුගල සාදන වර්ගයකට මේම උපක්‍රමය තරමක් අනතුරුදායක වන බව කිව යුතු නොවේ. උත්තේජනය අවශ්‍ය ප්‍රමාණයට වඩා දුර දිග යෑම වැළැක්විය යුතුය. සංස්කෘතිය නිසා ඇතිවී තිබෙන ලිංගික සීමාවන්ට අනුකූලව කටයුතු කිරීමෙන් "මම සංසර්ගයට සූදානම් නැත" යන සංඥාව පැහැදිලිවම නිකුත් කළ හැකිය. නමුත් මේ සමඟම "මම ඉතා කාමුකය" යන සංඥාව ද නිකුත් කළ හැක වේ. දෙවැනි සංඥාව නිසා විරුද්ධවාදීකම් අඩුවන අතර පළමුවැන්නෙන් තත්වය ව්‍යාකූලවීම වළකිනු ඇත. මේ නිසා අපට රැවුලත්, කැදැත් දෙකම බේරාගත හැකි වී තිබේ.

මෙය ඉතා හොඳින් ක්‍රියාත්මක විය යුතු නමුත්, වෙනත් සාධක ද මෙයට බලපායි. එය, මුල් අග්‍රේශ පද්ධතියට අපහසුවෙන් එක් කළ දෙයක් බව පෙනේ. යුගල බන්ධනයේ යම්කිසි වරදක් සිදු වූවහොත්, පැරණි අග්‍රේශ ආශාවෝ නැවතත් ඉදිරියට එති. මෙයට අමතරව නිරුවත් වානරයාගේ පරිණාමීය වර්ධනයක් වන ළමා කුතුහලය, වැඩිහිටි අවස්ථාව දක්වා විහිදීම නිසා තත්වය තවත් අනතුරුදායක වී තිබේ.

මෙම ක්‍රියාපිළිවෙළ සැලසුම් කරන ලද්දේ, ස්ත්‍රිය දරුවන් විශාල සංඛ්‍යාවක් සහිත පවුලක් සාදා ගන්නා හා පිරිමියා අනිකුත් පිරිමින් සමඟ දඩයමේ යන තත්වයන්ට සරිලන ආකාරයටයි. මූලික වශයෙන් මෙම තත්වයම පැවතුණත් වෙනස්කම් දෙකක් සිදුවී තිබේ. පළමුවෙන්ම දරුවන් ඇතිවීම කෘත්‍රිම වශයෙන් සීමා කිරීමක් අද දැකිය හැකිය. මේ නිසා ස්ත්‍රියගේ දරුවන් ඇති දැඩි කිරීමේ වගකීම ලිහිල් වන අතර සහකරු ළඟ නොසිටින අවස්ථාවල දී පවා

Scanned by TapScanner

ලිංගික වශයෙන් ක්‍රියාකාරී විය හැකි තත්වයක ඇ පසුවේ. එදා සමහර අවස්ථාවන්හි දී ගැහැනු ද දඩයමට එක්වූහ. දඩයම් වෙනුවට දැන් යෙදෙන පදය වැඩ කිරීම වන අතර, වැඩට යන පිරිමියාට අද හමුවන්නේ පිරිමින්ගෙන් පමණක් සෑදුණු කණ්ඩායමක් නොව ගැහැනු පිරිමි දෙවර්ගයෙන්ම සමන්විත විසමලිංගික කණ්ඩායමකි. මෙම තත්වයන් යටතේ බොහෝ විට යුගල බැම්ම බිඳ වැටේ. (ඇමරිකානු සංඛ්‍යාවන්ට අනුව වයස 40 වන විට විවාහක පුරුෂයන්ගෙන් සියයට 50ක්ද, විවාහක ස්ත්‍රීන්ගෙන් සියයට 26 ක් ද විවාහයෙන් පිට, සංසර්ගයේ යෙදෙන බව පෙනේ.) මෙම පිටස්තර ලිංගික කටයුතු මැද, නොකැඩී පවත්වා ගැනීමට තරම් මුල් යුගල බන්ධනය ශක්තිමත් වන අතර, එය සම්පූර්ණයෙන්ම බිඳ වැටෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකින් පමණි.

මේ පිළිබඳ සාකච්ඡාව මෙතනින් නතර නොකිරීම, යුගල බැම්ම වුවමනාවට වැඩියෙන් හුවා දැක්වීමක් විය හැකිය. ලිංගික විමසිලිමත් බව හේතුකොට ගෙන, යුගල බැම්ම බිඳ නොවැටෙන නමුත්, එවැනි දේ සම්පූර්ණයෙන්ම අතුගා දැමීමට තරම් එය බලවත් නැත. ප්‍රබල ලිංගික කා වැදීම හේතු කොට ගෙන, යුවළ එකට සිටින නමුත්, එයින් පිටස්තර ලිංගික කටයුතු පිළිබඳ ඔවුන්ගේ උනන්දුව නැති නොවේ.

මෙවැනි පිටස්තර ලිංගික සම්බන්ධයන්ගෙන් යුගල බන්ධනයට හානි සිදුවේ. ඒ වෙනුවට එතරම් අනතුරුදායක නොවන වෙනත් දෙයක් සොයා ගත යුතුය. මෙයට විසඳුම වී ඇත්තේ අනිකුත් අය ලිංගික කටයුතුවල යෙදීම (සංසර්ගයේ) දැකීමෙන් ලබන තෘප්තියයි. නමුත් තර්කානුකූලව බලන විට මෙය සහභාගීත්වයෙන් තොරව උනන්දුවක් දක්වන, ඕනෑම ලිංගික කටයුත්තක් අයත් වන ලෙස පුළුල් කළ හැකියි. අපි සියලු දෙනාම මෙවැනි ලිංගික කටයුතුවල නිරත වෙමු. අපේ ගුවන් විදුලිය, සිනමාව, රූපවාහිනී, නාටක හා නවකතා ආදියේ වැඩි කොටසක අරමුණ වී ඇත්තේ, මෙම ආශාව තෘප්තිමත් කිරීමයි. පුවත්පත්, සඟරා හා එදිනෙදා කතා බහෙන් ද මේ සඳහා සැලකිය යුතු සේවයක් සිදුවෙයි. මෙම ආශාව සංසිඳුවීම, අද ප්‍රධාන පෙළේ කර්මාන්තයක් බවට පත්ව ඇත. මෙහිදී නිරීක්ෂකයා විසින් කිසිවක් කරනු නොලැබේ. මෙවැනි දේ සඳහා ඇති ඉල්ලුම කොතරම් බලවත්ද යන්න අප වෙනුවෙන් එවැනි ක්‍රියාවන්හි යෙදෙන "නළුවෙක් හා නිළියන්" යනුවෙන් හඳුන්වන විශේෂ කොටසක් ඇති වීමෙන් පැහැදිලි වේ.

වෙනත් සත්ව වර්ග සමඟ සසඳා බැලීමේදී පෙනී යන්නේ, ලිංගික කටයුතු නැරඹීමෙන් අප ලබන මෙම තෘප්තිය ජීව විද්‍යාත්මක වශයෙන් සලකන විට අස්වාභාවික දෙයක් බවයි. නමුත් මෙය කිසිසේත් අනතුරුදායක නොවන අතර මෙයින් විවිධ ලිංගික ආශාවන් සංසිඳවා, අපේ යුගල බන්ධනය බිඳ දමන, අලුත් සම්බන්ධකම් වලක්වන බැවින් එය, යුගල බැම්ම වඩා ශක්තිමත් කිරීමට ආධාර කරයි.

වෛශ්‍යා වෘත්තියේ බලපෑම ද මේ ආකාරයම ගනී. මෙහිදී එයට සහභාගීවන පුද්ගලයා කලින් අවස්ථාවේ මෙන් නිරීක්ෂකයකු පමණක් නොවේ. එහෙත් මෙම කටයුතු සංසර්ගීය අවස්ථාවට පමණක් සීමාවේ. හඳුනා ගැනීමේ අවදියක් හෝ පූර්ව සංසර්ග අවදියක් ඇත්නම් ඉතා සුළු ප්‍රමාණයකට සීමාවී ඇත. සමහර විට, යුගල සෑදීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වුවහොත් එය වහාම යටපත් කරනු ලැබේ. යුගල වශයෙන් බැඳුණු පිරිමියෙකු, වෛශ්‍යාවක සමඟ සංසර්ගයේ යෙදීම නිසා යුගල බැම්මට හානි විය හැකි නමුත්, සංසර්ගීය නොවන ආදර බැම්මක වෙලීමෙන් වන හානිය, එයට වඩා විශාලය.

මෙහිදී විමසිල්ලට භාජනය විය යුතු තව දෙයක් නම් සමලිංගික කටයුතුවල වර්ධනයයි. ලිංගික කටයුතුවල මූලික කාර්යය වන්නේ වර්ගයා බෝ කිරීම වන අතර, සමලිංගික යුගලයකට කළ නොහැකි දෙයත් මෙයයි. ව්‍යාජ සංසර්ගයක් වන සමලිංගික ක්‍රියාවක, ජීව විද්‍යාත්මක වශයෙන් බලන විට අසාමාන්‍ය බවක් නැත. විවිධ තත්වයන් යටතේ බොහෝ සත්ව වර්ගවල මෙවැන්නක් දක්නට ලැබේ. නමුත් සමලිංගික යුගල

Scanned by TapScanner

බැම්මක් ඇතිවීම, ප්‍රජනන කාර්යය අතින් නිෂ්ඵල වූත්, වැඩිහිටි සතුන්ගේ ප්‍රජනන ශක්තිය අපතේ යවන්නා වූත් ක්‍රියාවලියකි. මේ ගැන අවබෝධයක් ලබා ගැනීමට අනිකුත් සත්ව වර්ග දෙස බැලීම ප්‍රයෝජනවත් වේ.

චණ්ඩ පිරිමියෙකු දමනය කිරීමට, ස්ත්‍රියක විසින් ලිංගික සංඥා යොදා ගන්නා ආකාරය, මම කලින් පැහැදිලි කළෙමි. ඔහු ලිංගිකව පිබිදවීමෙන්, ඔහුගේ විරුද්ධවාදී හැඟීම් යටපත් කොට, පහර දෙනු ලැබීමෙන් වැළකිය හැකිය. යටත් පිරිමියකු විසින් ද මෙවැනිම උපක්‍රමයක් යොදා ගැනීමට පුළුවන. චණ්ඩ වඳුරන්ගේ පහරින් වළකිනු සඳහා තරුණ වඳුරෝ ගැහැනු සතුන්ගේ ආරාධනා ඉරියව්වක් යොදා ගනිති.

මෙසේ ලිංගික නොවන තත්වයන් යටතේ, ලිංගික රටාවන් ප්‍රයෝජනයට ගැනීම, අග්‍රේශ සමාජීය පද්ධතියේ සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්ව ඇති අතර, කණ්ඩායමේ සංවිධානයත්, එකමුතු බවත් රැක ගැනීම සඳහා එය ආධාර වේ. නමුත් අනෙකුත් අග්‍රේශයන් අතර යුගල සෑදීමේ ලක්ෂණයක් දක්නට නොලැබෙන බැවින්, දීර්ඝ කාලීන, සමලිංගික යුගල සෑදීමේ දුෂ්කරතාව පිළිබඳ ප්‍රශ්නයක් පැන නොනඟී. එය එදිනෙදා ප්‍රමුඛත්ව ප්‍රශ්න විසඳන නමුත් දීර්ඝ කාලීන ලිංගික සම්බන්ධතා ප්‍රශ්න ඇති නොකරයි.

නියම වර්ගයේ ලිංගික සහකරුවකු ලබාගත නොහැකි අවස්ථාවලදී ද සමලිංගික රටා ක්‍රියාත්මක වේ. මෙය සත්ව වර්ග ගණනාවකම දැකිය හැක. ඊළඟ හොඳ දෙය ලෙස තම වර්ගයේ සහකරුවෙකු ලිංගික ක්‍රියාවන් සඳහා යොදා ගනු ලැබේ. සමහර අවස්ථාවල දී අජීව වස්තු සමඟ සංසර්ගයේ යෙදීම හා ස්වයංමෙථුනයේ යෙදීම ද තනි වූ සතුන්ගේ දකින්නට ලැබේ. කුඩුවල දමා සිටින සමහර මාංශභක්ෂකයින්, තම ආහාර දමන භාජන සමඟ, සංසර්ගයේ යෙදුණු අවස්ථා වාර්තා වී ඇත. වඳුරන්ගේ බොහෝ විට ස්වයංමෙථුන රටාවක් වර්ධනය වන අතර, මෙවැනි දේ සිංහයන්ගේද දක්නට තිබේ. වෙනස් වර්ගවල සතුන් එක කුඩුවේ දමනු ලැබූ විට ද ඔවුන්

අතර සංසර්ගය සිදුවනු දක්නට ලැබේ. එහෙත් නියම උත්තේජනය වන තම වර්ගයේ විරුද්ධ ලිංගික සතකු ලැබීමත් සමඟ මෙවැනි දේ ඉක්මණින්ම නැති වී යයි.

මෙවැනිම තත්වයක් අපේ වර්ගයාගේ ද දක්නට ඇති අතර ප්‍රතිචාරයන්ද අනිකුත් සතුන්ට සමානය. අපේ වර්ගයාගේ පිරිමින්ට හා ගැහැනුන්ට යම්කිසි හේතුවක් නිසා, විරුද්ධ ලිංගික සහකරුවන් සමඟ සම්බන්ධ විය නොහැකි නම්, ඔවුන් තම ලිංගික කටයුතු සඳහා වෙනත් ක්‍රම යොදා ගනු ඇත. එවිට තම වර්ගයාටම අයත් සතුන්, වෙනත් සත්ව වර්ග හෝ ස්වයංමෙථුනයේ යෙදීම ආදී ක්‍රම ප්‍රයෝජනයට ගැනීමට ඔවුන්ට සිදුවේ. ඇමරිකානු අධ්‍යයනයන්ට අනුව, එම සමාජයේ වයස හතළිස් පහ වූ පිරිමින්ගෙන් සියයට තිස්හතක් ද ගැහැනුන්ගෙන් සියයට දහතුනක්ද ලිංගික උච්ච අවස්ථාව දක්වා සමලිංගික ක්‍රියාවල යෙදී ඇත. අනිකුත් සතුන් සමඟ ලිංගික ක්‍රියාවන්හි යෙදුණු පිරිමින්ගේ ගණන සියයට අටක්ද ගැහැනුන්ගේ ගණන සියයට 3.6 ක් ද වේ. ගැහැනුන්ගෙන් සියයට 58 ක් ද පිරිමින්ගෙන් සියයට 92 ක් ද ජීවිතයේ යම්කිසි අවස්ථාවක ස්වයංමෙථුනයේ යෙදෙන බව පෙනී යයි.

ප්‍රජනනය අතින් නිෂ්ඵල වන මෙම කටයුතු, එම පුද්ගලයන්ගේ බෝකිරීමේ ශක්තිය හීන නොකරන්නේ නම් එයින් සිදුවන වරදක් නැත. එක් අතකින් බලන විට, සමාජයේ විවිධ ප්‍රශ්න ඇති කරන ලිංගික අසහනය, මෙයින් අඩුවෙන බැවින් ඒවා ප්‍රයෝජනවත් වෙයි. නමුත් මේවා ස්ථිර ලිංගික බැඳුම් බවට පත්වීමත් සමඟ විවිධ ප්‍රශ්න පැන නඟී. අපේ ලිංගික අවධානය යොමු වන තැනැත්තා සමඟ බලවත් බැම්මක් ඇති කරගෙන ආදරයෙන් බැඳීමේ ප්‍රබල ලක්ෂණය අපේ වර්ගයාගේ දක්නට ලැබේ. මෙම ලිංගික කාවැදීමේ ක්‍රියාවලිය, දෙමාපිය වගකීම් දැරීමට අවශ්‍ය වන දීර්ඝ කාලීන සහයෝගිතාව ඇති කරයි. ලිංගික සම්බන්ධතාවක් ආරම්භ වීමත් සමඟම මෙම කා වැදීම් ක්‍රියාවලියද ක්‍රියාත්මක වේ. අපේ ලිංගික අවධානය මුලින්ම යොමුවන වස්තු කෙරෙහි අපේ හැඟීම් තිර වෙයි. මෙය සංඝටක ක්‍රියාවලියකි. ලිංගික ප්‍රීතිය

Scanned by TapScanner

ලබන අවස්ථාවන්හි ඇති සමහර උත්තේජනයන් ප්‍රධාන උත්තේජනය බවට පත්වී, මෙම උත්තේජනය නොමැතිව ලිංගික තෘප්තියක් ලබාගත නොහැකි තත්වය දක්වා එය දියුණු වේ.

සමාජීය හෝ වෙනත් යම්කිසි හේතූන් නිසා, අපේ මුල් ලිංගික ප්‍රීතිය ලැබුණේ, සමලිංගික හෝ ස්වයංමෛථුන ක්‍රියාවලින් නම්, මේවා බොහෝ කලක් යනතුරු ලිංගික වශයෙන් ඉතා වැදගත් උත්තේජනයෝ වෙති. (වඩාත් අස්වාභාවික ලාංඡන භක්තිය ඇති වන්නේද, මේ ආකාරයටයි.)

ඉහත සඳහන් කරන ලද කරුණු අනුව බලන විට ඇති වන තත්වය ඉතා වියවුල්සහගත එකකැයි ඔබට සිතෙන්නට පුළුවන. නමුත් කරුණු දෙකක් නිසා එවැන්නක් සිදුවිම වැළකේ. පළමුවෙන්ම අපේ වර්ගයේ ලිංගික සංඥාවලට ප්‍රතිචාරයන් දැක්වීමේ ක්‍රියාවලියක් අප සතුව ඇති බැවින්, මෙම සංඥා නිකුත් නොකරන වස්තුවකට ප්‍රබල ප්‍රතිචාර දැක්වීමක් හෝ බැඳීමක් සිදු නොවේ.

දෙවනුව අපේ මුල් ලිංගික අත්හදා බැලීම් ඉතා තාවකාලික ඒවා වේ. මුලදී ඉතා ඉක්මණින් ආදරයෙන් බැඳෙන අපේ එම හැඟීම් ඉක්මණින් නැති වී යයි. මෙය නිතර නිතර සිදුවේ. මෙම සොයා බැලීමේ කාලයේ දී අපට සුළු ප්‍රමාණයේ කාවැදීම් කීපයක් සිදුවේ. මෙය අවසන් වන්නේ ප්‍රධාන පෙළේ කාවැදීමකට අප සුදානම් වූ විටයි. මෙම අවස්ථාව, වන විට ලිංගික උත්තේජයන් බොහොමයකට අප නිරාවරණය වී ඇති බැවින් මෙතැන් සිට සාමාන්‍ය විෂම ලිංගික සහවාස ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

අනිකුත් සත්ව වර්ගවල පරිණාමය වී ඇති ක්‍රියාවලිය සමඟ සංසන්දනය කළහොත් මෙය අවබෝධ කරගැනීම වඩා පහසු වනු ඇත. යුගල සාදන පක්ෂීහු බිත්තර දැමීම සඳහා එක්තරා නියමිත අභිජනන බිමකට සංක්‍රමණය වෙති. ඔවුන් කුඩු සාදා ගන්නේ මෙහිදීය. පළමුවෙනි වරට වැඩිහිටියන් ලෙස පියාසර කරන යුගල සාදා නැති තරුණ පක්ෂීන් ද අභිජනන බිමේදී, තම ප්‍රදේශය වෙන්කර ගෙන සහකරුවෙකු තෝරා ගත යුතුය. මෙය ඉතා ඉක්මණින්ම සිදුවේ. ඔවුනොවුන් ගේ ලිංගික සංඥාවන්ට අනුව, තරුණ පක්ෂීහු තම සහකරුවන් තෝරා ගනිති. සහකරුවන් තෝරා ගැනීමෙන් පසු ඔවුන්ගේ ලිංගික කටයුතු එම පක්ෂියාට පමණක් සීමා වේ. මෙය සිදු වන්නේ ලිංගික කා වැදීමේ ක්‍රියාවලියක් මගිනි. යුගල සෑදීම ක්‍රියාත්මක වෙද්දී (සෑම වර්ගයේම සතුන් තුළ දක්නට ඇති) ලිංගික සහජාසයන් ඒ ඒ සත්වයාට පෞද්ගලික වූ විශේෂ හඳුනා ගැනීමේ ලක්ෂණ සමඟ සම්බන්ධ වෙයි.

කා වැදීමේ ක්‍රියාවලිය, ලිංගික ප්‍රතිචාරයන් එක් සතෙකුට පමණක් සීමා කරන්නේ මේ ආකාරයටයි. අභිජනන කාලය සීමාසහිත බැවින්, මේ සියල්ල ඉතා ඉක්මණින් සිදුවිය යුතුය. මෙම අවස්ථාව ආරම්භයේදී, එක් ලිංගයකට අයත් සියලුම සතුන් ගණ්ඩාවාසයෙන් ඉවත් කළහොත්, සමලිංගික යුගල බන්ධන රාශියක් ඇතිවන බව පෙනේ.

අපේ වර්ගයාගේ මෙම ක්‍රියාවලිය මෙතරම් වේගවෙන් සිදු නොවේ. කෙටි අභිජනන කාලයක් ඉක්ම යෑමට පෙර ක්‍රියාකාරී වීමේ ප්‍රශ්නයක් අපට නැත. අපේ තරුණ වියේදී සැලකිය යුතු කාලයක් ලිංගික වශයෙන් වෙන්වූ පරිසරයක ජීවත් වූවත්, ස්ථිර සමලිංගික යුගල බැම් ඇතිවීමක් සිදු නොවේ. අපත් ඉහත සඳහන් පක්ෂීන් මෙන් වූයේ නම්, පිරිමි පාසල්වලින් (හෝ එවැනි ඒක ලිංගික ආයතන) පිටවෙන කිසිම කෙනෙකුට කවදාවත් ගැහැනියක සමඟ බැඳීමක් ඇතිකර ගැනීමට නොහැකි වනු ඇත. අපේ මුල් කාවැදීම සිදු වන්නේ යම්තම්න් වන අතර, පසුව ලැබෙන ප්‍රබල කා වැදීම් වලින් මුල් ඒවා මැකීයෑමක් දක්නට ලැබේ.

කෙසේ වෙතත් සුළු කොටසකට මෙයින් හානියක් සිදුවේ. බලවත් සංඝටක ලක්ෂණ, ලිංගික හැඟීම් සමඟ දැඩිව සම්බන්ධ වීම නිසා, පසුව ඇති වන යුගල සෑදීමේ ක්‍රියාවලියේදී ඒවා ප්‍රධාන තැනක් ගනී. සමලිංගික

Scanned by TapScanner

සහකරුවකුගේ මූලික ලිංගික සංඥාවල දුර්වලබව නිසා කා වැදීමේ ලක්ෂණය නැති නොවේ. සමාජය මෙවැනි අනතුරක් සිදුවීමට ඉඩ දී ඇත්තේ මන්ද? යන්න ඇසිය යුතු ප්‍රශ්නයකි. මෙයට හේතුව ශිෂ්ටාචාරයේ හා ශිල්පීය ඥානයේ සංකීර්ණත්වය හේතු කොට ගෙන අධ්‍යාපනික අවදිය ඉතා දීර්ඝ කිරීමට සිදුවීමයි. තරුණ පිරිමින් හා ගැහැනුන් ජීවමය වශයෙන්, හැකි වූ විගසම පවුල් ඒකක පිහිටුවා ගතහොත්, ඔවුන්ගේ දියුණු කළ හැකි හැකියාවන් බොහෝමයක්ම අපතේ යනු ඇත. මෙවැන්නක් සිදුවීම වැළැක්වීමට හැකි තාක් කටයුතු කරනු ලැබේ. අවාසනාවකට මෙන් සංස්කෘතික සීමාවන් කොතරම් තිබුණත්, එයට ලිංගික පද්ධතියේ වර්ධනය වැළැක්විය නොහැක. මෙම වර්ධනයට නියම මහ ගත නොහැකි නම්, එය වෙනත් මහක් සොයා ගනී.

සමලිංගික නැම්මට බලපාන තවත් ඉතා වැදගත් සාධකයක් වෙයි. වැඩෙන කාලයේදී දරුවන් ප්‍රබල පුරුෂ ලක්ෂණ ඇති මවක හෝ දුර්වල ළපටි ලක්ෂණ ඇති පියෙකු දකින් නම්, ඔවුන්ගේ සිත්වල සැලකිය යුතු අවුලක් ඇති වෙයි. හැසිරීම් ලක්ෂණ හා ව්‍යුහමය ලක්ෂණ එකට යන බවක් නොපෙනේ. මෙම දරුවන් වැඩිවියට පත්වීමෙන් පසුව පුතුන්, මවගේ (ව්‍යුහ නොව) හැසිරීම් ලක්ෂණ ඇති සහකරුවන් ලෙස තෝරා ගනු ලබන්නේ පිරිමින් මිස ගැහැනු නොවෙත්. දියණියන්ද මෙවැනිම ප්‍රශ්නයකට මුහුණ පානු ඇත. මේ ආකාරයේ ලිංගික ගැටලු සම්බන්ධයෙන් පැන නැඟී ඇති ලොකුම ප්‍රශ්නය නම් දෙමාපියන් මත යැපෙන දීර්ඝ ළමා කාලය හේතුකොට ගෙන, මේවා පරම්පරාවෙන් පරම්පරාවට යෑමයි. ඉහත සඳහන් කළ දුර්වල පියා එවැන්නකු වන්නට ඇත්තේ ද ඔහුගේ දෙමාපියන්ගේ සම්බන්ධතාවයේ වූ යම්කිසි අස්වාභාවික තත්වයක් හේතු කොට ගෙනයි. මෙවැනි ප්‍රශ්න නැතිවී යාමට පෙර පරම්පරා ගණනාවක් ඇතට විහිදෙයි. මේවා ඉතා උග්‍ර තත්වයකට පත් වූ විට, බෝවීම සම්පූර්ණයෙන්ම නතර වීමෙන්, ප්‍රශ්නය තවත් දුර යෑම වැළකෙයි.

සත්ව විද්‍යාඥයකු ලෙස සාමාන්‍ය සදාචාරයට අනුව මට ලිංගික කරුණු ගැන සාකච්ඡා කළ නොහැක. මට මෙහිදී ඉදිරිපත් කළ හැක්කේ ප්‍රජාවගේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය මත පදනම් වූ ජීව විද්‍යාත්මක සදාචාරයකි. කිසියම් ලිංගික රටාවක් ප්‍රජනක සාර්ථකත්වයට බාධා කරන්නේ නම්, එය ජීව විද්‍යාත්මක වශයෙන් නුසුදුසු දෙයක් යයි කිව හැකියි. පුජකයෝ, අවිවාහකයෝ ආදී සියල්ලෝම නොමඟ ගිය අය වෙති. සමාජය ඔවුන් උපදවා ඇති දැඩි කළ නමුත්, ඔවුන්ගෙන් සමාජයට එම සේවය සිදු වී නැත.

කෙසේ වෙතත් ප්‍රජනක කාර්යය අතින් බලන විට ක්‍රියාකාරී සම ලිංගිකයකුගේත්, පූජකයෙකුගේත් වෙනසක් නැත. යම්කිසි සංස්කෘතියක සමාජිකයන්ට ඉතා පිළිකුල් සහගත ලෙස පෙනුණත්, ප්‍රජනක සාර්ථකත්වයට බාධා නොකරන කිසිම ලිංගික භාවිතයක් ජීව විද්‍යාත්මකව විවේචනය කළ නොහැක. යම් යම් අරුම පුදුම චාරිත්‍රවලට අනුව, ලිංගික කටයුතුවල යෙදීමෙන් සංසර්ගයේ යෙදෙන යුවළක සංසේචනය සිදුවීම හෝ ඔවුන්ගේ යුගල බැම්ම ශක්තිමත් වීම හෝ සිදුවේ නම්, එවැනි චාරිත්‍ර ජීව විද්‍යාත්මකව බලන විට පිළිගත් ලිංගික චාරිත්‍ර තරම්ම වටිනා පිළිගත යුතු ඒවා වේ.

මෙම සාමාන්‍ය නියමයට එකඟ නොවන තවත් වැදගත් කරුණක් ද ඇති බව සඳහන් කළ යුතුය. අධික ලෙස ජනගහනය වැඩිවීමේ තත්වයන් යටතේ මා ඉහත සඳහන් කළ ජීව විද්‍යාත්මක සදාචාරය තවදුරටත් වලංගු නොවේ. පරීක්ෂණාගාරවල වෙනත් සත්ව වර්ගයන්හි ජනගහනය අධික ලෙස වැඩි කිරීමේ පරීක්ෂණවලින් පෙනී ගොස් ඇත්තේ, වැඩිවීම එක්තරා අවස්ථාවකට පැමිණි විට, එය සම්පූර්ණ සමාජ ව්‍යුහයම කඩා බිඳ දමන බවයි. මෙවැනි තත්වයක් යටතේ ජීවත්වන සතුන් විවිධ ලෙඩ රෝගත්, තම දරුවන් මැරීමත්, ඉතා භයානක ලෙස සටන් කිරීමත් දක්නට ලැබේ. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ ඒ ඒ සත්ව ගහනය අඩු මට්ටමකට නැවත ගෙන ඒමයි. මෙවැනි විනාශකාරී

Scanned by TapScanner

පෙරළියකින් පසුව ඔවුහු නැවතත් බෝවීම ආරම්භ කරති. ආරම්භයේදීම, ප්‍රජනන වේගය අඩුකරන ක්‍රමයක් යොදා ගත හැකිනම්, මෙම විපත්තිය වළක්වා ගත හැකි වේ. මෙවැනි තත්වයක් යටතේ කලින් සඳහන් කළ ප්‍රති ප්‍රජනක ලිංගික රටාවන් දෙස නැවතත් විමසිල්ලෙන් බැලිය යුතු වේ.

අපේ වර්ගයා දැන් ගමන් කරමින් සිටින්නේ මෙවැනි තත්වයකටයි. අපට මෙම තත්වය දෙස නිකම්ම බලා සිටීමට හැකියාවක් නැත. මෙයට පැහැදිලිම විසඳුම වන්නේ අභිජනන වේගය අඩුකිරීමයි. ගුණාත්මක වර්ධනය නොවළක්වා ප්‍රමාණාත්මක වර්ධනය වැළැක්වීමයි. උත්පත්ති පාලන ක්‍රම අවශ්‍ය නමුත්, මූලික පවුල් ඒකකය විනාශ කිරීමට ඒවාට ඉඩ නොදිය යුතුයි. උත්පත්ති පාලන ක්‍රම නිසා ලිංගික කටයුතු කිසිම වගවිභාගයක් නැතිව, සිදුවනු ඇතැයි බියක් පහළ වී ඇති නමුත්, එවැන්නක් සිදුවීමට ඇති ඉඩකඩ ඉතාම අඩුය. අපේ වර්ගයාගේ දකින්නට ලැබෙන ඉතා ප්‍රබල යුගල සෑදීමේ ක්‍රියාවලියෙන් එවැන්නක් සිදුවීම වැළකෙනු ඇත. දරුවන් කිසිසේත් ඇති නොවන ආකාරයට බොහෝ විවාහකයන් උත්පත්ති පාලනය යොදා ගතහොත් සැලකිය යුතු ප්‍රමාණයේ අවුලක් ඇතිවිය හැකියි. අවසානයේ දී මේ අයගේ යුගල බැම්ම කැඩී බිඳී යනු ඇත. මෙවැනි පුද්ගලයන්, පවුල් ඒකක ඇති කිරීමට නැත් කරන අනිකුත් යුගලවලට ද විශාල තර්ජනයක් වනු නොඅනුමානයි. නමුත් මෙතරම් අන්තවාදී ලෙස උපත් සීමා කිරීමක් අවශ්‍ය නොවේ. සෑම පවුලක්ම දරුවන් දෙදෙනෙකු ඇති කළහොත්, අවසාන වශයෙන් ජනගහනය වැඩිවීමක් සිදු නොවනු ඇත.

ලිංගික සංසිද්ධියක් වශයෙන් යාන්ත්‍රික හා රසායනික උත්පත්ති පාලන ක්‍රම ඉතාම නවීන දෙයක් වේ. පරම්පරා කිහිපයක් එය අත්හදා බලන තුරු සමාජයේ මූලික ලිංගික රටාවන්ට එය කෙසේ බලපාද යන්න කිව නොහැකිය. සමාජ ලිංගික පද්ධතියේ අපට දැනට නොපෙනෙන ආකාරයේ අලුත් ප්‍රශ්න මේ නිසා ඇතිවීමට පුළුවන. එය කිව හැක්කේ එදාට පමණි. නමුත් උත්පත්ති පාලන ක්‍රම නිසා කුමක් සිදු වුවත්

උත්පත්ති සීමා නොකිරීමේ ප්‍රතිඵලය, එයට වඩා බොහෝ භයානක බව කිව හැකිය.

ජනගහනය වැඩිවීමේ ප්‍රශ්නය ගැන සිත යොමු කරන විට පූජකයන්, අවිවාහකයන් හා සමලිංගිකයන් ආදී, වර්ගයා බෝ නොකරන කොටස්, විවේචනය කිරීම වැරදි බව පෙනේ. ප්‍රජනනය අතින් බලන විට මෙය සත්‍ය නමුත්, ඔවුන් ගේ විශේෂ ජීවන ක්‍රම හේතු කොටගෙන විවිධ සමාජීය ප්‍රශ්න ඇතිවීමට ඉඩ තිබේ. කෙසේ වෙතත් ප්‍රජනක ක්ෂේත්‍රයේ හැර අන් සියලුම අතින් ඔවුන් සමාජයට ප්‍රයෝජනවත් අය වෙත් නම්, ජනගහනය වැඩි නොකරමින් වැදගත් සේවයක් කරන අය ලෙස ඔවුන් හැඳින්විය හැකි වේ.

ලිංගික ක්ෂේත්‍රය දෙස නැවත හැරී බලන අපට පෙනී යන්නේ අපේ වර්ගයා අප සිතුවාටත් වැඩියෙන් මූලික ජීවමය ආශාවන්ට ළඟිව ජීවත්වන බවයි. අති මහත් කාර්මික හා ශිල්පීය දියුණුව මැද මාංශභක්ෂක අනුවර්තන සහිත, අග්‍රේශ ලිංගික රටාව එලෙසම පවතී. අද ජීවත්වන නාගරික පවුල් 20 ක කණ්ඩායමක් ගෙන, ආහාර සෙවීම සඳහා පිරිමියා, දඩයමේ යායුතු, නිවර්තන කලාපීය නොදියුණු පරිසරයක දැමුවහොත්, ඔවුන්ගේ ලිංගික රටාවේ කිසියම් අනුවර්තනයක් සිදු විය යුතු නැත. ඇත්ත වශයෙන්ම නගර ගොඩනැගීමේ දී සිදුවී ඇත්තේ, නිරුවත් වානරයාගේ දඩයම් (වැඩ කරන) උපක්‍රම වෙනස් වී, සමාජීය ලිංගික රටාව මුල් ආකාරයටම පවත්වා ගැනීමයි. විද්‍යා ප්‍රබන්ධ කථාවල සඳහන් වන කෘත්‍රිම ළදරුවන් සාදන ගොවිපොළවල්, පොදු ලිංගික ක්‍රියා, ප්‍රජනක ක්‍රියා රජයේ පාලනය යටතට ගැනීම ආදී සිදුවීමක් තවමත් දක්නට නොලැබේ. අභ්‍යවකාශ වානරයා තවමත් හඳට යන්නේත් තම බිරිඳ හා දරුවන් ගේ ඡායාරූපයක් රැගෙනයි. වර්තමාන ශිෂ්ටාචාරයේ බලවේග පැරණි ලිංගික රටාව සමඟ පළමුවැනි වරට මුහුණට මුහුණලා සටනක් කෙරෙන්නේ උපත් සීමා කිරීමේ ක්ෂේත්‍රයේයි.

වෛද්‍ය විද්‍යාව හා සෞඛ්‍යාරක්ෂක ක්‍රමවලට පින්සිදු

Scanned by TapScanner

වන්නට, බෝ කිරීමේ වේගය අතින් අද අපි විශ්වාස කළ නොහැකි තරම් දියුණුවක් ලබා ඇත්තෙමු. අප විසින් මරණය පාලනය කර ඇති බැවින්, එය දැන් උත්පත්ති පාලනය මඟින් සමතුලිත තත්වයකට ගෙන ආ යුතුව තිබේ. අවසානයේදී ඊළඟ ශතවර්ෂයේදී පමණ, අපට අපේ ලිංගික ක්‍රම වෙනස් කිරීමට සිදුවන බවක් පෙනේ. එසේ කරන්නට අපට සිදු වුවහොත් එයට හේතුව අප ලිංගික ක්‍රියාවන් අතින් අසාර්ථක වීම නොව, ඒ අතින් වුවමනාවටත් වඩා හොඳින් සාර්ථක වීමයි.

3 ඇති දැඩි කිරීම

අද ජීවත්වන සෑම සත්ව වර්ගයකටම වඩා විශාල වගකීමක් දෙමාපියන් ලෙස නිරුවත් වානරයාට පැවරී ඇත. වෙනත් සතුන්ද මෙම වගකීම් ඉටුකරනු දැකිය හැකි නමුත්, මෙතරම් විස්තීර්ණ ලෙස ඒවා ඉටුකරන සතකු දැකිය නොහැක. මෙහි ඇති වැදගත්කම සලකා බැලීමට පෙර, අපි මූලික කරුණු දෙස බැලිය යුතු වෙමු.

සංසේචනය සිදුවී ස්ත්‍රිය ගේ ගර්භාෂයේ කලලය වර්ධනයවීම ඇරඹීමත් සමඟ ඈ තුළ විවිධ විපර්යාසයන් ගණනාවක්ම දක්නට ලැබේ. ඇගේ මාසික ඔසප්වීම නතර වෙයි. උදේට ඔක්කාරයක් ඇති වෙයි. රුධිර පීඩනය පහළ බසී. තරමක රක්තහීනතාවක් දක්නට ලැබේ. කාලය ගතවීමත් සමඟ පියයුරු පිම්බී මෘදු වෙයි. ආහාර රුචිය ද වැඩිවන අතර ඈ වෙනදාට වඩා ශාන්ත බවක් පෙන්වයි.

දළ වශයෙන් දින 226 ක ගැබ්දැරීමේ කාලයෙන් පසුව, ඇගේ ගර්භාෂය ඉතා ප්‍රබල ලෙස හා රිද්මානුකූලව සංකෝචනය වීමට පටන් ගනී. කලල රූපය වටා ඇති කලලාකාර පටල කැඩී ළදරුවා පාවෙමින් සිටි ද්‍රව්‍ය නිකුත් වේ. බලවත් සංකෝචනවල ප්‍රතිඵලයක් වශයෙන් ළදරුවා, ගර්භාෂයේ සිට යෝනි මාර්ගය තුළින් බාහිර ලෝකයට තල්ලු කෙරේ. නැවතත් ඇති වන සංකෝචන මඟින් වැදෑමහ ගළවා පිටතට දමනු ලැබේ. ළදරුවා වැදෑමහට සම්බන්ධ කරන රජ්ජුව මින්පසු වෙන් කරනු ලබයි. අනිකුත් අග්‍රේශයන් ගේ නම් සිදුවන්නේ, මව විසින් එය කා දැමීමයි. අපේ මුතුන් මිත්තන්

Scanned by TapScanner

විසින්ද අනුගමනය කරන්නට ඇත්තේ මෙම ක්‍රමය බවට කිසිම සැකයක් නැත. නමුත් අද එය ගැටගසා කතුරකින් කපා දමනු ලැබේ. ළදරුවා ගේ බඩට සම්බන්ධ වී ඇති කොටස දින කීපයකින් වියළී වැටේ.

දරුවා බිහිකිරීමේ දී ස්ත්‍රියට අනිකුත් වැඩිහිටියන් ගේ ආධාර ලැබීම අද සාමාන්‍ය සිරිත වී ඇත. මෙය ඉතා පැරණි සිරිතකි. සිරස් ලෙස ගමන් කිරීම හේතු කොට ගෙන අපේ ස්ත්‍රී වර්ගයා පත්වී ඇත්තේ, ඉතා දුෂ්කර තත්වයකටයි. මෙම ඉදිරි පියවර ගැනීම නිසා, ඇයට පැය ගණනාවක්ම ප්‍රසව වේදනා විඳීමට සිදුවී තිබේ. වනාන්තරගත මුතුන් මිත්තන්ගෙන් දඩයම් වානරයා පරිණාමය වූ කාලයේ සිටම, දරුවන් බිහිකිරීමේ දී, අනිකුත් වැඩිහිටියන් ගේ සහයෝගය අවශ්‍ය වූ බැව් පෙනේ. වාසනාවකට මෙන් දඩයම්කාරී ජීවන රටාවත් සමඟ සහයෝගීතාවත් දියුණු වීම නිසා, මෙම ප්‍රශ්නයට හේතුව වූ දෙයින්ම එයට පිළියමක්ද සොයා ගත හැකි විය. සාමාන්‍යයෙන් චිම්පන්සි මව, ළදරුවා බිහි කිරීමෙන් පසු, රජ්ජුව පමණක් නොව, වැදෑමහෙන් ද සැහෙන කොටසක් කා දමා, ළදරුවා ලෙවකා පිරිසිදු කොට, ඇයගේ සිරුරට ළංව ආරක්ෂා සහිතව තබා ගනී. නමුත් දැඩි ලෙස විඩාවට පත්වන අපේ වර්ගයාගේ මව, මේ සියල්ල අන් අයට බාර කරයි.

මවට කිරී එරීම උත්පත්තියෙන් දිනක් හෝ දෙකක් තුළ සිදුවේ. මෙය ආරම්භ වීමෙන් පසු, ඇයට දිගටම අවුරුදු දෙකක් පමණ යනතුරු ළදරුවාට කිරි දීමට පුළුවන. සාමාන්‍යයෙන් කිරි උරාබොන කාලය, මෙයට වඩා අඩුවන අතර වර්තමානයේ එය මාස 6-9 ත් පමණ කාලයකට සීමා වී තිබේ. සාමාන්‍යයෙන් මේ කාලය තුළදී ස්ත්‍රියගේ ඔසප් වීම යටපත් වන අතර, එය නැවත ආරම්භ වන්නේ කිරිදීම නතර කිරීමත් සමඟය. නමුත් ළදරුවාට ටින් කිරි ආහාර දීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ කිරි දීම මෙයටත් කලින් නතර කළහොත් ස්ත්‍රියට ඉක්මණින්ම නැවත ළදරුවකු බිහි කිරීමට හැකිවේ. අනික් අතට, ඇය පැරණි සිරිත් අනුගමනය කරමින්,

ළදරුවාට අවුරුදු දෙකක්ම කිරි උරා බීමට ඉඩ දුන්නහොත්, ඇයට ඊළඟ දරුවා බිහිකළ හැකි වන්නේ අවුරුදු තුනකට පමණ පසුවය. (සමහර අවස්ථාවන්හි දී උත්පත්ති පාලන ක්‍රමයක් ලෙස කිරි උරා බොන කාලය මෙසේ දික්කිරීමක් දක්නට ලැබේ.) දළ වශයෙන් අවුරුදු 30 ක් පමණ වන ප්‍රජනන කාලය තුළ, මේ අනුව ඇයට දරුවන් 10 ක් පමණ බිහිකළ හැකි වේ. ටින් කළ කිරි ආහාර දීමෙන් හෝ කිරි දීමේ කාලය ඉතා කෙටි කිරීමෙන් හෝ සෛද්ධාන්තිකව බලන විට, ඇයට බිහි කළ හැකි දරුවන් ගණන 30 ක් පමණ වන බව පෙනේ.

කිරි උරා බීමේ ක්‍රියාව අනිකුත් අග්‍රේශයන්ට වඩා අපේ ස්ත්‍රී වර්ගයාට ප්‍රශ්නයක් වී තිබේ. අපේ ළදරුවාට කිසිවක් කරකියා ගත නොහැකි බැවින්, මවට මෙහි දී වඩා ක්‍රියාත්මක ලෙස සහභාගීවීමට සිදුවේ. සමහර ළදරුවන්ට කිරි උරා බීම පුරුදු කිරීම ඉතා අපහසු වෙයි. මෙයට හේතුව තන පුඩු ප්‍රමාණවත් තරම් ළදරුවාගේ කට තුළට නොයෑමයි. උඩුතල්ලත් දිවත් ගැවෙන සේ තන පුඩු කට තුළට යා යුතුය. උරා බීම සඳහා හනු, දිව හා කම්මුල් ක්‍රියාකාරී වන්නේ මෙම උත්තේජනයටයි. එම නිසා, තන පුඩු අසල කොටස, ළදරුවාට තන පුඩුව කට තුළට ගත හැකි ලෙස ඇදෙන සුළු විය යුතුය. මව්කිරි බීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස සිදුවීමට නම්, ඉපදී දින පහක් පමණ ඇතුළත මෙය සාර්ථක ලෙස සිදු විය යුතුය. නැවත නැවතත් එය අසාර්ථක වුවහොත්, ළදරුවාට නියම ආකාරයට ප්‍රතිචාර දැක්වීමට කිසිදාක හැකි නොවනු ඇත. ඒ වෙනුවට වඩා සතුටුදායක ප්‍රතිඵල ලබා දෙන බෝතලයට ඔහු පුරුදු වෙයි.

සමහර දරුවෝ තවත් දුෂ්කරතාවයකට මුහුණ පාති. මෙයින් බොහෝ මවුවරුන්ට හැඟී යන්නේ, ළදරුවාට කිරි උරා බීමට අවශ්‍ය නැතැයි යන්නයි. නමුත් ඇත්ත වශයෙන්ම සිදුවන්නේ, කොතෙක් උත්සාහ කළත්, හුස්ම ගැනීමේ අපහසුව නිසා මෙම ප්‍රයත්නය අසාර්ථක වීමයි. ළදරුවාගේ හිස, පියයුරු අසළ වැරදි ලෙස තිබුණහොත්, එයින් නාසය වැස

Scanned by TapScanner

යාමෙන් කටේ කිරි පිරුණ විට හුස්ම ගැනීම අපහසු වේ. ඔහු සටන් කරන්නේ කිරි උරා බීමට නොව, හුස්ම ගැනීමටයි. අලුතෙන් මවක බවට පත්වන ස්ත්‍රිය මුහුණ පාන වෙනත් ප්‍රශ්න කොතෙකුත් ඇති නමුත්, මා මේ දෙක තෝරා ගත්තේ, පියයුරු කිරි නිපදවන යන්ත්‍රයක් නොව, මූලික වශයෙන් ලිංගික සංඥා නිකුත් කරන උපකරණයක් යන මතය මෙයින් තහවුරු වන බැවිනි.

මෙම ප්‍රශ්න දෙකම ඇති වී තිබෙන්නේ, පියයුරුවල පිරුණු රවුම් හැඩය නිසාය. කිරි උරා බීම සඳහා වඩාම සුදුසු හැඩය කුමක්ද යන්න කිරි බෝතලවලට සවිකරන සූප්පුවක් දෙස බැලීමෙන් පැහැදිලි වෙයි. ඒවා දිහූ හැඩයෙන් යුතු වන අතර, එයින් ළදරුවා ගේ කටත්, නාසයත් නොවැසේ. සැලසුම අතින් ගැහැනු චිම්පන්සීන් ගේ පියයුරු මෙයට බොහෝ සමානය. කිරි දෙන කාලයේ දී චිම්පන්සි මවගේ තරමක් පිම්බුණු පියයුරු දැකිය හැකි නමුත්, ඒවා කිසි විටෙක අපේ ස්ත්‍රීන් ගේ තරම් විශාල නොවේ. චිම්පන්සියා ගේ තන පුඩු දිගු හැඩයෙන් යුක්ත වන අතර එයින් කිසිම අපහසුවක් නැතිව, ළදරුවාට කිරි උරා බීමට පුළුවන. අපේ ළදරුවන්ද මවගෙන් කිරි උරා බොන බැවින්, පියයුරුවල ඉදිරියට නෙරා ගිය රවුම් හැඩයද, මෙම කාර්යයේම කොටසක් ලෙස සැලකීමට අපි පුරුදු වී ඇත්තෙමු. නමුත් අපේ වර්ගයා සම්බන්ධයෙන් මෙම නිගමනය වැරදි බවත්, පියයුරුවල හැඩය මූලික වශයෙන් මාතෘ කාර්යයක් නොව, ලිංගික කාර්යයක් ඉටුකරන්නක් බව පෙනේ.

කිරි දීම පිළිබඳ ප්‍රශ්නය මෙතැනින් නතර කර අනිකුත් අවස්ථාවන්හිදී මව ළදරුවා සමඟ හැසිරෙන ආකාරය ගැන මඳක් සොයා බලමු. සුරතල් කිරීම, තුරුල් කර ගැනීම, පිරිසිදු කිරීම ආදිය ගැන වැඩිපුර කරුණු දැක්විය යුතු නැති නමුත්, ඈ ළදරුවා, සාමාන්‍යයෙන් තම සිරුරට තබා ගන්නා ඉරියව්ව ඉතා වැදගත් වේ. මේ පිළිබඳ කරන ලද අධ්‍යයනයකදී පෙනී ගියේ, මව්වරුන් ගෙන් සියයට 80 ක් ළදරුවන් තම වම් අතේ තබා ගන්නා බවයි. මෙයට හේතුව බොහෝ දෙනා දකුණත

හුරු අය වීම නිසා, අනිත් වැඩ කටයුතු සඳහා දකුණු අත නිදහස්ව තබා ගැනීම යයි, බොහෝ දෙනෙකු සිතනු ඇත. නමුත් මේ ගැන ගැඹුරට සලකා බැලීමේදී පෙනී ගියේ එය ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් නොවන බවයි. දකුණත හුරු මව්වරුන් ගෙන් සියයට 83ක් ළදරුවා වම් අතේ තබාගන්නා අතර වමත් මව්වරුන් ගෙන් ද සියයට 78 ක් ළදරුවා තබා ගන්නේ වම් අතේ බව පෙනුණි. වෙනත් වචන වලින් කිවහොත්, වමත් මවුවරුන් ගේ පුරුදු අත වෙනත් කටයුතු සඳහා නිදහස්ව ඇත්තේ සියයට 22 කගේ පමණි. මේ අනුව ළදරුවා වම් පැත්තේ තබා ගැනීමට, එතරම් පැහැදිලිව නොපෙනෙන, වෙනත් හේතුවක් තිබිය යුතු බව පෙනේ.

මෙයට දිය හැකි එකම ඉඟිය හදවත සිරුරේ වම් පැත්තේ පිහිටා තිබීමයි. මෙහිදී වැදගත් සාධකය වන්නේ මවගේ හෘද ස්පන්දනය විය නොහැකිද ? මවගේ සිරුර තුළ වැඩෙන කාලයේ හෘද ස්පන්දන හඬ දරුවාගේ සිතට කා වැදීමක් සිදුවේ. මෙය සත්‍යයක් නම් පිටස්තර ලෝකයේ දී මෙම හඬට ළදරුවා සන්සුන් කිරීමේ හැකියාවක් තිබීමට පුළුවන. ළදරුවා තම සිරුරේ වම් පැත්තේ තබා ගත් විට සන්සුන් වන බව මව සහජයෙන් හෝ අත්හදා බැලීමෙන් හෝ දැන ගනී. මේ නිසා නිතරම ඔහු වම් අතේ තබා ගැනීමට ඈ පුරුදු වෙයි.

මෙය කිසිසේත් විශ්වාස කළ නොහැකි දෙයක් ලෙස පෙනෙන්ට හැකි නමුත්, පරීක්ෂණවලින් පෙනී ගොස් ඇත්තේ, සත්‍යය එය බවයි. අලුත උපන් ළදරුවන් කණ්ඩායම් කීපයක්, මිනිත්තුවකට 72 වාරයක් සිදුවන හෘද ස්පන්දනයේ පටිගත කරන ලද ශබ්දයට නිරාවරණය කරන ලදී. එක කණ්ඩායමක ළදරුවන් 9 දෙනා බැගින් වූ අතර මෙම ශබ්දය නැතිවිට අඩුම වශයෙන් ඔවුන්ගේ එක් අයෙකු වත් සියයට 60ක කාලයක් හඬන බව පෙනුණි. නමුත් හෘද ස්පන්දන ශබ්දය වාදනය කරන විට, මෙය සියයට 38 දක්වා පහත වැටුණි. හෘද ස්පන්දන ශබ්දයට නිරාවරණය කරන ලද ළදරුවන් ගේ අන් අයට වඩා වැඩිමක්ද දකින්නට ලැබුණි. අනික් කණ්ඩායම

Scanned by TapScanner

හැඩීම සඳහා තම ශක්තියෙන් සැලකිය යුතු කොටසක් වැය කිරීම මෙයට හේතුව විය.

තරමක් වැඩිමහලු ළදරුවන් සමඟ මේ සම්බන්ධව තවත් පරීක්ෂණයක් කරන ලදී. සමහර කාමර නිශ්ශබ්දව තබන ලද අතර, සමහරක නැළැවිලි ගීත වාදනය කරන ලදී. තවත් සමහර කාමරවල මිනිත්තුවට ස්පන්දන 72 ක වේගයෙන් ක්‍රියා කරන කාලමාපකයක් ක්‍රියාත්මක කරවන ලදී. තවත් සමහරක නියම හෘද ස්පන්දන ශබ්දය ඇසෙන්නට සලස්වා ඉක්මණින් නින්දට වැටෙන්නේ කුමන කණ්ඩායම දැයි සොයා බලන ලදී.

හෘද ස්පන්දනයට ලක් කළ කණ්ඩායම නින්දට වැටීමට ගත වූයේ අන් කණ්ඩායම්වල ඒ සඳහා ගතවූ කාලයෙන් අඩකි. මෙයින් පැහැදිලි වන්නේ හෘද ස්පන්දන ශබ්දය ඉතා ප්‍රබල ලෙස ළදරුවා සන්සුන් කරන උත්තේජනයක් බවයි. මවක බොහෝ විට ළදරුවා වම් අතින් වඩා ගැනීමට හේතුව මෙය බව දැන් පැහැදිලිව පෙනේ. හෘද ස්පන්දන ශබ්දය ළදරුවාට කා වැඳීමේ වෙනත් ප්‍රතිඵල දකින්නට නිබේද? උදාහරණයක් වශයෙන් අපි ආදරය පිළිබඳ හැඟීම් හිසේ නොව, හදවතේ ඇතිවන්නක් ලෙස දැක්වීමට හේතුව මෙය වන්නට පුළුවන. ළදරුවන් නිදිකිරීමට මව්වරුන් ඔවුන් පැද්දීම ද මෙයින් පැහැදිලි වේ. පදවන වේගය බොහෝ විට හෘද ස්පන්දන වේගයට සමාන වන බැවින්, ළදරුවාට මව් කුස තුළ දී ලැබුණු රිද්මයානුකූල සංවේදනය මෙහිදීද ලැබේ.

මෙය මෙතැනින් නොනැවතී වැඩිහිටි ජීවිතය දක්වා විහිදේ. අපේ සිතේ අවුලක් හෝ ගැටුමක් පවතින විට අපි ඒ මේ අතට පැද්දෙමු. කථිකයෙකු රිද්මයානුකූලව වැනෙන්නට පටන් ගන්නේ පිරිසකට මුහුණදීමේ අපහසුව මහ හරවා ගැනීමටයි. එය සීමිත නත්වයන් යටතේ පරණ, පුරුදු, සුවදායක රිද්මය දෙසට හැරීමට තැත් කිරීමකි. බොහෝ ජන ගී හා ගැමි නැටුම්වල දක්නට ලැබෙන රිද්මය ද මෙයට සමාන වීම පුදුමයක් නොවේ.

මෙතෙක් කල් අප සාකච්ඡා කළේ දරුවා කෙරෙහි මව හැසිරෙන ආකාරයයි. උත්පත්තියේ සිට ආහාර දීම, වඩා ගැනීම හා නැළවීම ආදී දෑ අපි විමසීමට ලක් කළෙමු. දැන් අපි ළදරුවා දෙසට හැරී ඔහුගේ වැඩීම ගැන මඳක් විමසා බලමු.

උත්පත්තියේ දී ළදරුවාගේ සාමාන්‍ය බර රාත්තල් 7 ක් පමණ වේ. මෙය සාමාන්‍ය දෙමාපියකුගේ බරින් විස්සෙන් පංගුවකි. වැඩීම මුල් අවුරුදු දෙකේදී ඉතා වේගවත් වන අතර ඊළඟ අවුරුදු හතරේදී ද සැලකිය යුතු වේගයකින් සිදුවේ. කෙසේ වෙතත් වයස හයේදී පමණ වර්ධනය ඉතා අඩුවේ. වැඩි වියට පත්වීමත් සමඟ වැඩීම නැවතත් වේගවත් වේ. පිරිමි ළමයින් ගේ වයස 11 සිට 17 දක්වාද, ගැහැනු ළමයින්ගේ වයස 10 සිට 15 දක්වාද, වේගවත් වැඩීමක් සිදු වේ. ගැහැනු ළමයින් ඉක්මණින් වැඩිවියට පත්වීම නිසා, වයස 11 ත් 14 ත් අතර කාලයේ ඔවුන් පිරිමින්ට ඉදිරියෙන් සිටින නමුත් ඉන්පසුව වැඩීම අතින් පිරිමි, ගැහැනුන් පරදවති. ගැහැණුන් ගේ ශරීර වර්ධනය වයස 19 දී පමණ අවසන් වන නමුත් පිරිමින් ගේ වයස 25 පමණ වන තෙක් එය සිදුවේ. ළදරුවෙකුගේ හයවෙනි, හත්වෙනි මාසවලදී මුල් දත් ඇතිවන අතර, දෙවන අවුරුද්ද අවසානයේ හෝ තුන්වන අවුරුද්දේ මැද වන විට, කිරි දත් පෙළ සම්පූර්ණ වේ. ස්ථිර දත් ඇතිවීමවයස අවුරුදු හයේදී පමණ ආරම්භ වන නමුත්, අවසාන වාර්වක දත් වයස 19 පමණ වන තෙක් ඇති නොවේ.

ඉපදුණු අලුත ළදරුවෝ ඉතා වැඩි කාලයක් නිදා ගනිති. මුල් සති කීපය තුළ ඔවුන් අවදිව සිටින්නේ පැය දෙකක් පමණ යයි මතයක් ඇතත් එය සත්‍යයක් නොවේ. ඔවුන්ට එතරම් නිදිමතක් ඇති බවක් නොපෙනේ. මේ පිළිබඳව කරන ලද අධ්‍යයනයන්ගෙන් පෙනී යන්නේ, මුල් දින තුන තුළ ඔවුන් පැය 16.6 ක් පමණ නිදා ගන්නා බවයි. වැඩිපුරම නිදාගත් ළදරුවා පැය 23 ක් නින්දේ පසුවූ අතර වැඩිපුරම අවදියෙන්

Scanned by TapScanner

සිටි ළදරුවා නිදා ගත්තේ පැය 10.5 ක් පමණි. මෙයින් පෙනී යන්නේ නිදාගන්නා කාල ප්‍රමාණය ළදරුවාගෙන් ළදරුවාට වෙනස් වන බවයි.

කාලය ගෙවීයාමත් සමඟ නිදාගන්නා කාලය ක්‍රමයෙන් අඩුවී වැඩිහිටි අවස්ථාව වන විට, එය මුලදී නිදාගත් ප්‍රමාණය වූ පැය 16 න් අඩක් පමණ වේ. සාමාන්‍යයෙන් වැඩිහිටියෙකු නිදාගන්නා ප්‍රමාණය පැය 8 ක් පමණක් වන නමුත්, සමහර වැඩිහිටියෝ මෙයින් බොහෝ වෙනස් වෙති. වැඩිහිටියන්ගෙන් සියයට දෙකකට අවශ්‍ය වන්නේ පැය පහක නින්දක් පමණක් වන අතර, තවත් සමහරුන්ට පැය දහයක පමණ නින්ද අවශ්‍ය වේ. වැඩිහිටි ගැහැනුන් නිදාගන්නා කාලය සාමාන්‍යයෙන් වැඩිහිටි පිරිමින් නිදාගන්නා කාලයට වඩා මඳක් වැඩිවෙයි.

ඉපදුණු අලුත වුවද පැය 16 ම එකදිගට නිදා ගැනීමක් දක්නට නොලැබේ. දවස පුරා පැතිරුණු කුඩා කාල පරිච්ඡේදයන් ගණනාවකින් එය සමන්විත වෙයි. මුල සිටම රාත්‍රී කාලයේ වැඩි වශයෙන් නිදාගැනීමක් දක්නට ලැබේ. දිවා කාලයේ කෙටි කාල පරිච්ඡේදයන් කීපයක් නිදාගන්නා ළදරුවා, රාත්‍රියේදී දිග නින්දකට වැටේ. මේ අනුව වයස මාස 6 ක් පමණ වන විට නිදාගන්නා කාලය පැය 14 කට සීමා වෙයි. මින්පසුව දිවා කාලයේ නින්ද උදේ වරුවේ කෙටි නින්දකට හා සවස් වරුවේ කෙටි නින්දකට සීමා වෙයි. දෙවැනි අවුරුද්දේ පමණ උදේ නිදාගැනීම අත හැරී, දිනකට නිදා ගන්නා ප්‍රමාණය පැය 13 ක් පමණ වේ. පස්වැනි අවුරුද්දේ දී සවස නින්ද ද නතර වී, දිනකට නිදාගන්නා කාලය පැය 12 ක් පමණ වේ. වයස 13 වන විට ළමයෙකු නිදාගන්නා කාලය සාමාන්‍යයෙන් පැය 9 ක් පමණි. මෙතැන් සිට වැඩිහිටි කාලය දක්වා නිදාගන්නා කාලයේ එතරම් වෙනසක් දක්නට නොලැබෙන අතර සාමාන්‍යයෙන් එය පැය 8 ක් පමණ වේ. නිදාගැනීමේ රටාවේ වර්ධනය ගැලපෙන්නේ ශාරීරික වර්ධනය සමඟ නොව, ලිංගික වර්ධනය සමඟ බව පෙනේ.

පූර්ව පාසල් වයසේ ළමයින් අතර වඩා බුද්ධිමත් අය අන් අය තරම් නිදා නොගන්නා බව පෙනේ. වයස හතේ දී පමණ මෙම සම්බන්ධතාව අනික් අතට හැරේ. එනම් බුද්ධිමත් ළමයින් අන් අයට වැඩියෙන් නිදාගැනීමයි. කෙසේ වෙතත් වැඩිහිටියන් ගේ බුද්ධියත් නිදාගන්නා කාල සීමාවත් අතර සම්බන්ධයක් නැති බව පෙනේ.

සියලුම වයස්වල ගැහැනුන් හා පිරිමින් නින්දට වැටීමට ගතවන කාලය මිනිත්තු 20 ක් බව පෙනේ. අවදිවීම එක්විටම සිදුවන්නකි. අවදි වීමට කෘත්‍රිම උපකරණ අවශ්‍ය වන්නේ ප්‍රමාණවත් නින්දක් නොලැබීම නිසාය. නින්ද ප්‍රමාණවත්ව නොලැබීම නිසා, අවදියෙන් සිටින කාලය තුළ පරීක්ෂාකාරී බව හා උද්යෝගය අඩු වේ.

අලුත උපන් ළදරුවා වලනය වන්නේ ඉතා මඳ වශයෙනි. අනෙකුත් අග්‍රේශයන් ගේ මෙන් නොව, ඔහුගේ මාංශපේශී වර්ධනය වී ඇත්තේ ඉතා සුළුවෙනි. ළදරු වදුරෙකුට උත්පත්තියේ සිටම මවගේ සිරුරට තදින් එල්ලී සිටීමට පුළුවන. නමුත්, අපේ වර්ගයා ගේ අලුත උපන් ළදරුවාට කළ හැක්කේ, යන්තමින් අත පය වැනීම පමණි. මාසයක් පමණ යන තෙක් මුණින් අතට සිට නිකට එසවීමට වත් ඔහුට හැකි නොවේ. මාස දෙකේදී පමණ ඔහුට පපුව එසවිය හැකි වේ. මාස හතරේදී පමණ ඔහුට මවගේ ආධාර ඇතිව ඉඳගැනීමට පුළුවන. මාස පහේදී මවගේ උකුලේ ආධාරයක් නොමැතිව ඔහුට ඉඳ ගැනීමට හැකිවන අතර මාස අට වන විට මවගේ ආධාර ඇතිව සිට ගැනීමට හැකි වේ. මාස නවයේදී පමණ ඇඳ පුටු ආදිය අල්ලාගෙන තනියම නැගිටීමට පුළුවන් වේ. මාස එකොළහේ දී වැඩිහිටියකු ගේ අත අල්ලාගෙන ඔහුට ඇවිදීමට හැකි වේ.

මාස දොළහේ දී තනිව සිට ගන්නා ඔහුට මාස දහතුන වන විට පඩි පෙළක් දිගේ ඉහළ නැඟීමට පුළුවන. ඔහුට ආධාරයක් නැතිව ඇවිදීමට හැකි වන්නේ මාස පහළොවේ දී

Scanned by TapScanner

පමණය. (මේවා සාමාන්‍ය ළදරුවකු වර්ධනය වන ආකාරය වන අතර ඒවා මඳක් වෙනස් වීමට ඉඩ තිබේ. කෙසේ වෙතත් මෙය අපේ වර්ගයා ගේ සංවරණ හා ඉරියව් වර්ධනය පිළිබඳ දළ සටහනක් වෙයි.)

ආධාරයක් නොමැතිව ඇවිදීමට පටන් ගත් තැන් සිට ළදරුවා මුල් වචන කිහිපය ද කථා කිරීම අරඹයි. මුලදී ඔහුට ශබ්ද කළ හැක්කේ වචන කිහිපයක් පමණක් නමුත්, මෙය ඉතා ශීඝ්‍රයෙන් වැඩිවේ. වයස අවුරුදු දෙක වන විට, සාමාන්‍යයෙන් ළමයකුට වචන තුන්සියයක් පමණ කථා කළ හැකියි. වයස අවුරුදු තුන වන විට මෙම සංඛ්‍යාව තුන් ගුණයකින් පමණ වැඩි වේ. වයස හතරේදී ඔහුට කථා කළ හැකි වචන සංඛ්‍යාව 1600ක් පමණද, වයස පහ වන විට එය 2000ක් පමණ ද වේ. ශබ්ද අනුකරණය කිරීම අතින් දක්නට ලැබෙන මෙම පුදුමාකාර හැකියාව අපේ වර්ගයාට පමණක් විශේෂ වූ දෙයකි. සහයෝගයෙන් දඩයම් කිරීම සඳහා අවශ්‍ය වන වඩා නිවැරදි ලෙස අදහස් හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාව මෙයින් පිරී මැසේ. අපේ කිට්ටුම නෑයන්ගේවත් මෙයට යන්තමින් හෝ සම කළ හැකි දෙයක් දක්නට නොලැබේ. චිම්පන්සියාට වෙනත් දේ අනුකරණය කළ හැකි නමුත්, එතරම් හොඳින් ශබ්ද අනුකරණය කළ නොහැක. වරක් තරුණ චිම්පන්සියෙකුට කථා කිරීම පුරුදුකිරීමට ඉතා දුෂ්කර ප්‍රයත්නයක් දරන ලද නමුත්, එය සාර්ථක වූයේ ඉතා සුළු වශයෙනි. අපේ වර්ගයාගේ ළදරුවකුට ලැබෙන තත්වයන්ට සමාන ආකාරයේ වාතාවරණයක් සහිත නිවසක මෙම චිම්පන්සියා කුඩා කල සිටම ඇති දැඩි කරන ලදි. නිවැරදිව වචනයක් ශබ්ද කළ හැම විටම ඌ වඩා කැමති ආහාර වර්ග දීමෙන් වචන උච්චාරණය කිරීමට පොළඹවන ලදී. වයස දෙකහමාරේ දී වචන තුනක් උච්චාරණය කළ හැකි වූ අතර අවසානයේ ඒවා නියම අවස්ථාවකදී කීමට ඔහුට හැකි විය. පුහුණු කිරීම දිගටම කරගෙන ගිය අතර වයස අවුරුදු හය වන විට (අපේ ළදරුවකු වචන 2000 ක් පමණ උච්චාරණය කරන විට) ඔහුගේ වාග් මාලාව වචන හතකට වඩා වැඩි නොවීය.

මෙම වෙනසට හේතුව ශබ්ද කිරීමේ හැකියාව නොව මොළයයි. ව්‍යුහමය වශයෙන් අපට මෙන් විවිධ ශබ්ද ඇති කළ හැකි ස්වර උපකරණයක් චිම්පන්සියාට ද තිබේ. උගේ ගොළු බවට හේතුව එහි දුර්වලතාවක් නොව මොළයයි.

චිම්පන්සියා මෙන් නොව සමහර කුරුල්ලන්ට ශබ්ද අනුකරණය කිරීමේ පුදුම හැකියාවක් ඇත. ගිරවා, මයිනා වැනි පක්ෂීන්ට දිග වාක්‍යයක් පවා ඉතා පහසුවෙන් අනුකරණය කළ හැකි නමුත්, ඔවුන්ට ඇත්තේ කුරුලු මොළයක් වීම නිසා, එම හැකියාවෙන් එතරම් ප්‍රයෝජනයක් වී නැත. මෙම සතුන්ට හැකි වන්නේ සංකීර්ණ ශබ්ද මාලාවක් ඒ ආකාරයටම නැවත ශබ්ද කිරීම පමණි. ශබ්ද උච්චාරණය අතින් චිම්පන්සීන්ට හා වඳුරන්ට මීට වඩා හැකියාවක් නොතිබීම පුදුමයට හේතු වේ.

සරල වචන කිහිපයක්වත් උච්චාරණය කිරීමේ හැකියාව තිබුණේ නම්, ඔවුන්ට එය ඉතා ප්‍රයෝජනවත් වන්නට තිබුණි. එවැන්නක් පරිණාමය නොවූයේ මන්ද යන්න තේරුම් ගැනීම දුෂ්කරය.

අලුතෙන් ලැබුණු ශබ්ද උච්චාරණය කිරීමේ හැකියාව නිසා, අනිකුත් වානරයන්ට පොදු වූ විවිධ ගෙරවීමේ, වැලපීමේ හා කෑගැසීමේ ශබ්ද අප ඉවත දමා නැත. මෙම සහජ ශබ්ද තවමත් ඉතා වැදගත් තැනක් ගනී. අපේ යෝධ වචන මාලාව ගොඩනැගී ඇත්තේ ඒ මත වන්නාක් මෙන්ම, අදහස් හුවමාරු කරගැනීම සඳහා ද ඒවා තවමත් යොදා ගැනේ. වචන මෙන් නොව කිසිම පුහුණුවකින් තොරව අප ඒවා ඉගෙන ගන්නා අතර ඒවායින් සෑම සංස්කෘතියකදීම එකම දෙයක් අදහස් කෙරේ. මේ ආකාරයටම මඳ සිනහව, ගෙරවීම, වැලපීම හා හැඬීම මගින් සෑම තැනකදීම සෑම කෙනෙක්ම එකම දෙයක් අදහස් කරයි. අනිකුත් සත්වයන්ගේද මෙවැනි ශබ්දවලින් එම සත්වයාගේ මානසික තත්වය පිළිබඳ හැඟීම් ප්‍රකාශ වේ. සිනහවීම, නියවීම, රවා බැලීම ආදිය සියලුම සමාජවලට පොදු වන අතර විවිධ සංස්කෘතික සංඥාවන් ලබා ගැනීමෙන්

Scanned by TapScanner

පසුවත්, ඒවා රැඳී තිබෙනු දක්නට ලැබේ.

අපේ වර්ධනයේ මුල් අවස්ථාවේ දී මෙම මූලික ශබ්ද හා මුහුණු ඇතිවන්නේ කෙසේදැයි සොයා බැලීම වැදගත් වේ. රිද්මයානුකූල හැඩීම උත්පත්තියේ සිටම දක්නට ලැබෙන්නකි. මඳ සිනහව දක්නට ලැබෙන්නේ වයස සති පහක් පමණ වූ පසුය. සිනහව හා කෝපවීම තුන්වැනි හෝ හතරවැනි මාසය වන තෙක් දක්නට නොලැබේ. මෙම හැසිරීම් රටාවන් ඇතිවන ආකාරය ගැන දැන් මඳක් සලකා බලමු.

හැඩීම පළමුවැනි හැඟීම් දක්වන සංඥාව වනවා පමණක් නොව, ඉතා මූලික සංඥාවක් ද වේ. එමෙන්ම, සිනහව හා මඳ සිනහව අතිවිශේෂ මෙන්ම අද්විතීය සංඥාවක් වේ. නමුත් හැඩීම තවත් සත්ව වර්ග දහස් ගණනකට පොදු දෙයකි. සාමාන්‍යයෙන් සියලුම ක්ෂීරපායී සත්තු බිය වූ හෝ වේදනාවක් දැනුණු විට හඬති. මුහුණෙන් හැඟීම් ප්‍රකාශකිරීම, දියුණු වී ඇති ක්ෂීරපායීන් ගේ හැඩීම සමඟ බියමුසු මුහුණ දක්නට ලැබේ. තරුණ හෝ වැඩිහිටි හෝ සත්වයෙකු විසින් කරන මෙම ශබ්දවලින් කියැවෙන්නේ කුමක් හෝ වරදක් ඇති බවයි. බාලයා හැඩීමෙන් වැඩිහිටියාගේ අවධානය එයට යොමු කරවන අතර වැඩිහිටියෝ මෙවැනි සංඥාවලින් කණ්ඩායමේ අවධානය යොමු කරවති.

ළදරුවන් වශයෙන් අපි විවිධ හේතු නිසා හඬමු. වේදනාවක් දැනුණු විට, බඩගිනි වූ විට, නුපුරුදු හෝ නුහුරු උත්තේජයක් හමුවූ විට හෝ අවශ්‍ය දෙයක් ලබාගත නොහැකි වූ විට අපි හඬමු. මේ සියල්ල මූලික වශයෙන් සාධක දෙකකට වෙන් කළ හැකි වේ. ඒවා නම් ශාරීරික වේදනාව හා ආරක්ෂා රහිත බව පිළිබඳ හැඟීමයි. මෙම කුමන අවස්ථාවකදී වුවත් සංඥාව දුන් විගසම දෙමාපියන්ගෙන් ආරක්ෂිත ප්‍රතිචාරයක් ඇතිවේ. සංඥාවක් නිකුත්වන අවස්ථාවේ දෙමාපියන් දරුවා ළඟ නොසිටියේ නම් වහා ඔහු වෙත පැමිණ වඩාගෙන නළවනු දක්නට ලැබේ. ළදරුවා ස්පර්ශ කිරීමෙන් පසුවත් සංඥාව නොනැවතුණහොත්, වේදනාව ඇතිවීමට හේතුව සෙවීම සඳහා

ශරීරය පිරික්සනු ඇත. හැඩීමේ සංඥාව නතරවන තුරුම දෙමාපිය ප්‍රතිචාරය දක්නට ලැබේ. (මේ අතින් එය මඳ සිනහව හා සිනහ රටාවන්ගෙන් මූලික වශයෙන් වෙනස් වේ.) මාංශපේශීවල ආතතිය, මුහුණ රතු පැහැ ගැන්වීම, ඇස්වලින් කඳුළු ගැලීම, කට ඇරීම, ප්‍රබල ලෙස හුස්ම ගැනීම, හා අධික ශබ්ද ආදියෙන්, හැඩීම සමන්විත වේ. තරමක් වයස්ගත දරුවන් මේ සමහම දෙමාපියන් වෙත දුව යෑමක් දක්නට ලැබේ.

අප කාටත් ඉතා හුරු පුරුදු මෙම හැසිරීම මා මෙහිදී විස්තරාත්මකව දැක්වූයේ විශේෂ සංඥාවක් වන සිනහව හා මඳ සිනහව ඇතිවූයේ මෙයින් බැවිනි. "අපි ඇඬෙන තුරු සිනහ වුණෙමු" යි කිසිවෙකු කියන විට, ඔහු මේ සම්බන්ධතාව ගැන මතක් කරයි. නමුත් පරිණාමීය වශයෙන් බලන විට එය සිදුවී ඇත්තේ අනික් අතටයි. අප සිනහ යන තෙක් හැඬූ බව පෙනේ. මෙය සිදුවූ ආකාරය තේරුම් ගැනීමට ප්‍රතිචාර රටාවක් ලෙස හැඩීම හා සිනහව කොතරම් සමාන දැයි අවබෝධ කරගත යුතුව ඇත. ඒවා ඇතිවීමට හේතුවන හැඟීම් වෙනස් බැවින් අපට මෙය එක් වරම නොපෙනේ. හැඩීම මෙන්ම සිනහවත්, පේශී ආතතිය, මුඛය විවෘත වීම, තොල් පසුපසට ඇදීම, වේගයෙන් හුස්ම ගැනීම ආදියෙන් සමන්විත වෙයි. ඉතා තදින් සිනහවීමේ දී මුහුණ රතුවීමත්, ඇස්වලින් කඳුළු ගැලීමත් දක්නට ලැබේ. නමුත් ශබ්ද, හැඩීමේ දී තරම් බලවත් නොවේ. ඒවා එකකට පසුව එකක් එන කෙටි ශබ්ද බවට පත්වී ඇත. මෙය හරියටම ළදරුවාගේ දීර්ඝ හැඩීම, කුඩා කොටස්වලට කැඩී, වඩා මෘදු බවක් ගෙන ඇතිවාක් මෙනි.

හැඩීමේ ද්විතීයික සංඥාවක් ලෙස, සිනහවීමේ ප්‍රතික්‍රියාව ඇති වූයේ පහත දැක්වෙන ආකාරයට බව පෙනේ. උත්පත්තියේ සිටම හැඩීම දක්නට ලැබෙන නමුත්, සිනහව තුන්වැනි හා හතරවැනි මාසවල ඇතිවන දෙයක් බව මම සඳහන් කළෙමි. එය දෙමාපියන් හඳුනාගැනීමත් සමඟ ඇතිවන ප්‍රතික්‍රියාවකි. මව හඳුනාගන්නා ළදරුවා සිනහවීමට පටන් ගනී. මවගේ මුහුණ අනිකුත් වැඩිහිටියන්ගෙන් වෙන්කර

Scanned by TapScanner

හඳුනාගැනීමට පෙර, ළදරුවා විවිධ ශබ්ද කරන නමුත්, සිනහ නොවේ. තම මව හඳුනාගැනීමට හැකිවීමත් සමඟ ඔහු අනිකුත් වැඩිහිටියන් ගැන බියවීමට පටන් ගනී. මාස දෙකේදී පමණ මිත්‍ර ලීලාවක් දක්වන ඕනෑම වැඩිහිටියෙකුගේ අතට යන ළදරුවා ඊට කලකට පසුව නුපුරුදු මුහුණක් දුටු විගස හඬන්නට පටන් ගනී. (මව හැරුණු විට ක්‍රමයෙන් ඔහු වෙනත් වැඩිහිටියන්ට ද පුරුදු වන නමුත්, එය ඔවුන් අතර ඇති සම්බන්ධතාව අනුව සිදු වන්නකි.) මව පිළිබඳ අදහස ළදරුවා තුළට කා වැදීම නිසා, ඔහු පුදුමාකාර ගැටුමකට අසුවේ. ළදරුවා බිය ගන්වන හෝ විස්මයට පත්කරන යමක් මව කළහොත්, ළදරුවාට විරුද්ධ සංඥා දෙකක් ලැබේ. එක් සංඥාවකින් "මම ඔබේ මවයි. බියවීමට හේතුවක් නැහැ" යි කියවෙන අතර, අනිත් සංඥාවෙන් "මෙතැන බියවීමට දෙයක් ඇතැයි" කියැවේ. මව හඳුනාගැනීමට පෙර මෙවැනි ගැටුමක් ඇති නොවේ. එවිට ඇගෙන් ළදරුවා බියවන යමක් සිදුවුයේනම්, ඈ ඒ අවස්ථාවේ බියජනක උත්තේජයක් පමණක් වනු ඇත. නමුත් දැන් ඇයගෙන් නිකුත් වන්නේ මෙම ද්විත්ව සංඥාවයි. වෙනත් වචනවලින් කිවහොත් අනතුරක් ඇති නමුත්, "එය මගෙන් නිසා බිය විය යුතු නැත" යන්නයි. මෙහි ප්‍රතිඵලය වන්නේ අර්ධ හැඬීමේ හා අර්ධ වශයෙන් මව හඳුනාගැනීමේ හඬකි. මෙම ප්‍රතිචාර දෙකේ සංකලනය සිනහව ඇති කරයි. (නියම වශයෙන්ම කිවහොත්, පරිණාමයේ එක්තරා අවස්ථාවකදී මෙවැන්නක් සිදු වන්නට ඇත. එහෙත් දැන් එය විශේෂ ප්‍රතිචාරයක් ලෙස දියුණු වී තිබේ.)

මේ අනුව, සිනහවෙන් කියැවෙන්නේ අනතුරු සහිත දෙයක් නොවන බව හා එය තමා දන්නා බව මවට හැඟවීමයි. දැන් ඔහු නොහඬවා ඔහු සමඟ සෙල්ලම් කිරීමට මවට හැකි වේ. සාමාන්‍යයෙන් කුඩා දරුවන් සමඟ කරන සියලුම කෙළි සෙල්ලම් ඔවුන් බිය ගන්වන උත්තේජයන් වන නමුත්, ඒවා කරනු ලබන්නේ බිය නොවිය යුතු ආරක්ෂකයන් විසිනි. මේවා නැවත නැවත කිරීමට දෙමාපියන් පෙළඹවීමෙන් එම උත්තේජය ලබා ගැනීමට ළදරුවෝ ද ක්‍රමයෙන් පුරුදු වෙති.

මේ අනුව සිනහව සංඥාවක් වෙයි. මෙම සංඥාව නිසා දරුවා හා දෙමාපියන් අතර වැඩිවන සම්බන්ධය දිගටම වර්ධනය වේ. සිනහව ඇතිකරන උත්තේජයන් උවමනාවට වැඩියෙන් බියගන්වන සුළු හෝ වේදනාකාරී වුවහොත් ප්‍රතිචාරය හැඬීමට පෙරළේ. මේ මඟින් ළදරුවාට තම ශරීර හැකියාවන් හා අවට ලෝකයේ භෞතික ලක්ෂණ හඳුනා ගැනීමට ද හැකිවෙයි.

අනිකුත් සත්වයන්ගේද මෙවැනි සංඥා දක්නට ලැබේ. නමුත් මිනිසා සමඟ සසඳන විට ඒවායේ එතරම් වැදගත්කමක් නොපෙනේ. සමහර අවස්ථාවන්හි දී චිම්පන්සීන් ගේ කෙළිලොල් මුහුණක්ද, අපේ සිනහවකට සම කළ හැකි මෘදු හඬක්ද දක්නට ලැබේ. මෙම සියලුම සංඥාවල ආරම්භය එකම දෙයකි. තරුණ චිම්පන්සියෙක් අමුත්තකු පිළිගැනීමේදී තොල් ඉදිරියට දික්කරන අතර බිය වූ විට ඒවා පස්සට ගෙන මුඛය විවර කොට දත් විදහා දක්වයි. කෙළිලොල් මුහුණ, මිත්‍ර හැඟීම් හා බියජනක හැඟීම්වල මිශ්‍රණයක් වේ. බිය වූ විට මෙන් හනු විවෘත වන නමුත්, තොල් ඉදිරියට නෙරා දත් ආවරණය නොකරයි. මුලික වශයෙන් මෙම ක්‍රියාව අපට සමාන වන නමුත්, අපේ සිනහවට සම කළහැකි දෙයක් චිම්පන්සියාගේ දක්නට නැත. චිම්පන්සියා ගේ වර්ධනයත් සමඟ මෙම සංඥාවේ වැදගත්කම අඩුවන මුත්, අපේ වර්ධනයත් සමඟ එය එදිනෙදා කටයුතුවල වඩා වැදගත් තැනක් ගනී. වැඩිහිටි වානරයා පවා කෙළිලොල් වානරයෙකි. එය ඔහුගේ ගවේෂණාත්මක ස්වභාවයේ කොටසකි. හැම දෙයක්ම එහි අන්තිම සීමාව දක්වා කරමින්, අනතුරක් සිදුකර නොගෙන, විවිධ උත්තේජයන් ලබා ගන්නා ඔහු, එයින් ලබන සතුට සිනහවෙන් ප්‍රදර්ශනය කරයි.

යමෙකුට සිනහවීමටද, වැඩිහිටි ළමයින් හා වැඩිහිටියන් අතර සමාජීය ආයුධයක් වීමට පුළුවන. සිනහවට ලක්වන තැනැත්තා වැදගැම්මකට නැති අයෙකු හෝ විකාරයක් යන හැඟීම ඇතිවෙයි. කවටයන් ගේ සමාජීය කාර්යය මෙය

Scanned by TapScanner

වන අතර ඔහුගේ අස්වාභාවිකත්වය මහින් තමන්ගේ සාමාන්‍ය බව පිළිබඳ හැඟීම සහතික කරගන්නා අපි, ඒ වෙනුවෙන් ඔහුට මුදල් සම්භාරයක් ගෙවීමට ද මැලි නොවෙමු.

තරුණ ගැහැනු හා පිරිමි ළමයින් තම සිත් ගත් තළු නිළියන් හා අනිකුත් අයට සලකන ආකාරයද මෙහිදී වැදගත් වේ. ඔවුන් සමහර අවස්ථාවන්හිදී දක්වන ප්‍රතිචාරයන් අධික බිය හෝ වේදනාව නිසා ඇති වන ප්‍රතිචාරයන්ට සමානය.

හැඬීම හා සිනහව පිළිබඳ මෙම සාකච්ඡාව අවසන් කිරීමට පෙර පැහැදිලි කළ යුතු තවත් අභිරහසක් වෙයි. ජීවිතයේ මුල් මාස තුනේ නොනවත්වා හඬන ළදරුවන් පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දීමට සමහර මව්වරුන්ට සිදුවේ. කිසිම ආකාරයකින් මෙම හැඬීම නැවැත්විය නොහැකි බැවින්, ළදරුවා ගේ යම්කිසි ශාරීරික ආබාධයක් ඇතැයි තීරණය කරන දෙමාපියෝ, ඔහුට වෙදකම් කිරීමට පටන් ගනිති. ශාරීරික වශයෙන් වරදක් ඇතැයි යන්න සත්‍යයක් නමුත්, එය ළදරුවා ගේ මෙම හැසිරීමට හේතුව නොවේ. සාමාන්‍යයෙන් තුන්වැනි හෝ හතරවැනි මාසයේදී විජ්ජාවකින් මෙන් මෙම හැඬීම නතර වෙයි. මෙය නතර වන්නේ ළදරුවාට මව හඳුනා ගැනීමට හැකි වන කාලයේමයි. හඬන ළදරුවන් හා සන්සුන් ළදරුවන් ගේ මවුවරුන් අතර, ඔවුන් ගේ හැසිරීම් රටා පිළිබඳව කරන ලද අධ්‍යයනයකින් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලැබුණි. හඬන ළදරුවන් ගේ මවුවරුන් සාමාන්‍යයෙන් කලබලකාරී නොසන්සුන් අය වූ අතර අනෙක් මවුවරු සාමාන්‍ය වශයෙන් සන්සුන් අය වුහ.

මෙම ළදරු අවස්ථාවේ වුවද මවගේ හැඟීම් ළදරුවාගෙන් වසන් කළ හැකි නොවේ. චකිතයකට පත් මවක් එම හැඟීම ළදරුවාට දීම වැළැක්විය නොහැක. බිය වන දෙයින් තමා ආරක්ෂා කරන ලෙස ඉල්ලමින් ළදරුවා මවට සංඥා කරන්නේ හැඬීමෙනි. මවගේ නොසන්සුන් බව මේ නිසා තවත් වැඩි වන අතර එය දරුවාගේ හැඬීම වැඩි කිරීමට ආධාර වෙයි. මේ නිසා අවශ්‍ය එකම දෙය සන්සුන් ලෙස මෙම

තත්වය පිළිගෙන, එය නැති කිරීමට කටයුතු කිරීම පමණි. මවට මෙය කළ නොහැකි වුවත්, ළදරුවා මව හඳුනාගෙන ඇය තම ආරක්ෂකයා ලෙස සැලකීමට පටන් ගැනීමත් සමඟ හැඬීම අඩු වේ. බිය හා චකිතය පිළිබඳ උත්තේජයන්, ඇයගෙන් ළදරුවාට තවමත් ලැබෙන නමුත්, ඒවා ඔහු දන්නා කෙනෙකුගෙන් ලැබෙන බැවින්, ළදරුවා තවදුරටත් බිය නොවේ. මව සමඟ වැඩි වන බැඳීම ඇය සන්සුන් කිරීමට සමත්වන බැවින්, ඇගේ නොසන්සුන් බවද ක්‍රමයෙන් අඩුවේ. මේ සියල්ලේ ප්‍රතිඵලය වන්නේ ළදරුවා ගේ තොරතෝන්චියක් නැති හැඬීමේ අවසානයයි.

මඳ සිනහව පිළිබඳ ප්‍රශ්නය ගැන මා මෙතෙක් වේලා සාකච්ඡා නොකළේ, එය සිනහවටත් වඩා විශේෂ ප්‍රතිචාරයක් වන බැවිනි. සිනහව, හැඬීමේ ද්විතීයික ස්වරූපයක් වන්නාක් මෙන්ම මඳ සිනහව, සිනහවේ ද්විතියික ස්වරූපයකි. බැලූ බැල්මට, එය සිනහවේ අඩු තීව්‍රතා තත්වයක් ලෙස පෙනුණත්, එය එතරම් සරල වූවක් නොවේ. යම්තමින් සිනහවීම, මඳ සිනහවෙන් වෙන්කර හඳුනාගත නොහැකි බව සත්‍යයකි. මඳ සිනහව ආරම්භ වන්නට ඇත්තේ ද මේ ආකාරයටයි. කෙසේ හෝ අපේ පරිණාමයේදී සිනහව වෙනස්ම අංගයක් ලෙස දියුණු වී ඇත. මඳ සිනහවේ කාර්යය හඬ නගා සිනාසීමට සම්පූර්ණයෙන්ම වෙනස් වේ. නමුත්, අප කිසිවකුට සිනහ වුවහොත් ඇතිවන හැඟීම එයට හාත්පසින් විරුද්ධය.

ඕනෑම සමාජීය සම්බන්ධතාවක් යම්තමින් හෝ බිය ඇති කරන්නකි. යමෙකු හමුවෙන අවස්ථාවේ දී අනික් පුද්ගලයා හෝ හැසිරීම අප නොදන්නා තත්වයකි. සිනහව හා මඳ සිනහවෙන් කියවෙන්නේ මෙවැනි බියක් පවතින බවයි. ඒ සමඟම පිළිගැනීමේ හා ආකර්ෂණය පිළිබඳ හැඟීම්වල එකතුවක් දක්නට ලැබේ. අන්‍යෝන්‍ය මඳ සිනහවෙන් කියැවෙන්නේ දෙදෙනා එකිනෙකාට ආකර්ෂණය වූ තත්වයක පසුවන බවයි. යන්තමින් බියවීම යන්නෙන් අදහස් කරන්නේ ආක්‍රමණකාරී නොවන බව වන අතර ආක්‍රමණකාරී හෝ

Scanned by TapScanner

කලහකාරී නොවීමෙන් අදහස් කරන්නේ මිත්‍ර බවයි. මේ අනුව මඳ සිනහව දියුණු වී ඇත්තේ මිත්‍ර ආකර්ෂණීය උපකරණයක් ලෙස වේ.

අපට මෙම සංඥාව අවශ්‍යව ඇති නමුත් අනිකුත් අග්‍රේශයන් එය නොමැතිව ඔවුන්ගේ කටයුතු කර ගන්නේ කෙසේද? ඔවුන්ට විවිධ ආකාරයේ වෙනත් මිත්‍ර අභිනයන් ඇති බව සත්‍යයක් නමුත්, මඳ සිනහව අපට ලැබී ඇති අතිරේක ආයුධයකි. එය ළදරු මෙන්ම වැඩිහිටි කාලවල එදිනෙදා කටයුතුවලදී ඉතා වැදගත් තැනක් ගනී. මඳ සිනහවට මෙතරම් වැදගත් තැනක් හිමිවීමට හේතු වූයේ අපේ ජීවන රටාවේ කුමන අංගයක්ද? මෙයට පිළිතුර ඇත්තේ අපේ නිරුවත් සමේ බව පෙනේ. ළදරු වදුරකු ඉපදුණු විගස මවගේ ලොම්වල තදින් එල්ලෙයි. සති ගණනක් හෝ මාස ගණනක් යන තුරු වදුරු පැටියා මේ ආකාරයට මවගේ ආරක්ෂාව යටතේ ජීවත් වෙයි.

ඇගේ සිරුරෙන් ඉවතට යන පැටියාට ඕනෑම මොහොතක ඇගේ සිරුරේ නැවත එල්ලීමට පුළුවන. මෙය ඉතා කිට්ටු ශාරීරික සම්බන්ධයක් තබා ගැනීමේ එක් ක්‍රමයකි. (පැටියා ක්‍රමයෙන් වැඩෙන විට) මව මෙයට අකමැති වුවත්, එය ප්‍රතික්ෂේප කිරීමට ඇයට එතරම් පහසු නොවේ. චිම්පන්සි පැටියකු හදා වඩා ගත් ඕනෑම කෙනෙකු මෙය සත්‍යයක් බවට සාක්ෂි දරනවා ඇත.

ඉපදෙන විට අපේ තත්වය මෙයට වඩා බොහෝ අනතුරුදායක වේ. මවගේ සිරුරේ එල්ලීමට තරම් අප ශක්තිමත් නොවනවා පමණක් නොව, එල්ලීමට දෙයක් ඇත්තේද නැත. මවට, කිට්ටු සම්බන්ධතාවක් පවත්වා ගැනීමේ ක්‍රමයක් නොමැති බැවින්, අපට සම්පූර්ණයෙන්ම මාතෘ උත්තේජක සංඥා මත විශ්වාසය තැබීමට සිදුවේ. කෑගැසීමෙන් හා හැඩීමෙන් අපට දෙමාපිය අවධානය ලබා ගැනීමට හැකි වෙයි. නමුත් ඔවුන් අප වෙත රඳවා ගැනීමට මෙයට වඩා යමක් කළ යුතුය. තරුණ චිම්පන්සියෙක්ද දෙමාපිය අවධානය ලබාගැනීම සඳහා අප මෙන්ම කෑගසයි. ඌ වෙතට දුව එන

මව, ඌ ඔසවා ගනී. ඒ සමඟම ඌ මවගේ සිරුරේ එල්ලෙයි. චිම්පන්සියා, මවගේ සිරුරේ එල්ලීම වෙනුවට අපට වෙනත් දෙයක් අවශ්‍ය වන්නේ මේ අවස්ථාවේදීය. අප සමඟ සිටීමට, මව පොළඹවන සංඥාවක් දියුණුවීම අවශ්‍ය විය. අප මේ සඳහා යොදා ගන්නේ මඳ සිනහවයි.

ජීවිතයේ මුල් සති කීපය තුළදීම සිනහව ආරම්භ වන නමුත්, මුලදී එය යම් කිසිවක් අරමුණු කොට සිදු නොවේ. පස්වැනි සතියේදී පමණ එය සමඟර උත්තේජයන්ට දක්වන නියම ප්‍රතික්‍රියාවක් ලෙස දක්නට ලැබේ. ළදරුවා ගේ ඇස්වලට දැන් විවිධ වස්තු දෙස බලා සිටීමට පුළුවන. මුලදී ඔහු වැඩිපුරම ප්‍රතිචාර දක්වන්නේ ඔහු දෙස බලා සිටින ඇස් දෙකටයි. කඩදාසියක් මත අඳින ලද කළු තිත් දෙකක්ද වුව මේ සඳහා ප්‍රමාණවත්ය. නමුත් ක්‍රමයෙන් කටක් ද අවශ්‍ය වේ. ඉක්මණින් කට පළල්වීම වැදගත් වන අතර ප්‍රධාන උත්තේජය ලෙස ඇස්වල වැදගත්කම අඩුවේ. මාස තුනක් හෝ හතරක් වන මේ කාලයේදී ප්‍රතිචාරය වඩා විශේෂ එකක් වීමට පටන් ගනී. ඕනෑම මුහුණක් වෙනුවට දැන් මවගේ මුහුණට පමණක් ප්‍රතිචාර දැක්වීම ආරම්භ වෙයි. මේ දෙමාපියන් පිළිබඳ අදහස් සිතට කා වැදීමේ කාලයයි.

මෙම ප්‍රතික්‍රියාවේ වර්ධනය පිළිබඳ පුදුමාකාර ලක්ෂණයක් නම්, එය දියුණුවීගෙන යද්දී පවා, චතුරස්‍ර, ත්‍රිකෝණ ආදිය හඳුනා ගැනීම අතින් ළදරුවා ඉතා දුර්වල වීමයි. මිනිස් ලක්ෂණවලට සම්බන්ධ හැඩරුව හඳුනාගැනීමේ හැකියා, අනිකුත් දෘෂ්ටිමය හැකියාවන්ට කලින් දියුණුවන බව පෙනෙන්නට තිබේ. මේ නිසා ළඟ ඇති අවේතනික වස්තු ළදරුවා ගේ සිතට කා වැදීම වැළකෙයි.

වයස මාස හතක් වන විට මවගේ ස්වරූපය ළදරුවා ගේ සිතට කා වැදී අවසානය. ඈ මොනවා කළත් ළදරුවා ගේ ජීවිතයේ ඉදිරි කාලය තුළ ඈ "මවු පිළිරුව" ලෙස සිතේ පවතිනු ඇත. තාරා පැටවු තම මව් පසු පස්සේ යෑමෙන්ද, වදුරෝ තම මවට එල්ලීමෙන්ද, මෙය ඉටුකර ගනිති. අප මෙම

Scanned by TapScanner

වැදගත් බැඳීම ඇතිකර ගන්නේ, මඳ සිනහ ප්‍රතිචාරය මගිනි.

දෘෂ්ටිමය උත්තේජයක් ලෙස මඳ සිනහව, එහි අද්විතීය වින්‍යාසය ප්‍රධාන වශයෙන් ලබා ගන්නේ, මුව කොන් හැරවීමේ සරල ක්‍රියාවෙනි. මඳ සිනහවේදී, බිය ඇතිවූ අවස්ථාවේ දී මෙන් මුඛය විවෘත කොට තොල් පසුපසට අදිනු ලබන නමුත්, මුඛයේ දෙකෙළවර නැවීමෙන් එයින් ප්‍රකාශ වන දෙය මූලික වශයෙන්ම වෙනස් කෙරේ. සිනහ හැඩයට හාත්පසින් විරුද්ධ වන ආකාරයට මුඛය සකස් කිරීමෙන්, සිනහවේ ප්‍රතිවිරුද්ධ සංඥාව දීමට පුළුවන් වේ. සිනහව හැඩීමෙන්ද, මඳ සිනහව, සිනහවෙන්ද පරිණාමය වුවාක් මෙන්, සතුරු මුහුණ පරිණාමය වී ඇත්තේ මිත්‍ර බව දක්වන මුහුණෙනි.

සිනහවීම මුඛයෙන් පමණක් කෙරෙන්නක් නොවේ. වැඩිහිටියන් වන අපට තොල් හැරවීමෙන් අපේ හැඟීම් ප්‍රකාශ කිරීමට හැකි නමුත්, ළදරුවා මේ සඳහා එයට වැඩි ප්‍රයත්නයක් දරයි. හොඳින් සිනහ වීමේදී දත් දික් කරමින් ඒවා ඉහළට ඔසවයි. විවිධ ශබ්ද නගමින් හිස හරවා නිකට ඉදිරියට දික්කොට ඒ මේ අතට පෙරළෙන ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාසය ද වැඩිවෙයි. ඔහුගේ ඇස් දීප්තිමත් වන අතර යන්තමින් පියවී තිබීමට ද පුළුවන. දෑසේ රැළි දක්නට ලැබෙන අතර දිවද යන්තමින් එළියට දැමීමක් දක්නට ලැබේ. මේ ශරීර චලන සියල්ලම මව සමඟ සම්බන්ධතාවක් පවත්වා ගැනීමට ළදරුවා දරන ප්‍රයත්නයේ විවිධ අංග වෙයි. ඔහුගේ දුර්වල ශරීරයත් සමඟ ළදරුවා, මේ පෙන්වන්නේ පාරම්පරික අග්‍රේශ එල්ලීමේ ප්‍රතිචාරයේ නෂ්ටාවශේෂ විය හැකියි.

මා මෙතෙක් කල් සාකච්ඡා කළේ ළදරුවාගේ සිනහව ගැන පමණක් නමුත් එය දෙපැත්තටම ක්‍රියාකරන සංඥාවක් ද වෙයි. ළදරුවා මව සමඟ සිනහ වන විට ඇයද එයට සමාන සංඥාවකින් ප්‍රතිචාර දක්වයි. මෙයින් දෙදෙනා අතර ඇති බැම්ම තව තවත් ශක්තිමත් වෙයි. සමහර මව්වරු දරුවා සමඟ කෝපයෙන් පසුවන අවස්ථාවලදී එය නොපෙන්වා සිනමුසු මුහුණක් පෙන්වති. මෙයින් ළදරුවාට තම හැඟීම් සැඟවිය

හැකි යැයි ඔවුහු බලාපොරොත්තු වෙති. නමුත් ඇත්ත වශයෙන්ම මෙයින් හොඳට වඩා නරකක් වීමට ඉඩ තිබේ. මවගේ මානසික තත්වය පිළිබඳව ළදරුවා කිසිසේත් රැවටිය නොහැකි යයි මම කලින් සඳහන් කළෙමි. සංකේතාත්මක සංස්කෘතික අදහස් හුවමාරු කරගැනීමේ ක්‍රමවල බරින්, අප හෙම්බත් වන්නට පෙර, ඉරියව් හා හඬේ වෙනස්කම්වලට වඩා හොඳින් ප්‍රතිචාර දැක්වීමටත්, ඒවා අවබෝධ කර ගැනීමටත් අපට ළදරු කාලයේදී හැකි වෙයි. මව කලබලකාරී නොසන්සුන් බවකින් පසුවේ නම්, එය ළදරුවාගෙන් සැඟවිය නොහැක. ඈ කොතරම් හොඳින් සිනහ වුවත් ඔහු රැවටීමට හැකි නොවේ. එයින් වන්නේ ඔහුගේ සිතේ මහත් අවුලක් ඇතිවීම පමණි. මෙවැන්නක් නිතර නිතර සිදුවුවහොත් අනාගත සමාජීය සම්බන්ධතාවන් පවත්වා ගැනීමේදී අති මහත් දුෂ්කරතාවන්ට මුහුණ පෑමට දරුවාට සිදුවෙයි.

සිනහවීම ගැන සාකච්ඡා කිරීම නවතා, දැන් අපි එයට වඩා බොහෝ වෙනස් ක්‍රියාවක් ගැන සැලකිල්ල යොමු කරමු. මාස කීපයක් ගතවීමෙන් පසුව, ළදරුවා ගේ අලුත් හැසිරීම් රටාවක් වන චණ්ඩ හැඩීම වෙනුවට, කෝපයට පත්වී හැඩීම දියුණු වෙයි. ළදරුවා චණ්ඩතාව ප්‍රදර්ශනය කරන්නේ, කඩින් කඩ අක්‍රමවත්ව කරන කෑ ගැසීමෙන් හා අත් හා පය ගසා දැමීමෙනි. කුඩා භාණ්ඩවලට පහර දෙන ඔහු, විශාල ඒවා සොලවමින්, ඒවා හැපීමට තැත් කරයි. මුලදී මෙම කටයුතු පිළිවෙළක් නොමැතිව සිදුවේ.

හැඩීමෙන් කියවෙන්නේ තවම බිය ඇති බවයි. චණ්ඩතාව පහරදීමේ තත්වයට තවම පත්වී නැත. මෙය දක්නට ලැබෙන්නේ ළදරුවා තම ශාරීරික හැකියාවන් ගැන අවබෝධ කරගත් විටය. එය දියුණු වූ විට ඔහුටම ආවේණික වූ මුහුණු සංඥා දක්නට ලැබේ. කටේ කෙළවර පසුපසට නොව ඉදිරියට එයි. ඇස් විරුද්ධවාදියා දෙසට කෙළින්ම යොමුවෙයි. අත් මිට මෙළවෙයි. මේ අනුව ළදරුවා තම බලය පෙන්වීම ආරම්භ කරයි.

Scanned by TapScanner

කණ්ඩායමක ඇති ළමයින් ගණන වැඩිකිරීමෙන් චණ්ඩතාව වැඩි කළ හැකි බව පෙනේ. තදබදය වැඩි වූ විට, කණ්ඩායමක සමාජිකයන් අතර දක්නට ලැබෙන මිත්‍ර සමාජීය රටාවන්හි ප්‍රබලතාව වැඩිවී, ඒවා නිතර නිතර දක්නට ලැබේ. අනිකුත් සතුන් ගේ ප්‍රමුඛත්ව ප්‍රශ්න විසඳීමට පමණක් නොව, කණ්ඩායමක සමාජිකයින් ගේ පැනිරීම වැඩිකිරීම සඳහාද සටන් කිරීම යොදා ගන්නා බැවින්, මෙය ඉතා වැදගත් වේ. මේ ගැන අපි නැවතත් පස්වෙනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කරමු.

ආරක්ෂා කිරීම, ආහාර දීම, පිරිසිදු කිරීම හා සෙල්ලම් කිරීමට අමතරව, ඉතා වැදගත් ක්‍රියාවලියක් වන පුහුණු කිරීම් දෙමාපිය වගකීම්වලට අයත් වේ. අනිකුත් සත්ව වර්ග්වල මෙය දඩුවම් හා පාරිතෝෂික ක්‍රියාවලියක් මඟින් සිදුවෙයි. මෙයට අමතරව අනුකරණය මඟින්ද ළදරුවා ඉගෙන ගනී. මෙය අපේ වර්ගයාගේ ඉතා දියුණු වී ඇති ක්‍රමයක් නමුත්, අනිකුත් සතුන්ගේ එය දියුණු වී ඇත්තේ ඉතා මඳ වශයෙනි. අනිකුත් සතුන් ඉතා දුෂ්කර ලෙස ඉගෙන ගතයුතු බොහෝ දේවල්, අපි දෙමාපියන් අනුගමනය කිරීමෙන්, ඉතා පහසුවෙන් ලබාගනිමු. නිරුවත් වානරයා උගන්වන හා ඉගෙන ගන්නා වානරයෙකි. (අප මෙම ආකාරයට ඉගෙන ගැනීමට කොතරම් හුරු වී ඇත්ද යත්, අනිකුත් සත්වයන්ටද මේ ආකාරයට ඉගෙන ගත හැකි යයි සිතන්නට අපි පුරුදු වී ඇත්තෙමු.)

වැඩිහිටියන් ලෙස කරන බොහෝ දෑ පදනම් වී ඇත්තේ අපේ ළමා කාලයේ, මෙසේ අනුකරණයෙන් ඉගෙන ගන්නා දේ මතයි. අප කිසියම් ආකාරයකට හැසිරෙන්නේ, එම ආකාරයට හැසිරීම, එක්තරා ආචාර ධර්ම පද්ධතියකට එකඟ වන බැවිනැයි බොහෝ අය විශ්වාස කරන නමුත්, ඇත්ත වශයෙන්ම අප කරන්නේ අප තුළ හොඳින් කාවැදී ඇති, එහෙත් අමතක වූ අනුකරණ රටාවන් කීපයක් අනුව කටයුතු කිරීම පමණක් බව පෙනේ. මිනිස් සමාජයන්ට තම චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාස වෙනස් කිරීමට නොහැකි වී ඇත්තේ, මෙම අනුකරණ රටාව කාවැදී ඇති ආකාරය වෙනස් කළ නොහැකි බැවිනි. විෂය මූල දැනුම මත පදනම් වූ බුද්ධිමත් නව අදහස්වලට

මුහුණ පෑමට සිදු වූ විට පවා, අපේ සමාජයෝ පැරණි දුර්මත හා පුරුදුවලම ඇළී ගැළී ජීවත් වෙති. පෙර පරම්පරාවල දැනුම හා අත්දැකීම් ලබාගැනීම නිසා අපට සිදුවී ඇත්තේ මෙයයි.

අපේ අනුකරණ ඉගෙනීම් ක්‍රියාවලියට ආවේණික වූ මෙම දුර්වලතාව නැති කිරීමට විරුද්ධව යන, හැම දෙයම සොයා බැලීමේ තියුණු කුතුහලයක් ද අප සතුව ඇති බැවින්, මේ දෙක අතර ඇති වී තිබෙන සමබරතාව ඉතා සාර්ථක වී තිබේ. සමාජයක් හෝ සංස්කෘතියක් දුෂ්කර තත්වයකට පත්වන්නේ, එය අනුකරණ ක්‍රියාවලියේ වහලකු බවට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වුවමනාවට වඩා දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් හෝ ප්‍රමාණයට වඩා ගවේෂණාත්මක වීම හෝ නිසාය.

මෙම ලක්ෂණ දෙක අතර සාර්ථක සමතුලිතතාවක් ඇති සමාජ දියුණු වෙයි. වුවමනාවට වැඩි දැඩි බවෙන් මෙන්ම ප්‍රමාණයට වැඩි ඉක්මන් බවෙන් යුත් සමාජයන් අද ලොව පුරාම දැකිය හැකි වෙයි. පැරණි වාරිත්‍ර වාරිත්‍ර හා තහංචිවල බරින් පිරුණු කුඩා නොදියුණු සමාජ කලින් සඳහන් කළ වර්ගයට උදාහරණ වෙයි. මෙම සමාජ දියුණු සංස්කෘතීන් හා ගැටීමෙන් ඉතා ඉක්මණින්ම දියුණුවීමට පටන් ගැනීමත් සමඟ, පසුව සඳහන් කළ කොටසට හොඳ උදාහරණ බවට පත්වෙයි. හදිසියේ ඇතිවන ගවේෂණාත්මක උනන්දුවත්, සමාජීය නවතාවත් නිසා, සාම්ප්‍රදායික අනුකරණයේ සමතුලිත බලවේගයන් ඉවතට විසිවී, සමාජය අනිත් කෙළවරටම ගෙනයනු ලබයි. මෙහි ප්‍රතිඵලය වන්නේ, සංස්කෘතික වශයෙන් වියවුලක් හා සියල්ල විනාශ වී යාමේ තත්වයකි. අනුගමනයත්, ගවේෂණයත් අතර මෙන්ම වහල් අනුකරණයත්, ප්‍රගතිශීලී බුද්ධිමය අත්හදා බැලීමත් අතර නියම සමබර බවක් ලබා ගන්නේ ඉතා වාසනාවන්ත සමාජයකි.

Scanned by TapScanner

4 ගවේෂණය

සියලුම ක්ෂීරපායී සතුන් තුළ ඉතා ප්‍රබල, විමසා බැලීමේ ආශාවක් හා කුතුහලයක් දක්නට ඇති නමුත්, මෙය සමහර සතුන්ට අන් අයට වඩා වැදගත් වෙයි. එය බොහෝ දුරට රැඳී ඇත්තේ පරිණාමයේදී ඔවුන් කොතරම් දුරට, විශේෂණය වී ඇද්ද යන්න මතයි. කිසියම් ජීවන රටාවක් සර්ව සම්පූර්ණ එකක් කිරීමට මුළු මහත් පරිණාමීය ක්‍රියාවලියම යොදවා ඇත්නම්, ලෝකයේ දක්නට ඇති සාමාන්‍ය සංකීර්ණත්වය ගැන ඔවුන් තවදුරටත් වෙහෙස විය යුතු නැත. ඇයාට, කුඹි ඇති නාක් කල් හා කෝලා වලහාට, මැලියම් කොළ ඇති නාක් කල් ඉතා තෘප්තිමත් සැප පහසු ජීවිත ගතකළ හැක. අනික් අතට සත්ව ලෝකයේ අවස්ථාවාදීන් ලෙස සැලකිය හැකි විශේෂණය නොවූ සතුන්ට, කිසි විටක මේ ආකාරයට තෘප්තිමත්ව නිසංසලේ සිටීමට පුළුවන්කමක් නැත. ඊළඟ ආහාර වේල සපයා ගත හැක්කේ කෙසේද? යන්න ගැන ඔවුන්ට කිසිවිටක සහතික විය නොහැකි අතර, පරිසරයේ සෑම අස්සක් මුල්ලක් ගැනම විමසිල්ලෙන් යුතුව වාසනාව එළඹෙන තෙක් බලා සිටිය යුතුය. ඔවුන් සෑම දෙයක් ගැනම විමසිල්ලෙන් හා පරීක්ෂාවෙන් පසුවිය යුතුය. වෙනත් වචනවලින් කිවහොත් ඉතා ඉහළ මට්ටමේ විමසිලිමත් බවක් ඔවුන්ට තිබිය යුතුයි.

එය ආහාර සොයා ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවේ. ආත්මාරක්ෂාව සඳහාද මෙය ඉතා වැදගත් වේ. ඉත්තෑවන්, විටිහුරන් වැනි සතුන්ට තම සතුරන් ගැන නොතකා ඕනෑම තැනක යා හැකි නමුත්, අවි රහිත ක්ෂීරපායී සත්වයා සෑමවිටම සතුරන් ගැන විමසිල්ලෙන් පසුවිය යුතුය. අනතුරු සංඥාවන් මෙන්ම, බේරී යා හැකි මාර්ග ද ඔහු දැන සිටිය යුතුය. ජීවිතය රැක ගැනීමට තම පරිසරයේ සෑම තැනක් ගැනම දැන සිටීම ඉතා වැදගත් වේ.

මේ අනුව බලන විට, විශේෂණය නොවීම ඉතා අවාසිදායක තත්වයක් ලෙස පෙනීමට පුළුවන. අවස්ථාවාදී

ක්ෂීරපායීන් එකෙකුවත් සිටිය යුත්තේ ඇයි? මෙයට පිළිතුර නම් විශේෂණය වූ ජීවිත ක්‍රමයේ ඉතා බරපතළ අනතුරක් දක්නට ලැබීමයි. විශේෂ උන්නති උපකරණය හොඳින් ක්‍රියාත්මක වනතුරු කිසිම ප්‍රශ්නයක් පැන නොනඟී. නමුත්, පරිසරයේ ප්‍රධාන පෙළේ වෙනසක් සිදු වුවහොත්, විශේෂඥයා අතරමං වෙයි. එක්තරා උචිත ක්‍රමයකට විශේෂණය වූ සතකු ගේ ප්‍රවේණි ලක්ෂණවල ද, එයට සරිලන ප්‍රධාන වෙනස්කම් සිදුවී ඇති බැවින්, මෙවැනි හදිසි පරිවර්තනයක් සමඟ ඒවා වෙනස් කිරීමට ඔහුට හැකි නොවනු ඇත. යම්කිසි ආකාරයකින් මැලියම් ගස් සහිත වනාන්තර නැති වුවහොත්, කෝලා වලහාද නැති වී යනු ඇත. ඉත්තෑවා ගේ කුරු කා දැමිය හැකි සතකු ඇති වුවහොත්, ඌ ඉතා පහසු ගොදුරක් වනු නොඅනුමානය. අනික් අතට බලන විට, අවස්ථාවාදියාට ජීවිතය හැමවිටම දුෂ්කර වන නමුත්, ඔහුට පරිසරයේ හදිසි පරිවර්තනයකට ලෙහෙසියෙන්ම අනුවර්තනය වීමට හැකි වේ. මුගටියාට, මීයන් සොයා ගත නොහැකි වුවහොත්, ඌ බිත්තර හා ගොළුබෙල්ලන් ආහාරයට ගැනීමට පුරුදු වෙයි. පලතුරු හා ඇට වර්ග සොයා ගත නොහැකි වුවහොත්, වඳුරා අල හා මුල් කෑමට පුරුදු වනු ඇත.

විශේෂණය නොවූ සතුන් අතර වඳුරන් හා වානරයන් වඩාම අවස්ථාවාදී සතුන් ලෙස සැලකිය හැකියි. කණ්ඩායමක් ලෙස සැලකූ විට, ඔවුන් විශේෂණය නොවීම අතින් විශේෂණය වී ඇති බව පෙනේ. වඳුරන් හා වානරයන් අතරින් ද උත්තරීතර අවස්ථාවාදියා වන්නේ නිරුවත් වානරයායි. මෙය ඔහුගේ විරශිශුකතා පරිණාමයේ තවත් එක් පැත්තකි. සියලුම තරුණ වඳුරන්ගේ විපරම් කිරීමේ ගතිය දක්නට ඇති නමුත්, ඔවුන් වැඩිහිටියන් වීමත් සමඟ මේ කුතුහලය ක්‍රමයෙන් අඩුවෙයි. එහෙත්, අපේ වර්ගයාගේ ළදරු කාලයේ දක්නට ලැබෙන විපරම්කාරී බව, තවත් බලවත් වී වැඩිහිටි කාලය දක්වාම විහිදෙයි. අපි විවිධ දේ ගැන සොයා බැලීම කිසිවිටක නොනවත්වමු. අප දන්නා දෙයින් අපි කිසිදාක තෘප්තිමත් නොවෙමු. අප අසන සෑම ප්‍රශ්නයක්ම නිසා, අලුත් ප්‍රශ්නයකට පිළිතුරු සෙවීමට සිදුවෙයි. අපේ වර්ගයා ගේ

Scanned by TapScanner

ශ්‍රේෂ්ඨතම උන්නති ප්‍රයෝගය වී ඇත්තේ එයයි.

අලුත් දෙයට බියවීමට (නව භීතිකා) විරුද්ධ ලක්ෂණය වන්නේ අලුත් දෙයට ආකර්ෂණය වීමයි. (නව කාමී) නුපුරුදු හැම දෙයක්ම අනතුරුදායකය. ඒවා අසලටවත් යා යුත්තේ ඉතා පරිස්සමිනි. හැකි නම් ඒවා මහහැරිය යුතුය. මේ නව භීතිකා රෝගයේ රෝගයේ ලක්ෂණයි. ඒවා මග හැරීමෙන් අප ඒ පිළිබඳව මොනම දෙයක්වත් දැන ගන්නේ කෙසේද? නොදන්නා දෙය, දන්නා දෙයක් බවට පත්වෙන තුරු, හුරුපුරුදු බව හා කුළුපග බව, පිළිකුලක් බවට පත්වෙන තුරු, නවකාමී ආසාවන් මඟින් අපේ උනන්දුව නැති නොකර තබාගත යුතුය. මෙම ක්‍රියාවලියේදී අප ඉතා වටිනා අත්දැකීම් ලබාගන්නා අතර, ඒවා පසුව ප්‍රයෝජනවත් වේ. ළමයෙකු හැමවිටම කරනුයේ මෙයයි. ඔහුගේ නවකාමී ආශාවන් කොතරම් ප්‍රබලද යන්න දෙමාපියන්ට ඔහුගේ කටයුතු මෙල්ල කිරීමට හා පාලනය කිරීමට සිදුවීමෙන්ම පැහැදිලි වේ. කෙසේ වෙතත් ළමයා ගේ කුතුහලය වැඩිදියුණු කිරීමට දෙමාපියන්ට හැකි වුවත්, එය යටපත් කිරීම කිසිදාක කළ නොහැක්කකි. ළමයින් ක්‍රමයෙන් වැඩීමත් සමඟ, ඔවුන්ගේ ගවේෂණාත්මක කුතුහලය ඉතා උග්‍ර තත්වයට පත්වෙයි. "කැලෑ සතුන් ලෙස හැසිරෙන ළමයින්" ලෙස වැඩිහිටියන් ඔවුන් හඳුන්වන්නේ මේ නිසාය. එසේ වුවත් නියම තත්වය නම් මෙහි අනික් පැත්තයි. කැලෑ සතුන් හැසිරෙන ආකාරය විග්‍රහ කොට බැලුවහොත්, කැලෑ සතුන් ලෙස හැසිරෙන්නේ වැඩිහිටියන් බව පෙනී යනු ඇත. විමසිලිමත් බව සීමා කිරීමට තැත් කරන්නේ ඔවුනි. නමුත් වාසනාවකට මෙන් ළදරු විමසිලිමත් බව හා කුතුහලය, දිගටම පවත්වා ගන්නා වැඩිහිටියන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සමාජයේ හැම විටම දක්නට ඇති බැවින්, අපේ සමාජයට ඉදිරියට යෑමටත්, දියුණුවීමටත් හැකි වී තිබේ.

සෙල්ලම් කරන තරුණ විම්පන්සීන් දෙස බැලුවහොත් ඔවුන්ගේ හැසිරීමත්, අපේ වර්ගයා ගේ දරුවන්ගේ හැසිරීමත් අතර ඇති සමානකමින් ඔබ පුදුමයට පත්වනු ඇත. මේ දෙකොටසම සෙල්ලම් බඩුවලින් වශී වෙති. ඔවුහු ඒවා

ඔසවමින්, බිම දමමින්, ඒ මේ අත හරවමින් කැලිවලට කඩා බිඳ දමති. මේ දෙවර්ගයම, අලුත් සරල ක්‍රීඩාවන් සොයා ගනිති. ඔවුන් තුළ දක්නට ලැබෙන උද්‍යෝගය ඉතා බලවත්ය. ජීවිතයේ මුල් අවුරුදු කීපය තුළ මාංශපේශී ඉතා ඉක්මණින් වර්ධනය වන බැවින්, විම්පන්සි අපටත් වඩා හොඳින් මෙම කටයුතු කරති. නමුත් ටික කලකට පසු ඔවුන්ගේ හැකියාව දුර්වලවීමට පටන් ගනී. සාර්ථක ආරම්භයක් ඇති නමුත් එය වැඩි දියුණු කර ගැනීමට තරම් ඔවුන්ගේ මොළය සංකීර්ණ වී නැත. සිත එකහකර ගැනීමේ හැකියාව අතින් ඔවුන් ඉතා දුර්වල අතර සිරුරේ වර්ධනයත් සමඟ එය වැඩි නොවේ. මේ සියල්ලටම වැඩියෙන් ප්‍රශ්නය වන්නේ, විම්පන්සි පැටියා සොයා ගන්නා විවිධ දේ පිළිබඳව, ඔවුන්ගේ දෙමාපියන් සමඟ අදහස් හුවමාරු කරගැනීමට ඇති අපහසුවයි. මෙම වෙනස පැහැදිලි කිරීමට හොඳම ක්‍රමය, යම්කිසි උදාහරණයක් ගැනීමයි. අපි පින්තූර ඇඳීම ගැන සලකා බලමු. මෙය හැසිරීම් රටාවක් ලෙස අපේ වර්ගයාට අවුරුදු දහස් ගණනක් තිස්සේ ප්‍රයෝජනවත් වූ බව අල්ටමීරා වැනි ස්ථානවල ඇති ප්‍රාග් ඓතිහාසික නෂ්ටාවශේෂවලින් පෙනේ.

අවස්ථාවත්, අවශ්‍ය ද්‍රව්‍යත් ලබා දුනහොත්, අපේ කුඩා දරුවන් මෙන්ම විම්පන්සියාද විවිධ දේ ඇඳීමට දැඩි කැමත්තක් දක්වයි. ශක්තිය ඉතා ටිකක් වැය කිරීමෙන්, ඉතා විශාල ප්‍රතිඵලයක් ලබා ගැනීමට හැකිවීම මෙම උනන්දුව ඇතිවීමට එක් හේතුවක් වේ. මෙය සියලුම ක්‍රීඩාවන්හි දක්නට ලැබෙන්නෙකි. මෙවැනි කටයුතු සඳහා මහත් උත්සාහයක් දැරීමට සිදුවන නමුත්, වඩාත්ම තෘප්තියක් ලබා දෙන්නේ බලාපොරොත්තු නොවූ තරම් විශාල දෙයක් තමන්ට ආපසු ලබාදෙන ඒවායි. මෙය "විශාලන පාරිතෝෂික" මූලධර්මය ලෙස හැඳින්වීමට පුළුවන. සුළු වෑයමකින් වැඩිම ශබ්ද ඇතිකරන දේවල් පොළොවේ ගැසීමට විම්පන්සියා මෙන්ම අපේ දරුවෝද කැමැත්තක් දක්වති. යන්තමින් ගැසූ විට ඉතා ඉහළ යන බෝල, බැලුන්, මඳ තල්ලුවක් ප්‍රමාණවත් වන රෝද සහිත සෙල්ලම් බඩු ආදිය, මොවුන් වැඩියෙන්ම කැමති දේ වෙයි.

Scanned by TapScanner

මුල් වරට කඩදාසියක් හා පැන්සලක් ලැබුණු විට, අපේ ළදරුවාට එතරම් දෙයක් කළ හැකි බව නොපෙනේ. ඔහුට කළ හැකි හොඳම දෙය කඩදාසියට පැන්සෙලන් තට්ටු කිරීම පමණි. නමුත් මෙයින් ඔහු මවිත කරවන ප්‍රසන්න දෙයක් සිදුවෙයි. තට්ටු කිරීම නිසා හඬක් පමණක් නොව, ඇසින් දැකිය හැකි යමක්ද ඇතිවේ. පැන්සල් කෙළවර කඩදාසියේ ගෑවීම නිසා එහි යමක් ඇඳෙනු ළදරුවාට පෙනේ.

චිම්පන්සියකු හෝ අපේ දරුවකු සිත්තම් කලාවේ මුල් සොයා ගැනීම කරන මෙම මොහොත ඉතා චිත්තාකර්ෂණීය දර්ශනයකි. තම ක්‍රියාව නිසා ලැබුණ, බලාපොරොත්තු නොවූ දෘෂ්ටිමය පාරිතෝෂිකයෙන් ඔහු වශී වෙයි. තම ක්‍රියාවේ ප්‍රතිඵලය දෙස ටික වේලාවක් බලා සිටින ඔහු, එය නැවත නැවතත් කරයි. මෙහි ප්‍රතිඵලය වන්නේ මුළු කඩදාසියම ඉරි කැලිවලින් වැසී යාමයි. මුලදී එක් අතකට රේඛා ඇඳ පසුව දෙපැත්තටම ඇඳීමට පටන් ගනී. වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා දෙන රට හුණු, පාට පැන්සල් හා තීන්තවලට ඔවුහු ක්‍රමයෙන් වැඩි කැමැත්තක් දැක්වීමට පටන් ගනිති.

චිම්පන්සින් ගේ හා අපේ දරුවන් ගේ මෙවැනි කටයුතු පිළිබඳ උනන්දුව ඇතිවන්නේ අවුරුදු 1 1/2 දී පමණය. නමුත් දෙවෙනි උපන් දිනය පසුවන තුරු මෙය එතරම් බලවත් ලෙස ක්‍රියාත්මක නොවේ. වයස අවුරුදු තුනේදී පමණ අපේ දරුවෝ තේරුමක් නැති ඉරි ඇඳීම් වෙනුවට විවිධ හැඩයන් තෝරා ඇඳීමට පටන් ගනිති. කතිර, චක්‍ර, චතුරස්‍ර හා ත්‍රිකෝණ ආදිය ඇඳීමට ක්‍රමයෙන් ඔවුහු හුරු වෙති. මෙතෙක් කල් තේරුමක් නැතිව ඇඳි රේඛා ඉන්පසුව, යම් යම් හැඩයන්හි පිට මායිම් බවට පත්වෙයි.

මීළඟ මාස කීපය තුළදී මෙම සරල හැඩයන්, එකිනෙක සමඟ සම්බන්ධ කිරීමෙන් අමුර්ත රටාවක් ගොඩ නගනු දැකිය හැකිය. රවුමක් තුළ කතිරයක් ඇඳීමටත්, චතුරස්‍රයක මුළු විකර්ණ රේඛාවකින් සම්බන්ධ කිරීමටත් ඔහුට හැකි වේ.

සිත්තම් මහින් අදහස් ප්‍රකාශ කිරීමේ පළමු වැනි අවස්ථාව මෙයයි. අපේ දරුවෙකුගේ මෙය සිදුවන්නේ තුන්වැනි අවුරුද්දේ අග භාගයේ හෝ හතරවැනි අවුරුද්දේ ආරම්භයේදීය. චිම්පන්සියා මෙන් කතිර, වෘත්ත වැනි විවිධ දේ අඳින අපේ දරුවා, රවුමක් තුළ විවිධ රේඛා හා සලකුණු තබන විට මුහුණක් ඇඳී ඇති බව එක් වරටම හඳුනා ගනී. "අමුර්ත" අත්හදා බැලීමේත්, රටාවන් සෙවීමේත් කාලය මෙයින් අවසන් වෙයි. දැන් ඉලක්කය වන්නේ යම් යම් දේ නියම ආකාරයටම දැක්වීමයි. ටිකෙන් ටික වඩා හොඳ මුහුණු ඇඳීමට පුරුදුවන ඔහු, එයට හිස කෙස්, කන්,නාස් අත් හා පාද එක් කරයි. මේ සමඟම මල්, ගෙවල්, සතුන් බෝට්ටු, කාර් වැනි විවිධ දේ ඇඳීමට ද ඔහු පුරුදු වෙයි. මෙම තත්වයට චිම්පන්සියෙකුට කිසිම දාක පත්විය නොහැක.

අපේ දරුවාට දැන් ප්‍රධානම දෙය වන්නේ මෙම සිත්තම් මහින් විවිධ දේ නිරූපණය කිරීම වුවද, පැරණි "අමුර්ත" රටාවන්හි බලපෑම් තවම දක්නට ලැබේ. විශේෂයෙන්ම වයස අවුරුදු 5 සිට 8 දක්වා කාලය තුළ මෙය දැකිය හැකියි. මේ කාලයේදී අමුර්ත හැඩ මත පදනම් වූ ඉතා ආකර්ෂණීය චිත්‍ර නිපදවීමට ඔවුන්ට හැකි වේ.

තීන්වලින් පිරුණ වෘත්තය නිවැරදිව සම්පූර්ණ ප්‍රමාණයේ චිත්‍රයක් බවට පත්වීමේ ක්‍රියාවලිය ඉතා සිත්ගන්නා සුළු එකකි. මෙයින් මුහුණක් ඉබේට ඇඳීම නිසා, ක්‍රියාවලිය සාර්ථක ලෙස සම්පූර්ණ වීම එක් දිනක දී සිදු නොවේ. මේ සඳහා බොහෝ කාලයක් ගත වේ. ආරම්භයේදී මූලික ලක්ෂණ ටිකක් නිවැරදිව සකස් වෙයි. ඇස් සඳහා රවුම්ද, කට දැක්වීමට තිරස් රේඛාවක්ද, නාසය දැක්වීමට තීන් දෙකක් හෝ මධ්‍යම රවුමක්ද යන ආකාරයෙනි. එය වනුයේ, මින් ටික කලකට පසුව මෙයට කෙස් ද එක්වේ. මුහුණ මවගේ අංගෝපාංගවලින් දරුවාට ඉතාම වැදගත් වන කොටසයි. සමහර කෙස් අනික් ඒවාට වඩා දික් කිරීමෙන් මේ මුහුණන් අත් හා පය ඇතිවේ. මෙම රූපයට තවමත් පදනම් වී ඇත්තේ මුල් වෘත්තයයි. මෙහි අත් සවිවී ඇත්තේ හිසට වීම, දරුවාට

Scanned by TapScanner

එතරම් ප්‍රශ්නයක් වන බව නොපෙනේ. තවත් කාලයක් ගතවීමෙන් පසු දෙවෙනි කොටසක් පහළින් එක්වන අතර එයට පාද සවිවෙයි. තවමත් හිසට සවිවී තිබෙන අත් නියම ස්ථානයට එන්නේ එයින් පසුවයි.

මෙසේ පියවරින් පියවර ඉදිරියට තබමින් සෙමෙන් මෙම ක්‍රියාවලිය සම්පූර්ණ වන ආකාරය බලා සිටීම ඉතා සිත් ගන්නා දෙයකි. ක්‍රමයෙන් තවත් හැඩයක් හා ඒවායේ සංකලනයන්ද, වඩා සංකීර්ණ වර්ණයන්ද, ඇඳීමට ඔහු සමත් වෙයි. අවසානයේ බාහිර ලෝකයේ නිවැරදි පිටපත් මේ අතුව ඇඳීමට හැකි වේ. නමුත් මෙම අවස්ථාව වන විට, මෙම ක්‍රියාවේ මුල් ගවේෂණාත්මක ස්වරූපය, සිත්තම් මඟින් අදහස් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයන් හේතුකොට ගෙන යටපත් වී යයි. අපේ දරුවාගේත්, ළදරු චිම්පන්සියාගේත් මුල් චිත්‍ර හා සිතුවම් අදහස් ප්‍රකාශ කිරීමේ මහක් නොවීය. එය සොයා බැලීම හා ගවේෂණය සම්බන්ධ ක්‍රියාවලියක් වූ අතර සංඥා නිකුත් කිරීමේ මහක් ද නොවීය. ඒ සඳහා පාරිතෝෂිකයන් අවශ්‍ය නොවේ. එය ක්‍රීඩාවේ නාමයෙන් ක්‍රීඩා කිරීමකි. කෙසේ වෙතත් ළමා ක්‍රීඩාවල බොහෝ අංග මෙන් එයද වැඩිහිටි ක්‍රීඩාවක් බවට දියුණු විය. සමාජීය වශයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා මෙය යොදා ගැනීමත් සමඟ මුල් ගවේෂණාත්මක බව නැතිවෙයි. (මෙයින් අදහස් කරන්නේ ඔවුන්ගේ නව නිපැයුම් සෙවීමේ ලක්ෂණය නැති වූ බව නොව, එය වඩා සංකීර්ණ කාර්මික ක්ෂේත්‍රවලට විහිදී ඇති බවයි.)

චිත්‍ර ඇඳීමේ හා සිතුවම් කිරීමේ ගවේෂණාත්මක කලාවේ වාසනාවකට මෙන්, අවට ලෝකයේ ප්‍රතිබිම්බයක් ඇති කළ හැකි චිත්‍ර කලාවේ වගකීමක් බවට පත්ව තිබූ, ලෝකය ඒ ආකාරයටම නිරූපණය කිරීම අද ඡායාරූප ශිල්පය හා එහි අනිකුත් අංශ මඟින් භාරගෙන තිබේ. මේ නිසා චිත්‍ර ශිල්පීන්ට නැවතත් වරක්, පරිණත වැඩිහිටි මට්ටමකින් ගවේෂණ කටයුතුවල යෙදීමට හැකිවනු ඇත. නව හැකියාවන් තුළින් ඇත්ත වශයෙන්ම අද සිදුවන්නේ එය බව කිවයුතු නොවේ.

මා ගවේෂණාත්මක හැසිරීම පිළිබඳ මේ උදාහරණ තෝරා ඇත්තේ, එයින් අපත්, අපේ කිට්ටු නෑයා වන චිම්පන්සිත් අතර ඇති වෙනස හොඳින් පැහැදිලි වන හෙයිනි. අනිකුත් අංග පිළිබඳව, මේ සමාන සංසන්දනයක් කළ හැකිය. මෙයින් එකක් දෙකක් කෙටියෙන් සඳහන් කළ යුතුය. ශබ්ද පිළිබඳ ගවේෂණය මෙම සත්ව වර්ග දෙකේම දැකිය හැකි වේ. යම්කිසි හේතුවක් නිසා චිම්පන්සියා ගේ ශබ්ද ඇති කිරීමක් දක්නට නොලැබේ. එහෙත් විවිධ දේට තට්ටු කිරීමෙන් ශබ්ද ඇතිකිරීම උගේ ජීවිතයේ වැදගත් තැනක් ගනී. මෙම ලක්ෂණය "බෙර ගැසීමේ" කාලයක් ලෙස වැඩිහිටි චිම්පන්සින්ගේ දක්නට ලැබේ. පැය භාගයක් පමණ ගතවන මෙම සමාජීය වාදනයේදී කණ්ඩායමේ සෑම සතෙක්ම, අඩි හප්පමින්, කෑ ගසමින්, ගස්වල කොළ අතු කඩා ඒවායින් ගසමින් එයට සහභාගී වෙති. මෙහි කාර්යය කුමක්දැයි නොදන්නා නමුත් කණ්ඩායමේ සමාජිකයන් අන්‍යෝන්‍ය වශයෙන් පිබිදවීමට එය සමත් වන බව පෙනේ. අපේ වර්ගයා ගේ ද ඉතා බහුලව දක්නට ලැබෙන සංගීතමය ප්‍රකාශන මාධ්‍යය, බෙර වාදනයයි. චිම්පන්සියා ගේ මෙන් අපේ ද මෙය ඉතා කුඩා කාලයේම ආරම්භ වෙයි. චිම්පන්සියාට මෙය සරල රිද්මයකට වඩා දියුණු කළ නොහැකි නමුත්, අපි එය ඉතා සංකීර්ණ බහු රිද්මයන් දක්වා දියුණු කරමු. හිස් කුහරයන්ට පිඹීමෙන් හා ලෝහ කැබලි භාවිතයෙන් අපි විවිධ ශබ්ද ගොඩනගා ගනිමු. සරල සමාජීය කණ්ඩායම්වල දක්නට ලැබෙන අපේ සංගීතමය ක්‍රියාවන්හි කාර්යය, චිම්පන්සියා ගේ බෙර වාදන ක්‍රියාවේ කාර්යයම බව පෙනේ. එනම්, කණ්ඩායම අන්‍යෝන්‍ය වශයෙන් පිබිදවීමයි. එය පින්තූර ඇඳීම මෙන්, විස්තරාත්මකව තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා යොදාගත් ක්‍රියාවලියක් නොවීය. සමහර සමාජයන්හි දක්නට ලැබෙන බෙර වාදනය මඟින් පණිවුඩ යැවීම මෙම නීතියේ අනනුකූලයක් වේ. සංගීතය දියුණු වූයේ සාමාන්‍ය වශයෙන් හැඟීම් පුබුදු කරවන උපකරණයක් ලෙසයි. එහි ගවේෂණාත්මක ලක්ෂණ ක්‍රමයෙන් ප්‍රබල විය. කෙසේ වෙතත් අවට ලෝකය නිරූපණය කිරීමේ අවශ්‍යතාවයෙන් තොරවූ බැවින්, එය අමූර්ත සෞන්දර්යාත්මක

Scanned by TapScanner

අත්හදා බැලීම්වල ප්‍රධාන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ. (මුලදී තොරතුරු ගෙන ඒමේ මාධ්‍යයක් ලෙස යොදා ගැනීම නිසා චිත්‍ර ශිල්පය මේ තත්වයට පැමිණ ඇත්තේ දැන්ය.)

නැටීම ද ගෙන ඇත්තේ සංගීතය හා වාදනය ගත් මගමයි. විම්පන්සියා ගේ බෙර වාදනයන්හි දී ඔවුන් එක්තරා කාලයකට වැනෙන හා පෙරළෙන බව පෙනේ. අපේ වර්ගයා ගේ සංගීතමය අවස්ථාවන්හිද මෙවැන්නක් දක්නට ලැබේ. සංගීතය මෙන් මෙය ද සෞන්දර්යාත්මක වශයෙන් සංකීර්ණ ක්‍රියාවක් ලෙස දියුණු වී ඇත.

නැටුමත් සමඟ දියුණු වී ඇති අනික් දෙය නම් සරඹ ක්‍රීඩාවයි. තරුණ විම්පන්සින් ගේ හා ළමයින් ගේ ක්‍රීඩාවන්හි රිද්මයානුකූල ශරීරික ක්‍රියා බහුල වශයෙන් දක්නට ලැබේ. මේවා ඉතා ඉක්මණින් ශෛලිගත වන නමුත්, එම ව්‍යුහමය රටාවන් තුළ සැහෙන ප්‍රභේදනයක් පවත්වා ගැනේ. නමුත් විම්පන්සියාගේ ශරීරික ක්‍රීඩා මේ ආකාරයට වැඩි දියුණු වීමක් දක්නට නොලැබේ. අපි මෙම හැකියාවන්ගෙන් සම්පූර්ණ ප්‍රයෝජනය ගනිමින් වැඩිහිටි ජීවිතයේ ද දක්නට ලැබෙන විවිධ ව්‍යායාමයන් හා ක්‍රීඩාවන්ට ඒවා දියුණු කරමු. තවද, ඒවා සමාජීය සමකාලීකරණ උපකරණ වන නමුත්, ප්‍රධාන වශයෙන් ඒවා අපේ ශාරීරික හැකියාවන් වැඩි දියුණු කිරීමේ මහක් වෙයි.

ලිවීම, පින්තූර ඇඳීමේ විධිමත් නව මහක් ලෙස දියුණු වී කථාකිරීමේ ශක්තියත් සමඟ එය තොරතුරු හුවමාරු කර ගැනීමේ හා වාර්තා කිරීමේ ප්‍රධාන ක්‍රමය බවට පත්ව ඇත. අති විශාල පරිමාණයකින් මෙය සෞන්දර්යාත්මක ගවේෂණ මහක් ලෙසද යොදාගෙන තිබේ. අපේ පරම්පරික ගෙරවිලි හා කෙඳිරිලි ශබ්දයන් සංකීර්ණ වූත්, සංකේතාත්මක වූත් කථාවක් බවට දියුණුවීම නිසා, අපට විවිධ අදහස් සමඟ ක්‍රීඩා කිරීමට හැකිවී ඇත. සෞන්දර්යාත්මක අත්හදා බැලීම් සඳහා ඒවා ක්‍රීඩා භාණ්ඩ ලෙස යොදා ගැනීමට ද මේ නිසා ඉඩ ලැබී තිබේ.

මේ අනුව, චිත්‍ර කලාව, මූර්ති කලාව, සංගීතය

ගායනය, නැටීම, සරඹ ක්‍රීඩා, ලිවීම හා කථාව ආදී සෑම ක්ෂේත්‍රයකම අපේ දීර්ඝ ජීවිත කාලය තුළ අපේ සිතේ හැටියට සංකීර්ණ වූත්, විශේෂණය වූත්, ගවේෂණයන් හා අත්හදා බැලීම් කිරීමට හැකි වේ. අති මහත් පුහුණුවක් මගින් මෙම කටයුතුවල නියැළුණු අය හා නිරීක්ෂකයන් ලෙස, අපේ ප්‍රතිචාරයන් සංවේදිකෘත කිරීමට අපට හැකි වේ. මෙම කටයුතුවල ද්විතියික කාර්යයන් (මුදල් ඉපයීම, තත්වයක් ලබා ගැනීම ආදිය) අමතක කළහොත් ජීව විද්‍යාත්මක වශයෙන් බලන විට මේවා සියල්ලම ළදරු ක්‍රීඩා රටාවන්, වැඩිහිටි ජීවිතය දක්වා ව්‍යාප්තවීමක් හෝ මෙම ක්‍රීඩා නීති, වැඩිහිටි තොරතුරු පණිවුඩ හුවමාරු පද්ධතිය මත අධිස්ථාපිත කිරීමක් ලෙස හෝ සැලකිය හැකි වෙයි.

මෙම නීති පහත දැක්වෙන ආකාරයට දැක්විය හැකිය. (1) නුහුරු දේ හුරු පුරුදු දෙයක් බවට පත්වන තුරු ඒවා විමසිල්ලට භාජනය කළ යුතුය. (2) හුරුපුරුදු දේ රිද්මයානුකූලව නැවත නැවතත් සිදු කළ යුතුය. (3) මෙසේ කිරීමේදී හැකි හැම අතකටම එය වෙනස් කළ යුතුය. (4) මෙයින් වඩාත්ම තෘප්තියක් ලබා දෙන ක්‍රමය තෝරා ගෙන එය දියුණු කළ යුතුය. (5) මෙම ප්‍රභේදයන් එකිනෙක සමඟ සම්බන්ධ කළ යුතුය. (6) මේවා (සියල්ල) ඒ වෙනුවෙන් එයම අවසාන පරමාර්ථය ලෙස සලකා කළ යුතුය.

වැලි කෙළියේ යෙදී සිටින ළදරුවකුගේ සිට සංගීත නාද ගීත රචනයක් කරන සංගීතවේදියකු දක්වා සෑම කෙනෙකුම ක්‍රියා කරන්නේ මෙම මූල ධර්මයන්ට අනුවයි.

අවසාන නීතිය වඩාත්ම වැදගත් වේ. ආහාර ගැනීම, සටන් කිරීම හා සහවාසය ආදියෙන් සමන්විත මූලික උන්නති රටාවේ ගවේෂණය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. නමුත් එය මුල් කාලයේ විශේෂ අවශ්‍යතාවන් පිරිමැසීමට පමණක් සීමා වෙයි. බොහෝ සත්ව වර්ගවල මින් ඔබ්බට දියුණුවක් දක්නට නොලැබේ. ගවේෂණය වෙනුවෙන් ගවේෂණය කිරීමක් ඔවුන්ගේ දක්නට නැත. නමුත් ක්ෂීරපායීන්ගේ මෙය විශේෂ

Scanned by TapScanner

බලයක් ලෙස වර්ධනය වී තිබේ. අපේ වර්ගයා ගේ එය ඉතාම උත්තරීතර තත්වයකින් දැකිය හැකියි. මෙහි කාර්යය වන්නේ අප අවට ඇති ලෝකය පිළිබඳව සියුම් හා සංකීර්ණ අදහසක් ලබාදීමයි. මේ අතින් අප ලබන දැනුම, ඕනෑම වේලාවක, ඕනෑම තත්වයක් යටතේ භාවිතයට ගත හැකි වේ.

මා මේ සාකච්ඡාවේදී විද්‍යාවේ හා කාර්මික ඥානයේ දියුණුව අත්හැර දැමූවේ ඒවා මූලික උන්නති ඉලක්කයන් වන සටන් කිරීම (ආයුධ), ආහාර ගැනීම (කෘෂිකර්මය), කුඩු සෑදීම (ගෘහ නිර්මාණ ශිල්පය) හා සැප පහසුව (වෛද්‍ය විද්‍යාව) ආදිය ලබා ගැනීමේ ක්‍රමවල විශේෂ දියුණුවක් පමණක් වන බැවිනි. කාලයාගේ ඇවෑමෙත් සමඟ ශිල්පීය වර්ධනයන් එකිනෙකා සමඟ සම්බන්ධ වීමත් සමඟ පිරිසිදු ගවේෂණාත්මක ආශාව, විද්‍යාත්මක ක්ෂේත්‍රය ද ආක්‍රමණය කර තිබේ. විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක වන්නේද කලින් සඳහන් කරන ලද ක්‍රීඩා මූල ධර්ම මතය. "ශුද්ධ" පරීක්ෂණවලදී විද්‍යාඥයා තම කල්පනා ශක්තිය මෙහෙයවන්නේ කලාකරුවා තම සිතුවිලි දාමය මෙහෙයවන ආකාරයටමයි. කලාකරුවා මෙන්ම ඔහුද ගවේෂණය කරන්නේ ගවේෂණයේ නාමයෙනි. මෙම අධ්‍යයනයන්හි ප්‍රතිඵල යම් විශේෂ උන්නති ඉලක්කයක් සඳහා ප්‍රයෝජනවත් වන්නේ නම් වඩා හොඳ නමුත්, එය ද්විතීයික දෙයක් වේ.

සියලුම කලාත්මක, විද්‍යාත්මක හා ගවේෂණාත්මක හැසිරීම් රටාවල නවකාමී හා නව භීතිකා ආශාවන් අතර ගැටුම් දක්නට ඇත. මුල් ආසාව නව අත්දැකීම් හා අලුත් දේවලට අප පොළඹවයි. දෙවැන්න, අප එවැනි දේ කිරීම වළක්වයි. අපේ නව භීතිකා ලක්ෂණය නැති වුවහොත් අප සීමා රහිතව ඉදිරියට ගොස්, කෙළවර වන්නේ මහා විනාශයකිනි. මෙම ගැටුම, ඇඳුම් හා කොණ්ඩා මෝස්තර, ගෘහ භාණ්ඩ හා රථ වාහන ආදියේ හැඩරුව වෙනස් වීමට පමණක් නොව, අපේ සංස්කෘතික දියුණුවේ පදනම ද වෙයි. පියවරෙන් පියවර ඉදිරියට යමින් මෙන්ම විටින් විට නතර වෙමින් අපිත්, අප ජීවත්වන සංකීර්ණ පරිසරය පිළිබඳ අපේ

දැනුම වැඩිකර ගනිමු.

මෙම සාකච්ඡාව අවසන් කිරීමට පෙර සඳහන් කළ යුතු ගවේෂණාත්මක හැසිරීම් රටාවේ විශේෂ අංගයක් වෙයි. ඒ ළදරු කාලයේ සමාජීය ක්‍රීඩා ආරම්භ කරන අවදිය පිළිබඳවයි. ඉතා කුඩා කාලයේ දරුවාගේ සියලුම කෙළි සෙල්ලම් දෙමාපියන් සමඟ වන නමුත්, වයස ගතවීමත් සමඟ මෙය ඔහුගේ වයසේ අනිකුත් දරුවන් සමඟ සිදුවෙයි. දරුවා බාලයන්ගේ ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙක් වෙයි. මෙය ඔහුගේ වර්ධනයේ ඉතා වැදගත් අවස්ථාවකි. ගවේෂණාත්මක බව අතින් ඔහුගේ පසු ජීවිතයට මෙය ඉතා දැඩි බලපෑමක් කරයි. ඇත්ත වශයෙන්ම මෙම වයසේ දී කරන කටයුතුවල බලපෑම ඉතා දීර්ඝ කාලීන එකක් වේ. මේ වයසේදී සංගීතය හෝ චිත්‍ර ඇඳීම අවබෝධ කර නොගන්නා දරුවාට, වැඩිහිටියෙකු ලෙස ද ඒවා දුෂ්කර ක්‍රියා වනු ඇත. නමුත් පුද්ගලයන් අතර ඇතිවන සම්බන්ධතා අන් සියල්ලටම වඩා වැදගත් වෙයි. ළමා කාලයේ කිසිම හුරුවීමක් නොමැතිව, සංගීතය හදාරන වැඩිහිටියකුට එය දුෂ්කර විය හැකි නමුත්, එය කළ නොහැකි දෙයක් නොවේ. එනමුත් ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු ලෙස සමාජීය සම්බන්ධතා ඇතිකර නොගත් දරුවෙකු, ඔහුගේ වැඩිහිටි සමාජීය සම්බන්ධතාවන්හිදී ද පසු බසිනු ඇත.

වඳුරන් සමඟ කරන ලද අත්හදා බැලීම්වලින් පෙනී ගොස් ඇත්තේ ළදරු කාලයේ තනිවීම නිසා සමාජීය වශයෙන් පසු බසින වැඩිහිටියකු ඇතිවනවා පමණක් නොව, ඒ හේතු කොට ගෙන ප්‍රති-ලිංගික හා ප්‍රති- දෙමාපිය පුද්ගලයන්ද බිහිවන බවයි. තනියම ඇති දැඩි කරන ලද වඳුරන්ට, පසුව කණ්ඩායම් කටයුතුවලට සහභාගිවීමට නොහැකි විය. මොවුන් ශාරීරික අතින් ඉතා හොඳින් වැඩී සිටියත් සාමාන්‍ය දිවීම්, පැනීම්වලට සම්බන්ධවීමට හැකියාවක් ඔවුන්ට නොවීය. ඒ වෙනුවට ඔවුන් කළේ අත් බැඳගෙන මුල්ලකට වී සිටීම හෝ ඇස් වසාගෙන සිටීමයි. ශාරීරික වශයෙන් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයන් ලෙස වැඩීමෙන් පසුවත් ඔවුහු ලිංගික සහකරුවන්

Scanned by TapScanner

පිළිබඳ කිසිම උනන්දුවක් නොපෙන්වූහ. මෙවැනි ගැහැනු සතුන් බලෙන් සහවාසයේ යෙදවූ විට සාමාන්‍ය ආකාරයට පැටවුන් ඇති කළ නමුත් ඔවුන් එම පැටවුන් සැලකුවේ, තම සිරුරේ එල්ලී සිටින විශාල පරපෝෂිතයන් ලෙසිනි. පැටවුන්ට පහරදී ඔවුන් පලවා හැරීමට තැත් කළ මේ ගැහැනු සත්තු, සමහර විටක පැටවු මරා දැමීමට තරම් සාහසික වූහ.

තරුණ චිම්පන්සින් සමඟ කරන ලද මේ හා සමාන අත්හදා බැලීම්වලින් පෙනී ගොස් ඇත්තේ, තනිකිරීම නිසා සිදුවන හානිය මොවුන් ඉතා පරිස්සමින් දීර්ඝ කාලයක් පුනරුත්ථාපනය කිරීමෙන් තරමක් දුරට නැති කළ හැකි බවයි. පවුලේ එකම දරුවා වීම නිසා මූලික වශයෙන් ඉතා අවාසිදායක තත්වයකට පත්වන ළමයින් සම්බන්ධයෙන් මෙය ඉතා වැදගත් වේ. බාල ක්‍රීඩා කණ්ඩායම්වල දිවිලි පැනිලිවල සමාජීය බලපෑම අත්දැකීමට ඔවුන්ට නොහැකි වූවහොත්, ඔවුන් ජීවිතයේ ඉදිරි කාලය ලජ්ජාශීලී, හැම දෙයටම පසු බසින පුද්ගලයන් ලෙස ගත කරනු ඇත. ඔවුන්ගේ ලිංගික යුගල බන්ධනයන් දුෂ්කර හෝ අපහසු ඒවා වන අතර, ඔවුන් කෙසේ හෝ දෙමාපියන් බවට පත්වූවහොත් ඉතා නරක දෙමාපියන් වන බවටද සැකයක් නැත.

ඇති දැඩි කිරීමේ ක්‍රියාවලියේ වෙන්කොට දැක්විය හැකි අවස්ථා දෙකක් ඇති බව මෙයින් පෙනේ. ඒවා නම් මුල් අභ්‍යන්තර අවස්ථාව හා පසු බාහිර අවස්ථාව යනුවෙනි. මෙම අවස්ථා දෙකම ඉතා වැදගත් වන අතර වඳුරන්ගේ හැසිරීමෙන් අපට ඒ පිළිබඳව බොහෝ දේ ඉගෙනීමට පුළුවන. ජීවිතයේ මුල් අවදියේදී මව දරුවාට ආදරය පෙන්වා, ඔහුට අවශ්‍ය විවිධ දේ ලබා දෙමින් ඔහු ආරක්ෂා කරයි. ආරක්ෂාව යනු කුමක්දැයි ඔහු අවබෝධ කර ගනී. දෙවැනි අවස්ථාවේදී, අනිකුත් ළමයින් සමඟ සමාජීය සම්බන්ධතාවන් ඇති කර ගැනීම වැනි බාහිර කටයුතුවල යෙදීමට ඔහු පොළඹවනු ලැබේ. මේ වන විට මවගේ ආදරය පෙන්වීම අඩුවන අතර ඇගේ ආරක්ෂක කටයුතු අනතුරුදායක අවස්ථාවලට පමණක් සීමා වෙයි. තවදුරටත් තමා සමඟම රැඳී සිටීමට, වැඩෙන පැටවා තැත්

කළහොත් මව ඔහුට දඬුවම් කිරීමට වුවද පසුබට නොවේ. මේ නිසා ඔහු තමාගේ වැඩිවෙන ස්වාධීනත්වය අවබෝධ කර ගැනීමටත්, ඒ අනුව ක්‍රියා කිරීමටත් පුරුදු වෙයි.

අපේ වර්ගයේ පැටවුන් සම්බන්ධයෙන් ද තත්වය මූලික වශයෙන් මෙයට සමාන විය යුතුය. ළදරුවාගේ ජීවිතයේ, ඉහත සඳහන් කළ මූලික අවස්ථා දෙකේදී දෙමාපියන් නියම ආකාරයට කටයුතු නොකළහොත්, දරුවාට පසු ජීවිතයේ ඉතා බලවත් දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවනු ඇත. ඔහුට මුල් ආරක්ෂක අවදිය නියම ලෙස නොලැබී, ස්වාධීන අවදියේ ඔහු සුදුසු ලෙස ක්‍රියාශීලී වුයේ නම් ඔහුට පහසුවෙන් අලුත් සමාජීය සම්බන්ධතාවන් ඇති කර ගත හැකි වන නමුත්, ඒවා පවත්වා ගැනීම හෝ බලවත් බැම්මක් ඇතිකර ගැනීම අපහසු වනු ඇත. මුල් අවදියේ ඔහුට ආරක්ෂාව බෙහෙවින් ලැබී, පසු අවදියේත් වුවමනාවට වැඩියෙන් ආරක්ෂා කරනු ලැබුවේ නම්, ඔහුට අලුත් සම්බන්ධතාවන් ඇතිකර ගැනීම ඉතා දුෂ්කර වන බැවින්, පැරණි පුරුදු අයටම ඇලී සිටීමට උත්සාහ කරනු ඇත.

සමාජයෙන් කොන්වීමේ ඉතාම දරුණු අවස්ථාවන් දෙස විමසිල්ලෙන් බැලුවහොත්. මේ සෑම අවස්ථාවකම ඉතා උග්‍ර ප්‍රති-ගවේෂණාත්මක හැසිරීම් රටාවක් දක්නට ලැබේ. මෙවැනි පුද්ගලයෝ සමාජීය වශයෙන් අක්‍රියකාරී වුවත්, ශාරීරික වශයෙන් අක්‍රියකාරී නොවෙති. ඔවුන් තුළ නැවත නැවත සිදුවන ඒකාකාරී ක්‍රියාවෝ දක්නට ලැබෙති. විවිධ ආකාරයේ ගැස්සීම්, පැද්දීම්, සෙලවීම් මෙයින් සමහරකි. ඇඟිලි හෝ ශරීරයේ වෙනත් කොටස් උරා බීම, පුදුමාකාර ලෙස මුහුණ සකස් කිරීම, අතේ ඇති කුඩා දේවලින් තට්ටු කිරීම හෝ ඒවා රිද්මයානුකූලව කරකැවීම මෙවැනි අය නිරත වන කාර්යයෝ වෙති. අප කවුරුත් ඉඳහිට මෙවැනි දේ කරන නමුත්, මෙවැනි පුද්ගලයන් ගේ ඒවා මූලික ක්‍රියා බවට පත්වෙයි. සමාජයටත් සමාජීය සම්බන්ධතාවන්ටත් බියවීම නිසා, තම හැසිරීම් රටාව තමා වටේම සකස්කර ගැනීමෙන් ඔවුහු සැනසීම ලබාගනිති. යම්කිසි ක්‍රියාවක රිද්මයානුකූලව නිතර නිතර යෙදීම නිසා, එය "ආරක්ෂා සහිත" කටයුත්තක්

Scanned by TapScanner

බවට පත්වේ. තමාට හුරුපුරුදු නැති කටයුතුවල යෙදීම වෙනුවට, මෙවැනි පුද්ගලයන් තමාට පුරුදු ක්‍රියාවන්හි නිරත වනු දක්නට ලැබේ.

හෘද ස්පන්දන රිද්මයේ ඇති සැනසිලිදායක ලක්ෂණය ගැන මම මීට පෙර සඳහන් කළෙමි. මේ ආකාරයේ බොහෝ හැසිරීම් රටාවන්හි වේගය, හෘද ස්පන්දනයේ වේගයට සමාන බව පෙනේ. එසේ නොවන ඒවා වුවද නිතර නිතර සිදුවීමෙන්, අධික පුරුද්ද නිසා සැනසීමක් ලබා දෙන ක්‍රියා බවට පත්වේ. සමාජීය වශයෙන් පසු බසින පුද්ගලයන් ගේ මෙම ක්‍රියාවන් නුහුරු පරිසරයක දී වැඩි වන බව සොයාගෙන ඇත. පරිසරයේ අලුත් බව හා නුපුරුදු බව හේතුකොට ගෙන නව භීතික ලක්ෂණය වැඩි වන බැවින්, එය යටපත් කිරීම සඳහා සැනසිලිදායක ක්‍රියාවන් වැඩි වැඩියෙන් අවශ්‍ය වේ.

මෙවැනි ක්‍රියාවක නැවත නැවතත් යෙදීම නිසා එය කෘත්‍රිම වශයෙන් ඇති කරන ලද මානෘ හෘද ස්පන්දනයක් බවට පත්වෙයි. එහි ඇති සැනසිලිදායක හා සුවදායක ලක්ෂණය වැඩිවී ගොස් එය නැතිවම බැරි තත්වයකට පත්වන බව පෙනේ. එවැන්නක් ඇති වීමට හේතුභූත වූ බිය ඉවත් කළ හැකි වූවත්, මෙම ක්‍රියාව දිගටම සිදුවනු ඇත. සමාජයට හොඳින් හැඩ ගැසුණු පුද්ගලයන් ද වරින් වර මෙවැනි ක්‍රියාවල නිරත වන බව මම සඳහන් කළෙමි. සාමාන්‍යයෙන් මේවා ඇති වන්නේ පීඩාවට පත්වූ අවස්ථාවන්හි වන අතර ඒවා සිතට සැනසීමක් ගෙන දෙයි. වැදගත් දුරකථන පණිවුඩයක් බලාපොරොත්තු වන ව්‍යාපාරිකයකු මේසයට තට්ටු කරමින් නොඉවසිල්ලෙන් සිටීම, වෛද්‍යවරයා හමුවීමට සිටින ගැහැනිය ඇඟිලිවලින් අත් බැගය පිරිමැදීම, බලාපොරොත්තු සහගත නොඉවසිලිමත් අවස්ථාවක එහා මෙහා යෑම, විභාගයේදී ශිෂ්‍යයා පැන්සල් විකීම, රැවුල අතගෑම ආදිය මෙවැනි අවස්ථා වේ. මෙම ප්‍රතිගවේෂණාත්මක ක්‍රියා තරමක් දුරට ප්‍රයෝජනවත්ය. අපට නවතාව හුරුවීමට ඒවා ආධාර වේ. කෙසේ වෙතත් වුවමනාවට වැඩියෙන් ඒවායේ යෙදුණහොත්, ඒවා නැති කළ නොහැකි තත්වයකට පත්වී,

අනවශ්‍ය අවස්ථාවන්හිදීත් ඒවා දක්නට ලැබෙනු ඇත.

අධික ලෙස වෙහෙසට පත්වූ අවස්ථාවන්හිත් මෙවැනි ක්‍රියාවෝ දක්නට ලැබෙති. මේවා සත්ව උද්‍යානයන්හි කොටු කර සිටින සතුන් ගේ මෙන්ම අපේ වර්ගයා ගේත් දක්නට ඇත. සමහර විටක මෙය ඉතා භයානක තත්වයකට පත්විය හැකියි. කොටුකර සිටින සතුන්ට සමාජීය සම්බන්ධතාවයන් පැවැත්වීමට අවස්ථාවක් නොලැබේ. කුඩුව තුළම සිටීම නිසා, ඔවුහු සමාජීය වශයෙන් පසුබසින තත්වයකට පත්වෙති. මෙය සමාජීය වශයෙන් පසුබසින පුද්ගලයකු ගේ මානසික තත්වයට සමාන වෙයි. එය ඉතා ප්‍රබල ප්‍රති-ගවේෂණාත්මක උපකරණයක් වන අතර, ගවේෂණය කිරීමට හෝ විමසා බැලීමට කිසිවක් නැති බැවින්, කුඩුව තුළ කොටු වූ සතා තමාට හැකි එකම ආකාරයට හැඟීම් ප්‍රකාශ කිරීමට පටන් ගනී. එනම් කලින් සඳහන් කළ ආකාරයේ රිද්මයානුකූල ක්‍රියාවන් මගිනි. නොනවත්වා කුඩුව තුළ එහා මෙහා යන සතුන් අපට හුරු පුරුදු දර්ශනයකි. නමුත් මෙය මෙවැනි තත්වයන් යටතේ ඇති වන පුදුමාකාර හැසිරීම් රටාවන්ගේ එකක් පමණි. ශෛලිගත ස්වයංමෙථුන ක්‍රමද දක්නට ලැබේ. සමහර විට මේ සඳහා පුරුෂ ලිංගය සම්බන්ධ කර නොගැනේ. සත්වයෝ (බොහෝ විට වඳුරෝ) පුරුෂ ලිංගය ස්පර්ශ නොකොට අත ඉදිරියට පස්සටත් ගැනීමෙන් ස්වයංමෙථුන ක්‍රියාවක් අනුකරණය කරති. සමහර වැඳිරියන් නිතර නිතර තම තන පුඩු උරා බීමද, තරුණ වඳුරන් පාද උරා බීමද දක්නට ලැබේ. චිම්පන්සි කන්වලට පිදුරු කැබලි දමා ගනිති. පැය ගණන් නෙනවත්වා හිස සලන අලි, අපි කවුරුත් දැක ඇත්තෙමු. සමහර සතුන් ඔවුන්ම සපා ගැනීම හෝ ඔවුන්ගේ කෙස් අදිනු දැකිය හැකිය. ඉතා බරපතළ ලෙස තම සිරුරට තුවාල සිදුකර ගන්නා අවස්ථා විරල නොවේ. මේවා වෙහෙසකාරී බවෙන් හෝ අලස බවෙන් මිදීමට දරන ප්‍රයත්නයෝය. පරිසරයේ අලුත් බවක් නැතිවීම නිසා ගවේෂණාත්මක ආසාවන් තෘප්තිමත් කර ගැනීමට අවස්ථාවක් සත්වයාට නොලැබීම මෙයට හේතුවයි.

Scanned by TapScanner

මෙවැනි ක්‍රියාවක යෙදෙන තනිවූ සතකු දෙස බැලීමෙන් පමණක් එම හැසිරීමට හේතු සොයා ගත නොහැකියි. එයට හේතුව අලස බව හෝ වෙහෙසට පත්වීම විය හැකියි. හේතුව පරිසරයේ කිසියම් තත්වයක් නිසා ඇති වූවක්ද විය හැකියි. සරල අත්හදා බැලීමකින් මෙය සොයා ගැනීමට පුළුවන. අලුත් දෙයක් කුඩුවේ තැබූ විට එම ක්‍රියා නැති වේ නම් එය, කළ යුතු කිසිම දෙයක් නැතිවීම නිසා සිදු වූවක් විය යුතුය. එවැන්නක් කුඩුවට ඇතුල් කිරීමත් සමඟ එවැනි ක්‍රියාවන් වැඩි වුවහොත් හේතුව වෙහෙසට හෝ පීඩාවට පත්වීම විය යුතුය. සාමාන්‍ය සමාජීය වාතාවරණයක් ඇති කරන ඔවුන්ගේ වර්ගයේ තවත් සතුන් කුඩුවට ඇතුළු කළ විටත්, මෙම ක්‍රියාවෝ දක්නට ලැබෙත් නම්, එම සත්වයාගේ ළමා කාලය ඉතාම තනිවූ එකක් බවට සැකයක් නැත.

සත්වෝද්‍යානයෙහි දක්නට ලැබෙන මෙම සිද්ධීන් සියල්ලම අපේ වර්ගයා තුළද දක්නට ලැබේ. (මෙයට හේතුව සත්වෝද්‍යාන අපේ නගර මෙන් සැලසුම් කොට තිබීම වන්නට පුළුවන.) එය අපට හොඳ පාඩමක් විය යුතුය. අපේ නවකාමී හා නවභීතික හැඟීම් අතර සම බරක් පවත්වා ගැනීමේ වැදගත්කම එය අපට මතක් කර දෙයි. අපට එම සමතුලිත බව ඇතිකර ගත නොහැකි වුවහොත්, නියම ලෙස කටයුතු කළ නොහැකි වනු ඇත. අපේ ස්නායු පද්ධතිය කොතරම් හොඳින් ක්‍රියා කළත්, අපේ හැසිරීම් රටාවන්හි ශක්තිය ඉක්මවා යෑමට එයට හැකි නොවේ.

5 සටන් කිරීම

අපේ කලහකාරී හා චණ්ඩ ආශාවන්හි ස්වභාවය තේරුම් ගැනීමට නම් අපේ සත්ව ආරම්භය පිළිබඳ පසුබිම මත තබා, ඒ දෙස බැලිය යුතු වේ. අද අප ලක්ෂ ගණනින් විනාශයට පත් කරවන සැහැසිකම්වල නිරත වී ඇති බැවින්, මේ විෂයය ගැන සාකච්ඡා කිරීමේදී අපේ විෂය මුල ස්වභාවය නැතිවීමට ඉඩ තිබේ. ආක්‍රමණකාරීභාවය යටපත් කිරීමේ ඉතාම හදිසි අවශ්‍යතාව ගැන සාකච්ඡා කරන විට, බොහෝ විචක්ෂණ බුද්ධිමත්තු පවා ආක්‍රමණකාරී වෙති. මෙය පුදුමයට කරුණක් නොවේ. ඉතාම අඩුවෙන් කිවහොත් අද අපි වැටී ඇත්තේ ඉතාම වියවුල්සහගත තත්වයකටයි. ශත වර්ෂය අවසාන වන විට අප සියල්ලන්ම විනාශ වීමට බොහෝ ඉඩ ඇති බව පෙනේ. අපේ වර්ගයාට සිත සනසා ගත හැකි එකම දෙය වන්නේ අප ඉතාම උද්දීප්‍ය කාලයක් ගත කළ බව පමණයි. සත්ව වර්ගයක් ලෙස බලන විට එය එතරම් දීර්ඝ කාලයක් නොවූවත්, ඉතා උත්කර්ෂණීය සිද්ධීන්ගෙන් පිරුණු කාලයක් විය. අපේ පහරදීමේ හා ආරක්ෂාවීමේ පුදුම ක්‍රම විග්‍රහ කොට බැලීමට පෙර හෙල්ල, තුවක්කු හා බෝම්බවලින් තොර වූ සත්ව ලෝකයේ සාහසික ස්වභාවය ගැන පරීක්ෂා කොට බැලිය යුතුය.

සතුන් ඔවුනොවුන් සමඟ සටන් කරන්නේ ඉතා හොඳ හේතු එකක් හෝ දෙකක් සඳහායි. ඒවා නම්, සමාජීය ධුරාවලියේ ප්‍රමුඛතාව තහවුරු කිරීම හෝ යම්කිසි බිම් කොටසක් පිළිබඳව ඔහුගේ අයිතිය තහවුරු කිරීම සඳහා හෝ වේ. සමහර සත්ව වර්ග නියමිත බිම් ප්‍රදේශයක් නැති ධුරාවලික සත්තු වෙති. සමහරු ධුරාවලික ප්‍රශ්න නැති බිම් ප්‍රදේශයන් අයිති කරගෙන සිටින සත්තු වෙති. තවත් සමහර සතුන් බිම් ප්‍රදේශවලට අයිතිවාසිකම් කියන අතරම, ඔවුන්ගේ සමාජයන්හි ධුරාවලියක් ද දක්නය ඇත. එහෙයින් එවැනි සමාජයන්හි මේ දෙවර්ගයේම සැහැසිකම් දක්නට ලැබේ. අප අයත් වන්නේ මේ තුන්වැනි කොටසටයි. අග්‍රේශයන් ලෙස අපට

Scanned by TapScanner

ධුරාවලි පද්ධතියක් ලැබී ඇත. මෙය මූලික අග්‍රේශ ජීවන ක්‍රමය වේ. කිසියම් ප්‍රදේශයක් ස්ථිර වාසස්ථානයක් කර ගැනීමට තරම් කාලයක් එක් තැනක නොසිට, මෙම කණ්ඩායම් තැනින් තැනට ගමන් කරති. වරින් වර කණ්ඩායම් අතර ගැටීම් ඇති විය හැකි වුවත්, ඒවා දුර්වලව සංවිධානය වූ ඒවා වන බැවින්, සාමාන්‍ය වඳුරකුගේ එදිනෙදා ජීවිතයේ එය එතරම් වැදගත් තැනක් නොගනී. බොහෝ වඳුරන් හා වානරයන් ගේ ඉතා දැඩි සමාජීය ධුරාවලී පද්ධතියක් දක්නට ලැබේ. ප්‍රමුඛ පිරිමි සතකු කණ්ඩායම භාරව සිටින අතර, අනික් සත්තු එක් එක් ප්‍රමාණයට ඔහුට යටත් වෙති. තම අධිපති බව පවත්වා ගැනීමට නොහැකි තරමට ඔහු දුර්වල හෝ මහලු වූ විට, වඩා ශක්තිමත් තරුණ පිරිමි සතෙක් නායකත්වය ගනියි. දරුණු පාලකයකු ලෙස හැසිරීම ඔහුගේ කාර්යය වුවත්, එම සමාජයේ ඇති ඉතා ඉව්ජාකාර මෙන්ම කාමුකම වඳුරා වන්නේ ඔහුය.

සියලුම අග්‍රේශ වර්ගවල සමාජීය සංවිධානය සාහසික ලෙස ඒකාධිපති නොවේ. ගෝරිල්ලන් කණ්ඩායමක දක්නට ඇතිවාක් මෙන්, හැම විටම ඒකාධිපතියෙකු සිටින නමුත්, සමහර විට ඔහු කරුණාහරිත ඒකාධිපතියෙක් වෙයි. අනිකුත් පිරිමින් සමඟ ගැහැනු සතුන් බෙදාගන්නා ඔහු, කණ්ඩායමේ අන් අය සමඟ ආහාර ද බෙදාගනී. ඔහු තම බලය ප්‍රයෝජනයට ගන්නේ ආරවුලක් ඇති වූ විට හෝ බෙදාගත නොහැකි දෙයක් ගැන වියවුලක් පැන නැගුණ විට පමණි.

නිරුවත් වානරයා නියමිත වාසස්ථානයක් සහිත සහයෝගී දඩයම්කරුවකු වීමත් සමඟ මෙම මූලික ක්‍රමය වෙනස් කිරීමට සිදුවිය. ලිංගික හැසිරීම් රටාව වෙනස් වූ ආකාරයටම ඔහුගේ, මාංශභක්ෂක ජීවන ක්‍රමයට සරිලන සේ අග්‍රේශ රටාව වෙනස් කිරීම අවශ්‍ය විය. ඔවුන් ශේම්කිසි ප්‍රදේශයකට අයිතිවාසිකම් කියන කණ්ඩායමක් බවට පත්විය යුතුය.

ඔවුන් වාසස්ථානය ආරක්ෂා කළ යුතු විය. දඩයම් කිරීමේ සහයෝගිතා ස්වභාවය නිසා, මෙය පෞද්ගලිකව නොව, කණ්ඩායමක් ලෙස කළ යුතු විය. දඩයම් කිරීමේ දී දුර්වල සමාජිකයන් ගේ ද සහයෝගය ලබා ගැනීම සඳහා අග්‍රේශයන් ගේ දක්නට ඇති ඒකාධිපති ක්‍රමය සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් කළ යුතු විය. නමුත් එය සම්පූර්ණයෙන්ම නැති කළ හැකි නොවේ. ස්ථිර තීරණයක් ගැනීම සඳහා නායකයකු හා බලවත් සමාජිකයන්ගෙන් සැදුම් ලත් ධුරාවලියක් තිබිය යුතුය. කැලෑවල ජීවත් වූ රෝම සහිත අනිකුත් අග්‍රේශයන් ගේ නායකයන්ට වඩා මොහුට, තමා යටතේ සිටින අයගේ හැඟීම් ගැන සැලකිලිමත්වීමට අවශ්‍ය වූයේය.

සමාජීය සංවිධානයත්, තම ප්‍රදේශයත්, කණ්ඩායමක් ලෙස ආරක්ෂා කිරීමට අමතරව, අපේ ළදරුවන් දීර්ඝ කාලයක් අපෙන් යැපීම හේතු කොට ගෙන ඇති වූ පවුල් ඒකක නිසාත් ස්වයං බලපෑමක් සිදු විය. ජනාවාස තුළ තම පෞද්ගලික ආධිපත්‍යය ආරක්ෂා කිරීමට පවුලේ මූලිකයා ලෙස සෑම පිරිමියෙකුටම සිදු විය. මේ නිසා සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කලහකාරී ක්‍රියාවන් දෙකට අමතරව අපේ වර්ගයාගේ තුන් ආකාරයක චණ්ඩ ක්‍රියා දක්නට ලැබේ. අපේ සමාජ කොතරම් සංකීර්ණ වී තිබුණත්, අදත් මේවා ඉතා පැහැදිලිව දැකිය හැකි වේ.

කලහකාරී ආක්‍රමණකාරීභාවය ඇති වන්නේ කෙසේද? ඒ හා සම්බන්ධ හැසිරීම් රටාවන් මොනවාද? අපි එකිනෙකා භය ගන්වන්නේ කෙසේද ? මේවාට පිළිතුරු සෙවීම සඳහා අප නැවතත් වරක් අනිකුත් සතුන් දෙස බැලිය යුතුය. ක්ෂීරපායී සතෙකු ආක්‍රමණකාරීභාවයෙන් පිබිදෙන විට, ඔහුගේ සිරුරේ කායික විපර්යාසයන් ගණනාවක් සිදුවෙයි. ස්වයං සාධක ස්නායු පද්ධතිය මගින් මුළු මහත් ශරීර යන්ත්‍රයම ක්‍රියාත්මක වීමට සුදානම් කළ යුතුය. මෙම පද්ධතිය එකිනෙකට විරුද්ධ, එකිනෙක තුලිත කරන උප පද්ධති දෙකකින් සමන්විත වේ. එනම්, අනුවේගී හා ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතියයි. සාහසික ක්‍රියා සඳහා ශරීරය පිළියෙළ කරන්නේ අනුවේගී පද්ධතියයි. දෙවැනි කාර්යය වන්නේ ශරීරය රැස්කොට ඇති ආහාර රැක

Scanned by TapScanner

ගැනීමයි. "ඔබ ක්‍රියාත්මක වීම සඳහා සුදානම්" යයි පළමු වැන්නෙන් කියන විට, කලබල නොවී ශක්තිය ඉතුරු කරන්න යයි දෙවැන්න කියයි. සාමාන්‍ය තත්වයන් යටතේ මෙම විධානයන් දෙකටම ඇහුම්කන් දී, ඒ දෙක සමබරව තබා ගන්නා ශරීරය, ප්‍රබල ආක්‍රමණකාරීභාවයෙන් පිබිදුණ විට ඇහුම්කන් දෙන්නේ අනුවේගී පද්ධතියට පමණි. මෙය ක්‍රියාකාරී වූ විට රුධිරයට ඇඩ්‍රීනලින් ගලා යෑමෙන් සම්පූර්ණ පද්ධතියටම බලපෑමක් කරයි.

හදවත වේගයෙන් ස්පන්දනය වීමට පටන් ගන්නා අතර මාංශපේශීන්ට හා මොළයට රුධිරය වැඩි වැඩියෙන් ගලා යයි. රතු රුධිරාණු නිපදවන වේගයද වැඩි කෙරේ. ලේ කැටි ගැසීමට ගතවන කාලයේ අඩුවීමක් දක්නට ලැබේ. ආහාර දිරවීමේ ක්‍රියාවලිය නතර වී කෙළ ගැලීමද අඩුවෙයි. ආමාශයේ චලනය, ආමාශ යුෂ නිපදවීම හා අන්ත්‍රයේ ක්‍රමාකුංචනය ද යටපත් වෙයි. සාමාන්‍ය තත්වයන් යටතේදී තරම් පහසුවෙන් ගුදයෙන් හා මුත්‍රාශයෙන් ඒ ද්‍රව්‍ය පිට නොකැරේ. අක්මාවේ ගබඩා කොට ඇති "කාබොහයිඩ්‍රේට්" එයින් පිටවී ලේවල ඇති සීනි ප්‍රමාණය වැඩි කරයි. ශ්වසන ක්‍රියාවන්හි අධික වැඩිවීමක් දක්නට ලැබේ. හුස්ම ගැනීම වඩා ඉක්මන් මෙන්ම ගැඹුරුද වේ. උෂ්ණත්ව පාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක වෙයි. රෝම කෙළින් වන අතර බෙහෙවින් දහඩිය ගැලීමට ද පටන් ගනී.

මෙම විපර්යාස සියල්ලම සත්වයා සටනට සුදානම් කිරීමට ආධාර වේ. විඥ්ඤාවකින් මෙන් මේ නිසා තෙහෙට්ටුව නැති වී ශාරීරික සටන සඳහා අවශ්‍ය තරම් ශක්තිය ලැබේ. රුධිරය වැඩියෙන්ම අවශ්‍ය වන ස්ථානවලට එය වැඩිපුර යවනු ලැබේ. ඉක්මණින් සිතීම සඳහා මොළයටත්, වහා ක්‍රියාකිරීම සඳහා මාංශපේශිවලටත් මෙසේ රුධිරය ගලා යයි. රුධිරයේ ඇති සීනි ප්‍රමාණය වැඩිවීම නිසා මාංශ පේශිවල කාර්යක්ෂමතාව වැඩි වේ. ලේ කැටි ගැසීමේ ක්‍රියාවලිය වේගවත් වීම නිසා, තුවාලයකින් ගලා යන ලේ ඉක්මණින් කැටි ගැසීමෙන් අපතේ යෑම අඩුවෙයි. ප්ලීහාවෙන් රතුරුධිරාණු වේගයෙන් නිකුත් වීමත්, රුධිර සංසරණය වේගයෙන් සිදුවීමත් හේතුකොට පටක වෙතට වැඩිපුර "ඔක්සිජන්" ගෙන ඒමටත් "කාබන්ඩයොක්සයිඩ්" ඉක්මණින් ඉවත් කිරීමටත් හැකි වේ. රෝම කෙළින්වීම නිසා සම වාතයට නිරාවරණය වී, සිරුර සිසිල් කිරීමට ආධාර කරයි. ස්වේද ග්‍රන්ථාවලින්ද ස්වේදය බෙහෙවින් නිකුත් වෙයි. මේ නිසා ශරීරය අධික ලෙස රත්වීමේ අනතුර වැළකේ.

මෙසේ වැදගත් පද්ධති සියල්ලම ක්‍රියාත්මක වීමත් සමඟ සත්වයා පහරදීම ආරම්භ කිරීමට සුදානම් නමුත්, තවත් ප්‍රශ්නයක් මතුවෙයි. සටන් කිරීමෙන් ජයග්‍රහණය ලබා ගත හැකි නමුත්, මේ නිසා ජයග්‍රාහකයාට බොහෝ හානි සිදුවීමට ඉඩ ඇත. සතුරා චණ්ඩ බව මෙන්ම බියද උපදවයි. චණ්ඩ බව, සත්වයා ඉදිරියට යවන අතර, බිය ඔහු පස්සට අදී. මේ නිසා ඉතා ප්‍රබල අභ්‍යන්තර ගැටුමක් ඇති වේ. සාමාන්‍යයෙන් සටන් කිරීමට පොළඹවන ලද සතෙක් කෙළින්ම පහර නොදේ. ඌ ආරම්භයේදී කරන්නේ පහර දීම ගැන තර්ජනය කිරීම පමණි. පහර දීමට ඔහු තවම සූදානම් නැත. මේ අවස්ථාවේ, ඔහුට විරුද්ධවාදියා බිය ගැන්වීමට හැකි වුවහොත්, ඔහු පසු බසින බැවින් වඩාම හොඳ දෙය වන්නේ එයයි. ලේ නොහලා ජයග්‍රහණයක් ලැබිය හැකි වෙයි. අනවශ්‍ය තුවාල හා හානි සිදුවීමෙන් තොරව තම ආරවුල් විසඳා ගැනීමට මේ නිසා සත්වයන්ට හැකි වී තිබෙන බැවින්, එය ඉතා ප්‍රයෝජනවත් ක්‍රියාවලියක් වේ.

දියුණු සත්ව වර්ග සියල්ලන්ගේම මේ ආකාරයේ නැමීමක් දක්නට ලැබේ. එනම්, චාරිත්‍රානුකූල පිළිවෙතක් බවට පත් වූ සටනයි. තර්ජනයන් හා ප්‍රතිතර්ජනයන් නියම ශාරීරික සටනේ තැන ගෙන ඇත. නියම ලෙසට සටන් වැදීම විටින් විට සිදුවන නමුත්, ඒ චණ්ඩ සංඥාවන් හා ප්‍රති සංඥාවන් මගින් ආරවුල විසඳා ගැනීමට නොහැකි වූවහොත් පමණි. මා කලින් විස්තර කළ කායික විපර්යාසවල බාහිර ලක්ෂණයන්හි ප්‍රබලතාව, චණ්ඩ සත්වයා කොතරම් සාහසික ලෙස සටනට සුදානම් වන්නේ ද යන්න සතුරාට දන්වයි.

Scanned by TapScanner

හැසිරීම් රටාව අතින් මෙය ඉතා සාර්ථක ලෙස ක්‍රියා කරන නමුත්, කායික වශයෙන් මේ නිසා ප්‍රශ්න ඇති වේ. මුළු මහත් ශරීර යන්ත්‍රයම අධික වැඩ ප්‍රමාණයක් කිරීමට සුදානම්ව ඇත. නමුත් මෙය ඇත්ත වශයෙන්ම සිදු නොවේ. මේ තත්වයට ස්වයංසාධක ස්නායු පද්ධතිය මුහුණ දෙන්නේ කෙසේද ? සටන් කිරීම සඳහා සියලුම සේනාවන් පෙරමුණට ගෙන ආ පමණින්ම යුද්ධයේ ජයග්‍රහණය හිමි වී ඇත. දැන් සිදුවන්නේ කුමක්ද?

ශාරීරික සටනක් සිදු වූයේ නම්, අනුවේගී ස්නායු පද්ධතියේ ක්‍රියාකාරීත්වය හේතු කොටගෙන සිදුවූ විවිධ විපර්යාසයන් සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට ඉඩ තිබේ. රැස්කරන ලද සියලුම ශක්තිය දැවී යාමත්, ඒ අතර ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය, ක්‍රියාත්මකවීමත් නිසා, ක්‍රමයෙන් කායික සන්සුන් බවක් ඇති වේ. සටන ඇත්ත වශයෙන්ම සිදු නොවීම නිසා, චණ්ඩතාව හා බිය අතර ගැටුම මැද සියල්ල නතර වෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ප්‍රත්‍යානුවේගී පද්ධතිය, සත්වයා සාමාන්‍ය තත්වයට ගෙන ඒමට ක්‍රියාකාරී වීමයි. තර්ජන හා ප්‍රතිතර්ජනවලින් පිරුණු අවිනිශ්චිත තත්වය මොහොතින් මොහොත ගෙවී යද්දී, අනුවේගී ක්‍රියා අතර අපට ප්‍රත්‍යනුවේගී ක්‍රියා දැකිය හැකි වේ. කටේ වියළි බව වෙනුවට අධික ලෙස කෙළ ගැළීමක් දැකිය හැකි වේ. මළ හා මුත්‍ර රඳවා ගැනීම බිඳ වැටී, ඒවා එකවරම පිටවීමට පුළුවන. සමෙන් ලේ ඉවත් කිරීම නතර වී එය ඉතා රතු පැහැ ගැන්වීමට ඉඩ තිබේ. ගැඹුරු හා වේගවත් ආශ්වාස ප්‍රශ්වාස කිරීම එක්වරම නතර වී, හිල්ලීම හා සුසුම්ලෑම දක්නට ලැබේ. මේ සියල්ල අනුවේගී ස්නායු පද්ධතියේ ක්‍රියා යටපත් කිරීමට ප්‍රත්‍යානුවේගී පද්ධතිය දරණ උත්සාහයෙහි ප්‍රතිඵල වේ. සාමාන්‍ය තත්වයන් යටතේ සත්වයා එක් දිසාවකට යොමු කරන ප්‍රතික්‍රියාවන් සමඟ ඔහු අනිත් දිසාවට යොමු කරන ප්‍රතික්‍රියා සිදු නොවන නමුත්, ආක්‍රමණකාරී තර්ජන තත්වයන් යටතේ සියල්ලම අවුල් වෙයි. (බලවත් කම්පනයක් නිසා ක්ලාන්තය හෝ සිහි නැතිවීම සිදු වන්නේ මන්ද යන්න මෙයින් පැහැදිලි වෙයි. මෙවැනි අවස්ථාවන්හි දී ඉතා වේගයෙන් මොළයට යවන ලද ලේ නැවත වරක් ඉතා ඉක්මණින් ආපසු ගැනීමේ ප්‍රතිඵලය වන්නේ හදිසියේ සිහිමුර්ජා වීමයි.)

තර්ජන සංඥා ක්‍රමය අනුව බලන විට, මෙම කායික කලබලකාරී බව ඉතා වටිනා දෙයක් බව පෙනේ. මෙයින් වඩා ප්‍රබල සංඥා නිකුත් කිරීමට හැකිවේ. සත්වයා සිතේ ස්වභාවය දක්වන මෙම සංඥා පරිණාමයේ කීප ආකාරයකින් දියුණු වී ඇත. සත්ව වර්ග ගණනාවක මළ මුත්‍ර පහ කිරීම, ඒ ගඳින් තම ප්‍රදේශය දක්වන වැදගත් සංඥාවක් බවට පත්වී තිබේ. ඉතා සුලබ දර්ශනයක් වන විදුලි පහන් කණුවලට මුත්‍රා කරන බල්ලන් මෙයට හොඳ උදාහරණයකි. විරුද්ධවාදී බල්ලන් අතර ඇතිවන ගැටුම්වලදී මෙම ක්‍රියාව වැඩි වැඩියෙන් සිදුවේ. (එම ප්‍රදේශය තමන්ට අයිති බව පෙන්වීමට තරගයට මෙන් එහි තම ගන්ධය පැතිරවීමට ඔවුහු ක්‍රියා කරති.) මළ පහකිරීමේදී හිපපොටේමස් තම පැතලි වලිගය ඉතා වේගයෙන් වනන්නට පටන් ගනී. මේ නිසා උගේ අසූචි විශාල ප්‍රදේශයක් වටා විසිර යයි. මෙයද ගන්ධය මඟින් තමාට අයිති ප්‍රදේශය වෙන්කර දැක්වීමක් වේ. අසුචිවලට ප්‍රබල ගන්ධයක් එක් කරන විශේෂ ගුද ග්‍රන්ථි සමහර සත්වයන් ගේ දක්නට ලැබේ.

සමහර සතුන්ගේ මුහුණේද, අනිකුත් සතුන්ගේ පසුපස ද රෝමවලින් තොර ප්‍රදේශ ඇතිවීම නිසා, සංසරණ පද්ධතියේ වෙනස් වීම් කරණ කොට ගෙන සිදුවන අධික සුදුමැලි බව හෝ තීව්‍ර රතු පැහැ ගැන්වීම සංඥාවක් ලෙස හොඳින් දියුණු වී ඇත. සුසුම්ලෑම හා වේගයෙන් හුස්ම ගැනීම වැනි දේ ගෙරවීම් හා වෙනත් ආක්‍රමණකාරී හඬවල් බවට දියුණු වී තිබේ. ශ්වසන පද්ධතියේ චංචල බව නිසා ඇති වී තිබෙන තවත් ලක්ෂණයක් නම්, ශරීරය පිම්බීම වැනි සිරිත්ය. තර්ජනයක් ඇති වූ විට බොහෝ සත්ව වර්ගවල මෙවැන්නක් දක්නට ලැබේ. සමහරු මේ සඳහා විශේෂයෙන් සකස් වූ වාතකෝෂ වැනි අවයවල සුළං පිරවීම ප්‍රයෝජනයට ගනිති. (ශ්වසන පද්ධතියේ මූලික කොටසක් ලෙස වාත කුහර ගණනාවක් දක්නට ඇති පක්ෂීන්ගේ මෙය ඉතා සුලබ

Scanned by TapScanner

දර්ශනයක් වේ.)

ආක්‍රමණකාරී වණ්ඩභාවය දැක්වීමට රෝම කෙළින්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් කරමල, ශිඛා හා කේශර වැනි විශේෂ කොටස් දියුණු වී තිබේ. මේවා සහ අනිකුත් රෝම කොටස් ඉතා ප්‍රකටව පෙනෙන ලක්ෂණ බවට පත්වී ඇත. මෙම රෝම විශේෂයෙන්ම දික්වී හෝ දැඩි වී ඇති අතර ඒවායේ වර්ණය ඒ අවට ඇති අනිකුත් රෝමවලින් කැපී පෙනෙන ලෙස වෙනස් වී තිබේ. වණ්ඩතාවෙන් පිබිදුණ විට, මෙම කොටස් වඩා විශාල හා දීප්තිමත් වීම නිසා, සත්වයාට වඩා විශාල හා වඩා බියජනක පෙනුමක් ලබා දෙයි.

වණ්ඩතාව නිසා ඇතිවන ඩහදිය ගැලීමද, තවත් ගන්ධ සංඥාවක් බවට පත්ව ඇත. මෙය ද සත්ව පරිණාමයේ දී විවිධ ආකාරයට දියුණු වී තිබේ. සමහර ස්වේද ග්‍රන්ථි, ඉතා සංකීර්ණ ගන්ධ ග්‍රන්ථීන් ලෙස දියුණු වී ඇති අතර, මේවා බොහෝ සත්වයන් ගේ මුහුණ, පතුල වලිග ආදී විවිධ ශරීර කොටස්වල දැකිය හැකි වේ.

ඉහත සඳහන් කරන ලද මෙම සියලුම වර්ධනයන් නිසා සත්වයන් ගේ සිතේ ස්වභාවය දක්වන ක්‍රම වඩාත් සියුම් මෙන්ම විස්තරාත්මක ලෙස දියුණු වී තිබේ. වණ්ඩ බවින් පිබිදුණු සත්වයාගේ තර්ජනාත්මක හැසිරීම් රටාව වඩා නිවැරදි ලෙස වඩාත් හොඳින් "කියවීමට" මේ නිසා හැකි වෙයි.

එහෙත් මෙය කථාවේ එක් පැත්තක් පමණි. අප මෙතෙක් කල් සැලකිල්ලට භාජනය කළේ, ස්වයංසාධක සංඥාවන්ය. මේ සියල්ලටම අමතරව තර්ජනකාරී සත්වයා ගේ ඉරියව් හා පේශීවල චලනය නිසා ඇති වන තවත් සංඥා රාශියක්ම වේ. ස්වයංසාධක පද්ධතියෙන් කෙරෙන්නේ ශරීරය මාංශපේශී ක්‍රියාකාරීත්වය සඳහා සුදානම් කිරීම පමණි. නමුත් පේශී මේ පිළිබඳව කරන්නේ කුමක්ද? ඒවා පහරදීම සඳහා සුදානම් කරනු ලැබූ නමුත් පහර දීමක් සිදු නොවීය. මෙහි ප්‍රතිඵලය වන්නේ ආක්‍රමණකාරී චලනය, උභයාවේගී ක්‍රියා හා ගැටුම් ඉරියව් ආදිය වේ. එකිනෙකාට ප්‍රතිවිරුද්ධ දිසාවන්ට සත්වයා යොමු කරන මෙම ක්‍රියාවන් රාශිය ගොනු කොට, නව වණ්ඩ සංඥා මාලාවක් දියුණු වී තිබේ.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ සත්ව වර්ගවල ඉතා හොඳින් දියුණු වූ තර්ජන චාරිත්‍ර සටන් හා නැටුම් ක්‍රම දක්නට ලැබේ. සටන් වැදීමට පළමු ඔවුහු හිස හා සිරුර රිද්මයානුකූලව සොලවමින් කෙටි, ශෛලිගත රැහුමක යෙදෙති. පහරදීමේ අභිමතාර්ථය දක්වන මෙම චලනයන් ඉතා වැදගත් සංඥාවන් ලෙස සලකනු ලබන අතර, ඇති වූ වණ්ඩතාවේ තිව්රතාව පිළිබඳ නිවැරදි අදහසක් ලබාදීමට ඒවා ස්වයංසාධක සංඥාවලට එක් වෙයි. මේ මගින් පහර දීමේත්, පලා යෑමේත් හැඟීම් අතර සමතුලිත බව නිවැරදිව දැක්වෙයි.

මේ අතරම තවත් දේ දක්නට ලැබේ. විස්ථාපන ක්‍රියාවන් යනුවෙන් හඳුන්වන හැසිරීම් රටාවෙන් ඉතා වැදගත් විශේෂ සංඥා නිකුත් කෙරේ. ඉතා උග්‍ර අභ්‍යන්තර ගැටුමක අතුරු ඵලයක් වන්නේ සත්වයා සමහර අවස්ථාවල දී පුදුමාකාර වූත්, කිසිම ආකාරයකට අදාළ නොවන්නා වූත් හැසිරීම් රටාවන් පෙන්වීමයි. හැඟීම්වලින් පිබිදී අවිනිශ්චිත ස්වභාවයේ, පසුවන සත්වයාට අවශ්‍ය එක කටයුත්තක් වත් කර ගැනීම අපහසු බැවින්, මේ සඳහා රැස් කළ ශක්තිය වෙනත් ආකාරයකින් ප්‍රයෝජනයට ගත යුතු වෙයි. එකිනෙකාට තර්ජනය කරන සත්තු එක්වරම ආහාර ගැනීමේ ක්‍රියාවන් වැනි කටයුතුවල යෙදී, නැවතත් තර්ජනාත්මක ඉරියව්වට පැමිණෙති. එසේ නැත්නම් ඔවුන් සිරුර පිරිසිදු කිරීමේ කටයුතු වල යෙදෙන්නට පුළුවන. සමහර සත්ව වර්ග විස්ථාපන ක්‍රියාවක් ලෙස කුඩු ඉදිකිරීමේ යෙදෙති. තවත් සමහර සත්තු විස්ථාපන ක්‍රියාවක් ලෙස නිදා ගනිති.

මෙම විස්ථාපන ක්‍රියාවන් පිළිබඳ නොයෙකුත් වාද විවාද ඇති වී තිබේ. ඒවා මෙම කාර්යයට අදාළ ක්‍රියා ලෙස සැලකීමට තරම් කරුණු නැතැයි සමහරු තර්ක කරති. සතකු ආහාර ගන්නේ උෑට බඩගිනි නම් පමණි. උෑ ඇහ කසන්නේ

Scanned by TapScanner

කැසිල්ලක් ඇති වූ හෙයිනි. මේ අනුව සටන් වැදීමට සුදානම්ව සිටින සතකු ආහාර ගැනීම හෝ කැසීම වැනි විස්ථාපන ක්‍රියාවක යෙදෙන විට, ඌට බඩගින්න හෝ කැසිල්ලක් ඇති වී නැතැයි අප්පු කළ හැකි නොවේ. නමුත් සත්වයාගේ චණ්ඩතාව හොඳින් නිරීක්ෂණය කළ කෙනෙකුට මෙය කිසිසේත් පිළිගත නොහැක.

මෙවැනි මොහොතක ඇති කලබලකාරී අවිනිශ්චිත ස්වභාවය කොතරම් උග්‍රද යත්, මොහොතකටවත් ඔවුන් ඇත්ත වශයෙන්ම ආහාර ගැනීමට, ඇහ කැසීමට හෝ නිදා ගැනීමට කාලය ගත කරනැයි සිතීම විහිළුවකි.

විස්ථාපන ක්‍රියා පිළිබඳව ඇති තර්ක විතර්ක මොනවා වුවත්, මෙයින් ඉතා පැහැදිලිව පෙනෙන එක් කරුණක් නම්, වටිනා තර්ජනාත්මක සංඥාවක් පරිණාමයෙහි ලා, එය ආධාර වී ඇති බවයි. බොහෝ සත්වයන් ගේ මේවා දියුණු වීමෙන් ඉතා ප්‍රකටව පෙනෙන සංඥා බවට පත්ව තිබේ.

ස්වයංසාධක සංඥා, චණ්ඩ අරමුණු දක්වන චලන, උභයාවේගී ඉරියව් හා විස්ථාපන ක්‍රියා ආදී මේ සියල්ල වාරිත්‍ර බවට පත්වී තර්ජනාත්මක සංඥා දැක්වීමේ සාර්ථක ක්‍රමයක් ලෙස දියුණු වී තිබේ. ඇත්ත වශයෙන්ම පහර නොදී ආරවුල විසඳා ගැනීමට මේ නිසා සතුන්ට හැකි වේ. නමුත් මෙම ක්‍රියාවලිය අසාර්ථක වුවහොත්, ශාරීරික වශයෙන් පහරදීම සිදුවෙයි. එවිට, දත් සපාකෑම හා ඉරා දැමීම සඳහාද, හිස, සතුරා තල්ලු කිරීමට හා සතුරාට ඇනීමටද, කකුල්, පහරදීමටද, අත්, සතුරා අල්ලා ගැනීම හා මිරිකීමටද, සමහර විට වලිගය, පහරදීමට ද යොදා ගනු ලැබේ. එනමුත් එක් සතකු විසින් අනිකා මැරීම ඉතා දුර්ලභ දෙයකි. ගොදුර, දඩයම් කිරීම සඳහා විශේෂ මරණීය දඩයම් ක්‍රම යොදා ගන්නා සත්තු වුවද, තම වර්ගයේ අය සමඟ සටන් කිරීමේදී ඒවා යොදා නොගනිති. (ගොදුරට පහර දීමත්, විරුද්ධවාදියෙකුට පහර දීමත්, හැම අතින්ම වෙනස් වූ ක්‍රියාදාම දෙකක් වේ.) විරුද්ධවාදියා සෑහෙන තරම් මර්දනය වූ විට, තවදුරටත් තර්ජනයක් ලෙස නොසලකන බැවින්, නැවත පහර දීමක් සිදු නොවේ.

මෙම දබරකාරී ක්‍රියාවන් රැස, අපේ වර්ගයා අතර ක්‍රියාත්මක වන ආකාරය විමසීමට පෙර, සත්ව චණ්ඩතාවේ තවත් එක් අංශයක් සැලකිල්ලට ගත යුතු වෙයි. එනම්, පරාජයට පත්වූ සතාගේ හැසිරීමයි. සටනින් ජය ගත නොහැකි බව පෙනුණු විගස ඔහු කළ යුතු දෙය වන්නේ හැකි තරම් ඉක්මණින් එයින් ඉවත්වීමයි. නමුත් මෙය හැම විටම කළ හැකි නොවේ. සමහර විට පැන යෑම දුෂ්කර වීම නිසා හෝ කණ්ඩායමකට අයත්ව සිටීම නිසා හෝ තම සතුරාගෙන් ඉවත්ව යෑමට නොහැකි වීමට පුළුවන. මෙවැනි තත්වයකදී තමා තවදුරටත් තර්ජනයක් නොවන බවත්, තමා සටන් කිරීමට සුදානම් නැති බවත්, පෙන්විය යුතුය. යම්කිසි ක්‍රමයකින් බලවත් සත්වයාට මෙය පෙන්වීමට කලින් ඔහුට බලවත් ශාරීරික පීඩා සිදුවුවහොත්, ජයග්‍රාහී සත්වයා ඉවත්ව යනු ඇත. නමුත් එය සිදුවීමට පෙර, තමාගේ පරාජය පිළිගැනීමට ඔහුට හැකි වුවහොත්, මෙම අවාසනාවන්ත තත්වයට පත් නොවී සිටීමට හැකි වේ. මේ සඳහා එක්තරා ආකාරයක අවනතභාවය ප්‍රකාශ කරන ඉරියව් ප්‍රයෝජනයට ගනු ලැබේ. මේවා පහර දෙන සත්වයා සැනසීමට ප්‍රමාණවත් වන බැවින්, ඔහුගේ චණ්ඩතාව අඩු වී ආරවුල පහසුවෙන් බේරා ගැනීමට හැකි තත්වයක් උදා කරයි. මේවා කීප ආකාරයකින් සිදුවේ. මූලික වශයෙන් ඒවා සමන්විත වන්නේ ඔවුන්ගේ චණ්ඩතාව පුබුදුවන සංඥා නිකුත් කිරීම, නතර කරන හෝ චණ්ඩ නොවන සංඥා නිකුත් කිරීම යන අංග දෙකිනි. මෙයින් ප්‍රබල සත්වයා සංසිඳවීමට හෝ ඔහුගේ සිතේ ස්වභාවය වෙනස් කිරීමට හැකි වේ. චණ්ඩතාව සමඟ සාහසික චලන සම්බන්ධ වන බැවින්, නිශ්චල ඉරියව්ව, අවණ්ඩ බවක් දක්වයි. මේ සමඟ බොහෝ විට ශරීරය, උක්කුටිකව හෝ වකුටුව තබා ගැනීමක් දක්නට ලැබේ. චණ්ඩ හෝ ආක්‍රමණකාරී හැඟීම් සමඟ ශරීරයේ ප්‍රමාණය විශාල කිරීමක් දක්නට ලැබෙන අතර, ශරීරය වකුටු කිරීම බලවතා සැනසීමට හේතු වේ. පහර දෙන්නේ ඉදිරි පසින් වන නිසා, පහර දෙන සත්වයාට පසුපස හැරවීමද, මෙහි දී

Scanned by TapScanner

උපකාරී වේ. මේ ආකාරයේ චණ්ඩතාව හා ආක්‍රමණකාරී බව දක්වන ශරීර ඉරියව් හා අනිකුත් චලනවල, ප්‍රතිවිරුද්ධ ඉරියව් යොදා ගැනීමෙන් පහරදීම වළක්වනු ලැබේ. සමහර අවස්ථාවල දී ප්‍රබල සත්වයාට තම ශරීරයේ පහර දිය හැකි කොටසක් දීමෙන්, පරාජය පිළිගනී. උදාහරණයක් වශයෙන් යටත්වීමේ ලක්ෂණයක් ලෙස, චිම්පන්සියා තම අත දික්කරයි. ආක්‍රමණකාරී චිම්පන්සියකු කිසිදාක මෙවැන්නක් නොකරන බැවින්, මෙම අභිනය ප්‍රබල සත්වයා සන්සුන් කිරීමට සමත් වෙයි.

දෙවැනි වර්ගයේ සිත සන්සුන් කරන සංඥා ක්‍රියා කරන්නේ ප්‍රති - පෙළඹවීමේ ක්‍රමයක් ලෙසයි. පහර දෙන සත්වයා තුළ අවණ්ඩ ප්‍රතිචාරයක් ඇති කරන උත්තේජයන්, යටහත් සත්වයා විසින් නිකුත් කිරීම නිසා, ඔහුගේ සටන් කිරීමට ඇති ආශාව හීන වේ. මෙය තුන් ආකාරයකට සිදුවෙයි. බොහෝ ප්‍රචලිතව දක්නට ඇති ක්‍රමය නම්, බාලයන් ආහාර ඉල්ලා සිටීමේ ඉරියව්ව යොදා ගැනීමයි. දුර්වල සත්වයා උක්කුටිකව සිට ළදරු ඉරියව්වක් ගැනීම, බොහෝ විට පිරිමි සතුන් විසින් පහරදීමේදී, ගැහැනු සතුන් විසින් ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම ක්‍රියාව කොතරම් සාර්ථක ද යන්න, එවිට පිරිමි සතා ආහාර ටිකක් වමාරා ගැහැනු සතාට දීමෙන්ම පැහැදිලි වෙයි. පීතෘමය හෝ ආරක්ෂක තත්වයන් යටතේද, පිරිමියාගේ චණ්ඩ බව අඩුවේ. පක්ෂීන්ගේ දක්නට ඇති, ආහාර කැවීමේ සිරිතේ පදනම මෙයයි. මෙහි දී ප්‍රයෝජනයට ගනු ලබන තවත් ක්‍රියා මාර්ගයක් නම්, දුර්වල සත්වයා විසින් ස්ත්‍රී ලිංගික ඉරියව්වක් ගැනීමයි. දුර්වල සත්වයා කුමන ලිංගයට අයත් වුවත් ලිංගික වශයෙන් කුමන තත්වයක පසු වුවත්, ස්ත්‍රී ලිංගික පසුපස ඉදිරිපත් කිරීමේ ඉරියව්ව ගන්නා බව පෙනේ. මෙය දකින ආක්‍රමණිකයා ගේ ලිංගික ප්‍රතිචාරයන් උත්තේජනය වී චණ්ඩ හැඟීම් යටපත් වෙයි. මෙවැනි තත්වයන් යටතේ බලවත් පිරිමි හෝ ගැහැනු සතා, යටත් පිරිමි හෝ ගැහැනු සතා මත නැග ව්‍යාජ සංසර්ගයේ යෙදෙනු දක්නට ලැබේ.

ප්‍රබල සත්වයා නව මහකට යොමු කිරීමේ තුන්වැනි ක්‍රමය, සත්වයාගේ ආයිත්තම්වීම පිළිබඳ ආශාව පිබිදවීමයි. සත්වයන්ගේ සමාජීය ජීවිතයේ සාමකාමී අවස්ථාවන්හි, අන්‍යෝන්‍ය හා සමාජීය ආයිත්තම්වීම හා පිරිසිදු කිරීම් බොහෝ දුරට දක්නට ලැබේ. වඳුරන්ගේ මෙය විශේෂයෙන් දැකිය හැකියි. ප්‍රබල සත්වයා, මේ මහින් කොතරම් සැනසිය හැකිද යත්, දුර්වල සත්වයාට ඉතා පහසුවෙන් ඔහුගෙන් ගැලවී යෑමට හැකිවීමෙන් පෙනේ.

සත්වයන් තමන්ගේ ආක්‍රමණකාරී හා චණ්ඩභාවය පාලනය කර ගැනීමට යොදා ගන්නා චාරිත්‍ර විධි හා ක්‍රම මේවායි. සත්ව වර්ගයක් නොනැසී පැවතීමට නම් එකිනෙකාට ඔවුන්ගේ වර්ගය විනාශ කිරීමට ඉඩ දිය නොහැක. වර්ගය තුළ සිදුවන චණ්ඩ ක්‍රියා පාලනය කළ යුතුය. යම්කිසි සත්ව වර්ගයක ගොදුරු මරා ගැනීමේ ක්‍රම දරුණුවන තරමටම, තම වර්ගයා අතර සිදුවන, ගැටුම් වලදී ඒවා ප්‍රයෝජනයට ගැනීම වළක්වන ක්‍රම වඩා ප්‍රබල විය යුතුය. ප්‍රදේශය පිළිබඳව හා ධූරාවලිය පිළිබඳව වූ ආරවුල් සඳහා ඇති, වනයේ නීතිය එයයි. මෙම නීතිය අනුව කටයුතු කිරීමට නොහැකි වූ සත්වයෝ ඉතා කෙටි කාලයක් තුළ විනාශයට පත් වූහ.

සත්ව විශේෂයක් ලෙස අප මෙම තත්වයට මුහුණ දෙන්නේ කෙසේද? සතුරකුට තර්ජනය කිරීම හා ඔහු සැනසීම සඳහා අප යොදා ගන්නා සංඥා මොනවාද? අපේ යටත් කිරීමේ ක්‍රම මොනවාද? අප ඒවා පාලනය කර ගන්නේ කෙසේද?

චණ්ඩභාවයෙන් පිබිදීම නිසා සාමාන්‍ය සතකුගේ ඇති වන, කායික වෙනස්කම් සහ පේශී ආතති අප තුළද ඇති වේ. අනිකුත් සතුන් මෙන් අපි ද විස්තාපනය ක්‍රියාවන් ගණනාවක් පෙන්වමු. සමහර විට මෙම මූලික ප්‍රතිචාරයන් ප්‍රබල සංඥා බවට පත්කිරීමට හැකි වී නැත. උදාහරණයක් වශයෙන් අපේ රෝම කෙළින් කිරීමෙන් අපට, අපේ විරුද්ධ වාදීන් බිය ගැන්විය නොහැක. බියෙන් නිගැස්සීම වැනි

Scanned by TapScanner

අවස්ථාවක අපි තවමත් එය කරමු. (ඇහේ මවිල් කෙළින් සිටීම) නමුත් සංඥාවක් ලෙස එය එතරම් ප්‍රයෝජනවත් නොවේ. නිරුවත්වීම නිසා අපට අන් සතුන්ට මෙන් රෝම පුප්පා පෙන්වීම කළ නොහැකි වුවත්, ඒ නිසාම සමෙන් ප්‍රබල සංඥා යැවීමට හැකි වේ. අපට කෝපය නිසා රතු වීමටත්, බිය නිසා සුදුමැලි වීමටත් පුළුවන. මෙහි දී අපේ අවධානය යොමු විය යුත්තේ සුදු පැහැයටයි. මෙය පහරදීම පිළිබඳව අනිකුත් සංඥාවන් ද සමඟ සම්බන්ධ වූ විට, ඉතා අනතුරුදායක වේ. සුදුමැලි පැහැය, බිය පිළිබඳ සංඥා සමඟ දක්නට ලැබේ නම්, එය සන්ත්‍රාසය දක්වන සංඥාවකි. මෙය අනුවේගී ස්නායු පද්ධතිය ක්‍රියාත්මකවීම නිසා ඇතිවන්නක් වන අතර, එය සුළු කොට තැකිය යුතු නොවේ. රතු මුහුණ, පහරදීම වැළැක්විය නොහැක.

මේ ආකාරයටම වේගවත් ලෙස ගැඹුරට ආශ්වාස ප්‍රශ්වාස කිරීම අනතුරුදායක සංඥාවක් වන අතර, එය වෙනුවට ක්‍රමවත් නොවූ ගෙරවීම් හා අනිකුත් ශබ්ද ඇති වේ නම්, එය එතරම්ම ප්‍රබල තර්ජනයක් ලෙස සැලකිය යුතු නොවේ. පහරදීමට සුදානම් වූවකුගේ වියළි කටත්, පහරදීම හා නොදීම අතර ගැටුමකට මැදිවූවකු ගේ කෙළ හැලෙන කටත් අතර ඇත්තේ ද මෙයට සමාන සම්බන්ධතාවකි. මුත්‍රා කිරීම, මළ පහකිරීම හා ක්ලාන්ත වීම දකින්නට ලැබෙන්නේ මින් පසුවයි. පහර දීමත්, පලා යෑමත් පිළිබඳ හැඟීම් සමකාලීනව ක්‍රියාත්මක වූ විට, විශේෂ චලන හා උභයාවේගී ඉරියව් කීපයක් දක්නට ලැබේ. මිට මෙළවූ අත, ඉතාම බහුලව දක්නට ලැබෙන මෙවැනි ලක්ෂණයකි. විරුද්ධවාදියාට පහරක් ගැසීමට නොහැකි තරම් දුරින් සිට මෙම ක්‍රියාව කරනු ලබන බැවින්, එය දෘෂ්ටිමය සංඥාවක් පමණක් බවට පත්ව ඇත. මේ සමඟම අත ඉදිරියට හා පසුපසට සෙලවීම ද දක්නට ලැබේ. මිට මෙළවූ අතින් අප රිද්මයානුකූලව පහරදීම නැවත නැවතත් කරන්නේ, ආරක්ෂා සහිත දුරකින් සිට බැවින්, එය දෘෂ්ටිමය සංඥාවක් පමණක් වේ.

මේ අතර වරින් වර සිරුර විරුද්ධවාදියා දෙසට යෑමක් දක්නට ලැබුණත්, ඔහු ආසන්නයට යෑමක් දක්නට නොලැබේ. මේ අතර අඩි පොළොවේ හැප්පීමත්, ළඟ ඇති දෙයකට පහර දීමත් දක්නට ලැබේ. වෙනත් දෙයකට පහරදීම අනිකුත් සතුන්ගේ ද දක්නට ලැබෙන්නකි. මෙහිදී සිදුවන්නේ, පහරදීමට පොළඹවන (විරුද්ධවාදියා) දෙය කෙරෙහි ඇති බිය ඉතා අධික වන බැවින්, වණ්ඩ හා ආක්‍රමණකාරී ක්‍රියාවන් පැත්තකින් බලා සිටින අහිංසකයකු වැනි තර්ජනකාරී නොවන දෙයක් කෙරෙහි යොමු කරනු ලැබීමයි. (අපි කවුරුත් මෙවැනි දේට මුහුණ දී ඇත්තෙමු.) මෙය අවේතනික වස්තුවක් වීමටද පුළුවන. මල් බඳුන පොළොවේ ගසා කුඩු කරන බිරිඳ, ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ සැමියාගේ හිස ඒ ආකාරයට කුඩු කිරීමයි. චිම්පන්සීන් සහ ගෝරිල්ලන්, ගස් කොලන්වල අතු කඩා බිඳ දමමින් නිතර මේ ආකාරයට හැසිරෙනු පෙනේ.

මෙම සියලුම වණ්ඩ ක්‍රියාවන් සමඟ එකට යන තවත් වැදගත් දෙයක් නම්, බියගන්වන ආකාරයට මුහුණින් හැඟීම් ප්‍රකාශ කිරීමයි. අපේ ශබ්ද සංඥා සමඟ මේ මහින් වණ්ඩ බව පිළිබඳ හැඟීම් ඉතා නිවැරදිව ප්‍රකාශ කළ හැකි වෙයි. කලින් පරිච්ඡේදයක සාකච්ඡා කළ පරිදි අපේ මුහුණ, අපේ වර්ගයාට පමණක් විශේෂ වූ දෙයක් වන නමුත්, අපේ වණ්ඩ මුහුණ අනිකුත් අග්‍රේශයන් ගේ ද දක්නට ලැබෙන මුහුණක් වෙයි. (බිය වූ හෝ වණ්ඩ වඳුරකු අපට එක් වරම හඳුනාගත හැකි නමුත්, මිත්‍ර වඳුරු මුහුණ හඳුනාගැනීම එතරම් පහසු නොවේ.) මේ පිළිබඳ නීති ඉතා සරල ඒවා වේ. පහරදීමේ හැඟීම් ප්‍රමුඛතාව ගැනීමත් සමඟ ඇහිබැම ඉස්සෙයි. නළල රැලි වැටෙයි. තොල් විවර වී දත් පෙනේ. නළල රැලී ගැසීම හා දත් පෙන්වීම ආක්‍රමණකාරී වණ්ඩ ලක්ෂණයක් ලෙස වරදවා සලකනු ලැබුවද, ඒවා ඇත්ත වශයෙන්ම බිය දක්වන සංඥාවන් වේ. ශරීරයේ අනිත් කොටස්වලින් තර්ජනාත්මක අභිනයන් දක්වනු ලැබුවත්, ඔහු බියට පත් වී ඇති බව මුහුණෙන් ප්‍රකාශ වෙයි.

මෙම මුහුණ සෑදීම අතින් අපි වඳුරන්ට බොහෝ සමාන වෙමු. නමුත් මෙයට අමතරව දිව දික් කිරීම, දෙකොපුල් පිම්බීම හා සමහර ලක්ෂණ වැඩිකොට දැක්වීම වැනි, සංස්කෘතික

Scanned by TapScanner

වශයෙන් දියුණු වූ ලක්ෂණ බොහෝමයක්ද අපේ දක්නට ලැබේ. ශරීරයේ අනිකුත් කොටස් යොදා ගනිමින් කරන තර්ජනාත්මක හෝ නින්දා කරන අභිනයද බොහෝ සංස්කෘතීන් හි දක්නට ඇත. වණ්ඩ අභිප්‍රාය දක්වන විවිධ ආකාරයේ ශෛලිගත යුද්ධ නැටුම් බවට පත්ව තිබේ. මේවායේ කාර්යය වී ඇත්තේ සතුරාට දෘෂ්ටිමය තර්ජනයක් කිරීම නොව, කණ්ඩායම පිබිදවීමත්, ප්‍රබල වණ්ඩ හැඟීම්වල සමකාලිකරණයත්ය.

කෘත්‍රිම මාරක අවි දියුණු කිරීම හේතු කොට ගෙන, අප ඉතා අන්තරාදායක සත්ව වර්ගයක් බවට පත්ව ඇති බැවින්, ඉතා පුළුල් පරාසයක වූ අති විශේෂ, සැනසිලි සංඥාවන් දක්නට ලැබීම පුදුමයට කරුණක් නොවේ. වකුටු වී කෑ ගසමින් කරන යටත්වීමේ ප්‍රතිචාරය අපේ මෙන්ම අනිකුත් අග්‍රේශයන් ගේද දක්නට ලැබෙන්නකි. ශරීරය වකුටු කිරීම, දණ ගැසීම, හිස පහත් කිරීම ආදී ක්‍රම කීපයක්ම දක්නට ලැබේ. මෙහිදී ප්‍රධාන සංඥාව වන්නේ ප්‍රබල පුද්ගලයාට වඩා, සිරුර පහත් කිරීමයි. වණ්ඩ අවස්ථාවේදී තර්ජනය කරන විට, හැකි තරම් සිරුර විශාල කර ගන්නා බැවින්, යටත් වීමේදී අනුගමනය කරන හැසිරීම් රටාව එයට හාත්පසින්ම විරුද්ධ විය යුතුය. මෙය පියවර කීපයකින් සමන්විත වන අතර ඒ ඒ සංඥා, විශේෂ තේරුම් ඇති ශෛලිගත ක්‍රියාවලියක් ලෙස දියුණු වී තිබේ. මුල් අභිනය කොතරම් දුරට වෙනස් වේද යන්න පෙන්වන බැවින්, හිස ඔසවා (Salute) ආචාර කිරීම මෙහිදී ඉතා වැදගත් වේ. යුද හමුදා ආචාරය බැලූ බැල්මට පෙනෙන්නේ වණ්ඩ ක්‍රියාවක් ලෙසිනි. එය පහරක් දීමට අත එසවීමේ සංඥාවක් මෙන් පෙනේ. වෙනස අත මිට මොළවා නොතිබීමත්, එය හිස් වැසුම දෙසට දික්වී තිබීමත්ය. මෙය ඇත්ත වශයෙන්ම ශරීරයේ උස අඩු කිරීමේ ක්‍රියාවලියක් ලෙස දියුණු වූ හිස් වැස්ම ඉවත් කිරීමේ ක්‍රියාවේ ශෛලිගත අනුවර්තනයක් වෙයි. උක්කුටිකවීම හිස නමා ආචාර කිරීම දක්වා දියුණු වූ ආකාරයද සිත් ගන්නා සුළුය. මෙහි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඇස් බිමට හැරවීමයි. කෙළින් රවා බැලීම වණ්ඩ බව දක්වන ලක්ෂණයකි. මෙය මුහුණින් ප්‍රකාශ කරන ඉතාම දරුණු හැඟීමක් වන අතර, එය බොහෝ දබරකාමී අභිනයන් ගේ කොටසක් වේ. හිස නැමීමේ ප්‍රමාණය සමාජීය සිරිත් විරිත් අනුව වෙනස් වුවත් , මුහුණ බිමට හැරවීම හැම විටම දක්නට ලැබේ. නිතර නිතර හිස නමා ආචාර කිරීමට සිදුවන සමහර අය, ඉනෙන් නොනැමී හිස පමණක් පහත් කිරීමට පුරුදු වී සිටිති.

සමහර අවස්ථාවන්හි දී රවා බැලීමට විරුද්ධ ප්‍රතිචාරය ලෙස ඉවත බැලීම ද යොදා ගනු ලැබේ. ඇස් දෙස ඉතා දීර්ඝ වේලාවක් බලා සිටිය හැක්කේ ඉතා වණ්ඩ පුද්ගලයකුට පමණි. මුහුණට මුහුණලා කෙරෙන එදිනෙදා කතාබහේ දී අපි ඉවත බලා කථා කරමින් අප කී දෙයට අනික් නැනැත්තාගේ ප්‍රතිචාරය කුමක්දැයි දැන ගැනීමට වරින් වර ඔහු දෙස බලමු. මෙහිදී හුරුපුරුදු කථිකයෙකු පවා, තමා කථාකරන සභාව දෙස බලා කථා කිරීම පුරුදු වීමට සැලකිය යුතු කාලයක් ගනී. නැටුමක් සම්බන්ධයෙන්ද මෙය සත්‍ය වේ. කණ්ණාඩි හා අව් කණ්ණාඩි පැළඳීම නිසා ද වණ්ඩ පෙනුමක් ලබා දෙයි. ශාන්ත ගති පැවතුම් ඇති අය තෝරා ගන්නේ තුනී රුවුමක් ඇති හෝ රාමු රහිත කණ්ණාඩි වන අතර, මේ නිසා ඔවුන්ගේ වණ්ඩභාවයේ වැඩිවීමක් සිදු නොවේ. ඒ මඟින් ප්‍රති-ආක්‍රමණකාරීභාවයක් ඇතිවීමද ඔවුහු වළක්වා ගනිති. අත්වලින් ඇස් වසා ගැනීම, රැවීමේ ප්‍රතිචාරයට විරුද්ධ තවත් ප්‍රතිචාරයක් වෙයි. අමුත්තන් සමඟ කථා කරන විට සමහරකු නැවත නැවත, ඇස් පියා ගන්නා බව පෙනේ. මෙයින් ඔවුන් අදහස් කරන්නේ නුපුරුදු අමුත්තාගේ තර්ජනාත්මක ස්වරූපය අඩු කිරීම ද, නැතහොත් තමාගේ ඇස්වල බලය අඩු කිරීම ද යන්න එතරම් පැහැදිලි නැත.

ඇස්වල දක්නට ඇති මෙම බිය ගන්වන ලක්ෂණ නිසා සමහර සත්ව විශේෂ එය ස්වාරක්ෂක ක්‍රමයක් බවට දියුණු කොට ඇත. සමහර සලඹයන්ගේ තටුවල බියජනක දැස් දෙකක රටාවක් දක්නට ලැබේ. වෙනත් සතකු විසින් ඔවුන්ට පහර දෙන තුරු ඒවා වැසී තිබේ. පහර දීමත් සමඟම පියාපත් විවර වී, එහි ඇති ඇස් රටාවෙන් සතුරා බිය ගැන්වෙයි. මෙය

Scanned by TapScanner

සතුරන්ගෙන් ආරක්ෂා වීමේ ක්‍රමයක් ලෙස යොදා ගන්නා බව, පවත්වන ලද පරීක්ෂණවලින් පෙනී ගොස් ඇත. බොහෝ මත්ස්‍ය වර්ග, සමහර පක්ෂීන් හා සමහර ක්ෂීරපායීන් පවා මෙවැනි ක්‍රම ප්‍රයෝජනයට ගන්නා බව පෙනේ. අපේ වාණිජ නිෂ්පාදන බොහෝමයක්ම මෙවැනි උපක්‍රම භාවිතයට ගෙන ඇත. පාරවල් රථවාහනවලින් පිරී ඉතිරී යෑමත් සමඟ ඒවායේ වණ්ඩ පෙනුම ක්‍රම ක්‍රමයෙන් වැඩි වී තිබේ. සමහර වාණිජ ආහාර නිෂ්පාදනද (CXO, CMO, OVO, OZO) මෙම තර්ජනකාරී මුහුණු සංඥාව ප්‍රයෝජනයට ගෙන ඇත. මේ මගින් එම නිෂ්පාදන ගැන උනන්දුව වැඩි කිරීමට හැකි වී තිබේ. බලවත් සත්වයා වෙත බැගෑපත්ව අත් දික්කිරීමෙන්, චිම්පන්සියා ප්‍රබල සතා සැනසීමට තැත්කරන බව මම කලින් සඳහන් කළෙමි. සිහාකෑමේ හෝ අයැද සිටීමේ ඉරියව්වක ආකාරයකට අපි ද මෙම අභිනය ප්‍රයෝජනයට ගනිමු. අතට අත දීම බවට දියුණු වී ඇත්තේ ද මෙයයි. මිත්‍ර අභිනයන් බොහෝ විට පරිණාමය වී ඇත්තේ යටත් හෝ අවනත බව දක්වන ඒවායිනි. සිනහව හා මඳ සිනහව පිළිබඳ ප්‍රතිචාරයන් සම්බන්ධයෙන් මෙය සිදු වුයේ කෙසේ දැයි අපි දුටුවෙමු. අතට අත දීම සමාන තත්වයේ පුද්ගලයන් අතර සිදුවන්නක් වන අතර දෙදෙනාගේ තත්වයේ වෙනස අනුව, එය හිස නැමීමේ සිට අත සිඹීම දක්වා වෙනස් වේ.

අවනතභාවය හෝ යටත් වීමේ දී අනුගමනය කරන හැසිරීම් රටාව, විවිධ සංස්කෘතීන් අනුව එක් එක් ආකාරයට වෙනස් වී ඇතත්, අප ඒවා මෙහිදී සැලකිල්ලට ගත යුතු නොවේ. නමුත් මෙවැනි සරල උපක්‍රම දෙක තුනක් ගැන සඳහන් කළ යුතුය. ඒ, ඒවා වෙනස් සත්ව වර්ගවල දක්නට ඇති රටාවන්ට සමානකමක් පෙන්වන බැවිනි. වණ්ඩ හා ආක්‍රමණකාරී සත්වයන් ගේ අවණ්ඩ හැඟීම් පිබිදවීම සඳහා බාල හෝ ලිංගික හෝ හැසිරීම් රටාවක් අනුගමනය කළ බව ඔබට මතක ඇත. අපේ වර්ගයා ගේ ගැහැනියක හා පිරිමියකු ආලයෙන් බැඳෙන, එකිනෙකා හැඳින ගැනීමේ කාලයේ "තොදොල් කතාවට" යොමු වන්නේ ළදරුවකු ලෙස කථා කිරීමෙන් ආරක්ෂා සහිත මාතෘ හෝ පිතෘ හැඟීම් උද්දීපනය කෙරෙන බැවිනි. පක්ෂීහු, ආදරයෙන් බැඳෙන කාලයේ එකිනෙකාට ආහාර කැවීමේ කොතරම් යෙදේද යත්, එය අපේ ප්‍රවුමයට පවා හේතු වේ. ජීවිතයේ වෙන කිසිම කලක අපි ද එකිනෙකා ගේ කටට රසවත් දේ හා රස කැවිලි දමමින් මෙතරම් කාලයක් ගත නොකරමු.

ලිංගික අතින් මෙවැනි ප්‍රති-චේතනාවලියක් ඇතිවනු දක්නට ලැබෙන අවස්ථාවක් නම්, යටත් පිරිමියෙකු හෝ ගැහැනියක, බලවත් පිරිමියකු හෝ ගැහැනියක වෙත, ස්ත්‍රී ලිංගිකයකු ආකාරයට හැසිරීමයි. මෙය ඉතා බහුලව දක්නට ඇති නමුත්, බලවතා, සැනසීම සඳහා ස්ත්‍රී ලිංගික පසුපස ඉදිරිපත් කිරීමේ ඉරියව්ව, එහි මුල් ලිංගික ඉරියව්ව වෙනස්වීමත් සමඟ බොහෝ දුරට නැතිවී තිබේ. මෙය දක්නට ඇති එක් අවස්ථාවක් නම්, පාසල් ළමයින්ට දඬුවම් කිරීමේ දී ඔවුන් ගේ පසුපසට, රිද්මයානුකූලව කෝටුවකින් පහර දීමයි. වේවැල් පහර බලවත් පිරිමියා ගේ ශ්‍රෝණි තෙරපීම්වලට සමාන වෙයි. තමා ඇත්ත වශයෙන්ම යෙදී ඇත්තේ දුර්වලයකු සමඟ ව්‍යාජ සංසර්ගයේ යෙදීමේ, පැරණි අග්‍රේශ චාරිත්‍රයෙහි බව දන්නා නම්, බොහෝ පාසල් ගුරුවරුන් තවදුරටත් එහි නියැළේද යන්න සැක සහිතය. මෙම ස්ත්‍රී ලිංගික යටත් වීමේ ඉරියව්වෙන් තොරව දඬුවම් කිරීමේ අපහසුවක් නැත. (පාසල් ශිෂ්‍යාවන්ට පහරදීමේ දී මෙම ඉරියව්ව යොදා නොගැනීම සැලකිය යුත්තකි. එසේ කෙරුණේ නම්, මෙම ක්‍රියාවේ ඇති ලිංගික මූලාරම්භය වඩා පැහැදිලිව පෙනෙනු ඇත.) මෙසේ දඬුවම් කිරීමේදී ළමයින්ට කලිසම පහත් කිරීමට සමහරුන් අණ කරන්නේ, වේදනාව වැඩි කිරීමට නොව, පූර්ණ ලිංගික තත්වයක් යටතේ ස්ත්‍රී ලිංගික අග්‍රේශයන් ගේ පසුපස රතු වෙන ආකාරයට පහර දීමෙන්, ළමයා ගේ පසුපසද රතුවන ආකාරය බැලීම සඳහාය යන්න, එක්තරා විද්‍යාඥයකුගේ අදහස වී තිබේ. මෙය සත්‍ය වුවත් නැතත්, සැනසීමේ උපක්‍රමයක් ලෙස මෙය යොදා ගැනීම සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇත. බලවත් පිරිමියා ගුප්ත ලෙස ලිංගිකව උත්තේජනය කරන, අවාසනාවන්ත ශිෂ්‍යයාට සිදුවන්නේ, තව තවත් පහර කෑමටයි. රිද්මයානුකූල ශ්‍රෝණි තෙරපීම, සංකේතාත්මක

Scanned by TapScanner

රිද්මයානුකූලව වේවැල් පහරවල් බවට පරිවර්තනය වී ඇති බැවින්, ශිෂ්‍යයා නැවත පටන් ගත් තැනට පැමිණ ඇත. වණ්ඩ පහර දීමක්, ලිංගික පහරදීමක් බවට පත්කිරීමට ඔහු සමත් වී ඇති නමුත් මෙම ලිංගික පහරදීම සංකේතාත්මක පෙරළියක් මගින් තවත් වණ්ඩ රටාවක් බවට පත් වී තිබේ.

හැඩ වැඩ ගැන්වීමේ උපක්‍රමයද අපේ වර්ගයා ගේ ජීවන රටාවේ වැදගත් කාර්යයක් ඉටුකරයි. කැළඹීමට පත්වූවකු සැනසීමේ දී අපි අත ගැමේ හා තට්ටු කිරීමේ වලනයන් යොදා ගනිමු. සමාජයේ වඩා ප්‍රමුඛ තත්වයන් දරන අය, යටතේ අය ලවා හැඩ වැඩ ගන්වා ගැනීම සඳහා බොහෝ කාලයක් ගත කරති. මේ පිළිබඳව වෙනත් පරිච්ඡේදයක දී විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

අපේ ආක්‍රමණකාරී හමුවීම්වල විස්ථාපන ක්‍රියාවන්ටද සැලකිය යුතු තැනක් හිමි වේ. කෙසේ වෙතත් වර්ගයාට විශේෂ වූ විස්ථාපන රටාවන් කීපයකට පමණක් සීමා නොවීම නිසා අපි අන් සතුන්ගෙන් වෙනස් වෙමු. අපේ ඇතුළත පැහෙන හැඟීම් පිට කිරීම සඳහා අපි නොයෙකුත් ආකාරයේ ක්‍රියා ප්‍රයෝජනයට ගනිමු. සිත කැළඹීමට පත් වූ අවස්ථාවන්හිදී ආහරණ නැවත සකස් කිරීම, දුම්වැටියක් දල්වා ගැනීම, කණ්ණාඩිය පිස දැමීම, අත් ඔරලෝසුව දෙස බැලීම, යම් කිසිවක් කෑම හෝ බීම වැනි දහසක් එකක් කටයුතුවල නිරතවීමට අපට පුළුවන. මෙම කටයුතු, නියම හේතූන් නිසාත් කළ හැකි නමුත්, මෙවැනි අවස්ථාවකදී මේවා විස්ථාපන ක්‍රියාවෝ වෙති. සකස් කරන ලද ආහරණ ඇත්ත වශයෙන්ම නියම ලෙස තිබූ ඒවා වීමට පුළුවන. අලුත් දුම්වැටියක් දල්වා ගන්නේ අවසන් නොවූ දුම්වැටියක් ඉවත දැමීමෙනි. තවද, මෙවැනි අවස්ථාවක දුම් බීමේ වේගය කිසිම අතකින් නිකොටින් අවශ්‍යතාවට සමානකමක් නොපෙන්වයි. පිස දමන උපැස් යුවළේ කුණු ඇත්තේ නැත. ඔරලෝසුව දෙස කොතරම් බැලුවත් නියම වේලාව කුමක්දැයි අපේ සිතේ සටහන් නොවේ. අප මෙවැනි අවස්ථාවක යමක් බොන්නේ හෝ කන්නේ අපට පිපාසය හෝ බඩගින්න ඇති නිසා නොවේ. මෙම සියලුම

කටයුතුවල අප නිරත වන්නේ ඒවා කිරීමෙන් ලබන තෘප්තිය නිසා නොවේ. අපේ සිතේ ඇති කැළඹිල්ල නැති කිරීමේ මහක් වශයෙනි. සමාජීය හමුවීම්වල මුල් අවස්ථාවේ මේවා වැඩිපුරම දක්නට ලැබේ. නාට්‍ය හා චිත්‍රපට දර්ශන අස්සේ පවා කෑම හා බීම වැනි විස්ථාපන ක්‍රියාවන්හි යෙදීම සඳහා මැදදී නතර කොට විවේකයක් දෙනු ලැබේ.

වඩා දරුණු වණ්ඩ තත්වයන්හි පසුවන අපි, අනිකුත් අග්‍රේශ වර්ගවල ද දක්නට ලැබෙන විස්ථාපන ක්‍රියාවන්හි යෙදෙමු. මෙවැනි තත්වයක පසුවන චිම්පන්සියා දිගටම, ශරීරය කසා ගැනීමේ ක්‍රියාවක යෙදීමට පුළුවන. මෙය සාමාන්‍ය ශරීරය කැසීමට වඩා වෙනස් වේ. මෙවැනි අවස්ථාවන්හිදී වැඩිපුරම කසනු ලබන්නේ හිස හෝ අත් වේ. මෙම වලනවල තරමක ශෛලිගත බවක් ද දක්නට ලැබේ. මෙවැනි අවස්ථාවන්හිදී අපේ හැසිරීම් ද මෙයට බොහෝ දුරට සමාන වේ. හිස කැසීම, නියපොතු සැපීම, රැවුල අත ගැම, නාසය පිරිසිදු කිරීම, කන්පෙති අතගැම, කන ශුද්ධ කිරීම, තොල් ලෙව කෑම, අත් ඇතිල්ලීම ආදිය අප මෙවැනි අවස්ථාවන්හිදී කරන ප්‍රධාන විස්ථාපන ක්‍රියා වේ. එක් අයකුගේ විස්ථාපන හිස කැසීම, තව අයකු එය කරන ආකාරයෙන් වෙනස් විය හැකි අතර, ඒ ඒ පුද්ගලයාගේ විස්ථාපන ක්‍රියාව ඔහුටම ආවේණික වූ මහක් ගනී. නියම පිරිසිදු කිරීමක් මෙහිදී සිදු නොවන බැවින්, කොතන කසන්නේද යන්න එතරම් වැදගත් නොවේ. මෙවැනි විස්ථාපන ක්‍රියාවන් සිදුවන වාර ගණන අනුව කුඩා කණ්ඩායමක යටත් සමාජිකයන් කවුරුන්ද? යන්න ඉතා පහසුවෙන් හඳුනාගත හැකි වෙයි. ඇත්ත වශයෙන්ම ප්‍රමුඛ පුද්ගලයා ගේ මෙවැනි ක්‍රියා කිසිසේත්, දක්නට නොලැබේ. යම්කිසි ප්‍රමුඛ තත්වයේ පසුවන සත්වයකු ගේ මෙවැනි විස්ථාපන ක්‍රියා දක්නට ලැබේ නම්, එයින් කියැවෙන්නේ ඔහුගේ තත්වයට අනිකුත් අය තර්ජනයක් වී ඇති බවයි.

මෙම සියලුම ආක්‍රමණකාරී හා යටත් වීමේ හැසිරීම් රටාවන් සාකච්ඡා කිරීමේදී, එම පුද්ගලයන් සත්‍ය ස්වභාවය

Scanned by TapScanner

වසන් නොකළ බවත්, තම අරමුණ ඉටුකර ගැනීම සඳහා මෙම ක්‍රියාවන් සිතා මතා වෙනස් නොකළ බවත් උපකල්පනය කරන ලදී. අප වචනවලින් තරම් මෙම සංඥාවලින් බොරු නොකියන නමුත්, එවැන්නක් සිදු නොවේ යැයි කිව හැකි නොවේ. මා කලින්ද සඳහන් කළ පරිදි, තරුණ ළමයින් සඳහා දෙමාපියන් මෙම ක්‍රමය යොදාගත් විට, එය සාමාන්‍යයෙන් අසාර්ථක වේ. වචනවලින් තොරතුරු හුවමාරු කර ගැනීමට පුරුදු වූ වැඩිහිටියන් අතර, එය සාර්ථක ලෙස යොදා ගත හැක. අවාසනාවකට මෙන්, බොරුකාරයාට බොරු කිව හැක්කේ තම සංඥා පද්ධතියේ සමහර කොටස්වලින් පමණි. ඔහුට නොදැනීම අනික් සංඥාවලින් රහස එළිවෙයි. ඉතාම සාර්ථක බොරුකාරයෙකු වන්නේ, හිතා මතා ඒ සංඥා වෙනස් නොකොට තමන්ට අවශ්‍ය මුලික චිත්ත ස්වභාවය ගැන සිත යොමු කොට, අනිකුත් සුළු අංග ඒ අනුව සකස් වීමට ඉඩ දෙන අයයි. නළු නිළියන් විසින් මෙම ක්‍රමය ඉතා සාර්ථක ලෙස අනුගමනය කරනු ලැබේ. ඔවුන්ගේ ජීවිතයේ වැඩි කාලයක් ගත කරන්නේ හිතාමතාම වෙනත් ආකාරයකට හැසිරෙමිනි. මෙම ක්‍රියාව ඔවුන්ගේ පෞද්ගලික ජීවිතවලට ඉතා අනතුරුදායක විය හැකියි. දේශපාලකයන් හා නානාපති සේවයේ නියුතු අයටද මේ ආකාරයට, හැසිරීම් රටාව අතින් බොරු කීමට සිදුවෙයි. එහෙත් ඔවුන්ට නළුවන්ට මෙන් විශේෂ පුහුණුවක් දෙනු නොලැබේ.

මෙම පොතෙහි සඳහන් කරුණු සැලකිල්ලෙන් අවබෝධ කර ගැනීමෙන්, ඒ අතින් නියම පුහුණුවක් නොලබා වුවද තමන්ට අවශ්‍ය අරමුණ ඉටුකර ගැනීමට පුළුවන. පොලීසිය සමඟ කටයුතු කිරීමට සිදුවූ අවස්ථා දෙක තුනකදී මම එය සාර්ථක ලෙස අත්හදා බලා ඇත්තෙමි. අවනතවීමේ අභිනයන් තුළ සැනසීමට පත් කරවන ප්‍රබල ජීව විද්‍යාත්මක හැකියාවක් ඇත්නම්, නියම සංඥාවක් යොදා ගැනීමෙන් මිනිසුන් තමන්ට අවශ්‍ය ආකාරයට හැසිරවිය හැකි විය යුතුය, යන්න මගේ තර්කය විය. සුළු වැරදිවලට පොලීසිය මගින් අල්ලා ගත් විට බොහෝ රියැදුරන් කරන්නේ, තමාගේ නිවැරදි බව ගැන තර්ක කිරීමයි. මෙහිදී ඔවුන් කරන්නේ තම ප්‍රදේශය (ජංගම)

ආරක්ෂා කරමින් ප්‍රාදේශීය විරුද්ධවාදියෙකු ලෙස හැසිරීමයි. මේ නිසා ප්‍රති - ප්‍රහාර දීමකට ඔහු පොලිසිය පොළඹවයි. මේ වෙනුවට යටත් වීමේ ආකල්පයක් යොදා ගත්තේ නම්, පොලිස් නිලධාරියා සැනසීමට පත්වීම නොවැළැක්විය හැකිය. සිදු වූ දේ තමාගේ නොදැනුවත්කමත්, මෝඩකමත් නිසා සිදු වූ වරදක් ලෙස පිළිගත් විට, පොලිස් නිලධාරියා උසස් ප්‍රබල තත්වයකට පත්වන බැවින්, එම තත්වයේ සිට පහරදීම ඔහුට දුෂ්කර දෙයක් වනු ඇත. ඔබ නතර කිරීම ගැන ඔහුට ප්‍රශංසා කළ යුතුය. නමුත් මේ සඳහා වචන පමණක් ප්‍රමාණවත් නොවේ.

නියම ඉරියව් හා අභිනය ද ඒ සමඟ තිබිය යුතු වේ. මේ සියල්ලටම වැඩියෙන් වහාම රථයෙන් බැස පොලිස් නිලධාරියා දෙසට ගමන් කළ යුතුය. ඔබ රථයේම නතර වී සිටීම, ඔබේ ප්‍රදේශයේම සිටීමකට සමාන වනු ඇත. එයින් ඉවත්ව යෑම නිසා ඔබේ ප්‍රාදේශීක තත්වය ඉබේටම දුර්වල වෙයි. මෙයට අමතරව රථය තුළ වාඩි වී සිටීම ද ප්‍රමුඛතාව දක්වන ඉරියව්වක් වේ. වාඩි වී සිටීමේ ඉරියව්වේ බලය, අපේ හැසිරීම් රටාවේ ඉතා අසාමාන්‍ය තැනක් ගනී. රජ හිටගෙන සිටින විට කිසිවෙක් වාඩි නොවෙති. රථයෙන් ඉවත්ව යෑමෙන් ඔබේ ප්‍රාදේශීක අයිතිවාසිකම දුර්වල තත්වයකට පත්වේ. රථයෙන් බැසීමෙන් පසු සිරුර කෙළින් නොතබා හිස පහත් කොට තිබීම ද අවශ්‍ය වේ. යොදාගන්නා වචන මෙන්ම, ඒවායේ හඬද මෙහිදී වැදගත්ය. අවුල් වූ හැඟීමක් පළකරන මුහුණක් මෙන්ම හිස කැසීම වැනි විස්ථාපන ක්‍රියාවන් ද ප්‍රයෝජනවත් වනු ඇත. අවාසනාවකට මෙන් මෝටර් රථයක රියැදුරකු ලෙස අප මුලික වශයෙන් පසු වන්නේ ආක්‍රමණකාරී චිත්ත ස්වභාවකින් හෙයින්, ඒ පිළිබඳ බොරුකිම ඉතා දුෂ්කර වේ. ඒ සඳහා හොඳ පුහුණුවක් හෝ වචන නොවන අනිකුත් හැසිරීම් සංඥාවන් පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුය. මේ නිසා සමහර විට දඩය ගෙවීම මේ සියල්ලට වඩා පහසු වන්නට පුළුවන.

මෙය සටන් කිරීමේ හැසිරීම් රටාව පිළිබඳ

Scanned by TapScanner

පරිච්ඡේදයක් නමුත්, අපි මෙතෙක් කල් සාකච්ඡා කොට ඇත්තේ, නියම වශයෙන්ම සටන් වැදීම වළකන ක්‍රම ගැන පමණකි. අවසානයේ ශාරීරික වශයෙන් පහර දෙන තත්වයට පත්වූ විට, ආයුධ රහිත නිරුවත් වානරයා අනිකුත් අග්‍රේශයන්ට වඩා වෙනස් ආකාරයකට හැසිරෙයි. වානරයන්ට වැදගත්ම ආයුධය වන්නේ දත් නමුත්, අපට වඩා වැදගත් වන්නේ අත්ය. වානරයන් සතුරා අල්ලා ගෙන හපන නමුත්, අප කරන්නේ අල්ලා මිරිකීම හෝ මිට මෙලවූ අතින් පහරදීමයි. හපාකෑම වැදගත් තැනක් ගන්නේ ළදරුවන්ගේ හෝ ඉතා කුඩා ළමයින්ගේ සටන්වලදී පමණි. මෙයට හේතුව ඔවුන්ගේ අත් ප්‍රමාණවත් තරමට වැඩී නොතිබීමයි.

අනුවර්තනයකට භාජනය වූ ආයුධ නොමැතිව සටන් කිරීමක් දැකීම අද ඉතා දුර්ලභ සිද්ධියක් නමුත්, මල්ලව පොර, ජූඩෝ වැනි ඉතා ශෛලිගත සටන් ක්‍රම කීපයක්ම දක්නට ලැබේ. නියම වශයෙන් සටනක් ආරම්භ වූ විගසම, කිසියම් ආකාරයක කෘත්‍රිම ආයුධ ප්‍රයෝජනයට ගනු ලැබේ. මේවා ඉතාම දළ වශයෙන් වේගවත් පහරවල් දීම සඳහා අත දික්කිරීමකට සමාන වෙයි. විශේෂ තත්වයන් යටතේ චිම්පන්සීහු ද මෙවැන්නක් අනුගමනය කරති. අල්ලා ඇතිකර ගනු ලබන චිම්පන්සීන් සමහර අවස්ථාවලදී අන් සතුන්ට පහර දීම සඳහා කොළ අතු කැබලි ප්‍රයෝජනයට ගන්නා නමුත්, කැලෑවේ නිදැල්ලේ වෙසෙන විට, මෙවැනි ක්‍රම යොදා ගන්නා බවක් නොපෙනේ. තම වර්ගයේ සතකුට පහරදීමට කිසිසේත් මෙවැනි ක්‍රම යොදාගනු නොලැබේ. කෙසේ වෙතත් මෙයින් අපේ කෘත්‍රිම ආයුධ භාවිතය ඇති වූයේ කෙසේද යන්න ගැන අවබෝධයක් ලැබිය හැකි වෙයි. එය මූලික වශයෙන් ගොදුර මරා ගැනීමේත්, අනිකුත් සත්ව වර්ගවලින් ආරක්ෂා වීමේත් ක්‍රමයකි. තම වර්ගයා තුළ ඇතිවන ආරවුල්වල දී මෙම ආයුධ භාවිතයට ගැනීම, ඇත්ත වශයෙන්ම දෙවනුව සිදුවූ දෙයක් බව පෙනේ.

ඉතාම සරල කෘත්‍රිම ආයුධ වන්නේ ලී හෝ ගල්වලින් සාදාගත් දැඩි ඝන ස්වභාවික වස්තුවකි. මෙම හාණ්ඩවල ඉතා

සරල වෙනස් කිරීම් මගින්, ඒවා දමා ගැසීම, කැපීම, ඇනීම හා ඉරීම ආදිය සඳහා යොදා ගන්නා ලදි.

සටන් කිරීම් රටාවේ සිදුවූ අනිත් වැදගත්ම වෙනස නම්, සතුරන් දෙදෙනා අතර ඇති දුර ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවීමයි. හෙල්ල විසි කළ හැකි දුර ප්‍රමාණය සීමා සහිතය. ඊතල එයට වඩා හොඳ නමුත්, ඒවා එතරම්ම නිවැරදිව යැවිය හැකි නොවේ. තුවක්කු නිසා මෙම දුර ප්‍රමාණය ඉතා විස්මයානුකූල ලෙස වැඩි වූ අතර, අහසින් දමන බෝම්බ හේතු කොට ගෙන, සතුරන් අතර තිබිය හැකි දුර තව තවත් වැඩි විය. ඉතා ඈත පිහිටි ඉලක්කයක් කරා යවන රොකට් දියුණුවීමත් සමඟ පහර දිය හැකි දුර මහාද්වීපයක සිට තවත් මහාද්වීපයක් දක්වා වැඩි විය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ සතුරන් පරාජය වනු වෙනුවට, තේරුමක් නැතිව විනාශ වී යෑමයි.

මා කලින් පැහැදිලි කළ පරිදි සත්ව වර්ගයක් තුළ දක්නට ලැබෙන චණ්ඩබවේ අරමුණ සතුරා මැරීම නොව, යටත් කිරීමයි. පරාජයට පත්වන සත්වයා යටත් වන බැවින් හෝ පලායන බැවින්, ජීවිත විනාශ වීමක් සිදු නොවේ. එයින් පසු ආරවුල විසඳී චණ්ඩ ක්‍රියා අවසන් වේ. නමුත් පරාජයට පත්වන සතාගේ, සතුරා සැනසීමේ සංඥාවන්, දැකිය නොහැකි තරම් දුරක සිට පහරදීම සිදුවන විට, ඉතා සාහසික ලෙස සටන දිගටම සිදුවීම නැවැත්විය නොහැක. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ විය හැක්කේ සතුරා පලා යාමෙන් හෝ යටත් වීමෙනි. වර්තමාන ආක්‍රමණකාරීත්වයේ දක්නට ඇති, දුරස්තර භාවය නිසා මේ දෙකම සිදු විය නොහැක. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ වෙනත් කිසිම සත්ව වර්ගයක නොදුටු විරූ ආකාරයට මිනිසුන් තොග පිටින් මරා ගැනීමයි.

මෙම තත්වයට, ආධාර හා උපකාර කරන අනික් දෙය නම්, අප තුළ විශේෂයෙන්ම පරිණාමය වී ඇති සහයෝගීතාවයි. ගොදුරු දඩයම් කිරීම සම්බන්ධයෙන් මෙම ගුණාංග දියුණුවීම ඉතා ප්‍රයෝජනවත් වූ නමුත්, දැන් එය

Scanned by TapScanner

ආපිට පෙරළී ඇත. ඒ නිසා ඇතිවූ, අන්‍යෝන්‍ය ලෙස ආධාර කිරීමේ ප්‍රබල ආසාව, වර්ගය තුළ ආක්‍රමණික තත්වයන් යටතේද පිබිද විය හැකිව තිබේ. දඩයමේදී දක්නට ලැබුණු පක්ෂපාතීභාවය, සටන් කිරීමේ පක්ෂපාතිත්වය බවට පත්වීමෙන් යුද්ධ ඇති වී තිබේ. යුද්ධයේ දක්නට ලැබෙන, අති මහත් භයානක තත්වයට හේතුව වී ඇත්තේ පුදුමයකට මෙන් අප තුළ දියුණු වී ඇති, අන් සගයන්ට ආධාර කිරීමේ ආසාවයි. අපට මාරක ආයුධ හා හමුදා ලබා දී ඇත්තේ ද මෙම ආසාවමයි. අන්‍යෝන්‍ය වශයෙන් ආධාර කිරීමේ මෙම ආසාවෙන් තොරව, එකමුතු බවක් කිසිසේත් පවත්වා ගත නොහැක.

දඩයම් පිණිස සතුන් මරා ගන්නා සත්ව වර්ගයක් ලෙස පරිණාමය වූ බැවින්, අපි ඉබේම විරුද්ධවාදීන් මරණ සත්ව වර්ගයක් වූ වෙමු යැයිද, විරුද්ධ කාරයන් මැරීමට අප තුළ ඇති ආසාව සහජයෙන්ම ඇති වූවක් යැයිද අදහසක් ඉදිරිපත් වී තිබේ. නමුත් දැනට සොයාගෙන ඇති සියලුම කරුණු මෙම මතයට විරුද්ධ වේ. සතකුට වුවමනා කරන්නේ පරාජය කිරීම මිස, මැරීම නොවේ. චණ්ඩභාවයේ අරමුණ යටත් කිරීම මිස, විනාශ කිරීම නොවේ. මූලික වශයෙන් අප මේ අතින් අනිකුත් සත්ව වර්ගවලින් වෙනස් වන බවක් නොපෙනේ. අප පමණක් වෙනස් වීමට හේතුවක් ද නැත. කෙසේ වෙතත් සිදුවී ඇත්තේ, දුර සිට පහර දීමත්, කණ්ඩායමේ සහයෝගීතාවයත් නිසා, සටන් වදින පුද්ගලයාට එහි මුල් අරමුණ නොපැහැදිලි වීමයි. දැන් ඔවුන් පහර දෙන්නේ සතුරන් පරාජය කිරීමට වඩා තම සහෝදරයන්ට ආධාර කිරීමටයි. මෙම අවාසනාවන්ත තත්වය නිසා, අපේ වර්ගයා සම්පූර්ණයෙන් විනාශ වී යෑමට වූවද ඉඩ තිබේ.

මෙම උභතෝකෝටික ප්‍රශ්නය විසඳීමට අපේ වර්ගයා බොහෝ වෙහෙස දරා ඇත. ඉතා ජනප්‍රිය විසඳුමක් නම් අන්‍යෝන්‍ය වශයෙන් සියල්ලන්ම නිරායුධ කිරීමයි. නමුත් මෙය සාර්ථක වීමට නම්, ස්වයංක්‍රිය සැනසීමේ සංඥා නැවතත් ක්‍රියාත්මක විය හැකි ලෙස, අනාගත සටන්වලදී ඒවාට සම්බන්ධ වන අය, ඉතා කිට්ටුවෙන් සිටින බවට සහතික විය යුතුය. තවත් විසඳුමක් නම්, ඒ ඒ කණ්ඩායම්වලට පුද්ගලයන් තුළ ඇති බැඳීම නැති කිරීමයි. නමුත් මෙය අපේ වර්ගයා ගේ මූලික ජීව විද්‍යාත්මක ලක්ෂණයකට විරුද්ධව යෑමක් වනු ඇත. අපේ වර්ගයාගේ මූලික වෙනසක් සිදු නොවී, සමාජීය වශයෙන් කණ්ඩායම් සෑදීමට අප තුළ ඇති ස්වභාවික හැකියාව විනාශ කළ නොහැක.

තුන්වැනි විසඳුම වන්නේ යුද්ධය වෙනුවට යොදාගත හැකි සංකේතාත්මක අනතුරු රහිත ආදේශකයන් සැපයීමයි. මේවා ඇත්ත වශයෙන්ම අනතුරු රහිත නම්, ප්‍රශ්නය විසඳීමෙහි ලා එයින් ලැබෙන පිහිට ඉතා අල්ප වනු ඇත. ජීව විද්‍යාත්මක වශයෙන් බලන විට, මෙම ප්‍රශ්නය කණ්ඩායමට අයත් ප්‍රදේශ රැකීම පිළිබඳව වූවක් මෙන්ම, අපේ වර්ගයා ගේ ජනගහනය වැඩිවීම නිසා, මෙය කණ්ඩායමට අයිති ප්‍රදේශය පුළුල් කිරීමේ ප්‍රශ්නයක්ද වෙයි. චණ්ඩ අන්තර් ජාතික පාපන්දු තරග කොපමණ පැවැත්වූවත්, එය මේ ප්‍රශ්නයට විසඳුමක් නොවේ.

සිව්වැනි විසඳුම වන්නේ, චණ්ඩ බව බුද්ධිමය වශයෙන් පාලනය කිරීමයි. අප මෙම අවුලට වැටී ඇත්තේ බුද්ධිය නිසා වන බැවින්, අප එයින් මිදිය යුත්තේද බුද්ධිය මහින්ම යැයි තර්ක කරේ. නමුත් ප්‍රදේශය ආරක්ෂා කිරීම වැනි මූලික කරුණු සම්බන්ධයෙන් , අපේ මොළයේ උසස් මධ්‍යස්ථාන සියල්ලම පහළ ඒවායේ හැඟීම්වලට යටත් වෙයි. බුද්ධියට පාලනය කළ හැක්කේ එක්තරා ප්‍රමාණයකට පමණි. අවසාන වශයෙන් බලන විට එය එතරම් විශ්වාසදායක නොවන අතර, බුද්ධිමය වශයෙන් සලකා නොබැලූ හැඟීම්වලට බර වූ එක් ක්‍රියාවකින් සියලුම හොඳ දේ නැති කිරීමට පුළුවන.

ජීව විද්‍යාත්මකව බලන විට මෙම ප්‍රශ්නයට එකම විසඳුම වන්නේ, ජනගහනය අඩු කිරීම හෝ අනිකුත් ග්‍රහලෝකවල අපේ වර්ගයා පදිංචි කරවීමයි. හැකිනම් කලින් සඳහන් කරන ලද විසඳුම් හතරෙන් ද ප්‍රයෝජන ගැනීමට

Scanned by TapScanner

පුළුවන. දැනට සිදුවන ආකාරයට අපේ ජනගහනය භයානක ලෙස වැඩිවීගෙන ගියහොත් පාලනය කරගත නොහැකි ලෙස චණ්ඩභාවය ද වැඩිවනු ඇත. රසායනාගාර පරීක්ෂණවලින් මෙය නිසැකවම පෙන්වා දී තිබේ. ජනගහනය වැඩි වී අප සාගින්නෙන් මිය යෑමට පෙර, ඒනිසා ඇතිවන සාමාජීය ගැටුම්වලින්, අපේ සියලුම සමාජීය සංස්ථා බිඳ වැටෙනු ඇත. එම තත්වය බුද්ධිය නොව, හැඟීම් දියුණු කිරීමට ක්‍රියා කරනු ඇත. මෙවැන්නක් සිදුවීම වැළැක්විය හැක්කේ උත්පත්ති වේගය අඩු කිරීමෙන් පමණි. අවාසනාවකට මෙන් මෙහිදී ප්‍රධාන බාධක දෙකක් දක්නට ලැබේ. කලින් විස්තර කළ පරිදි තවමත් අන් සියලුම සමාජවල මූලික ඒකකය වන පවුල, වර්ගයා බෝකරන උපක්‍රමයකි. එය අද දක්නට ලැබෙන උසස් සංකීර්ණ තත්වයට පරිණාමය වී ඇත්තේ, පැටවුන් සෑදීමේ, හදා වඩා ගැනීමේ හා ආරක්ෂා කිරීමේ පද්ධතියක් ලෙසයි. මෙම කාර්යය තාවකාලිකව ඉවත් කළහොත් හෝ අඩු කළහොත් යුගල බන්ධන රටාවට හානි සිදුවේ. ඒ හේතු කොටගෙන සමාජීය වශයෙන් වියවුල් තත්වයක් ඇතිවීමට පුළුවන. අනික් අතට සමහර යුගලවලට පමණක් බෝ කිරීමට ඉඩදුන හොත් සමාජයේ අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු සහයෝගීතාව බිඳ වැටීමට එය හේතු වනු ඇත.

සරල සංඛ්‍යාත්මක බසින් කිවහොත් ජනගහනය ස්ථීර මට්ටමක පවත්වා ගැනීමට නම්, සෑම වැඩිහිටි යුවලකට ඉඩදිය යුත්තේ දරුවන් දෙදෙනෙකු පමණක් සාදා ගැනීමටයි. දරුවන් ඇති නොකරන හා වැඩිවියට පත්වීමට පෙර මිය යන අයද සැලකිල්ලට ගත් විට, සාමාන්‍ය පවුලක් මෙයට මදක් විශාලවීමට පුළුවන. මෙය වුවද යුගල බන්ධන ක්‍රියාවලියට විශාල බරක් වේ. දරුවන් අඩුවීම නිසා යුගල බැම්ම ශක්තිමත්ව තබා ගැනීම සඳහා අනිකුත් අංශවලින් විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවෙයි. නමුත් ජනගහනය වැඩි වී සියල්ලන් විනාශ වීමේ අනතුර සමඟ සලකා බලන විට, මෙය ඉතා සුළු කොට සැලකිය යුතුය.

මෙතෙක් සඳහන් කරන ලද කරුණු සියල්ලම ගොනු කොට ගත් කල, ස්ථීර ලෝක සාමයක් ඇති කිරීමට හොඳම ක්‍රමය වනුයේ, උත්පත්ති පාලනය හෝ ගබ්සා කිරීමයි. ගබ්සා කිරීම ඉතා දරුණු පියවරක් වන අතර, මේ නිසා ඉතා ප්‍රබල මානසික ප්‍රශ්න ඇතිවීමට පුළුවන. තවද, සංසේවනයෙන් පසුව යුක්තානුවක් ඇතිවූ තැන් සිට එය සමාජයේ අලුත් සාමාජිකයෙකු බැවින්, කලලයක් විනාශ කිරීම (අප පාලනය කිරීමට තැත් කරන හැසිරීම් රටාව වන) තවත් ආක්‍රමණකාරී ක්‍රියාවක්ම වේ. ප්‍රතිසන්ධිරෝධය වඩා හොඳ ක්‍රියා මාර්ගයකි. එයට විරුද්ධ වන ඕනෑ ම ආගමික හෝ වෙනත් කණ්ඩායමක් ඇත්නම්, ඔවුන් අති භයානක යුද්ධ ඇති කරන්නන් බව පිළිගත යුතුය.

ආගම පිළිබඳව මෙහිදී සඳහන් වූ බැවින් අපේ වර්ගයාගේ චණ්ඩ ක්‍රියාවල අනිකුත් අංශ ගැන සැළකිල්ල යොමු කිරීමට පෙර, මෙම පුදුමාකාර සත්ව හැසිරීම් රටාව ගැන විමසා බැලීම ද ප්‍රයෝජනවත් වනු ඇත. එය විමසිල්ලට ලක්කිරීමට පහසු විෂයයක් නොවත්, සත්ව විද්‍යාඥයන් වශයෙන් සිදුවිය යුතු දෙය ගැන නොව, ඇත්ත වශයෙන්ම සිදුවන දෙය නිරීක්ෂණය කිරීමට අප තැත් කළ යුතුය. මේ අනුව බලන විට, ආගමික කටයුතු සමන්විත වී ඇත්තේ ප්‍රබල පුද්ගලයෙකු සැනසීමට අවනතභාවය දක්වන කටයුතු පුන පුනා කිරීමට මිනිසුන් විශාල කණ්ඩායම් ලෙස එක්වීමෙනි.

විවිධ සංස්කෘතීන්හි මෙම ප්‍රබල පුද්ගලයා විවිධ ස්වරූපයන් ගන්නා නමුත්, අධික බලයක් ඔහු සතුවීම සෑම සමාජයකටම හා සෑම ආගමකටම පොදු සාධකයක් වේ. සමහර විට එය වෙනත් වර්ගයක සතකුගේ ස්වරූපය ගන්නා අතර සමහර විටෙක අපේම වර්ගයාගේ ඥානවන්ත වැඩිහිටියෙකු ගේ ස්වරූපය ගනී. එමෙන්ම, තවත් සමහර අවස්ථාවන්හිදී එය "රාජ්‍යය" වැනි අමූර්ත ස්වරූපයක්ද ගනී. එයට අවනතභාවය දක්වන ප්‍රතිචාරයන් වන්නේ ඇස් පියාගැනීම, හිස පහත් කිරීම, දණ ගැසීම, සිප ගැනීම හා විවිධ ශබ්දයන් ගායනා කිරීමයි. මෙම ක්‍රියා සාර්ථක නම්, ප්‍රබල පුද්ගලයා සැනසෙනු ඇත. ඔහු කෝපවීම වැළැක්වීම

Scanned by TapScanner

සඳහා මෙම වාරිත්‍ර වාරිත්‍ර නියමිත කාලවල දී ක්‍රමවත්ව කළ යුතු වේ. හැමවිටම නොවුවත් බොහෝ විට මෙම ප්‍රබල පුද්ගලයා දෙවියෙකු යයි හඳුන්වනු ලැබේ.

කිසිම දෙවියකු ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නට නොමැති නමුත්, අප ඔවුන් නිර්මාණය කර ඇත්තේ ඇයි? මෙයට පිළිතුර සොයා ගැනීම සඳහා පරම්පරාවේ ආරම්භය දක්වා යා යුතුයි. අප සමූපකාර දඩයම්කරුවන් බවට පත්වීමට පෙර, වඳුරන්ගේ හා වානර වර්ගවල අද දක්නට ලැබෙන ආකාරයේ, සමාජීය කණ්ඩායම් ලෙස, ජීවත් වන්නට ඇත. මෙම සෑම කණ්ඩායමක්ම එක් පිරිමි සතකුගේ නායකත්වය යටතේ පවතී. සියල්ලටම අධිපති වන ඔහුගේ කැමැත්තට අනුව කණ්ඩායම ආරක්ෂා කිරීමත්, නම කණ්ඩායමේ සමාජිකයන් අතර ඇතිවන ආරවුල් විසඳීමත්, ඔහුගේ කර්තව්‍යයෝ වෙත්. මෙවැනි කණ්ඩායමක සාමාජිකයෙකුගේ සම්පූර්ණ ජීවිතයම, මෙම ප්‍රබල සත්වයා වටා ගොඩ නැඟී ඇත. ඔහුගේ සර්ව බලධාරී ලක්ෂණය හේතු කොට ගෙන ඔහුට දෙවියකුගේ තත්වය ලැබේ. කණ්ඩායමක් ලෙස දඩයම් කිරීමට ඉතා වැදගත් වන, සහයෝගීතා හැඟීම දියුණුවීමත් සමඟ, කණ්ඩායමේ සාමාජිකයන්ගේ ක්‍රියාකාරී සහයෝගය ලැබීමට නම්, මෙම ප්‍රබල පුද්ගලයාගේ ආධිපත්‍යය බොහෝ දුරට සීමා කළ යුතු විය. ඔහුට බියවීම වෙනුවට සාමාජිකයන් ඔහුට ආධාර කිරීමට කැමැත්තෙන් ඉදිරිපත් විය යුතුය. මෙම අධිපති සත්වයාටද ඔවුන්ගේ එකකු බවට පත්වීමට සිදුවිය. මේ නිසා පැරණි ආකාරයේ වඳුරු අධිපතියකු වෙනුවට වඩා සාධාරණ, වඩාත් සහයෝගී, නිරුවත් වානර නායකයෙක් පරිණාමය විය. විකාශනය වෙමින් පැවතුණු අන්‍යෝන්‍ය ආධාර සංවිධානයට මෙය අත්‍යවශ්‍ය වූ නමුත්, මේ නිසා විවිධ ප්‍රශ්න ද පැන නැඟිණි. කණ්ඩායමේ මුලිකයාගේ පූර්ණ ආධිපත්‍යය අඩුවීම නිසා ඔහුට තවදුරටත් පූර්ණ අවනතභාවය ලබාගත නොහැකි විය. මෙම පරිවර්තනය නව සමාජීය පද්ධතියට කොතරම් වැදගත් වූවත්, ඒ නිසා හිස් බවක් හා අඩුවක් දක්නට ලැබිණි. අපේ පැරණි පසුබිම හේතු කොට ගෙන, කණ්ඩායම පාලනය කළ හැකි සර්වබලධාරී පුද්ගලයකු අවශ්‍ය විය. දෙවියන්

නිර්මාණය කිරීමෙන් පුරවන ලද්දේ මෙම පුරප්පාඩුවයි. මෙය කණ්ඩායමේ නායකයාගේ බලපෑමට අතිරේකව ක්‍රියාත්මක විය හැකි නවත් බලයක් විය.

ආගම මෙතරම් සාර්ථක වීම බැලූ බැල්මට පුදුමයට කරුණක් වුවත්, මෙය කණ්ඩායමේ සර්වබලධාරී ප්‍රබල සාමාජිකයකුට අවනත වීමට අපේ වානර මුතුන් මිත්තන් තුළ නිබී, ඔවුන්ගෙන් අපට ලැබුණ මූලික ජීවමය නැමියාවේ ප්‍රබලත්වය පෙන්නුම් කරන්නකි. මේ නිසා සමාජීය එකමුතුකම තබා ගැනීම සඳහා මෙය ඉතා ප්‍රයෝජනවත් වූ අතර, අතිවිශේෂ පරිණාමීය තත්වයන් යටතේ එවැන්නක් නොමැතිව අපට මෙතරම් දියුණු විය හැකිව තිබුණේද යන්න සැක සහිතය. දෙවියන් හමුවන "නවත් ජීවිතයක්" පිළිබඳ විශ්වාසයක් ද මේ නිසා ඇතිවී තිබේ. කලින් විස්තර කළ ආකාරයට, ඔවුන්ට මේ ජීවිතයේදී අප සමඟ එකතු විය නොහැකි බැවින්, මතු ජීවිතයක දී එක්වීමට, ඉඩ දීමෙන්, මෙම වරද හරි ගැස්සීමට පුළුවන. මෙම කාර්යය පහසු කිරීම සඳහා අප මිය යෑමෙන් පසු අපේ සිරුර ඉවත් කිරීම සම්බන්ධව ඉතා පුදුමාකාර භාවිත ක්‍රම දියුණු වී තිබේ. මරණයෙන් පසු, අපි අපේ අධිපතියන් හමුවීමට යන්නෙමු නම්, අප එම අවස්ථාවට සුදුසු ආකාරයට සැරසී සිටිය යුතු බැවින්, විසිතුරු අවමංගල වාරිත්‍ර සිදුකළ යුතු වෙයි. භාවිතය අතින් වුවමනා ප්‍රමාණයටත් වඩා වාරිත්‍රානුකූල වීම නිසා, ආගම බොහෝ දුක් වේදනාවන්ට ද මුල් වී ඇත. දෙවියන්ගේ මෙලොව සහකරුවන්, ඔහුගේ බලය තමන් අතට ගැනීමට යෑම, මෙයට බොහෝ විට හේතු වී තිබේ. එහි හොඳ හා නරක මුසු වූ ඉතිහාසයේ කුමක් සිදුවුවත්, අද සමාජීය ජීවිතයේ එය නැතිවම බැරි අංගයක් බවට පත්ව ඇත. ආගම පිළිගත නොහැකි තත්වයකට පත්වූ විට, සමහර විටක ඉතා සාහසික ලෙස ප්‍රතික්ෂේප කරනු ලබන නමුත්, වැඩිකල් ගතවීමට පෙර එය නව ස්වරූපයකින් අප අතරට එයි. ප්‍රතික්ෂේප කරන ලද ආගමේ වූ මූලික ලක්ෂණ සියල්ලම නව ස්වරූපයේ දී සැහවුණු ආකාරයකින් හෝ දක්නට ලැබේ. යම්කිසි දෙයක් විශ්වාස කිරීම අපට අවශ්‍යය. අප පාලනය කළ හැක්කේත්,

Scanned by TapScanner

එකට තබා ගත හැක්කේත්, එවැනි පොදු විශ්වාසයකට පමණි. ඕනෑම ප්‍රබල විශ්වාසයක් මේ සඳහා ප්‍රමාණවත් යැයි තර්ක කළ හැකි නමුත්, එය නියම වශයෙන් සත්‍ය නොවේ. මෙම විශ්වාසය සිත් ගන්නා සුළු දෙයක් මෙන්ම චමත්කාරභාවයකින් යුත් දෙයක් ද විය යුතුය. අපේ සාමූහික ස්වභාවය කරණ කොට ගෙන විසිතුරු, වත්පිළිවෙත්වලට සහභාගී වීම අවශ්‍ය වෙයි. මෙම විහුතිය ඉවත් කළහොත්, ඒ නිසා සංස්කෘතික වශයෙන් විශාල අඩුවක් සිදුවී, වඩා වැදගත් වන චිත්ත මට්ටමේ දී එය ක්‍රියාකාරී වීම අපහසු වනු ඇත. සමහර විශ්වාසයන් වඩා මෝඩ ඒවා වන අතර මේවා ප්‍රජාවක හැසිරීම් රටාව දැඩි පාලනයකට යටත් කිරීමෙන් එහි ගුණාත්මක වර්ධනයට බාධා කිරීමට ද පුළුවන. සත්ව විශේෂයක් ලෙස අප මූලික වශයෙන්ම බුද්ධිමත්, ගවේෂණාත්මක සතුන් වන බැවින්, ඒ අතථ යොමුවුනු විශ්වාසයන් වඩාත්ම ප්‍රයෝජනවත් ඒවා වෙයි. දැනුම ලබා ගැනීමේ වටිනාකමත්, ලෝකය විද්‍යාත්මකව අවබෝධ කර ගැනීමත්, විවිධ ආකාරයේ සෞන්දර්යාත්මක දේ නිර්මාණය කිරීමත්, ඒවා අගය කිරීමත්, එදිනෙදා ජීවිතයේ අත්දැකීම් පරාසය පුළුල් කිරීමත්, ඉතා වේගයෙන් අපේ යුගයේ ආගම බවට පත්වේගෙන යයි. අත්දැකීම් හා අවබෝධය අපේ අමුර්ත දේව රූපයන් වී ඇති අතර, අවිද්‍යාව හා අඥානකම අප කෝපයට පත් කරවයි. අපේ පාසල් හා විශ්වවිද්‍යාල නව ආගමික පුහුණු කිරීම් මධ්‍යස්ථාන වන අතර, අපේ පුස්තකාල, කෞතුකාගාර, කලාගාර, නාටක ශාලා හා ක්‍රීඩා භූමි, අප සාමූහික වන්දනාවේ යෙදෙන ස්ථාන වී තිබේ. ගෙදර දී පොත්, පුවත්පත්, සහරා, ගුවන් විදුලිය හා රූපවාහිනිය ආදිය මඟින් අපි වැදුම් පිදුම් කරමු. එක් අතකින් බලන විට, අපි තවමත් මරණින් මතු ජීවිතයක් ගැන විශ්වාස කරමු. නිර්මාණාත්මක කටයුතුවල යෙදීමෙන් ලබන එක සතුටක් නම්, අපේ මරණයෙන් පසුත් ඒ තුළින් අප ජීවත්වන බවයි. සෑම ආගමක මෙන් මෙහිද අනතුරු තිබේ. නමුත් ආගමක් තිබිය යුතු නම්, අපේ වර්ගයාගේ අතිවිශේෂ ජීව විද්‍යාත්මක ලක්ෂණවලට වඩාම යෝග්‍ය වන්නේ මෙවැන්නක් බව හොඳින් පෙනී යයි. ලෝක ජනගහනයේ වැඩි කොටසක් මෙවැනි අදහස් වැඩි වැඩියෙන් පිළිගැනීම නිසා, අපේ වර්ගයාගේ අනාගතය ගැන විශ්වාසය තැබීමට හැකි වී තිබේ.

පවුල් ඒකකයේ මධ්‍යස්ථානය වන නිවස ආරක්ෂා කිරීමේ ලක්ෂණය, අතිමහත් ගෘහ නිර්මාණාත්මක දියුණුව මැද පවා, අප අතර තවම දක්නට ලැබේ. දහස් ගණන් මිනිසුන් ජීවත්වන අපේ විශාල තට්ටු නිවාස ආදී ගොඩනැගිලි පවා පවුලකට එකක් බැගින් කුඩා ඒකකවලට වෙන් කොට තිබේ. අනිත් අංශවලින් අප කොතරම් දියුණු වී වෙනස් වී සිටියත් අපේ නගර හා නුවර සැලසුම් කිරීමේදී මුල් තැනක් ගෙන ඇත්තේ කණ්ඩායම් තුළ කුඩා පවුල් ඒකකවලට අයත් ප්‍රදේශ වෙන් කිරීමේ, නිරුවත් වානර ලක්ෂණයයි. තනි ගෙවල් දක්නට ඇතුවාක් මෙන්ම ඒවා තාප්ප, වැටවල් ආදියෙන් අසල් වැසියන්ගෙන් වෙන් කරනු ලැබේ. මෙම බෙදා වෙන්කිරීම් අනිකුත් සත්ව වර්ගයා මෙන් අප විසින්ද ඉතා දැඩි ලෙස ගරු කරනු ලැබේ.

පවුලට අයිති ප්‍රදේශයේ ඉතා වැදගත් ලක්ෂණයක් නම්, එය අන් සියලුම ප්‍රදේශවලින් පහසුවෙන් වෙන් කර හඳුනා ගත හැකි වීමයි. නියම ස්ථානයක පිහිටා තිබීම නිසා, එයට අතිවිශේෂ තත්වයක් ලැබේ. නමුත්, එය පමණක් ප්‍රමාණවත් නොවේ. එය හැඩය හා පෙනුම අනින්ද පහසුවෙන් හඳුනා ගත හැකි දෙයක් විය යුතුය. මෙය, ඉතා පැහැදිළි දෙයක් ලෙස පෙනුණත්, ආර්ථික හේතූන් හා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ පටු ජීව විද්‍යාත්මක දැනුම හේතු කොට ගෙන, බොහෝ විට අමතක කෙරේ. ලොව පුරා මහා නගරවල කෙළවරක් නැති ඒකාකාර ගෙවල්, පේළි ගණන් දක්නට ලැබෙන්නේ මේ නිසාය. තට්ටු ගෙවල් සම්බන්ධයෙන් ප්‍රශ්නය වඩාත් භයානක වෙයි. මෙම තත්වයන් යටතේ ජීවත්වන අයට, ගෘහ නිර්මාණ ශිල්පීන් හා සැලසුම්කරුවන් විසින් කර ඇති හානිය කිව නොහැකි තරම්ය. වාසනාවකට මෙන් ඒවායේ ජීවත්වන පවුල්වලට අනිත් ක්‍රමවලින් තම නිවස වෙන් කොට දැක්විය හැකි වෙයි. තම නිවස විවිධ වර්ණවලින් සායම් කළ හැකි අතර ගෙම්මුල්ද විවිධාකාරයෙන් සකස් කරනු ඇත. ගෙවල්

Scanned by TapScanner

ඇතුළත විවිධ ආකාරයේ විසිතුරු භාණ්ඩ මහින් අලංකාර කැරේ. ලස්සන කිරීම සඳහා කරන්නක් ලෙස මෙය, හඳුන්වනු ලැබෙනත්, ඇත්ත වශයෙන් මෙය සමාන වන්නේ, වෙනත් ප්‍රදේශයන්ට හිමිකම් කියන සත්ව වර්ග තම ප්‍රදේශය ඔවුන්ට අයත් විවිධ ගන්ධ මහින් ලකුණු කිරීමටයි. දොරක නාම පුවරුවක් සවිකරන විට හෝ බිත්තියේ චිත්‍රයක් එල්ලන විට හෝ ඔබ කරන්නේ, බල්ලකු කකුල උස්සා මුත්‍රා කොට තම පෞද්ගලික ගන්ධය එම ප්‍රදේශයේ ඇති කිරීමට සමාන කටයුත්තකි. සමහර විශේෂ භාණ්ඩ එකතු කිරීමද, සමහරෙක් තම ප්‍රදේශ වෙන් කොට දැක්වීම සඳහා ප්‍රයෝජනයට ගනිති.

මෝටර් රථවල එල්ලා අති විවිධ කුඩා භාණ්ඩ හා අනිකුත් විශේෂ සංකේත ආදියත්, අලුත් කාර්යාලයට යන නිලධාරියකු තම මේසය මත හුරු පුරුදු භාණ්ඩ හෝ බිරිඳගේ ඡායාරූපයක් තැබීමත්, තම ප්‍රදේශය වෙන් කොට දැක්වීමේ අප තුළ දක්නට ඇති, මෙම සිරිත හේතු කොටගෙන සිදුවුණු ඒවා වෙයි. මෝටර් රථය හෝ කාර්යාලය නිවසේ උප ප්‍රදේශ වන බැවින්, ඒවා ද හුරු පුරුදු ප්‍රදේශ බවට පත්කර ගැනීම අවශ්‍ය වේ.

සමාජීය ප්‍රමුඛත්වය ලබාගැනීමේ දී චණ්ඩතාව ක්‍රියාකරන්නේ කෙසේද? යන ප්‍රශ්නය ගැන ඊළඟට අප විමසිලිමත් විය යුතුය. පුද්ගලයකුට අයිති ප්‍රදේශය මෙන්ම පුද්ගලයා ද ආරක්ෂා කළ යුතු වේ. ඔහුගේ සමාජීය තත්වය ඒ ආකාරයට පවත්වා ගැනීම හෝ හැකි නම් එය දියුණු කිරීම හෝ අවශ්‍යය. නමුත් මෙය කළ යුත්තේ ඔහුගේ සහයෝගිතා සම්බන්ධතාවන්ට හානි නොවන පරිද්දෙනි. මීට කලින් විස්තර කරන ලද චණ්ඩ හා අවනතභාවයේ සංඥාවන් වැදගත් වන්නේ මෙහිදීය. සමූපකාරී ස්වභාවය නිසා ඇඳුමේ හා හැසිරීමේ විශාල වෙනස්කම් ද දක්නට ලැබේ. කර පටිය ගැටගසන ආකාරය, සාක්කුවේ ලේන්සුව දමන ආකාරය හෝ කථාවේ ස්වභාවය ආදිය මගින් ඒ ඒ පුද්ගලයා ගේ සමාජීය තත්වය දැක්වේ. මේ ගැන හොඳ දැනීමක් ඇති කෙනෙකුට, තම සමාජයේ ඕනෑම පුද්ගලයකුගේ මෙම ලක්ෂණ දෙස බැලීමෙන්

ඔහුගේ තත්වය ගැන කිව හැකි නමුත්, වෙනත් සමාජයක එම ලක්ෂණවලින් කියැවෙන දේ අවබෝධ කර ගත නොහැක. ඇඳුමේ හා හැසිරීමේ මෙම සුළු වෙනස්කම් වෙන වෙනම ගත විට, හේතුවක් නැති දේ ලෙස පෙනුණද, සමාජයේ තම තත්වය රැක ගැනීමේ ක්‍රියාවේදී ඒවා ඉතාම වැදගත් දේ වෙයි.

අප පරිණාමය වී ඇත්තේ මිනිසුන් දස දහස් ගණනක් සමඟ ගුලි වී සිටීමට නොවේ. අපේ හැසිරීම් රටාව සකස් වී ඇත්තේ සියයක් පමණ වන කුඩා ගෝත්‍රික කණ්ඩායම් සඳහාය. එවැනි තත්වයක් යටතේ අනිකුත් වඳුරු හා වානර වර්ගවල මෙන්, කණ්ඩායමේ සෑම සාමාජිකයෙක්ම පෞද්ගලිකව අන් සියලු දෙනාම හඳුනති. මෙවැනි සමාජීය සංවිධානයක ප්‍රමුඛත්ව ධුරාවලිය පවත්වාගැනීම ඉතා පහසුය. නමුත් විශාල නාගරික සමාජවල තත්වය මීට වඩා බොහෝ වෙනස් වේ. වත්මන් නාගරිකයාට දිනපතාම දහස් ගණනක් නාඳුනන අමුත්තෝ හමුවෙති. මෙය අනිකුත් අග්‍රේශ වර්ගවල කිසිදාක දක්නට නොලැබුණු තත්වයකි. මේ සියලු දෙනා සමඟම සම්බන්ධකම් පවත්වා ගැනීම කළ හැක්කක් නොවේ. මේ ආකාරයට සමාජීය සම්බන්ධතාවන් ඇතිවීම වැළැක්වීම සඳහා ස්පර්ශ නොකිරීමේ, හැසිරීම් රටා දියුණු වෙයි. ලිංගික හැසිරීම් ගැන සාකච්ඡා කරද්දී මේ ගැන සඳහන් කෙළෙමි. නමුත් ඒවා ලිංගික සම්බන්ධතාවන් වැළැක්වීමට පමණක් සීමා නොවේ. ඒවා සියලුම සමාජීය සම්බන්ධතා පිළිබඳවද වේ. එකිනෙකා වෙත රවා බැලීම, අභිනයන් කිරීම, සංඥා කිරීම හෝ ශරීරික ස්පර්ශයන් ආදිය පරිස්සමින් වැළැක්වීමෙන්, ඉතා අධික ලෙස උත්තේජක සමාජීය පරිසරයක ජීවත්වීමට අපි පුරුදු වී ඇත්තෙමු. ස්පර්ශ නොකිරීමේ නීතිය කැඩූ විගසම අපි එය වැරදීමකින් සිදුවූවක් බව කියමින් සමාව අයැද සිටිමු.

මෙම ප්‍රති ස්පර්ශ හැසිරීම් රටාවන් නිසා අපේ වර්ගයාට යෝග්‍ය මට්ටමක, හිත මිතුරන් සංඛ්‍යාවක් පවත්වා ගැනීමට අපට හැකි වේ. නාගරිකයන් කාගේත්, හිතමිතුරන් හා නෑයන් සංඛ්‍යාව, දළ වශයෙන් කුඩා ගෝත්‍රික කණ්ඩායමකට සමාන වන බව ඔබට පෙනෙනු ඇත. වෙනත් වචනවලින්

Scanned by TapScanner

කිවහොත්, අපේ සමාජීය සම්බන්ධතාවන්හි පවා අප තවමත් පිළිපදින්නේ පැරණි මුතුන් මිත්තන් ගේ මුලික නීති බව පෙනේ.

වෘත්තීය වශයෙන් පෞද්ගලික සම්බන්ධතාවන් ඇතිකර ගත යුතු අය, අස්වාභාවික ලෙස තනිවූ හෝ ලැජ්ජාශීලි අය හා මානසික රෝගවලින් පෙළෙන අය ආදී වශයෙන් මෙම නීතිය අනුව ක්‍රියා නොකරන පුද්ගලයන් සිටින්නට පුළුවන. නමුත් මොවුහු සාමාන්‍ය නගරවාසීන්ගෙන්, සුළු ප්‍රමාණයක් පමණක් වෙති. අන් සියලු දෙනා තම එදිනෙදා කටයුතුවල යෙදෙන්නේ මහා ජනසන්නිපාතයක් තුළ බව පෙනෙනත්, ඇත්ත වශයෙන්ම එය ඉතා සංකීර්ණ ලෙස අතිශාදනය වූ හා පුට්ටු වූ ගෝත්‍රික කණ්ඩායම් සමූහයකි. ඔහුගේ පැරණි අතීතයේ සිට අද දක්වා නිරුවත් වානරයා වෙනස් වී ඇත්තේ කොතරම් සුළුවෙන් ද යන්න මෙයින් පැහැදිලි වෙයි.

6 ආහාර ගැනීම

නිරුවත් වානරයාගේ ආහාර ගැනීමේ හැසිරීම් රටාව බැලූ බැල්මට ඉතාම වෙනස් වන සුළු අවස්ථාවාදී හා සංස්කෘතික බලපෑම්වලට යටත්වූ, කටයුත්තක් බව පෙනේ. එහෙත් මෙහිදී ද, මුලික ජීව - විද්‍යාත්මක මූලධර්ම කිපයක් ක්‍රියාත්මක වන බව පෙනේ. ඔහුගේ පාරම්පරික පළතුරු ඇහිඳ කෑමේ රටාව, සමූපකාර ගොදුරු දඩයම් කිරීමක් බවට අනුවර්තනය වූ ආකාරය ගැන අපි කළින් සාකච්ඡා කළෙමු. ආහාර සෙවීම වඩා පුළුල් කාර්යයක් වූවා පමණක් නොව, හොඳින් සංවිධානය කළ යුතු දෙයක්ද විය. ගොදුරු මරා ගැනීමේ ආසාව, අනුභව කිරීමේ ආසාවෙන් අර්ධ වශයෙන්වත් ස්වාධීන වීම අවශ්‍ය විය. ආහාර පරිභෝජනය කිරීම සඳහා නිවාස නම් නියමිත මධ්‍යස්ථානයකට ගෙන එනු ලැබීය. ආහාර වේල විශාල වූවා පමණක් නොව, මේ සමහම ආහාර වේල් අතර කාල පරතරය ද දීර්ඝ විය. ආහාරයේ ඇති මස් කොටස බෙහෙවින් වැඩි විය. ආහාර ගබඩා කොට තැබීමටත්, බෙදා ගෙන කෑමටත් පුරුදු විය. පිරිමින් තම පවුල්වලට ආහාර සැපයිය යුතු විය. මළපහ කිරීමේ කටයුතු පාලනය කිරීමත්, ඒවා වානර ක්‍රමයෙන් වෙනස්වීමත් අවශ්‍ය විය. මෙම වෙනස්කම් හා පරිවර්තන ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සිදු වූ ඒවායි. මෑත කාලයේ දක්නට ලැබුණු අතිමහත් කාර්මික දියුණුව මැද වුවද අප තවමත් පැරණි සිරිත් විරිත්ම අනුගමනය කිරීම වැදගත් කරුණකි. ඒවා විවිධ මෝස්තර අනුව වෙනස් වන, සංස්කෘතික රටාවන්ට වඩා, බලවත් බව පෙනේ. මේවා සැලකිය යුතු තරමකට අපේ වර්ගයා තුළ ඉතා ගැඹුරට කා වැදුණු ජීව විද්‍යාත්මක ලක්ෂණ බව, අද අපේ හැසිරීම් රටාව දෙස බලන විට පෙනේ.

වත්මන් කෘෂිකාර්මික ක්‍රම හේතු කොටගෙන අද අපේ සමාජයේ වැඩිහිටි පිරිමින් බොහෝ දෙනෙකුට දඩයම් කිරීමේ වගකීමක් නැත. මේ වෙනුවට ඔවුන් කරන්නේ වැඩට යෑමයි. දඩයම් වෙනුවට වැඩ කිරීම යොදා ගෙන ඇතත්, මේ දෙකේම

Scanned by TapScanner

මූලික ලක්ෂණ සමාන වෙයි. මේ දෙකේදීම නිවසේ සිට දඩයම් බිමට නිත්‍යානුකූල ගමන් කිරීමක් දක්නට ලැබේ. එය බොහෝදුරට පුරුෂයාගේ කාර්යයක් වන අතර පිරිමි - පිරිමි සබඳතාවලටත් කණ්ඩායම් කටයුතු වලටත් ඒ නිසා අවස්ථාවක් සැලසේ. මේ දෙකේදීම උපාය මාර්ග සැළසුම් කිරීමටත් අනතුරුවලට භාජනය වීමටත් සිදුවේ. ව්‍යාජ දඩයම්කරුවාද නිවසට ආහාර ගෙන එයි.

ව්‍යාජ දඩයම්කරුවා විවේකයෙන් පසුවන විට ඔහු යන්නේ ගැහැණුන්ගෙන් තොර පිරිමි සමාජශාලා වෙතය. තරුණ පිරිමි කුඩා කාණ්ඩ ලෙස එක්රොක් වෙති. අධ්‍යාපනික සමාජ, සමාජීය සංවිධාන, වෘත්තීය සමිති, ක්‍රීඩා සංවිධාන, රහස් සමාජ ආදී සියල්ලේම පිරිමින් පමණක් එක් වීමේ ලක්ෂණය බොහෝ දුරට දක්නට ලැබේ. මේවායේ සාමාජිකයෝ ප්‍රබල ලෙස මෙම කණ්ඩායම්වලට පක්ෂපාතභාවයක් දක්වති. මේ සඳහා විශේෂ ඇඳුම් පැළඳුම්, ආයිත්තම් ආදියද භාවිත කරනු ලැබේ. මෙම කණ්ඩායම්වල ඒකලිංගිකතාව, සමලිංගිකතාව සමඟ පටලවා නොගත යුතුය. මූලික වශයෙන් එහි ලිංගික අංශයක් ඇත්තේම නැත. ප්‍රධාන වශයෙන් මෙහි දක්නට ලැබෙන්නේ, පැරණි සමූපකාර දඩයම් කණ්ඩායමේ පිරිමින් අතර වූ බන්ධනය පමණකි. මෙම මූලික පාරම්පරික හැඟීම් කොතරම් දුරට අපේ ජීවිතවලට බලපාන්නේ ද යන්න එයින් පැහැදිලි වේ. මෙවැනි බලපෑමක් නැත්නම් මෙම කටයුතු බොහොමයක්ම පවුල් ඒකකය තුළම කළ හැකි වේ.

මෙසේ පිරිමි තම වර්ගයේ කණ්ඩායම් සමඟ පමණක් සම්බන්ධතා පැවැත්වීම අපේ ස්ත්‍රී වර්ගයා නුරුස්සන නමුත්, ඔවුන් එසේ කළයුතු නැත. අප මේ දකින්නේ පැරණි පිරිමි දඩයම් කණ්ඩායමේ වර්තමාන අනුවාදයකි. ඇත්ත වශයෙන් මෙය නිරුවත් වානරයා ගේ දක්නට ඇති ගැහැණු පිරිමි බන්ධනය තරම්ම මූලික එකක් වන අතර මෙය පරිණාමය වූයේද ඒ සමඟයි. අපේ ප්‍රවේණි රටාවේ ප්‍රධාන වෙනසක් සිදුවන තුරු මෙම තත්වය අප සමඟ පවතිනු ඇත. අද

වැඩකිරීම, දඩයම් කිරීමේ තැන ගෙන ඇත්ත්, මෙම මූලික ආසාව සම්පූර්ණයෙන්ම තුරන් වී නැත. ආර්ථික වශයෙන් ප්‍රයෝජනයක් නොමැති අවස්ථාවන්හිදී පවා අපි සතුන් දඩයම් කිරීමේ යෙදෙමු. විනෝදයට දඩයමේ යෑම හා මසුන් මැරීම මෙම පැරණි දඩයම් කිරීමේ ආසාව වර්තමානයේ ප්‍රකාශ වන ආකාරය වේ.

වර්තමානයේ විනෝදය පිණිස කරන දඩකෙළිය (දඩයම් කටයුතු) සඳහා අප පොළඹවන්නේ, "ගොදුරු දඩයම් කිරීමේ ආසාව නොව, විරුද්ධවාදියා පරාජය කිරීමේ ආසාවය" යනුවෙන්ද අදහසක් ඉදිරිපත් වී ඇත. අද දඩයම් කරන සතා නියෝජනය කරන්නේ අපේ වර්ගයේම අප අකමැති සාමාජිකයෙකි. සමහර පුද්ගලයන් සම්බන්ධයෙන් නම් මෙය සත්‍යයක් වන නමුත්, මෙම ක්‍රියාදාමය දෙස සම්පූර්ණයෙන්ම බැලූ විට එය අර්ධ පැහැදිළි කිරීමක් පමණක් බව පෙනේ. ක්‍රමවත් ලෙස දඩයම් කිරීමේ දක්නට ඇති මූලික ලක්ෂණයක් නම්, ගොදුරට බේරී පලායෑමට සැහෙන ඉඩක් ලබාදීමයි. (ගොදුර අපේ වෛරක්කාර විරුද්ධවාදියෙක් නම්, ඔහුට එවැනි ඉඩක් ලබා දෙන්නේ ඇයි ?) දඩයම්කරුවන්ට මෙහිදී මැෂින් තුවක්කු හෝ ඊටත් වඩා බලවත් ආයුධ භාවිතා කොට, වඩා කාර්යක්ෂම ලෙස සතුන් මැරිය හැකි නමුත්, එසේ කිරීමක් දක්නට නොලැබේ. එවිට එය ක්‍රීඩාවක් නොවනු ඇත. මෙහිදී වඩා වැදගත් වන්නේ අභියෝගයයි. මෙහි දී අපට තෘප්තියක් ලැබෙන්නේ, එලවා යෑමේ සංකීර්ණත්වයත් සියුම් උපාය ආදී උපක්‍රමත් මගිනි.

දඩයම් කිරීමේ අත්‍යවශ්‍ය ලක්ෂණයක් නම්, එය විශාල සුදුවක් වීමයි. අද විවිධ ආකාරවලින් දක්නට ලැබෙන සුදුවලට අප තද ආශාවක් දැක්වීම පුදුමයට කරුණක් නොවේ. ආදී දඩයම් හා දඩ කෙළිය මෙන් එයද, ප්‍රධාන වශයෙන් පිරිමින්ට සීමා වූ කාර්යයක් වන අතර, ඒ පිළිබඳ විවිධ චාරිත්‍ර වාරිත්‍ර හා සමාජීය නීති දක්නට ලැබේ.

අපේ පන්ති ව්‍යුහය විමසිල්ලට ලක්කළ විට පෙනී යන

Scanned by TapScanner

එක් කරුණක් නම්, විනෝදයට දඩයම් කිරීම මෙන්ම, සුදු කෙළිය ඉහළ හා පහළ පන්තිවල කටයුත්තක් මිස, මධ්‍යම පන්තියේ කටයුත්තක් නොවන බවයි. දඩයම් කිරීමේ තැන වැඩ කිරීමට අයත් වී ඇති බව මම සඳහන් කෙළෙමි. නමුත් මෙයින් වඩාම ප්‍රයෝජන ලබාගෙන ඇත්තේ මධ්‍යම පන්තියයි. සමාන්‍ය පහළ පන්තියේ පිරිමියෙකුට කිරීමට සිදුවන වැඩ, දඩයම් කිරීමේ ආශාවන් තෘප්තිමත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. එය බොහෝ විට එකම දෙයක් නැවත නැවතත් කිරීමක් වන බැවින්, දඩයම් කරුවාට අත්‍යවශ්‍ය වන අභියෝගය, වාසනාව හෝ අනතුරු එහි දක්නට නැත. මෙම හේතුව නිසා පහළ පන්තිවල පිරිමින්ට හා ඉහළ පන්තිවල (වැඩ නොකරන) පිරිමින්ට දඩකෙළි මගින් තම ආශාවන් තෘප්තිමත් කර ගැනීමට සිදුවෙයි. මධ්‍යම පන්තිකයන් සාමාන්‍යයෙන් නියැළි ඇති වැඩ, දඩයම් කිරීම වෙනුවට යොදා ගත හැකි, එහි අංග ලක්ෂණ වලින් සමන්විත දේ බැවින්, ඔවුන්ට විනෝදයට දඩයමේ යෑමේ අවශ්‍යතාවක් නැත.

දඩයම් කිරීම මඳකට අමතක කොට සාමාන්‍ය ආහාර ගැනීමේ රටාවේ ඊළඟ කාර්යයට හැරෙන අපට හමු වෙන්නේ, මැරීමේ අවස්ථාවයි. විනෝද දඩයමේ දී මැරීමේ ක්‍රියාව ඒ ආකාරයට දක්නට ඇති නමුත්, වැඩ කිරීමේ හා සුදු කෙළියේ දී එය සංකේතාත්මක ජයග්‍රාහී අවස්ථාවක් බවට පත්වේ. මෙහි ශරීරික ක්‍රියාවේ ඇති සාහසික බව දක්නට නොලැබේ. මේ නිසා අපේ වර්තමාන ක්‍රමයේ දී ගොදුරු මැරීමේ ආශාව බොහෝ දුරට අනුවර්තනය වී නිබේ. තරුණ ළමයින්ගේ ක්‍රීඩාවල එය නිතර දැකිය හැකි වුවත්, වැඩිහිටි ලෝකයේ එය ප්‍රබල සංස්කෘතික යටපත් කිරීමකට භාජනය වී ඇත. මෙසේ යටපත් කිරීමට අසුවී නැත්තේ අවස්ථා දෙකක් පමණි. මෙයින් එකක්, විනෝද දඩයම (දඩ කෙළිය) වන අතර අනික ගොන් පොරය වේ. දිනපතා දහස් ගණන් සතුන් මස් පිණිස මරණ නමුත්, එය කරන්නේ අප්‍රසිද්ධියේය.

මෙවැනි අවස්ථාවන් හැර අනිකුත් අවස්ථාවන්හි සතුන්ට හිංසා කිරීම තහනම් වන අතර, එවැනි කටයුතුවලට

දඬුවම් ද පමුණුවනු ලැබේ. නමුත් හැම විටම තත්වය මෙය නොවීය. මීට අවුරුදු සිය ගණනකට පෙර ගොදුරට වදදීම හා මැරීම ප්‍රසිද්ධියේ විනෝදය සපයන ක්‍රමයක් විය. මේ නිසා පුද්ගලයන් ගේ සංවේදීතාව මොට විය හැකි බව බොහෝ කලක සිට පිළිගැණුනි. අපේ තදබද වුත්, සංකීර්ණ වුත් සමාජයේ මෙය අනතුරක් විය හැකියි. ඒ මන්ද යත් ප්‍රාදේශීය හිමිකම හා ප්‍රමුඛතා සීමාවන් ඉවසිය නොහැකි තත්වයකට පත්වී ඉතාම අස්වාභාවික මිලේච්ඡ ආකාරයේ ප්‍රචණ්ඩත්වයකින් එය කෙළවර විය හැකි බැවිනි.

අප මෙතෙක් කල් සාකච්ඡා කර ඇත්තේ ආහාර ගැනීමේ ක්‍රියාවලියේ මුල් අවස්ථා හා ඒවායේ නොයෙකුත් අංශ සම්බන්ධවයි. දඩයමෙන් හා මැරීමෙන් පසුව එන්නේ භෝජනයයි. අග්‍රේශයන් ලෙස අප කළ යුත්තේ; තොර තෝංචියක් නැතිව දිගටම ටිකින් ටික කෑමයි. අපේ මාංශ භක්ෂක පරිණාමය මෙම ක්‍රමය වෙනස් කොට ඇත. සාමාන්‍ය මාංශභක්ෂකයා ගේ කෑම, විශාල ආහාර වේල් කීපයකට සීමා වේ. අප විසින්ද අනුගමනය කැරෙන්නේ මෙම රටාවයි. මෙවැන්නක් ඇතිවීමට තුඩු දුන් මුල් දඩයම්කාරී අවශ්‍යතාවන් නැතිවීමෙන් පසුවත් මෙම ක්‍රමය අනුගමනය කරනු දක්නට තිබේ. අපට අවශ්‍ය නම් පැරණි අග්‍රේශ ක්‍රමයට ආපසු යෑම අද ඉතා පහසු දෙයකි. නමුත් අපි තවමත් ගොදුරු දඩයම් කර ආහාරයට ගන්නා සත්ව වර්ගයක් මෙන් නියමිත භෝජන වේලාවකට ඇළී සිටිමු. අද ලෝකයේ දක්නට ලැබෙන නිරුවත් වානරයන් කෝටි ගණනකින් අනිකුත් අග්‍රේශයන් මෙන් නිතර නිතර කෑම ගැනීමට පුරුදු වී ඇත්තේ ඉතා ටික දෙනෙක් පමණක් වෙයි. කොතරම් නිබුණත් තුන් වරකට වඩා අපි ආහාර නොගනිමු. බොහෝ දෙනෙකුට මෙය ආහාර වේල් එකක් හෝ දෙකක් පමණක් වෙයි. මෙය සංස්කෘතික වශයෙන් කාගේත්, පහසුව තකා ඇති වූවක් ලෙස තර්ක කළ හැකි නමුත්, එය පිළිගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නැත. අපට දන් ලැබී ඇති ආහාර සැපයීමේ සංකීර්ණ සංවිධාන ක්‍රම නිසා, අවශ්‍ය නම් දවස පුරා කුඩා ආහාර වේල් ගණනාවක් කෑ හැකි ආකාරයේ ක්‍රමයක් සකස් කිරීම අපහසු නොවේ. සංස්කෘතික

Scanned by TapScanner

රටාව ඒ ආකාරයට වෙනස් වුවහොත්, අපේ කාර්යක්ෂමතාවට හානියක් නොවී, ආහාර ගැනීමේ ක්‍රියාවලිය සකස් කළ හැකි වෙයි. මේ නිසා දැන් දක්නට ඇති ප්‍රධාන ආහාර වේල් හේතුවෙන් අනිකුත් කටයුතු ඇනහිටීම ද නතර කළ හැකි වෙයි. නමුත් පැරණි විලෝපීය අතීතය හේතු කොටගෙන මෙවැනි ක්‍රමයකින් අපේ මූලික ජීවමය අවශ්‍යතාවන් තෘප්තිමත් නොවනු ඇත.

අප ආහාර රත්කොට උණුවෙන්ම ආහාරයට ගන්නේ ඇයිද යන ප්‍රශ්නය ගැන සැළකිල්ල යොමු කිරීම ද මෙහිදී අදාළ වනු ඇත. මෙය තුන් ආකාරයකට පැහැදිළි කොට තිබේ. එක් අදහසක් නම්, අපට මේ මහින් ගොදුරේ උණුසුම ලබාගත හැකි බවයි. තවදුරටත් අමු මස් නොකතත්, අප ඒවා කෑමට ගන්නේ අනිකුත් මාංශභක්ෂක සත්ව වර්ග, මස් ආහාරයට ගන්නා උෂ්ණත්වයට සමාන තත්වයකිනි. ඔවුන්ගේ ආහාරය උණුසුම් වන්නේ එය තවමත් සීතල නොවී ඇති බැවිනි. අපේ ආහාරය උණුසුම් වන්නේ අප එය නැවතත් රත්කොට ඇති බැවිනි. තවත් අදහසක් නම්, අපේ දත් ඉතා දුර්වල බැවින්, මස් තම්බා බුරුල් කර ගැනීම අවශ්‍යව ඇති බවයි. නමුත් උණුවෙන් අප එය ආහාරයට ගන්නේ ඇයිද යන්න හෝ මෙලෙක් නොකළ යුතු ආහාර වර්ග අප විසින් රත් කරන්නේ ඇයි ද යන්න හෝ මෙයින් පැහැදිළි නොකෙරේ. තුන්වැනි අදහස නම්, ආහාරයේ උෂ්ණත්වය වැඩි කිරීම මගින් අප එහි රසය වැඩිකරන බවයි. රසවත් ද්‍රව්‍ය ගණනාවක් ආහාරයට එක් කිරීමෙන් එය තවදුරටත් දියුණු කළ හැකි වේ. මෙය ඇත්ත වශයෙන්ම අප මෑතදී පුරුදු වූ මාංශභක්ෂක ලක්ෂණයට නොව වඩා පැරණි අග්‍රේශ අතීතයට සම්බන්ධ වන්නකි. සාමාන්‍ය අග්‍රේශයා ගේ ආහාරය මාංශභක්ෂකයෙකු ගේ ආහාරයට වඩා විවිධ රසවලින් යුක්ත වුවකි. මාංශභක්ෂකයා දඩයම් කොට මරා ගන්නා ගොදුර කා දමන්නේ ඉතා රළු ආකාරයෙනි. නමුත් වඳුරෝ ද වානරයෝ ද ඔවුන්ගේ ආහාරයේ විවිධ සියුම් රසවලට වඩා සංවේදී බවක් දක්වති. ඔවුහු එක් රසයකින් සෑහීමට පත් නොවී විවිධ රස සොයා යති. ඇත්ත වශයෙන් අපේ ආහාරවලට කුළුබඩු දැමීමෙන් හා

රත් කිරීමෙන් අප ප්‍රදර්ශනය කරන්නේ පහසුවෙන් සෑහීමට පත් නොවන පැරණි අග්‍රේශ ලක්ෂණයයි. සමහර විටෙක අප පූර්ණ මාංශභක්ෂකයන් බවට පත්වීම වැළැක්වූ එක් හේතුවක් මෙය වීමට ද පුළුවන. රස පිළිබඳව ප්‍රශ්නය පැන නැඟී ඇති බැවින්, මෙම සංඥා ලබා ගන්නා ආකාරය පිළිබඳව ඇති වැරදි අදහසක් මෙහිදී පැහැදිළි කළ යුතුය. අපට මේ ආකාරයට රස දැනෙන්නේ ඇයි? අපේ දිවේ මතුපිට පිටිකා යනුවෙන් හඳුන්වන ප්‍රසරයන් ගණනාවක් දක්නට ලැබේ. රසාංකුර ඇත්තේ මෙම පිටිකාවලය. අපේ දිවේ මෙවැනි රසාංකුර 10,000 ක් පමණ දක්නට ලැබේ. නමුත් වයස්ගත වීමත් සමඟ මේවා දුර්වල වන අතර සංඛ්‍යාවෙන්ද අඩුවෙයි. පුදුමයකට මෙන් අපට, ප්‍රතිචාර දැක්විය හැක්කේ මූලික රස වර්ග හතරකට පමණි. ඒවා නම් ඇඹුල්, ලුණු, තිත්ත හා පැණි රස වර්ග හතරට පමණි. යම්කිසි ආහාරයක් අපේ දිව මත තැබූ විට අපේ දිවට දැනෙන්නේ. එහි ඇති මෙම රස හතරේ සංකලනයකි. ඒ ආහාරයේ මූලික රසය වන්නේ මෙම මිශ්‍රණයයි. දිවේ එක් එක් ප්‍රදේශ, එක් එක රසවලට වඩා ප්‍රබල දෙස සංවේදී බවක් දක්වන බව පෙනේ. දිවේ ඉදිරි කෙළවර ලුණු හා පැණි රසයට වඩා සංවේදී වන අතර දිවේ පැති ඇඹුල් රසට ද, පසු කෙළවර තිත්ත රසට ද ප්‍රතිචාර දක්වයි. දියර ආහාරයක වයනය හා උෂ්ණත්වය ද ගැන තීරණයකට එළඹිය හැකි නමුත්, ඉන් එහා කළ හැකි දෙයක් නැත. අපි ඉතා සංවේදී ලෙස ප්‍රතිචාර දක්වන අන් සියළුම රස, ගන්ධ මගින් ලබා ගන්නා ඒවා වේ. ආහාරයේ ගන්ධය නාස් කුහරයට විසරණය වී ආඝ්‍රාණ පටලය දක්වා ගමන් කරයි. යම්කිසි ආහාරයක් රසවත් යයි අප කියන විට ඇත්ත වශයෙන්ම අප කියන්නේ, එය රසවත් බව හා රසවත් ගන්ධයකින් යුක්ත බවයි. තද ප්‍රතිශ්‍යාවෙන් පෙළෙන විට අපේ ආඝ්‍රාණ සංවේදය ඉතා දුර්වල බැවින්, ආහාර නීරසය යි අපි කියමු. ඇත්ත වශයෙන්ම එහි රස වෙනදා මෙන්ම දැනෙන නමුත්, අපට නොදැනෙන්නේ එහි සුවඳ පමණි.

රස ගැන කථා කරන විට විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කරුණක් තිබේ. එනම්, පැණි රසට අප දක්වන අති

Scanned by TapScanner

විශාල කැමැත්තයි. මෙය සාමාන්‍ය මාංශභක්ෂකයාට තුනුරු දෙයක් වුවද අග්‍රේශයන් තුළ දක්නට ඇති සිරිතක් වේ. අග්‍රේශයන් ගේ ස්වාභාවික ආහාරය වන පළතුරු, පැසී ඉදී පරිභෝජනයට සුදුසු ආකාරයට පත්වන විට, ඒවා පැණිරස වේ. වඳුරෝත් වානරයෝත් මෙම රසයට ඉතා ප්‍රිය කරති. අනිකුත් අග්‍රේශයන් මෙන් අපිද මෙම රසයට ඉතා කැමැත්තෙමු. ප්‍රබල ලෙස දියුණු වූ මස් කෑමේ සිරිත තුළින් වුවද අපේ පාරම්පරික වානර සිරිත් ඉදිරියට එයි. පැණිරස දේ පමණක් විකුණන කඩ සාප්පු ඇති නමුත්, ඇඹුල් දේ පමණක් විකුණන වෙළඳ හල් නැත. බොහෝ විට විවිධ රසයෙන් යුක්ත ආහාරයන් ගැනීමෙන් පසුව අප එය අවසන් කරන්නේ පැණිරස දෙයක් කෑමෙනි. ප්‍රධාන ආහාර වේල් අතර මැද සුළු ආහාරයක් ගන්නා විට (නිතර නිතර ආහාර ගැනීමේ පැරණි වානර සිරිත) අප ඒ සඳහා බොහෝ විට තෝරා ගන්නේද වොකලට් අයිස්ක්‍රීම් වැනි පැණි රස දෙයකි.

මෙම නැමියාව කොතරම් බලවත් ද යත්, මේ නිසා අප විවිධ දුෂ්කරතාවන්ටද පත්විය හැකියි. ආහාරයකට අප ඇදී යන කරුණු දෙකක් තිබේ. ඒවා නම්, එහි පෝෂ්‍යදායක ගුණය හා රසවත් බවයි. ස්වභාවික ආහාරවල මේ දෙකම ඇති නමුත්, කෘත්‍රිම වශයෙන් නිපදවන ආහාරවල මෙම ලක්ෂණ දෙක වෙන් කළ හැකි බැවින්, එය ඉතා අනතුරුදායක විය හැකියි. පෝෂ්‍යදායී ගුණයෙන් කිසිම වටිනාකමක් නැති ආහාර, කෘත්‍රිම පැණිරස කාරක එක් කිරීමෙන් ඉතා ආකර්ෂණීය ලෙස සකස් කිරීමට පුළුවන. අපේ පැරණි වානර ආශාවන් නිසා මේවා ප්‍රමාණයට වඩා කෑම, හේතු කොට ගෙන අන්කිසි දෙයක් කෑ නොහැකි වීමෙන් අපේ ආහාරයේ සමබර බව නැතිවීමට ඉඩ තිබේ. වැඩෙන ළමයින් සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම වැදගත් වේ. වැඩිවියට පත්වීමත් සමඟ පැණිරස හා පළතුරු සුවඳට ඇති කැමැත්ත අඩුවන බව මම කලින් පරිච්ඡේදයක සඳහන් කළෙමි. පැණි රසට බාලයන් තුළ ඇති කැමැත්ත බොහෝ විට අනවශ්‍ය ලෙස වාණිජමය වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ.

වැඩිහිටියෝද මේ හා සමාන තවත් අනතුරකට මුහුණ පා ඇත්තාහ. ඔවුන්ගේ ආහාරය ස්වාභාවිකව දක්නට ඇති ආහාරවලට වඩා රසවත් ලෙස පිළියෙළ කරන බැවින්, ආහාර ගැනීමේ ප්‍රතිචාරය ඉතා අධික ලෙස උත්තේජනය වෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ සෞඛ්‍යයට එතරම් හිතකර නොවූ, බර වැඩි තත්වයකි. මෙය සිදුවීම වැළැක්වීම සඳහා විවිධ ආකාරයේ ආහාර සීමා කිරීමේ ක්‍රම සොයාගෙන තිබේ. ඇත්ත වශයෙන්ම මෙම ප්‍රශ්නයට ඇත්තේ එක පිළිතුරක් පමණි. එනම් අඩුවෙන් කෑමයි. මෙය ඉතා සරල දෙයක් ලෙස පෙනුනත්, උපරිම රස සංඥාවන් ගෙන් පිරුණු ලෝකයක මෙය සැළකිය යුතු කාලයක් කළ හැක්කේ නොවේ. බර වැඩි පුද්ගලයාට තවත් කරදරයකට මුහුණ පෑමට සිදුවේ. සිතේ කළබලකාරී අවස්ථාවලදී අපි අනවශ්‍ය බීම වර්ග හා ආහාර ද්‍රව්‍ය කා දමමු. මේවා නිසා සිතේ ඇති කැළඹීම අඩුවන නමුත්, එය තවත් බර වැඩිවීමට හේතු වේ. මෙවැනි කෙනෙකුට ශරීරය සිහින් කිරීමේ විවිධ ක්‍රම වලින් සෑහෙන ප්‍රතිඵලයක් ලැබිය හැක්කේ සිතේ නොසන්සුන් බව නැතිකරන හැසිරීම් රටාවේ වෙනස්කම් ද සිදුකළ හොත් පමණි. "ඛුවින් ගම්" වල කාර්යය මේ අතින් ඉතා වැදගත් වේ. එය සිතේ නොසන්සුන් බව නැති කිරීමට උදව් කරන අතර ශරීරයට ගන්නා ආහාර ප්‍රමාණය වැඩි නොකරන ද්‍රව්‍යයක් ද වෙයි.

වර්තමාන නිරුවත් වානරයන් විසින් ආහාරයට ගන්නා කෑම ද්‍රව්‍ය දෙස බලන අපට පෙනී යන්නේ, ඒවා ඉතා විශාල පරාසයක විහිදෙන බවයි. සාමාන්‍යයෙන් අග්‍රේශයන්ගේ ආහාර වර්ග ගණන මාංශභක්ෂකයන්ට වඩා වැඩිය. ජපන් වඳුරන් වර්ගයක් පිළිබඳව කරන ලද පරීක්ෂණවලින් පෙනී ගොස් ඇත්තේ, ඔවුන් පැලෑටි වර්ග 117 ක දළු, කොළ, ගෙඩි, මල්, පොතු හා අල වර්ගවලට අමතරව විවිධ කුහුඹුවන්, සමනළයන්, කුරුමිණියන් හා බිත්තර වර්ග රාශියක් ආහාරයට ගන්නා බවයි. සාමාන්‍ය මාංශභක්ෂකයකු ගේ ආහාරය පමණට වඩා පෝෂ්‍යදායී වන නමුත්, එය ඒකාකාර වේ.

Scanned by TapScanner

අප දඩයම් කරුවන් වීමත් සමඟ, අපට දෙපැත්තෙන්ම ප්‍රයෝජනවත් ලක්ෂණ ලැබුණි. පැරණි සර්වභක්ෂක ආහාරය අත් නොහැර අපි එයට මස් එකතු කළෙමු. මෑතක සිට, එනම් පසුගිය අවුරුදු දහස් ගණනක සිට, ආහාර ලබා ගැනීමේ ක්‍රම බෙහෙවින් දියුණු වී ඇතත්, මූලික තත්වය නොවෙනස්ව පවතී. මුල් කෘෂිකාර්මික ප්‍රයත්නයන් "මිශ්‍ර ගොවිපලවල්" ලෙස හැඳින්විය හැක. ගෘහාශ්‍රිතව සත්වයන් ඇතිකිරීම පැළැටි වර්ග වැවීමත් සමඟ එකවිට දියුණු විය. සත්ව හා ශාක ලෝකය පාලනය කිරීමට අපට ලැබී ඇති හැකියාවන් මැද වුවද අපි මෙම අන්ත දෙකම අත්හැර දමා ඇත්තෙමු. මෙයින් එක් පැත්තකට හෝ යෑම නතර වූයේ කුමක් නිසාද? මෙයට පිළිතුරු ලෙස දැක්විය හැක්කේ, වැඩිවන ජනගහනයත් සමඟ අප මස් පමණක් කෑමට පුරුදු වූයේ නම්, ප්‍රමාණය පිළිබඳ දුෂ්කරතාවද, ශාක පමණක් කෑමට පුරුදු වූයේ නම්, ගුණය පිළිබඳ ප්‍රශ්නය ද පැන නගින්නට ඉඩ තිබූ බවයි.

"අපේ මුල් අග්‍රේශ මුතුන් මිත්තන් ගේ ආහාරයේ වූයේ, මාංශ ඉතා සුළු ප්‍රමාණයක් බැවින්, අපට ද එවැනි ආහාරයක් ප්‍රමාණයත්ය" යනුවෙන් කිසිවෙකුට තර්ක කරන්නට පුළුවන. අප මාංශභක්ෂකයන් වූයේ පරිසර තත්වයන් හේතු කොට ගෙනය. භෝග වගා කිරීමේ ක්‍රම ඉතා හොඳින් දියුණු කොට, පරිසරය යටත්කර ගෙන ඇති අද, අපට නැවතත් පැරණි ආහාරයම අනුභවයට ගැනීමට පුළුවන. මෙය එළවලු පමණක් ආහාරයට ගන්නා අයගේ මතය වුවත් එය එතරම් ප්‍රචලිතව දක්නට නොලැබේ. මස් කෑමේ ආශාව ඉතා තදින් මුල් බැස ඇති බවක් පෙනේ. එළවලු පමණක් කන අය ද එවැනි ආහාරයක් තෝරා ගැනීමට හේතුවක් ලෙස දක්වන්නේ එවැනි ආහාරයකට ඇති කැමැත්ත නොවීම මෙහිදී වැදගත් වේ. ඔවුන් එය පැහැදිළි කරන්නේ විවිධ අසංගත දාර්ශනික මත හා සාවද්‍ය වෛද්‍ය විද්‍යාත්මක අදහස් ඉදිරිපත් කිරීමෙනි. එළවළු වර්ග පමණක් කෑමට තීරණය කර ඇති අය සමබර ආහාරයක් ලබා ගන්නේ අග්‍රේශයන් මෙන් විවිධ පැළැටි වර්ග රාශියක් අනුභව කිරීමෙනි. නමුත් බොහෝ රටවලට මස් රහිත

ආහාරයකට පුරුදුවීමට සිදු වී ඇත්තේ, ආර්ථික අවශ්‍යතාවයන් හේතු කොට ගෙනයි. විශාල පරිමාණයේ කෘෂිකාර්මික කටයුතුවල දියුණුව, ජනගහනය පැතිරීමට හේතුවක් වී ඇති නමුත්, මූලික ධාන්‍ය වර්ග කීපයක් පමණක් මත යැපෙන්නට වීම නිසා අපේ වර්ගයා ඉතා භයානක මන්දපෝෂණයකට මුහුණ පා තිබේ. එවැනි පුද්ගලයන්ට ඉතා බහුල ලෙස වර්ගයා බෝකළ හැකි නමුත්, දරුවන් ශාරීරික වශයෙන් දුර්වල වෙනු ඇත. සංස්කෘතික වශයෙන් දියුණු කරන ලද ආයුධ හේතු කොට ගෙන, මහා විනාශයක් සිදුවිය හැකිවාක් මෙන්ම, සංස්කෘතික වශයෙන් දියුණු වූ ආහාර සපයා ගැනීමේ ක්‍රම නිසා, අපි පෝෂණය අතින් මහා අනතුරකට මුහුණ පා සිටිමු.

මේ ආකාරයට අත්‍යවශ්‍ය සමබර ආහාරයක් නොලැබෙන සමාජවලට නොමැරී පැවතිය හැකි වුවත්, ගුණාත්මක වශයෙන් දියුණු වීමට නම්, ප්‍රෝටීන්, ඛනිජ හා විටමින් හිඟය නිසා ඇතිවන ප්‍රතිඵල යටපත් කිරීමට ඔවුන් කටයුතු කළයුතු වේ. අද දක්නට ලැබෙන සෞඛ්‍ය සම්පන්න මෙන්ම දියුණු සමාජයන් සියල්ලකම ආහාරයේ, මාංශ, ශාක සමබරතාව පවත්වාගෙන ඇති අතර, පෝෂ්‍යදායක දේ ලබා ගැනීමේ ක්‍රම කොතරම් දියුණු වී තිබුණත්, දියුණු නිරුවත් වානරයාගේ අද ආහාරය, ඔහුගේ පැරණි දඩයක්කාර මුතුන් මිත්තන්ගේ ආහාරයම වෙයි. මෙහිදී සිදුවී ඇත්තේ සත්‍ය විපර්යාසයක් නොව, දෘශ්‍යමය විපර්යාසයක් පමණක් බව පෙනේ.

Scanned by TapScanner

7 සැප පහසුව

පරිසරය සමඟ කෙළින්ම ගැටෙන ස්ථානය වන, සත්වයකු ගේ ශරීර මතුපිට, ජීවන කාලය තුළ ඉතා රළු අවස්ථාවන්ට මුහුණ දෙයි. මේ සියල්ලටම ඔරොත්තු දිය හැකිව ඇත්තේ, ගෙවීයන පටක වෙනුවට, පටක නිපදවීමේ පුදුමාකාර ක්‍රමයත්, ශරීරය මතුපිට පිරිසිදුව තබා ගැනීමට දියුණු කොට ඇති විශේෂ ක්‍රියාවලියත්, හේතු කොට ගෙනය. ආහාර ගැනීම, සටන් කිරීම හා සහවාසය ආදී හැසිරීම් රටාවන් සමඟ සලකන විට, මෙම පිරිසිදු කිරීමේ කටයුතු ඉතා සුළු, නොවැදගත් ඒවා යයි අපට සිතෙන නමුත්, ඒවායින් තොරව ශරීරයට නියම ලෙස ක්‍රියාකළ නොහැක. කුඩා පක්ෂීන් වැනි සමහර සතුන්ට පිහාටු කළඹ හොඳින් තබා ගැනීම, ජීවිතයත්, මරණයත් අතර ප්‍රශ්නයකි. පිහාටුවල කුණු ගෑවී අපිරිසිදු වුවහොත්, සතුරන්ගෙන් බේරී පලායෑමට අවශ්‍ය තරම් වේගයෙන් පියාසර කිරීමට ඔවුන්ට නොහැකි වේ. මේ නිසා පිහාටු නෑවීමට, පිරීමට හා තෙල් ගැල්වීමට පැය ගණන් ගත කරන පක්ෂිහු මෙය ඉතා දීර්ඝවූත්, සංකීර්ණවූත් පිළිවෙතකට සිදු කරති. ක්ෂීරපායීන්ගේ මෙම කටයුතු සංකීර්ණත්වයෙන් මදක් අඩුවන නමුත්, ඔවුහු ද ලෙව කෑම, හැඩ වැඩ දැමීම, කැසිම සහ ඇතිල්ලීම සඳහා බොහෝ කාලයක් ගත කරති. සත්වයා උණුසුම්ව තබාගැනීම සඳහා පිහාටු මෙන්ම රෝම පිරිසිදුව තබාගත යුතු වේ. එහි කුණු ගෑවී අපවිත්‍ර වුවහොත් ලෙඩ රෝග වැළඳීම පහසු වෙයි. සමේ සිටින පරපෝෂිතයෝ ද හැකි තරම් දුරට අඩු කළ යුතුවේ. අග්‍රේශයත් සම්බන්ධයෙන්ද මෙය සත්‍ය වෙයි.

වනයේ ජීවත්වන වඳුරෝ හා වානරයෝ එක්තරා පිළිවෙලකට රෝම පිරිමදිමින්, වියලුණු සම් කැබලි හා බාහිර ද්‍රව්‍ය ඉවත් කරමින්, තම තමන් පිරිසිදු කර ගැනීමේ කටයුතුවල නිරත වෙති. මේවා කටට දමා කෑම හෝ අඩුම වශයෙන් රස බැලීමක් දක්නට ලැබේ. මෙම පිරිසිදු කර ගැනීමේ කටයුතුවලට සෑහෙන වේලාවක් ගත කරන අතර, සත්වයා ඒ

පිළිබඳව ඉතා තදින් සිත යොමුකර ඇති බවක් පෙන්වයි. මෙම කටයුතු මැද හදිසියේ එක් එක් තැන් කසාගැනීම ආදිය දක්නට ලැබේ. බොහෝ ක්ෂීරපායීන් ඇඟ කසාගැනීම සඳහා යොදා ගන්නේ පිටුපස කකුල් පමණක් වුවද වානරයකුට, ඉදිරි හා පිටුපස ගාත්‍රා දෙකම ඒ සඳහා යොදා ගතහැක. ඔවුන්ගේ ඉදිරි ගාත්‍රා මේ සඳහා හොඳින් හැඩගැසී තිබේ. වානරයා ශරීරයේ පිටුපස හා දත් හැරෙන්නට අන් සියලුම කොටස් පිරිසිදු කිරීම සඳහා දැතම යොදා ගනිති. හිස පිරිසිදු කිරීමේදී දැතම ප්‍රයෝජනයට ගත හැකි නමුත්, ඔවුන්ට අපට මෙන් කැඩපත් නොමැති බැවින්, එය කළ යුතුව ඇත්තේ, කරන්නේ කුමක්දැයි නොදැන අනුමාන වශයෙනි. මේ නිසා හිස පිටුපස හා දැත්, ශරීරයේ ඉතිරි කොටස් තරම් ලක්ෂණට පිරිසිදු කොට තබා ගැනීමට නම්, ඒ සඳහා විශේෂයෙන් යමක් කළ යුතුවිය.

මෙම ප්‍රශ්නයට විසඳුම වී ඇත්තේ, සමාජීය වශයෙන් එකිනෙකා පිරිසිදුකර ගැනීමයි. මේ සඳහා මිත්‍ර ලීලාවෙන් එකිනෙකාට ආධාර කරන ක්‍රමයක් දියුණු වී තිබේ. බොහෝ පක්ෂීන් හා ක්ෂීරපායි වර්ගවල මෙවැන්නක් දැකිය හැකි අතර උසස් අග්‍රේශයන් ගේ පිරිසිදු කිරීමේ විශේෂ ආරාධනාත්මක සංඥාවෝ දක්නට ඇත්තාහ. එක් වඳුරෙකුට තවත් වඳුරෙකු ගේ ශරීරය පිරිසිදු කිරීමට අවශ්‍ය වූ විට, ඌ ඒ බව දන්වා සිටින්නේ තම මුහුණ එක්තරා ආකාරයකට සකස් කිරීමෙනි. ඉක්මණින් තොල් ලෙවකන ඌ ඒ අතර දිවද එළියට දමයි. අනිත් වඳුරන් මෙය පිළිගන්නා බව පෙන්වන්නේ නිස්කලංකව සිට ශරීරයේ යම් කොටසක් පිරිසිදු කිරීම සඳහා ඉදිරිපත් කිරීමෙනි. මා කලින් විස්තර කළ පරිදි මෙම තොල් ලෙවකෑම පරිණාමය වී ඇත්තේ රෝම පිරිසිදු කිරීමේ දී දක්නට තිබූ කුණු කැබලි රස බැලීමේ ක්‍රියාවෙනි. මෙය වේගවත් කිරීමෙන් හා ඒවා රිද්මයානුකූලව කිරීමෙන්, එය නොවරදින දෘෂ්ටි සංඥාවක් බවට පරිවර්තනය කොට තිබේ. සමාජීය වශයෙන් පිරිසිදු කර ගැනීමේ ක්‍රියාවලිය, සමූපකාර හා චණ්ඩ නොවන කටයුත්තක් බැවින්, තොල් ලෙව කෑමේ රටාව මිත්‍ර සංඥාවක් වී තිබේ. සතුන් දෙදෙනෙකුට ඔවුන් අතර ඇති මිත්‍රත්වය වැඩිකර ගැනීමට අවශ්‍ය නම්, නැවත නැවතත් එකිනෙකා

Scanned by TapScanner

පිරිසිදු කිරීමෙන් එය කළ හැකි වේ. ඇත්ත වශයෙන් අද දක්නට ලැබෙන අන්‍යෝන්‍ය පිරිසිදු කිරීමේ කටයුතු හා ශරීරයේ ඇති කුණු ප්‍රමාණය අතර එතරම් සම්බන්ධතාවක් දක්නට නොලැබේ. සමාජීය පිරිසිදු කිරීමේ කටයුතු දැන් මුල් උත්තේජයෙන් සම්පූර්ණයෙන්ම ස්වාධීන වී ඇත. අද ඒවායේ පරමාර්ථය අලංකාරයට වඩා සමාජීය අවශ්‍යතාවක් බව පෙනේ. සතුන් දෙදෙනෙකුට සහයෝගයෙන් එකිනෙකාට ආසන්නව සිටීමට මේ නිසා හැකි වීමෙන්, ජනාවාසයක විවිධ පුද්ගලයන් අතර ඇති බැම්ම ශක්තිමත් කිරීමට එය ආධාර වේ.

මෙම මිත්‍ර සංඥා පද්ධතියෙන් ප්‍රති චේතනාවලික උපක්‍රම දෙකක් දියුණු වී ඇත. මෙයින් එකක් සැනසීම වන අතර අනික ධෛර්යමත් කිරීම හා බිය නැති කිරීම පිළිබඳව වේ. දුර්වල සතෙකු බලවත් සතෙකුට බිය වුවහොත් තොල් ලෙව කෑමේ ආරාධනාත්මක සංඥාවෙන් හා ඉන්පසුව උගේ රෝම පිරිමැදීමෙන් ඒ බිය නැති කිරීමට ප්‍රබල සතාට හැකි වේ. මේ නිසා ප්‍රබල සත්වයාගේ චණ්ඩ බව ද අඩුවෙයි. තොල් ලෙව කෑම ආක්‍රමණකාරී නොවන බව දැක්වෙන සංඥාවකි. අග්‍රේශයන් ගේ මෙම බිය නැති කිරීමේ සංඥාව දක්නට ලැබෙන්නේ ඉතා අඩුවෙන් වීමට හේතු වී ඇත්තේ අග්‍රේශ ජීවිතයට එය අවශ්‍ය වන්නේ අඩුවෙන් වීමයි. දුර්වලයා ළඟ ඇති, තමන්ට අවශ්‍ය වන ඕනෑම දෙයක්, ප්‍රබල සත්වයාට චණ්ඩභාවයෙන් ලබාගත හැකි වේ. මෙසේ නොවන එක් අවස්ථාවක් නම්, කණ්ඩායමේ වෙනත් සාමාජිකයකුට අයිති ළදරුවකු සුරතල් කිරීමට ප්‍රබල ගැහැණු සතකුට අවශ්‍ය වීමයි. එවැනි අවස්ථාවන්හි තොල් ලෙව කෑමේ සංඥාව මඟින් ළදරුවාගේ බිය පහකිරීමට බලවත් ගැහැණු සතා තැත්කරනු දැකිය හැකියි. මෙයින් ළදරුවාගේ බිය දුරුවී ඔහු සන්සුන් කිරීමට හැකිවේ.

මෙම මූලික පිරිසිදු කර ගැනීමේ ලක්ෂණය සමාජීය සිරිතක් ලෙස අපේ වර්ගයාගේ ද දැකීමට අපි බලාපොරොත්තු වෙමු. කෙසේ වෙතත් අපට පිරිසිදුව තබාගත යුතු රෝම කබායක් නැත. මේ නිසා නිරුවත් වානරයන් දෙදෙනකු එකට හමුවී මිත්‍රත්වය වැඩිකර ගැනීමේ දී ඔවුන් මේ සඳහා වෙනත් දෙයක් සොයා ගත යුතුය. වානරයාගේ දක්නට ඇති තොල් ලෙව කෑම වෙනුවට අපේ දක්නට ඇත්තේ සිනහවයි. ළදරු සංඥාවක් ලෙස මව ආකර්ෂණය කර ගැනීමට එය දියුණු වූ ආකාරය ගැන කලින් සාකච්ඡා කෙළෙමු. මෙය වැඩිහිටි ජීවිතයේ දී ඉතා විශිෂ්ට ගණයේ ආරාධනාත්මක සංඥාවක් වෙයි. වානරයා තොල් ලෙව කෑමෙන් පසු සිරුර පිරිසිදු කරන නමුත් සිනහවෙන් පසු අප කරන්නේ කුමක්ද? සිනහවෙන කාලය වැඩි කළහැකි නමුත්, ඉන්පසුව තවත් දෙයක් අවශ්‍ය වේ. එය සිරුර පිරිසිදු කිරීම වැනි යම්කිසි ක්‍රියාවක් විය යුතුය. මෙම ක්‍රියාව වී ඇත්තේ ශබ්දය මඟින් අදහස් පළ කිරීමයි.

කථා කිරීමේ රටාව පරිණාමය වූයේ තොරතුරු හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාව වැඩිවීම හේතු කොට ගෙනයි. එය දියුණු වූයේ සත්වයන් තුළ දක්නට තිබූ අදහස් පළ කිරීමට යොදාගත් විවිධ ශබ්දවලිනි. ක්ෂීරපායින් තුළ දක්නට ඇති ගෙරවිලි හා කෑගැසීම් තුළින් වඩා සංකීර්ණ ශබ්ද සංඥා මාලාවක් ඇති විය. මෙම ශබ්දයන් විවිධ ආකාරයට සම්බන්ධ කිරීමෙන් අපේ වර්තමාන කථාවේ පදනම බිහිවිය. අදහස් හුවමාරු කර ගැනීමේ මෙම නව ක්‍රමය නිසා අපේ මුතුන් මිත්තන්ට පරිසරයේ ඇති වස්තු පිළිබඳව මෙන්ම, අතීතය අනාගතය හා වර්තමානය ගැනද කථා කළ හැකිවිය. තොරතුරු හුවමාරු කර ගැනීමට පමණක් නොව, හැඟීම් දැක්වීමටද අද කථාව දියුණු වී තිබේ. මුල් වානරයන් භාවිතයට ගත් වචන නොවන විවිධ ශබ්ද අප තුළ ද ඇති බැවින්, හැඟීම් පළකිරීම සඳහා මෙය එක වරටම අවශ්‍ය නොවීය. වේදනාව පිළිබඳ කරන කෑගැසීමත් සමඟම අපි එය වචන වලින් ද පළ කරමු. මෙය මුල් වානර ශබ්දවලට කොතරම් ළං වන්නේද යත්, භාෂාව නොදන්නා කෙනෙකුට පමණක් නොව, බල්ලෙකු පවා මෙය අවබෝධ කරගත හැකි වෙයි. එහිදී යොදා ගන්නා වචන එතරම් වැදගත් නොවේ. අපට මේ නිසා වඩා සියුම් හා සංවේදී ලෙස සිතේ ඇති හැඟීම් දැක්වීමට අවස්ථාවක් ලැබී තිබේ.

Scanned by TapScanner

තවත් ආකාරයක ගවේෂණාත්මක කථා කිරීමක්ද දක්නට ලැබේ. එනම්, විහිළුවට කථාකිරීම හෝ කථාකිරීම වෙනුවෙන් කථා කිරීමයි. තොරතුරු හුවමාරු කර ගැනීමේ අතිත් ආකාරය වූ පින්තූර ඇඳීම, සෞන්දර්යාත්මක ගවේෂණ මාධ්‍යයක් ලෙස දියුණු වූ ආකාරයටම කථාව ද දියුණු විය. සිත්තරා සමඟ කවියා ද බිහිවිය. අපි මෙම පරිච්ඡේදයේ දී විමසීමට බලාපොරොත්තු වන්නේ සමාජීය උත්සව අවස්ථාවන්හි දක්නට ලැබෙන ආයිත්තම් කථාවයි. මෙය වැදගත් තොරතුරු හෝ අදහස් හුවමාරු කර ගැනීම හෝ සම්බන්ධ කථාවක් නොවේ. එහි සෞන්දර්යාත්මක වටිනාකමක් නැතිවාක් මෙන්ම, කථා කරන්නන් ගේ නියම හැඟීම් දැක්වීමක්ද සිදුනොවේ. මෙහි කාර්යය වන්නේ පිළිගැනීමේ සිනහව වැරගැන්නුමයි. එය අන්‍යෝන්‍ය හැඩ වැඩ දැමීම වෙනුවට අප දියුණුකොට ඇති දෙයයි. මේ නිසා අප අතර කණ්ඩායම් බැමි හා මිත්‍ර සම්බන්ධතාවන් දියුණුවීමත්, ඒවා ශක්තිමත්වීමත් පහසු වී තිබේ.

සමාජීය හමුවකදී මෙම කථාව දියුණු වන ආකාරය විමසිල්ලට ලක්කිරීම මෙහිදී ඉතා සිත් ගන්නා සුළු කාර්යයකි. එය ඉතා ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ ආරම්භක පිළිගැනීමේ චාරිත්‍රවලින් පසුවයි. ක්‍රමයෙන් එහි ප්‍රබලතාව අඩුවී ගෙන ගොස් නැවතත් කණ්ඩායම විසිර යෑමට මොහොතකට පෙර, එය ඉතා ඉහළ මට්ටමකට පැමිණේ. කණ්ඩායම එක්වී ඇත්තේ හුදු සමාජීය හේතුවක් සඳහා නම් මෙවැනි කථා දිගටම පවතිනු ඇත. "මිශ්‍ර මද්‍යපාන" සංග්‍රහය මෙයට හොඳ උදාහරණයකි. මෙහිදී බොහෝ විට දීර්ඝ සාකච්ඡා ආදිය වළකමින් ගැඹුරු ආකාරයේ සාකච්ඡා අඩුකිරීමට විශේෂ පරිශ්‍රමයක් දරණු ලැබේ. මෙවැනි අවස්ථාවන්හිදී කණ්ඩායමේ සෑම කෙනෙකුටම ලැබෙන්නේ මූලික සම්බන්ධතා ඇති කර ගැනීමේ අවස්ථාවක් පමණි. කුඩා රාත්‍රී භෝජන සංග්‍රහය මෙයට තරමක් වෙනස් ආකාරයක් ගනී. සංග්‍රහය ආරම්භ වී ටික වේලාවක් ගතවීමත් සමඟ මෙවැනි සරල කථා බහ අඩුවී, වැදගත් තොරතුරු හා අදහස් හුවමාරුවක් දක්නට ලැබේ. කෙසේ වෙතත් කණ්ඩායම විසිර

යෑමට පෙර නැවතත් වරක් එවැනි කථාබහ දක්නට ලැබේ. මෙම අවස්ථාවේ ද සිනහව දැකිය හැකිය. මේ මඟින් මෙහිදී ඇතිකර ගත් සමාජීය බැම්ම, ඊළඟ හමුවීම දක්වා පවත්වා ගැනීමට උත්සාහ දරනු ලැබේ.

වඩාත් විධිමත් ව්‍යාපාරික හමුවීමක් නිරීක්ෂණය කළහොත්, ආයිත්තම් කථාබහ එහිදී තවත් අඩු බව දක්නට ලැබේ. නමුත් එය සම්පූර්ණයෙන්ම ඉවත් නොවෙයි. මෙහිදී එවැනි කථාබහ දක්නට ලැබෙන්නේ ආරම්භක හා අවසාන අවස්ථාවන්හි පමණි. භෝජන සංග්‍රහයක දී මෙන් ක්‍රමයෙන් අඩුවී යෑම වෙනුවට, ආරම්භක අවස්ථාවෙන් පසුව එය ඉක්මනින්ම යටපත් කරනු ලැබේ. කථාබහට ඇති දැඩි කැමැත්ත යටපත් කිරීමේ අවස්ථාව නිසා, ව්‍යාපාරික කණ්ඩායම්වල හමුවීම් ඉතා චාරිත්‍රානුකූල, විධිමත් ඒවා බවට පත්කොට තිබේ. අනිකුත් පෞද්ගලික සමාජ අවස්ථාවන්හි දක්නට නොහැකි තරමේ විධිමත් චාරිත්‍රානුකූල බවක් දක්නට ලැබෙන කම්‌ටු ක්‍රියාවලියේ ආරම්භය මෙයින් පැහැදිළි වෙයි.

සමාජීය වශයෙන් එකිනෙකා හැඩ වැඩ ගැන්වීම වෙනුවට අපට ඇති වැදගත්ම ආදේශය මෙවැනි කථාබහ වූවත්, ඒ සඳහා යොදාගත හැකි එකම දෙය එය නොවේ. අපේ නිරුවත් සම හැඩ වැඩ ගැන්වීම හෝ පිරිසිදු කිරීම සඳහා යෝග්‍ය නොවූවත්, මෙවැනි ක්‍රියා සඳහා යොදාගත හැකි වෙනත් තැන් කොතෙකුත් ඇති බැවින්, ඒවා බහුල වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ. ලෝම සහිත ඇඳුම්, බිම් ඇතිරිළි හෝ ගෘහභාණ්ඩ ආදිය නිසා මෙවැනි ප්‍රතිචාරයෝ ඇතිවෙත්. බළලෙකු හෝ බල්ලෙකු දුටු විට අත නොගා සිටිය හැක්කේ නිරුවත් වානරයන් කීප දෙනෙකුට පමණි. අපේ පැරණි අග්‍රේශ ආශාවන් තෘප්තිමත් කර ගැනීමට මෙම සත්වයෝ උපකාරී වෙති. අපේ සිරුරේ වැඩි කොටසක් නිරුවත් වූවත් හිස ප්‍රදේශයේ හැඩ වැඩ ගැන්විය හැකි, කෙස් හොඳින් වැවී ඇත. විශේෂ හැඩ වැඩ ගන්වන්නන් වන කරණුවෑමියන් අතින් සරල සෞඛ්‍ය හේතූන් මත පැහැදිළි කළ නොහැකි තරම් අවධානයක් එයට යොමුවෙයි. එකිනෙකා ගේ හිසකෙස් පිරිසිදු

Scanned by TapScanner

කිරීම අප අතර සමාජීය ක්‍රියාවක් ලෙස දියුණු නොවූයේ මන්ද යන්න විමසිය යුත්තකි. මෙයට හේතුව හිසකෙස්වල ඇති ලිංගික වැදගත් කමයි. හිස කෙස් සකස්කර ඇති ආකාරය ලිංග දෙක අතර බෙහෙවින් වෙනස් වන බැවින්, එය ද්විතීයික ලිංගික ලක්ෂණයක් ද වෙයි. හිසකෙස් ලිංගික හැසිරීම් රටාව සමඟ ඉතා කිට්ටුවෙන් සම්බන්ධ වී ඇති බැවින්, සරල සමාජීය මිත්‍ර අභිනයක් ලෙස එය යොදා ගත නොහැක. මේ නිසා එය ප්‍රසිද්ධියේ කිරීම නහනම් වන බැවින් අපේ ආශාව නෘප්තිමත් නොවේ. මෙයට අප සොයාගෙන ඇති පිළිතුර බාබර් සාප්පුවයි. මෙහිදී හිතේ හැටියට හැඩ වැඩ දමා ගැනීමට පුළුවන. පිරිමින් සඳහා පිරිමි කරණවැමියන්ද ගැහැණුන් සඳහා ගැහැණු කරණවැමියන්ද ද යොදා ගැනීමෙන්, මෙහි ඇති ලිංගික අනතුරුදායකභාවය නවත් අඩුකොට තිබේ.

හැසිරීම් රටාවක් ලෙස හිසකෙස් සකස් කිරීම, කාර්යයන් තුනක් ඉටුකරයි. එය හිසකෙස් පිරිසිදු කිරීම හා සමාජීය හැඩ වැඩ ගැන්වීම සඳහා ආදේශයක් වනවා පමණක් නොව, සත්වයා අලංකාර කිරීමටද උපකාරී වේ. ලිංගික ක්‍රියා, වණ්ඩ ක්‍රියා හා අනිකුත් සමාජීය කටයුතු සඳහා ශරීරය සැරසීම නිරුවත් වානරයා ගේ බෙහෝවිට දක්නට ඇති සංසිද්ධියක් වන අතර, එය අනෙකුත් පරිච්ඡේදවල දී සාකච්ඡා කොට ඇත. ශරීරයේ ඇති රෝම ඉවත් කිරීම, ඒවා කැපීම, සමේ පච්ච කෙටීම ආදි සියල්ල ආයින්තම් වීමේ ක්‍රියාවකින් ආරම්භ වී තිබේ. කළින් සඳහන් කළ, කථාව වෙනත් දෙයකින් ආරම්භ වී, ආයින්තම් වීම වෙනුවට යොදා ගන්නා අතර, මෙහිදී ආයින්තම් වීමේ ක්‍රියා වෙනත් දේ සඳහා යොදා ගැනීමක් දක්නට ලැබේ. ප්‍රදර්ශන කාර්යය සඳහා එය යොදා ගැනීමේ දී සම ආරක්ෂා කර ගැනීම වෙනුවට එය සම විනාශ කිරීමක් බවට පත්ව ඇත.

මෙවැනි දෙයක් සත්වෝද්‍යානවල කොටුකර සිටින සමහර සතුන්ගේද දැකිය හැකිය. නම සඟයන්ගේ සිරුරුවල කුඩා තුවාල ඇතිවන තෙක් ඔවුන් සිරුර ලෙවකනු දක්නට ලැබේ. මෙවැනි අස්වාභාවික ආයින්තම්වීම්වලට හේතුව අධික

ලෙස විඩාවට හෝ වෙහෙසට හෝ පත්වීමයි. මෙවැනි තත්වයන් යටතේ අපේ වර්ගයා ද මේ ආකාරයට සිරුර තුවාල කර ගැනීමට පෙළෙඹෙණු ඇත. කෙසේ වෙතත් අප තුළ දක්නට ඇති අවස්ථාවාදී බව හේතු කොටගෙන, මෙය සිරුර අලංකාර කිරීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනීමට හැකිවී තිබේ.

සම ආරක්ෂා කිරීමේ සරල ක්‍රම තුළින්, තවත් වැදගත් දෙයක් දියුණු වී ඇත. එනම්, වෛද්‍ය කටයුතුයි. මේ අතින් අනෙකුත් සත්ව වර්ගවල දක්නට ලැබෙන්නේ ඉතා සුළු දියුණුවක් වන නමුත්, විශේෂයෙන්ම මෑත කාලයේදී නිරුවත් වානරයා ගේ සාර්ථකත්වයට වෛද්‍ය ක්‍රම බෙහෙවින් උපකාරී වී තිබේ. මෙම නව නැම්මේ ආරම්භය අපේ කිට්ටුම නෑයන් වන චිම්පන්සීන් ගේ දැකිය හැකිවේ. ඔවුහු එකිනෙකා ගේ සුළු ශරීරික ආබාධයන්ටද සැළකිල්ල යොමු කරති. කුඩා තුවාල හොඳින් පිරික්සා ලෙව කා පිරිසිදු කරනු ලැබේ. එක් අවස්ථාවක, ඇසේ යමක් වැටුණු චිම්පන්සියකු ගේ ඇස පරීක්ෂා කොට, ඉතා සැළකිල්ලෙන් නිවැරදිව දැතේ ඇඟිලි තුඩු භාවිත කරමින් එය, වෙනත් චිම්පන්සියකු විසින් ඉවත් කරනු වාර්තා වී තිබේ. මෙය සාමාන්‍ය අන්‍යෝන්‍ය පිරිසිදු කිරීමකට වඩා වැඩි දෙයක් වන අතර සහයෝගිතා වෛද්‍ය ක්‍රමයක ආරම්භයද වෙයි. චිම්පන්සියකුට නම්, ඉහත විස්තර කරන ලද සිද්ධිය මේ අතින් පැමිණිය හැකි ඉහළම තත්වයයි. වැඩිපුර බුද්ධියකින් හා සහයෝගිතාවෙන් යුත් අපේ වර්ගයාට, මෙය ශාරීරික වශයෙන් අනෙයන්‍ය ආධාර කිරීමේ සංකීර්ණ ශිල්පීය ක්‍රමවල පටන් ගැන්මද වෙයි. වෛද්‍ය ලෝකය අද කොතරම් සංකීර්ණ වී ඇත්ද යත්, එය සමාජික අතින් අපේ සුවපහසුව පිළිබඳ ප්‍රධානතම දෙය බවට පත්ව තිබේ. ඉතා සුළු අපහසුතාවෙහි සිට ප්‍රධාන පෙළේ රෝග සුව කිරීම දක්වා එය දියුණු වී ඇත. ජීව විද්‍යාත්මක සංසිද්ධියක් වශයෙන් මෙම ජයග්‍රහණය අද්විතීය වන නමුත්, අපි එහි අපරිමේය ලක්ෂණ නොසලකා හැර ඇත්තෙමු. මෙය තේරුම් ගැනීම සඳහා සුළු අසනීප හා භයානක අසනීප අතර වෙනස දැන ගැනීම අවශ්‍ය වේ. අනිකුත් සත්ව වර්ගවල මෙන් නිරුවත් වානරයාගේද කකුලක් කැඩීමට හෝ භයානක පරපෝෂිතයකු ආසාදනය

Scanned by TapScanner

වීමට හෝ පුළුවන. නමුත් සුළු අසනීපවලට වෙදකම් කරනු ලබන්නේ ඒවා භයානක රෝගවල සුළු ප්‍රමාණයේ තත්වයන් ලෙස සලකා නමුත්, මේවා ඇත්ත වශයෙන්ම ආදී ආයිත්තම් වීමේ ආශාවන්ට බොහෝ සම්බන්ධ බවට ප්‍රබල සාක්ෂි තිබේ. මෙවැනි රෝග ලක්ෂණවලින් කියවෙන්නේ නියම ශරීරික ප්‍රශ්නයක් ගැන නොව, ශරීරික මුහුණුවරක් ගත් හැසිරීම් රටාවේ ප්‍රශ්නයක් පිළිබඳවයි.

ආයිත්තම් ආරාධනා රෝග ලෙස දැක්විය හැකි ප්‍රධාන ඒවා අතර කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, කොන්ද කැක්කුම, හිස කැක්කුම, බඩ නරක්වීම, හමේ පලු දැමීම හා උගුරේ ආබාධ ආදිය වේ. මෙවැනි රෝගයක් වැළඳුන තැනැත්තකුගේ තත්වය භයානක නොවන නමුත්, තම සගයන් ගේ වැඩි අවධානයක් ලබා ගැනීමට තරම් එය ප්‍රමාණවත්ය. ආයිත්තම් ආරාධනා සංඥා ක්‍රියාකරන ආකාරයටම ක්‍රියා කරමින්, මෙම රෝග ලක්ෂණද වෛද්‍යවරුන්ගෙන්, හෙදියන්ගෙන්, නැයන්ගෙන් හා මිත්‍රයන් ගෙන් සැනසිමේ ප්‍රතිචාරයන් ඇති කරවයි. රෝග ලක්ෂණ නිසා අන් අය තුළ ඇති කෙරෙන අනුකම්පාවම, රෝගය සුවකිරීමට ප්‍රමාණවත් වේ. පැරණි ආයිත්තම් වීමේ ක්‍රියා වෙනුවට, බෙහෙත්දීම යොදා ගනු ලැබේ. දෙනු ලබන බෙහෙත්වල ඇති රසායනික ද්‍රව්‍යවල ස්වභාවය එතරම් වැදගත් නොවන අතර මෙම තත්වයේ රෝගියකුට ප්‍රතිකාර කිරීමේදී වර්තමාන වෛද්‍ය විද්‍යාවේ යොදාගන්නා භාවිතයන් හා පැරණි යක්දෙස්සන් ගේ ක්‍රම අතර වැඩි වෙනසක් දක්නට නොලැබේ.

සුළු ලෙඩ රෝග මෙම ආකාරයට තේරුම් කිරීමට විරුද්ධව ගෙන ආ හැකි තර්කයක් නම්, මෙවැනි අවස්ථාවල ඇත්ත වශයෙන්ම වයිරස් හා බැක්ටීරියා වර්ග දක්නට ලැබීමයි. බඩේ කැක්කුමේ හෝ සෙම්ප්‍රතිශ්‍යාවේ වෛද්‍යමය හේතුව ලෙස ක්ෂුද්‍ර ජීවීන් දැක්විය හැකි නම් ඒ සඳහා වෙනත් පැහැදිළි කිරීමක් අවශ්‍ය වන්නේ ඇයි? මෙයට පිළිතුර නම් අප නිරන්තරයෙන්ම මෙම බැක්ටීරියා හා වයිරස් වර්ගවලට නිරාවරණය වන නමුත් ඒවායින් රෝග වැළඳෙන්නේ ඉඳහිට පමණක් වීමයි. තවද සමහරුන්ට මෙම රෝග ඉතා ලෙහෙසියෙන්ම වැළඳේ. සමාජීය වශයෙන් ඉතා සාර්ථක වූ හෝ පරිසරයට හා සමාජයට හොඳින් හැඩ ගැසුණු අයට මෙවැනි ආයිත්තම් ආරාධනා රෝග සැදෙන්නේ ඉතා කළාතුරකිනි. අනිත් අතට තාවකාලික හෝ දීර්ඝකාලීන සමාජීය ප්‍රශ්න ඇති අයට, මේ රෝග ඉතා පහසුවෙන් වැළඳේ. මෙම රෝග සැදීමේ දී දක්නට ඇති ඉතාම පුදුම ලක්ෂණය නම්, ඒවා ඒ ඒ පුද්ගලයා ගේ අවශ්‍යතාවන් අනුව වැළඳීමයි. උදාහරණයක් වශයෙන් නිළියක් මේ ආකාරයේ ප්‍රශ්නවලට මුහුණ පා ඇතැයි සිතමු. මෙවිට වන්නේ උගුරේ ආබාධයක් සැදී ඇගේ කටහඬ වෙනස්වී විවේකයක් ගැනීමට සිදුවීමයි. මෙවිට ඇයට අවශ්‍ය සැප පහසුව ලබා දී කා විසින් හෝ ඇ හොඳින් රැක බලාගනු ලැබේ. මේ නිසා තාවකාලිකව හෝ මානසික ප්‍රශ්නය විසඳෙයි. මේ වෙනුවට ඇගේ මානසික ඝට්ටනයේ ප්‍රතිඵලයක් ලෙස හමේ බිබිලි දැමීමක් වැනි දෙයක් සිදු වූයේ නම්, හම ඇදුමෙන් වැසෙන බැවින්, ඈ දිගටම වැඩ කටයුතුවල නිරත වනු ඇත. එවිට මානසික අවුල නොවිසඳී දිගටම පවතී. ඇගේ මේ තත්වය සමඟ මල්ලව පොරකරුවකු ගේ තත්වය සසඳා බලමු. ඔහුට කටහඬ වෙනස්වීම ආයිත්තම් ආරාධනා රෝගයක් ලෙස කිසිසේත් ප්‍රයෝජනවත් නොවේ. නමුත් හමේ රෝගයක් ඇතිවීම කාගේත් අවධානය යොමු වන්නකි. බොහෝ මල්ලව පොරකරුවන් අතර වැඩිපුරම දක්නට ලැබෙන රෝගයත් මෙයයි. නිරුවත්ව තිරයේ පෙනී සිටීමෙන් ප්‍රසිද්ධියට පත් එක්තරා නිළියක් බොහෝවිට සමේ රෝගවලින් පෙළීම මෙහිදී සඳහන් කළ යුත්තකි. ඇයට වඩා වැදගත් වන්නේ සම නිරාවරණය කිරීම වන බැවින්, ඈ අනික් නිළියන්ට වැළඳෙන රෝගවලට නොව, මල්ලව පොරකරුවන් ගේ රෝගයකට ගොදුරු වූවාය.

සැනසීම ලබාගැනීමේ අවශ්‍යතාව ඉතා ප්‍රබල නම්, රෝගය ද ඉතා උග්‍ර වනු ඇත. අපට වැඩිපුර ආරක්ෂාවත් අවධානයත් ලැබෙන්නේ, අප ළදරුවන් ලෙස තොටිල්ලේ ගතකරන කාලයේදීයි. අප අසරණ ලෙස ඇඳටම සීමා කරන රෝගයකට මේ නිසා ළදරු කාලයේ ලැබූ අවධානය නැවත

Scanned by TapScanner

ලබාදීමේ හැකියාවක් තිබේ. අපි බලවත් ඖෂධයන් ගනිමු යි සිතන නමුත්, ඇත්ත වශයෙන්ම අපට අවශ්‍ය වන්නේත්, රෝගය සුව කරන්නේත්, ආරක්ෂාව හා අවධානය පිළිබඳව ප්‍රබල බෙහෙත් වේලකිනි. (මෙයින් කියවෙන්නේ අප බොරු ලෙඩ ගන්නා බවක් නොවේ. රෝග ලක්ෂණ ඇත්ත වශයෙන්ම දක්නට ලැබේ. මානසික (චර්යා) ප්‍රශ්නය රෝගයට හේතුව මිස, එහි ප්‍රතිඵලය නොවේ.)

අප සියළු දෙනාම එක්තරා ප්‍රමාණයකට ආයිත්තම් වීම හා ආයිත්තම් කිරීම අතින් බලාපොරොත්තු සුන් වූ අය වෙමු. රෝගියෙකු හොඳින් බලා ගැනීමෙන් ලබන තෘප්තිය රෝගය ඇතිවීමේ හේතුව තරම්ම ප්‍රධාන එකක් වේ. අන් අය මේ ආකාරයට බලා ගැනීමට සමහරු කෙතරම් ආශා කරන්නේද යත්, සමහරවිටක තම ආශාවන් තෘප්තිමත් කර ගැනීම සඳහා කෙනෙකුට, තම සගයකු ගේ රෝගය වුවමනාවෙන්ම දික් කිරීමට පවා පුළුවන. දෙදෙනා අතර ඇති සම්බන්ධතාව පමණට වඩා දුරදිග යෑමෙන් ඉතා අවුල් සහගත තත්වයක් ඇතිවීමට ඉඩ තිබේ. මෙවැනි අන්‍යෝන්‍ය ආයිත්තම් යුවලකට ඔවුන්ගේ ක්‍රියාවේ නියම ස්වභාවය පෙන්වා දුනහොත්, ඔවුන් එයට කිසිසේත් එකඟ නොවනු ඇත. මිථ්‍යා විශ්වාස මඟින් ලෙඩ සුව කරන්නන් මෙම තත්වය ඉතා සාර්ථක ලෙස ප්‍රයෝජනයට ගෙන තිබේ. නමුත් අවාසනාවකට මෙන්, ඔවුන්ට හමුවෙන රෝගීන් බොහෝමයකට ශාරීරික හේතු මෙන්ම, ශාරීරික රෝග ලක්ෂණද වේ. ඔවුන්ට විරුද්ධව යන අනිත් කරුණ නම්, "ආයිත්තම් ආරාධනා රෝග " වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ශාරීරික රෝග ලක්ෂණ නිසා, ශරීරික වශයෙන් හානි පැමිණිය හැකි වීමයි. මේවා සුවකළ හැක්කේ බුද්ධිමත් වෛද්‍ය ප්‍රතිකාර වලින් පමණි.

මා මෙතෙක් වේලා අවධානය යොමු කළේ අපේ වර්ගයා ගේ සුවපහසු සැනසුම් හැසිරීම් රටාවේ සමාජීය අංශය ගැනයි. මේ අතින් අප ඉතා ඉහළට දියුණු වී ඇති නමුත්, ස්වයං පිරිසිදු කිරීමේ හෝ ස්වයං සැප පහසුව සොයන ක්‍රියා හෝ මේ නිසා අභාවයට ගොස් නැත. අනිකුත් අග්‍රේශයන් මෙන් අපි

තවමත් ශරීරය කසා ගනිමු. ඇස් පිසදැමීම, තුවාල ලෙවකෑම ආදියද තවමත් අප අතර දක්නට ලැබේ. ඔවුන් මෙන්ම අප තුළද හිරු රැස් නැමට තදබල ආශාවක් වෙයි. මේවාට අමතරව විශේෂ සංස්කෘතික රටාවන් කීපයක් ද අපි එක්කොට ඇත්තෙමු. මෙයින් වඩාත් බහුල වශයෙන් දක්නට ලැබෙන දෙය නම්, ජලයෙන් නිතර සේදීමයි. මෙය අනිකුත් අග්‍රේශයන් අතර දුර්ලභ සිද්ධියක් වන නමුත්, සමහර සත්වයන් ඉඳහිට ස්නානය කරනු දක්නට ලැබේ. නමුත් පිරිසිදු කිරීමෙහි ලා අප අතර ප්‍රධානතම තැන ගන්නේ එයයි.

මෙහි ඇති ප්‍රයෝජන කෙසේ වෙතත්, ජලයෙන් නිතර නිතර සේදීම නිසා සමේ ඇති ග්‍රන්ථීන්ට ප්‍රතිපූතිකා, ආරක්ෂිත තෙල් හා ලුණුවර්ග නිෂ්පාදනය ඉතා අධික ලෙස වැඩි කිරීමට සිදුවෙයි. මේ නිසා සිරුරේ මතුපිට රෝගවලට භාජනය වීමට ඇති ඉඩ වැඩි කැරේ. මෙම අනතුරෙන් අප වැළකී ඇත්තේ ස්වාභාවික තෙල් හා ලවණ ඉවත් කරන අතරම රෝගවලට මුල්වන කුණු ද මේ මහින් ඉවත් කෙරෙන බැවිනි.

ශරීරය පිරිසිදුව තබාගැනීමේ ප්‍රශ්නවලට අමතරව සුදුසු ශරීර උෂ්ණත්වයක් පවත්වා ගැනීමද මෙම හැසිරීම් රටාවට ඇතුළත් වෙයි. අන් සියලුම ක්ෂීරපායීන් හා පක්ෂීන් තුළ මෙන් අප තුළද, පරිසරයට වඩා ඉහළ ස්ථීර ශරීර උෂ්ණත්වයක් ඇති බැවින්, අපේ ශරීරික කාර්යක්ෂමතාව ද වැඩිවේ. අපි සෞඛ්‍ය සම්පන්න නම්, බාහිර උෂ්ණත්වය කුමක් වුවත් අපේ ශරීරය ඇතුළත උෂ්ණත්වය පැරන්හයිට් අංශක 3කට වඩා වෙනස් නොවනු ඇත. මෙම අභ්‍යන්තර උෂ්ණත්වයත් දෛනික රටාවකට අනුව වෙනස් වේ. ඉහළම උෂ්ණත්වය සවස් ජාමයේ ද, අඩු, උෂ්ණත්වය උදයේ 4 ට පමණද දක්නට ලැබේ. බාහිර පරිසරයේ, ප්‍රමාණයට වඩා උණුසුම් හෝ සීතල වුවහොත් අපට අපහසු ගතියක් දැනේ. අපට දැනෙන වේදනාකාරී සංවේදයෝ, අනතුරු හැඟවීමක් වෙති. මේ නිසා ශරීර අභ්‍යන්තරයේ ඇති ඉන්ද්‍රියයන් වුවමනාවට වඩා සීතලවීම හෝ රත්වීම හෝ වැළැක්වීමට

Scanned by TapScanner

පියවර ගනු ලැබේ. මේ ආකාරයට අප සිතා මතා ගන්නා බුද්ධිමත් පියවරට අමතරව, ශරීර උෂ්ණත්වය ස්ථිර මට්ටමක තබා ගැනීමට ශරීරය ද ස්වයංක්‍රීය පියවර කීපයක් ගනී. පරිසරයේ උෂ්ණත්වය වැඩි වුවහොත් රුධිර වාහිනී මහත් වෙයි. මෙයින් පෘෂ්ඨය රත්වී එයින් තාපය පිටතට ගලායෑමක් සිදුවේ. අධික ලෙස ඩහදිය දැමීමක් ද දක්නට ලැබේ. අප හැම කෙනෙකුගේම සිරුරේ ස්වේද ග්‍රන්ථි විසිලක්ෂයක් පමණ දක්නට ඇත. ඉතා උණුසුම් වාතාවරණයකදී, මේවාට පැයක් තුළදී ඩහදිය ලීටරයක් පමණ ස්‍රාවය කිරීමට පුළුවන. මෙම ද්‍රව්‍ය ශරීර මතුපිටන් වාෂ්පීකරණය වීම නිසා, තවත් ආකාරයකට තාපය අඩුවෙයි. සාමාන්‍යයෙන් උෂ්ණ පරිසරයට පුරුදුවීමේ දී අපේ ඩහදිය දැමීමේ හැකියාව බෙහෙවින් වැඩවෙයි. අපේ ජාතිය කුමක් වුවත් උණුසුම් දේශගුණයක දී වුවද, අපේ අභ්‍යන්තර ශරීර උෂ්ණත්වය වැඩි විය හැක්කේ පැරන්හයිට් අංශක 0.4 ක් පමණක් බැවින් මෙය ඉතා වැදගත් වේ. පරිසරයට වඩා සීතල වුවහොත් සමේ තුවාල පවා සිදුවීමට ඉඩ ඇත. අත්වල මෙවැන්නක් සිදුවීම වැළැක්වීම සඳහා විශේෂ ක්‍රමයක් දියුණු වී තිබේ. එනම් අධික සීතල නිසා වාහිනී කුඩාවීමත්, මිනිත්තු පහකට පමණ පසුව වාහිනී මහත්වීමෙන් රුධිරය ගලා ගොස් අත් රත්වීමත්ය. සඳහටම සීතල ප්‍රදේශවල ජීවත්වන අයගේ පරිවෘත්තීය සීඝ්‍රතාව වැඩිවීම ආදිය මහින් සිරුර එම පරිසරයට හැඩ ගැසේ.

අපේ වර්ගයා පෘතුවියේ සෑම දිශාවකට පැතිරී යෑමත් සමඟ මෙම ජෛව උෂ්ණත්ව පාලන ක්‍රියාවලියට වැදගත් සංස්කෘතික අංගද එකතු විය. ගින්න, ඇඳුම්, නිවාස හා කෘත්‍රිම ශීතකරණය මහින් ශීත හා අධික උෂ්ණය පාලනය කරන ක්‍රම සොයා ගෙන ඇත. මේ අතින් අප ලබා ඇති දියුණුව කොතරම් උසස් වුවත් ඒවා කිසිම අතකින් අපේ අභ්‍යන්තර ශරීර උෂ්ණත්වය වෙනස් කොට නැත. ඒවා අපට උපකාරී වී ඇත්තේ බාහිර උෂ්ණත්වය පාලනය කිරීමට පමණි. මේ නිසා විවිධ බාහිර තත්වයන් යටතේ පැරණි අග්‍රේශ උෂ්ණත්ව මට්ටම පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ.

උෂ්ණත්ව ප්‍රතිචාරයන් පිළිබඳ සාකච්ඡාව අවසන් කිරීමට පෙර සඳහන් කළ යුතු තවත් දෙයක් තිබේ. අපේ වර්ගයා ගේ ඩහදිය දැමීමේ ප්‍රතිචාරයන් පිළිබඳව කරන ලද විස්තරාත්මක අධ්‍යයනයන්ගෙන් පෙනී ගොස් ඇත්තේ, ඒවා පෙනෙන තරම් සරල නොවන බවයි. උණුසුම වැඩිවීමත් සමඟ ශරීර පෘෂ්ඨයේ බොහෝ ප්‍රදේශවල ඩහදිය ඇති වේ. නිසැකවම ස්වේද ග්‍රන්ථි පද්ධතියේ මූලික හා ආරම්භක ප්‍රතිචාරය වන්නට ඇත්තේ මෙයයි. නමුත් සමහර ප්‍රදේශ, අනිකුත් උත්තේජනයන්ට අනුව, උෂ්ණත්වය කුමක් වුවත් ඩහදිය නිකුත් කිරීමට පුරුදුවී ඇත. වැඩියෙන් මිරිස් හා කුළුබඩු දමන ලද ආහාර අනුභව කිරීමේදී මුහුණේ ඩහදිය දැමීමක් දක්නට ලැබේ. සිතෙහි ප්‍රබල හැඟීම් ඇතිවීමත් සමඟ අල්ලේ, යටිපතුලේ, කිහිල්ලේ හා නලලේ ඩහදිය ඇතිවේ. අල්ල හා යටි පතුල ප්‍රතිචාර දක්වන්නේ හැඟීම් වලින් පිරුණු අවස්ථාවන්ට පමණක් වන අතර කිහිල්ල හා නලළේ ඩහදිය උණුසුම වැඩි වූ අවස්ථාවන්හිත් දක්නට ලැබේ. මෙයින් පැහැදිළිව පෙනී යන කරුණක් නම්, අත් හා කකුල්වල මෙම ඩහදිය දැමීම, උෂ්ණත්ව පාලන පද්ධතියෙන් ණයට ගෙන දැන් වෙනත් කාර්යයක් සඳහා යොදා ගන්නා බවයි. අල්ල හා යටි පතුල් තෙත්වීම, අනතුරක තර්ජනය ඇති වූ විට ශරීරය ඕනෑම දෙයකට සුදානම්ව තැබීමේ ප්‍රතිචාරයක් වෙයි. පොරව අතට ගැනීමට පෙර අල්ලට කෙළ ගැසීම එක් අතකින් මෙම ක්‍රියාවලියේ කායික නොවන සමකය ලෙස සැලකිය හැකිය.

අල්ලට ඩහදිය දැමීමේ ප්‍රතිචාරය කොතරම් සංවේදී ද යත්, යම්කිසි ආකාරයකින් කණ්ඩායමේ ආරක්ෂාවට යම්කිසි තර්ජනයක් එල්ල වූ විට, මුළු මහත් ජාතියක් හෝ සමාජයක් මෙම ප්‍රතික්‍රියාවේ හදිසි වැඩිවීමක් පෙන්වයි. න්‍යෂ්ටික යුද්ධයක් ඇතිවීමට පවා ඉඩ තිබූ බව පෙනී ගිය, මෑතක දී දක්නට ලැබුණු දේශපාලන අර්බුද සමයකදී, එක්තරා පර්යේෂණ ආයතනයක අල්ලට ඩහදිය දැමීම පිළිබඳව කරන ලද සියලුම පර්යේෂණ අත්හිටුවීමට සිදුවිය. මෙයට හේතුව වූයේ ප්‍රතිචාරයේ මූලික මට්ටම අස්වාභාවික ලෙස වැඩි වී තිබීම නිසා තවදුරටත් පරීක්ෂාවන් කිරීමේ තේරුමක් නොමැති

නිරුවත් වානරයා

Scanned by TapScanner

වීමයි. සාස්තරකරුවකු ලවා අපේ අල්ල කියවා ගැනීමෙන් අනාගතය ගැන එතරම් දැනගත නොහැකි වුවත්, කායික විද්‍යාඥයකු ලවා එය බලවා ගැනීමෙන් අනාගතය ගැන අපේ ඇති බිය පිළිබඳව යමක් නිසැකවම දැනගත හැකි බව මෙයින් පෙනී යයි.

8. සත්ව සම්බන්ධතා

අප මේ වන තෙක්ම සාකච්ඡා කළේ නිරුවත් වානරයා ගේ හැසිරීමත්, ඔහු තම වර්ගයේ අනිකුත් අය කෙරෙහි හැසිරෙන ආකාරයත්ය. එනම් ඔහුගේ අන්තර් විශේෂ හැසිරීමයි. අනිකුත් සත්ව වර්ග සම්බන්ධයෙන් ඔහුගේ හැසිරීම් රටාව, විශේෂයෙන් ඔහුගේ අන්තර් විශේෂ හැසිරීම විමසිල්ලට භාජනය කිරීම දැන් කළ යුතුව තිබේ.

අඩුම වශයෙන් තවත් සත්ව වර්ග කිහිපයක් සමඟවත් ඔවුන්ගේ පරිසරය භවුලේ ප්‍රයෝජනයට ගත යුතු බව, සියලුම උසස් සත්ව වර්ග අවබෝධ කරගෙන සිටිති. ගොදුර, සහජීවියා, තරහකරුවා, පරපෝෂිතයා හෝ විලෝපියා යන මේවායින් එක් ආකාරයට අනික් සත්තු සලකනු ලැබෙති. මෙම පස් ආකාර සම්බන්ධය අප සත්වයන්ට දක්වන ,ආර්ථික, ආකල්පය ලෙස ද හැඳින්විය හැකි වෙයි. මෙයට විද්‍යාත්මක, සෞන්දර්යාත්මක හා සංකේතාත්මක ආකල්පද එක් වේ. මේ ආකාරයට විවිධ අංශවලින් සතුන් පිළිබඳව උනන්දුව දැක්වීම නිසා අපට සත්ව ලෝකයේ අන්තර් විශේෂ සම්බන්ධකම් අතින් අද්විතීය ස්ථානයක් හිමි වේ. මෙය අවබෝධ කර ගැනීම සඳහා, එම සම්බන්ධතා එකින් එක විමසිල්ලට භාජනය කළයුතු වෙයි. නිරුවත් වානරයා ගේ ගවේෂණාත්මක හා අවස්ථාවාදී ස්වභාවය නිසා ඔහුට ගොදුරු නොවූ සතෙක් නැති තරම්ය. ඔබට මතක් කළ හැකි ඕනෑම සතකු, ඔහු කවදා හෝ මරාගෙන කා තිබේ. අවුරුදු පන් ලක්ෂයක් පමණ පැරණි ප්‍රාග් ඓතිහාසික නටබුන් හැදෑරීමේ දී පෙනී ගොස් ඇත්තේ, ඔහු එකම තැනක අශ්ව, රයිනෝ, මුව, වලස්, බැටළු, ඇන්ටිලොප්, මී හරක්, හයනා ආදී විවිධ සත්ව වර්ග මරාගෙන කා ඇති බවයි. අපේ විලෝපීය හැසිරීම් රටාවේ, මෙහිදී සඳහන් කළයුතු තවත් වැදගත් අංශයක් වේ. එනම්, ගොදුර වශයෙන් ආහාරයට ගන්නා සමහර සත්ව වර්ග ගෘහාශ්‍රිතව ඇති කිරීමට අප පුරුදු වීමයි. අපට ඕනෑම සතකු ආහාරයට ගතහැකි නමුත්, අද අපේ මාංශ ආහාරය ප්‍රධාන

Scanned by TapScanner

සත්ව වර්ග කීපයකට සීමා වී තිබේ.

සත්වයන් ගෘහාශ්‍රිතව ඇතිකිරීමත්, ඔවුන් සංවිධානාත්මක ලෙස පාලනය කිරීමත්, අඩුම වශයෙන් අවුරුදු දස දහසක් පමණ තිස්සේ කරනු ලැබූවකි. මේ ආකාරයට ගොදුරු කරගනු ලැබූ මුල්ම සත්ව වර්ගයෝ නම් එළු, බැටළු, පිනිමුව ආදීහුය. කෘෂිකාර්මික අංශය දියුණුවීමත් සමඟ මෙම ලැයිස්තුවට හරක් හා ඌරෝ ද එකතු වුහ. අවුරුදු හාරදහසකට පමණ පෙර හරක් වර්ග කීපයක්ම බෝකොට තිබූ බවට සාක්ෂි තිබේ. එළුවන්, බැටළුවෝ හා පිනිමුවන් දඩයම් ගොදුරුවලින්, කෙළින්ම ඇති කරනු ලැබූ, ගොදුරු, බවට පරිවර්තනය වූ සතුන් නමුත්, අපේ වර්ගයා සමඟ හරකුන් හා ඌරන් ගේ සම්බන්ධතාව ආරම්භ වූයේ වගා සොරුන් ලෙසය. වගා කළ බෝග ඇතිවීමත් සමඟ, මෙම සතුන් ඒවා කෑමට වගා බිම්වලට පැමිණීම අවසන් වූයේ මුල් ගොවියන් විසින් ඔවුන් ගෘහාශ්‍රිත පාලනයට ගැනීමෙනි. දීර්ඝකාලීන ගෘහාශ්‍රිත වීමකට ලක්වූ එකම කුඩා ක්ෂීරපායී සත්ව වර්ගය හාවෝ වෙති. ගෘහාශ්‍රිතව ඇති කරනු ලැබූ මත්ස්‍යයන් වන්නේ ආදා, පෙතියා හා රන් මාලුවා පමණකි. රන් මාලුන් ආහාරයක් නොව, විසිතුරු භාණ්ඩයක් බවට පත්විය. මසුන් ඇති කිරීමේ ඉතිහාසය අවුරුදු දෙදහසකට වැඩි නොවන අතර අපේ සංවිධානාත්මක විලෝපිය හැසිරීම් රටාවේ එයට හිමිවන්නේ ඉතා සුළු තැනකි.

අපේ අන්තර් විශේෂ සම්බන්ධතාවන්හි දක්නට ලැබෙන දෙවැනි ස්වරූපය සහජීවනයයි. සහජීවනයේ අර්ථ දක්වා ඇත්තේ අනෙයෝන්‍ය ප්‍රයෝජනය තකා වෙනස් සත්ව විශේෂ දෙකක් අතර ඇතිවන සම්බන්ධය ලෙසයි. සත්ව ලෝකයේ සහජීවන සම්බන්ධතා කොතෙකුත් දක්නට පුළුවන. ඉතා ප්‍රකටම පෙනෙන මෙවැනි සම්බන්ධතාවක් නම් රයිනෝසිරස්, ජිරාෆ් හා ගවයා වැනි සතුන් හා ඔවුන්ගේ සමේ ඇති පරපෝෂිතයන් කා දමන පක්ෂීන් අතර ඇති සම්බන්ධයයි. පක්ෂීන්ට ඔවුන්ගේ ආහාරය සැපයෙන අතර, මේ නිසා හරකුන් වැනි සතුන්ට පරපෝෂිතයන් ගෙන් තොරව පිරිසිදුව

සිටීමට හැකිවී තිබේ.

අප සහජීවන යුගලයක එක් සාමාජිකයකු වන විට, එය අපට වැඩිපුර වාසි සැලසෙන සම්බන්ධතාවක් වන නමුත්, මෙහිදී අනික් සත්ව වර්ගයාගේ මරණය සිදුනොවන බැවින්, මෙය ගොදුරක් හා විලෝපියකු අතර ඇති සම්බන්ධයට වඩා වෙනස් වේ. අපි ඔවුන් සුරා කන නමුත්, ඒ වෙනුවට කෑම ආදිය සපයා දී රැක බලා ගනිමු. මෙය එක් පැත්තකට බරවූ සහජීවනයක් වන්නේ සම්පූර්ණයෙන්ම එය අපේ පාලනය යටතේ පැවතීමත්, අපේ සත්ව සහකරුවන්ට මෙහිදී කිසිම තීරණාත්මක තැනක් හිමි නොවීමත් නිසාය.

අපේ ඉතිහාසයේ පැරණිම සහජීවියා වන්නේ බල්ලායි. අපේ මුතුන් මිත්තන් මෙම වටිනා සතා ගෘහාශ්‍රිතව ඇති කිරීමට පුරුදු වූයේ කවදා දැයි ස්ථිර වශයෙන්ම කිව නොහැක. අඩුම වශයෙන් මෙය සිදුවන්නට ඇත්තේ අවුරුදු දසදහසකට පමණ පෙර විය යුතුය. මෙය චිත්තාකර්ෂණීය කථාවකි. මුලදී වර්තමාන බල්ලාගේ මුතුන් මිත්තන් අපත් සමඟ තරහයට දඩයමේ යෙදෙන්නට ඇත. අප දෙගොල්ලන්ම කණ්ඩායම් ලෙස දඩයමේ ගොස් ගොදුරු සොයා ගන්නා සතුන් බැවින්, මුලදී මෙම දෙකොටස අතර එතරම් මිත්‍ර සම්බන්ධයක් තිබෙන්නට නැත. එහෙත් දඩයක්කාර නිරුවත් වානරයා තුළ නොවූ විශේෂ ලක්ෂණ කීපයක්ම වල් බල්ලා සතු විය. දඩයම් කිරීමේදී ගොදුර වටකොට වේගයෙන් ලුහු බැඳීමට බල්ලන් ඉතා දක්ෂ වූ අතර, උන්ගේ ශ්‍රවණ හා ආඝ්‍රාණ ඉන්ද්‍රියයන්ද ඉතා සියුම් විය. මරාගත් දඩයමින් කොටසක් දී, මේ හැකියාවන් ගෙන් ප්‍රයෝජනයක් ගත හැකි වූයේ නම්, එය නිරුවත් වානරයාට අවාසිදායක තත්වයක් නොවේ. මෙය සිදුවූයේ කෙසේදැයි අප නොදන්නා නමුත්, අවසානයේදී මෙම සත්ව වර්ග දෙක අතර එවැනි බැම්මක් ඇති වී තිබේ. ඇති දැඩිකොට පසුව ආහාරයට ගැනීමට බලු පැටවුන් ගුහාවලට ගෙන ඒමෙන් මෙය ආරම්භ වන්නට ඇත. රාත්‍රියේ මෙම සතුන් මුරකරුවන් ලෙස යොදාගත හැකිවීම ඔවුන්ගේ වාසියට හේතු විය. දඩයම් ගමන්වලදී ගොදුරු සොයා ගැනීමට අපට ආධාර

Scanned by TapScanner

කිරීමටද මෙම සතුන්ට හැකිවිය. ගෙදර දොර ඇතිකිරීම නිසා, බල්ලෝ නිරුවත් වානර කණ්ඩායමේ සාමාජිකයන් ලෙස සිතන්නට පුරුදු විය. පරම්පරා ගණනාවක් තිස්සේ, තෝරා බෝ කිරීම නිසා පහසුවෙන් පාලනය කළ හැකි ගෘහාශ්‍රිත දඩයම් සුනඛයෙක් බිහිවිණි.

ආහාරයට ගැනීම සඳහා සබුරයන් ගෘහාශ්‍රිතව ඇති කිරීමට හැකි වූයේ බල්ලන් සමඟ සම්බන්ධතාව දියුණුවීම නිසායැයි කියනු ලැබේ. නියම කෘෂිකාර්මික අවධිය ඇතිවීමට පෙර සිට එළුවන්, බැටළුවන් හා පිනිමුවන් එක්තරා ප්‍රමාණයකට මිනිස් පාලනය යටතට ගෙන තිබුණි. නමුත් මෙම සත්වයන් විශාල පරිමාණයෙන් එක්කොට ඇති කිරීමට හැකි වූයේ බල්ලා නිසාය. වර්තමාන එඩේර බල්ලන් හා වෘකයන් ගේ හැසිරීම් රටාවේ බොහෝ සමානකම් දක්නට හැකිවීම මෙම අදහස සනාථ කරයි.

මෑත යුගයේ වරණ බෝකිරීම් වලින් සහජීවී බල්ලන් වර්ග ගණනාවක්ම ඇති කර තිබේ. ආදී දඩයම් බල්ලා දඩයමේ සෑම අවස්ථාවකටම උපකාරී වූ නමුත්, පසුව ඔවුහු එක් එක් අවස්ථාවට සරිලන සේ ඇතිකරන ලදහ. එක් එක් බල්ලාගේ දක්නට තිබූ ලක්ෂණ වැඩි දියුණු කිරීමෙන් මෙය සිදුකරන ලදී. සමහරු එඩේර බල්ලන් ලෙසද, සමහරු ගන්ධ මඟින් ගොදුරු සොයා ගන්නවුන් ලෙසද, සමහරු වේගයෙන් ගොදුරු පසුපස ලුහු බඳින අය ලෙසද, තවත් සමහරු ආරක්ෂකයන් ලෙසද දියුණු කරනු ලැබුහ. මෙයට අමතරව ඉතා අසාමාන්‍ය කාර්යයන් සඳහා ද බල්ලන් බෝකර ඇති බව පෙනේ. මෙයට හොඳම උදාහරණය නම් පැරණි රතු ඉන්දියන් ජාතිකයන් විසින් බෝකරනු ලැබ සිටි ලෝම රහිත බල්ලායි. සමේ උෂ්ණත්වය ඉතා ඉහළ වූ මේ සතා ඔවුන් ගේ නිදන ගුහා උණුසුම් කිරීමට යොදා ගන්නා ලදි.

ඉතා මෑත කාලයේ දී සහජීවී බල්ලා, බර අදින සතකු, පණිවුඩ කරුවකු, විපත්වල දී පිහිට වන්නකු, පොලිසියේ උදව්කාරයකු, මහ පෙන්වන්නකු ලෙස පමණක් නොව, මිනිසා

වෙනුවට අභ්‍යවකාශයේ ගමන් කරන්නකු ලෙසද යොදා ගෙන ඇත. වෙනත් කිසිම සහජීවී සත්ව වර්ගයක් මෙතරම් විවිධ හා සංකීර්ණ ආකාරයෙන් අපට සේවය කර නැතැයි කිව හැකිය. මේ සියළුම කාර්මික දියුණුව මැද වුවත් බල්ලා තවමත් ඉහත සඳහන් කළ කාර්යයන් සඳහා යොදවනු ලැබේ. අද දක්නට ලැබෙන වර්ග සිය ගණනක් වන සුනඛයන් ගෙන් බොහෝ දෙනෙකු සුරතලයට ඇතිකරන සතුන් වන නමුත්, බල්ලා ලවා වැදගත් කටයුතු ඉටු කරගන්නා කාලය තවම අවසන් වී නැත.

දඩයම් සහකරුවකු ලෙස බල්ලා කෙතරම් සාර්ථක වීද යන්න, වෙනත් සතකු මෙවැනි සහජීවී ආකාරයට ගෘහාශ්‍රිතව ඇති දැඩි කිරීමට දරා ඇත්තේ ප්‍රයත්න කීපයක් පමණක් වීමෙන්ම පැහැදිළි වේ. කොටියා හා උකුස්සා මෙසේ ඇතිකිරීමට තැත් කොට ඇතත්, බෝ කිරීම අවශ්‍ය ලෙස සිදුවී නැත. මසුන් ඇල්ලීම සඳහා දියකාවන් පුහුණු කිරීමක් සමහර ආසියානු රටවල දක්නට ලැබේ. දියකාවන් ගේ බිත්තර ගෙන ඒවා කුකුල් බිත්තර සමඟ තබා රක්කවනු ලැබේ. ගෙදර ඇති කරන මෙම පක්ෂීන්ට මසුන් අල්ලන ආකාරය උගන්වනු ලැබේ. අල්ලන මසුන් ගිල දැමීමට නොහැකිවන සේ, කර පටියක්ද සවි කැරේ. නමුත් මෙහිදී ද "වරණ බෝ කිරීම" තුළින් වඩා හොඳ පක්ෂීන් ඇතිකිරීමට උත්සාහයක් ගෙන නැත.

තවත් පැරණි සිරිතක් නම්, කුඩා මාංශභක්ෂකයන් පළිබෝධ නාශකයන් ලෙස යොදා ගැනීමයි. අපේ ඉතිහාසයේ කෘෂිකාර්මික අවධිය පැමිණෙන තුරු මෙම නැම්ම එතරම් දියුණු නොවීය. විශාල පරිමාණයෙන් ධාන්‍ය ගබඩා කිරීමත් සමඟ කෘන්තකයන් විශාල ප්‍රශ්නයක් වූ අතර මේ නිසා කෘන්තකයන් මරාකන සතුන් යොදා ගැනීම අවශ්‍ය විය. මෙහිදී අපේ ආධාරයට පැමිණි සත්තු නම් බළල්ලු ද, මුගටින්ද, හෝතඹුවෝ ද වෙති. මුල් දෙවර්ගය ගෘහාශ්‍රිතව ඇති කොට වරණ බෝ කිරීම අනුගමනය කරන ලදී.

ඉතාම වැදගත් සහජීවනයක් ලෙස දැක්විය හැක්කේ බර අදින සතුන් ලෙස සමහර වර්ග යොදා ගැනීමයි. අශ්වයන්,

Scanned by TapScanner

බුරුවන්, හරකුන්, පිනිමුවන් හා අලින් මේ ආකාරයට බෙහෙවින් ප්‍රයෝජනයට ගෙන ඇත. බොහෝ අවස්ථාවන්හිදී මුල් ප්‍රභේද, වරණ බෝ කිරීම මඟින් තවත් දියුණු කොට තිබේ. මෙසේ බෝකොට ඇති සත්තු නම් ආසියානු බුරුවාත්, අලියාත්ය. බුරුවා පැරණි සුමේරියන් වරුන් විසින් මීට අවුරුදු හාර දහසකට පමණ පෙර, බර අදින සතකු ලෙස ප්‍රයෝජනයට ගැනීම අභාවයට ගියේය. අලියාගෙන් තවත් වැඩ ගන්නා නමුත්, ඌ වරණ බෝ කිරීමේ ක්‍රමවලින් දියුණු කිරීම ඉතා දුෂ්කර වී ඇත.

යම් යම් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා සතුන් ඇතිකිරීමක්ද මෙම සහජීවන රටාවේ දක්නට ලැබේ. මෙහිදී සතුන් නොමරන බැවින්, ඔවුන් ගොදුරු ලෙස සැළකිය නොහැක. මෙහිදී සත්වයන්ගෙන් ලබා ගන්නේ කිරි, බිත්තර, ලෝම වැනි යම්කිසි කොටසක් පමණි. දඩයම් සහකරුවන්, පළිබෝධනාශකයන්, බර අදින්නන්, විවිධ දේ සපයන්නන් ආදී ප්‍රධාන වර්ගවලට අමතරව සමහර සත්ව වර්ග අපේ වර්ගයා සමඟ අසාමාන්‍ය හා විශේෂ සහජීවන සම්බන්ධතා ගොඩ නගා ඇත. පරෙවියා පණිවුඩ ගෙන යන්නෙකු ලෙස අවුරුදු දහස් ගණනක් තිස්සේ යොදා ගෙන තිබේ. යුද්ධ කාලවලදී මෙම සම්බන්ධතා කෙතරම් වැදගත් වූයේද යන්න පරෙවියන් නතර කිරීමට උකුස්සන් යොදා ගැනීමෙන්, පෙනීයයි. මෙයට බොහෝ වෙනස් කාර්යයක් වන සුදු කෙළිම සඳහා කුකුළෝත්, මත්ස්‍යයෝත් බෝකරනු ලැබෙත්, වෛද්‍ය විද්‍යාවේ රසායනාගාර පරීක්ෂණ සඳහා ගිනි හාවෝ, බහුල ලෙස භාවිතයට ගැනෙයි. මේ අප සමඟ යම්කිසි ආකාරයක සම්බන්ධතාවක් පවත්වා ගන්නා ප්‍රධාන සහජීවී සත්ව වර්ගයෝය. මෙම සම්බන්ධතාවෙන් ඔවුන්ට ඇති වාසිය නම්, අප තවදුරටත් ඔවුන් අපේ සතුරන් ලෙස නොසැලකීමයි. මේ නිසා ඔවුන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි වේ. ලෝක ජනගහනය අනුව බලන විට ඔවුහු ඉතා සාර්ථක වී ඇත්තාහ. නමුත්, මේ සඳහා ඔවුන්ගේ පරිණාමීය නිදහස කැප කිරීමට සිදුවී තිබේ. හොඳින් ආහාර දී අප ඔවුන් රැක බලා ගන්නා නමුත්, ඔවුන්ගේ ප්‍රවේණි ස්වාධීනත්වය නැති වී, අපට අවශ්‍ය ආකාරයට ඔවුන්ගේ බෝ කිරීම සිදු

කෙරෙයි.

ගොදුරු හා සහජීවී රටාවට පසුව දක්නට ලැබෙන සත්ව සම්බන්ධතාවන් ගේ තුන්වැනි වර්ගය තරහකාරී බවයි. අපේ වර්ගයා සමඟ ආහාර හෝ ඉඩකඩ සඳහා තරඟ කරන සියලුම සත්ව වර්ග දරුණු ලෙස විනාශ කරනු ලැබෙති. කෑමට ගත නොහැකි හෝ සහජීවියකු ලෙස ප්‍රයෝජනවත් නොවන සියලුම සත්ව වර්ග ද විනාශ කරනු ලැබේ. මෙය ලෝකය පුරාම දැකිය හැකි ක්‍රියාවලියකි. සුළු තරහකරුවන් සම්බන්ධයෙන් එකම පිළිවෙතක් අනුගමනය කරනු නොලැබේ. ප්‍රබල තරහකරුවන්ට නම් කිසිම බුරුලක් දෙනු නොලැබේ. අතීතයේදී අපේ ප්‍රධානම විරුද්ධවාදීන් වුයේ අපට කිට්ටුම අග්‍රේශ නෑයන් වන අතර, අපේ කුලයේ ඉතිරි වී ඇති එකම සත්ව විශේෂය, "නිරුවත් වානරයා" පමණක් වීම පුදුමයට කරුණක් නොවේ. විශාල මාංශභක්ෂකයන් ද අපේ අනිත් ප්‍රබල තරහකරුවෝ වුහ.

අපේ වර්ගයේ ජනගහනය එක්තරා මට්ටමකට පැමිණි අවස්ථාවලදී, ඔවුහු ද අපේ වර්ගයා විසින්ම විනාශ කෙරුණි. උදාහරණයක් වශයෙන් අද යුරෝපයේ වෙනත් විශාල සත්ව වර්ග කිසිවක් දක්නට නැති අතර, එහි ඇත්තේ අනන්ත අප්‍රමාණ සංඛ්‍යාවක් නිරුවත් වානරයන් පමණි. අනික් වර්ගය වන පරපෝෂිතයන් ගේ අනාගතය මීටත් වඩා අඳුරු බව පෙනේ. මෙම සත්ව වර්ග සමඟ කෙරෙන සටන වඩාත් ප්‍රබල වී ඇත. වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමඟ පරපෝෂිතයන්ගේ බලය අඩුවෙයි. පරපෝෂිතයන් නැතිවීමෙන් අපේ සෞඛ්‍යය වැඩි දියුණුවීම නිසා ජනගහනය ඉතා ශීඝ්‍රයෙන් වැඩිවීමෙන්, අනිකුත් සුළු තරහකරුවන්ද විනාශ කිරීමේ අවශ්‍යතාව වැඩිවන බැවින්, මෙය සියලුම සත්ව වර්ගවලට තර්ජනයක් වෙයි.

පස්වැනි වර්ගය වන විලෝපියා ද අවසානය කරා ගමන් කරමින් සිටී. ඇත්ත වශයෙන්ම අපි කිසිම සත්ව වර්ගයක ප්‍රධාන ආහාරය නොවූ අතර අපේ ඉතිහාසයේ කිසිම

Scanned by TapScanner

අවස්ථාවකදී මෙවැනි හේතූන් නිසා නිරුවත් වානරයාගේ සංඛ්‍යාව අඩු නොවීය. නමුත් විශාල මාංශ භක්ෂකයන් වන කිඹුලන් හා මොරුන් වැනි සතුන් වරින් වර අපේ කොටස් කා දමා ඇතත්, ඔවුන්ගේ අවසානය ඉතා ළංව ඇති බව පෙනේ. (පරපෝෂිතයන් හැරුණු විට) නිරුවත් වානර මරණවලට වැඩිපුරම වගකිව යුතු සතා වන්නේ පෝෂ්‍යදායි මළකුණ කා දැමිය නොහැකි සතකි. මෙම මරණීය සතුරා නම් විසකුරු සර්පයායි. සියලුම සත්ව වර්ග අතුරෙන් අප වඩාම අකමැති සතා වී ඇත්තේත් ඌ බව පෙනේ.

ගොදුර, සහජීවියා, තරහකරුවා, පරපෝෂිතයා හා විලෝපියා යන මෙම අන්තර් විශේෂ සම්බන්ධතා පහ අනිකුත් සත්ව වර්ග අතර ද දැකිය හැකි වේ. ඒවා අපට පමණක් විශේෂ වූ සම්බන්ධතා නොවේ. අප අනිකුත් සතුන්ට වඩා මෙම සම්බන්ධකම් දියුණු කොට ඇති නමුත්, මේවා මූලික වශයෙන් එකම ආකාරයේ සම්බන්ධතාවන් වෙයි. මා කලින් කී පරිදි මේ සියල්ලම, සත්වයන් පිළිබඳව ආර්ථික ආකල්පය ලෙස දැක්විය හැකි වෙයි. මෙයට අමතරව අපට පමණක් සීමා වූ විද්‍යාත්මක සෞන්දර්යාත්මක හා සංස්කෘතික ආකල්ප ද දක්නට ලැබේ.

විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක ආකල්ප අපේ බලවත් ගවේෂණාත්මක ලක්ෂණයේ ප්‍රතිඵලයක් වෙයි. අපේ කුතුහලය හා විපරම්කාරී බව සියලුම ස්වාභාවික සංසිද්ධි පරීක්ෂා කිරීමට අප පොළඹවන අතර, මේ අතින් අපගේ වැඩිම අවධානය යොමු වී ඇත්තේ සත්ව ලෝකයටයි. සත්ව විද්‍යාඥයකුට සියලුම සත්තු එක හා සමාන වෙති. ඔහුට හොඳ හා නරක සත්ව විශේෂ නැත. ඔහු උන් සියල්ලන්ම ගැන අධ්‍යයනය කරයි. සෞන්දර්යාත්මක ආකල්පයද මූලික වශයෙන් මෙයට සමාන වන නමුත් එහි විභාග කෙරෙන කරුණු වෙනස් වේ. මෙහිදී විවිධ සත්ව හැඩයන්, වර්ණයන්, රටාවන් හා චලනයන් ආදිය විශ්ලේෂණය සඳහා වූ පද්ධති ලෙස නොව, සුන්දර වස්තු ලෙස අධ්‍යයනය කරනු ලැබේ.

සංකේතාත්මක ආකල්පය මේ සියල්ලෙන්ම වෙනස් වෙයි. මෙයට ආර්ථික හෝ ගවේෂණ අංශ සම්බන්ධ නොවේ. මෙහිදී විවිධ සංකල්ප දෘෂ්ටිමය වශයෙන් දැක්වීම සඳහා සත්තු යොදාගනු ලැබෙති. සත්ව විශේෂයකට රෞද්‍ර පෙනුමක් ඇත්නම් එය යුද්ධ සංකේතයක් වෙයි. සුරතල් බවක් පෙන්වන සත්තු ළමා සංකේත වෙයි. ඇත්ත වශයෙන්ම එම සතා රෞද්‍ර හෝ සුරතල් සතෙක් වන්නේ ද යන්න මෙහිදී වැදගත් නොවේ. මෙය විද්‍යාත්මක ආකල්පයක් නොවන බැවින්, සතාගේ නියම ස්වභාවය විමසීමට හාජනය කරනු නොලැබේ. සුරතල් ලෙස අප සලකන සතා තියුණු දත් හා දරුණු චණ්ඩ බවකින් යුත් සතකු වීමට පුළුවන. නමුත්, සංකේතාත්මක සතකු ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ පෙනුම පමණකි.

සත්වයන්ට අප දක්වන සංකේතාත්මක ආකල්පය හඳුන්වනු ලබන්නේ "මානවරූපී" යනුවෙනි. බොහෝ විද්‍යාඥයින් මෙම පදය යොදා ගන්නේ අවනම්බුවකට මෙනි. සත්ව ලෝකය නියම ආකාරයට ගවේෂණය කිරීමට නම්, අපේ විෂයමුල ස්වභාවය රැකගත යුතු වෙයි. නමුත් මෙය මතුපිටින් පෙනෙන තරම් පහසු කටයුත්තක් නොවේ.

ප්‍රතිමා, ප්‍රතිරූප හා ලාංඡන ලෙස සත්ව රූප යොදා ගැනීමට අමතරව, අනිකුත් සත්ව වර්ග අපේ සගයන් ලෙස සැලකීමට අප යොමු කරන සියුම් ක්‍රම ගණනාවක් ම තිබේ. ඉතා බුද්ධිමත් විද්‍යාඥයා වුවද තම බල්ලාට ආදර වචන යොදා කථා කරන්නේ, ඌ තවත් මිනිසකු ලෙස සලකා ගෙනය. බල්ලාට ඔහුගේ වචන තේරුම් ගත නොහැකි බව ඔහු හොඳාකාරව දනී. මෙම හැඟීම්වල ස්වභාවය කුමක්ද? ඒවා යටපත් කිරීම මෙතරම් අපහසු ඇයි? සමහර සතුන්ට අප කැමති වන්නේත්, සමහර සතුන් පිළිකුල් කරන්නේත් ඇයි? එය සුළුකොට තැකිය යුතු කරුණක් නොවේ. අපේ වර්තමාන සංස්කෘතියේ අන්තර්-විශේෂ සම්බන්ධතාවන් සියල්ලම රැඳී ඇත්තේ මේ මතයි. අපි සමහර සතුන්ට ඉතා ආදරය කරන්නාක් මෙන් සමහර සත්ව වර්ගවලට වෛර කරන්නෙමු. මෙම සම්බන්ධකම් හුදු ආර්ථික හා ගවේෂණාත්මක අංශවලින් පමණක් පැහැදිළි කළ නොහැක. අපට මෙම සතුන්ගෙන්

Scanned by TapScanner

ලැබෙන සංඥාවන් නිසා කිසියම් ආකාරයක ප්‍රතිචාරයක් අප තුළ ඇතිවන බව පැහැදිලිවම පෙනේ. අපි සතාට, සතකු ලෙස ප්‍රතිචාර දක්වතැයි සිතමින්, අපි අපම රවටා ගනිමු. සතුන් ප්‍රිය ජනක, ආසා උපදවන හෝ භයංකාර ලෙස අපි වර්ග කොට දක්වමු. අපි කුමක් නිසා මෙසේ කරමුද?

මෙම ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට කරුණු කීපයක් අවබෝධ කරගත යුතුය. අපේ සංස්කෘතියේ සත්ව ආදර හා සත්ව වෛර මොනවාද? ඒවා වයස හා ලිංගය අනුව වෙනස් වන්නේ කෙසේද? මේ සම්බන්ධයෙන් පිළිගත හැකි නිගමනවලට එළඹීමට නම්, විශාල පරිමාණයකින් ප්‍රමාණාත්මක සාක්ෂි අවශ්‍ය වෙයි. මේ සඳහා වයස අවුරුදු හතරත්, දහ හතරත් අතර වූ ළමයින් 80,000ක් සම්බන්ධ කොට බ්‍රිතාන්‍යයේ පරීක්ෂණයක් කරන ලදී. සත්වයන් පිළිබඳ වූ රූපවාහිනී වැඩ සටහනකදී "ඔබ වැඩියෙන් කැමති කුමන සතාටද ?" යන සරල ප්‍රශ්නය අසන ලදි මේ සඳහා ලැබුණ පිළිතුර විශාල සංඛ්‍යාවෙන් සසම්භාවී ලෙස පිළිතුරු 12,000 ක් තෝරාගෙන විශ්ලේෂණය කරන ලදි.

වැඩියෙන් ආදරය කරන සත්තු වුවෝ කවරහුද ? ළමයින් ගෙන් සියයට 97.15 ක්ම තමන් වඩාම කැමති සතා ලෙස තෝරා ගත්තේ ක්ෂීරපායි සතෙකි. පක්ෂීන් මුල් තැනට අවේ සියයට 1.6 ක පමණකි. උරගයන් සඳහා එය සියයට 1 ක්ද, මත්ස්‍යයන් සඳහා සියයට 0.1 ක් ද, අපෘෂ්ඨවංශීන් සඳහා සියයට 0.1 ක් ද, උභයජීවීන් සඳහා සියයට 0.05ක් ද විය. ක්ෂීරපායින් සම්බන්ධයෙන් යම්කිසි විශේෂයක් දක්නට ඇති බව මෙයින් පැහැදිලිවම පෙනේ. මෙම සමීක්ෂණය අනුව වැඩියෙන්ම කැමති සතුන් අතරින් මුල් තැනට ආ සතුන් දහදෙනා මෙසේය.

1.	චිම්පන්සියා (13.5%)	2.	වඳුරා (13%)
3.	අශ්වයා (9%)	4.	බුෂ්බේබි (8%)
5.	පැන්ඩා (7.5%)	6.	වලහා (7%)
7.	අලියා (6%)	8.	සිංහයා (5%)
9.	බල්ලා (4%)	10.	ජිරාෆ් (2.5%)

මෙම සත්වයන්ට කැමැත්ත දැක්වීමේ දී ප්‍රබල ආර්ථික හෝ සෞන්දර්යාත්මක බලපෑම් දක්නට නැති බව එකවරම පැහැදිළි වෙයි. ආර්ථික වශයෙන් වඩාම වැදගත් වන සතුන් දහදෙනා ගේ ලැයිස්තුව මෙයට වඩා බොහෝ වෙනස් වනු ඇත. අනිත් අතට මෙම දහදෙනා දීප්තිමත් වර්ණ සහිත වඩාම දර්ශනීය සතුන් දහ දෙනාද නොවෙති. නමුත් මොවුන් බොහෝ දෙනෙකුට, මානවරූපී ලක්ෂණ ඇති අතර, ළමයින් ප්‍රතිචාර දක්වන්නේ මේ ලක්ෂණවලට බව පෙනේ. මෙය සිතා මතා කරන දෙයක් නොවේ. මෙම සෑම සතකුගෙන්ම අපේ වර්ගයේ විශේෂ ලක්ෂණ මතක් කෙරෙන උත්තේජයක් ලැබෙන අතර, කැමති වන්නේ කුමකටද යන්න ගැන නියම අවබෝධයක් නැතිවම අපි මේවාට ස්වයංක්‍රිය ලෙස ප්‍රතිචාර දක්වමු. වඩාම කැමති සතුන් දහදෙනා ගේ දක්නට ඇති ප්‍රධාන මානවරූපී ලක්ෂණ මේවායි. (1) ඔවුන් සියලු දෙනාටම රෝම තිබේ. (2) ඔවුන්ගේ සිරුරේ පිට මායිම් රවුම් වේ. (3) ඔවුන්ට පැතලි මුහුණක් තිබේ. (4) ඔවුන්ට මුහුණෙන් හැඟීම් පළ කළ හැකිවේ. (5) ඔවුන්ට කුඩා වස්තු පරිහරණය කිරීමට පුළුවන. (6) ඔවුහු සමහර අවස්ථාවල දී සිරස් ඉරියව්වෙන් දක්නට ලැබෙති.

මෙම ලක්ෂණ වලින් වැඩි ගණනාවක් ඇති සතා ලැයිස්තුවේ ඉහළ තැනකට එයි. ක්ෂීරපායින් නොවන සතුන්ට වැඩි කැමැත්තක් නැත්තේ උන්ගේ මෙම ලක්ෂණ නොමැති බැවිනි. පක්ෂීන් අතර මුල් තැනට එන්නේ පෙන්ගුයින් (සියයට0.8) හා ගිරවා (සියයට 0.2) යි. පෙන්ගුයින් අනිත් සියලු පක්ෂීන්ට වඩා සිරස් බවක් දක්වයි. උගේ හොට අමුතු හැඩයක් ගන්නා බැවින්, මුහුණට පැතලි පෙනුමක් ලැබේ. අප කථා කරන වචන අනුකරණය කිරීමට ද උහට හැකි නමුත්,

Scanned by TapScanner

ඇවිදින විට ඌ තිරස් ඉරියව්වක් ගනී.

වඩාම කැමැත්තක් දක්වන ක්ෂීරපායින් අතරද විශේෂයෙන් සඳහන් කළයුතු කරුණු ගණනාවක්ම වේ. උදාහරණයක් වශයෙන් බළල් පවුලෙන් මේ ලැයිස්තුවට ඇතුළු වන එකම සතා සිංහයා පමණක් වී ඇත්තේ මන්ද? මෙයට හේතුව ලෙස පෙනෙන්නේ හිසේ කේසර ඇත්තේ සිංහයාගේ පමණක් වීමයි. මෙයින් මුහුණට වඩාත් පැතලි බවක් ලැබේ.

අපේ වර්ගයා ගේ මුලික දෘෂ්ටි සන්නිවේදන ක්‍රම ලෙස මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කිරීමද ඉතා වැදගත් තැනක් ගනී. සංකීර්ණ ආකාරයට මෙවැන්නක් පරිණාමය වී ඇත්තේ ක්ෂීරපායි සත්ව වර්ග කීපයක පමණි. එනම්, උසස් අග්‍රේශයන්ගේ, අශ්වයන්ගේ , බල්ලන් ගේ හා බළලුන්ගේයි. වඩාම කැමති සතුන් දහදෙනාගෙන් පස් දෙනකුම මෙම කණ්ඩායම්වලට අයිතිවීම පුදුමයක් නොවේ. ප්‍රකාශ කෙරෙන හැඟීම් හරිහැටි අවබෝධ කරගත නොහැකි වුවත් මෙයින් සතාත් අපත් අතර සමාන කමක් දැක්වෙයි. එක් එක් හාණ්ඩ හසුරුවීමේ හැකියාව අතින් පැන්ඩා හා අලියාට අද්විතිය ස්ථානයක් හිමිවේ. ආහාරයට ගන්නා සිහින් උණ බම්බු හොඳින් අල්ලා ගැනීම සඳහා පැන්ඩාගේ දිග මැණික් කටුවක් පරිණාමය වී ඇත. මෙවැනි ව්‍යුහයක් සත්ව ලෝකයේ වෙනත් කිසිම තැනක දක්නට නොලැබේ. මේ නිසා පැතලි පාද සහිත පැන්ඩාට සිරස් ඉරියව්වෙන් සිට කුඩා දේ අතින් කට ලහට ගෙන ඒමට හැකි වේ. "හොඩවැලද" සත්ව ලෝකයේ දක්නට ඇති අති විශේෂ ව්‍යුහයකි.

අපේ වර්ගයේ ලක්ෂණ වන සිරස් ඉරියව්ව, එය යොදා ගන්නා වෙනත් ඕනෑම සතකුට මානවරූපී වාසියක් ලබාදෙයි. වඩාම කැමති සතුන් දහදෙනා අතර ඇති අග්‍රේශයෝ, නිතර සිරස් ලෙස වාඩිවෙති. සමහර විට සිරස් ලෙස සිට ගැනීමටද තැත් කරන එම සතුන් ඒ ඉරියව්වෙන්ම ඇවිදිනු දක්නට ලැබේ. ජිරාෆ්ගේ අතිවිශේෂ ශරීරය නිසා ඌ සඳහටම සිරස් ඉරියව්වෙන් සිටින සතකු ලෙස පෙනේ. බල්ලා සමාජීය හැසිරීම

අතින් "මානරූපී" බවක් පෙන්වන නමුත් ශරීර ඉරියව්ව එයට නොගැළපේ. අපි මෙම තත්වය ඒ ආකාරයට නොපිළිගෙන බල්ලාට වාඩිවීමටත්, ආහාර ඉල්ලීමටත් පුරුදු කොට ඇත්තෙමු. අපට වලිගයක් නැති බැවින් උගේ වලිගය කොට කිරීමටත් "වරණ බෝකිරීම" මඟින් උගේ මුහුණ පැතලි කිරීමටත් අපි සමත් වී ඇත්තෙමු. සතුන්ට මානවරූපී ලක්ෂණ දීමට අපේ ඇති ආශාව කොතරම් බලවත් ද යන්න බල්ලාගේ දන්වල කාර්යක්ෂමතාව කැපකොට හෝ එය ලබා ගැනීමෙන් පෙනී යයි. මෙය සම්පූර්ණයෙන්ම ආත්මාර්ථකාමී ආකල්පයක් බව කිව යුතුයි. අපි සතුන් දකින්නේ සතුන් හැටියට නොව, අපේ ප්‍රතිබිම්බයන් හැටියටයි. ඔවුන් අපට අවශ්‍ය හැඩයට සකස් කර ගැනීමට හෝ ඉවත දැමීමට අපි පුරුදු වී ඇත්තෙමු.

අප මෙතෙක් සැළකිල්ලට ගත්තේ වයස හතරේ සිට දහහතර දක්වා වූ සියලුම වයස්වල ළමයින්ගේ, සතුන්ට ඇති කැමැත්තයි. මෙය විවිධ වයස් කාණ්ඩ අනුව වෙන් කළහොත්, එහි එක්තරා රටාවක් දක්නට ලැබේ. සමහර සත්ව වර්ගවලට ඇති කැමැත්ත වයස වැඩිවීමත් සමඟ ක්‍රමයෙන් අඩු වේ. සමහර සතුන්ට ඇති කැමැත්ත වැඩි වේ.

මෙහිදී පැහැදිළිව පෙනෙන එක් කරුණක් නම්, ඔවුන්ට ඇති කැමැත්ත හා මේ සතුන්ගේ ශරීර ප්‍රමාණයන් අතර සම්බන්ධතාවක් ඇති බවයි. වයසින් අඩු ළමයින් විශාල සතුන්ට කැමති වන අතර, වයස වැඩි ළමයි කුඩා සතුන්ට කැමති වෙති. එය පැහැදිළි කිරීමට ලොකුම සතුන් දෙදෙනා වන අලියා හා ජිරාෆ් සඳහා වූ සංඛ්‍යාවද, කුඩාම සතුන් දෙදෙනා වන බල්ලා හා බුෂ්බේබි සඳහා වූ සංඛ්‍යාව ද ගතහැකියි. සියලුම ළමයින්ගෙන් සියයට 6 ක කැමැත්තක් ඇති අලියාට වයස හතරේ ළමයින් අතර පමණක් බැලූ විට සියයට 15 ක කැමැත්තක්ද, වයස දහහතරේදී සියයට 3 ක කැමැත්තක්ද, ඇතිබව පෙනේ. ජිරාෆ් ද ජනප්‍රියතාව අතින් සියයට 10 සිට 1 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

වයස හතරේ ළමයින් අතර සියයට 4.5 ක කැමැත්ත

නිරුවත් වානරයා

Scanned by TapScanner

දැක්වූ බුෂ්බේබි නම් සතාට, වයස දහහතර වන විට සියයට 11 ක කැමැත්තක් පෙන්වා ඇත. බල්ලා සියයට 0.5 සිට 6.5 දක්වා ජනප්‍රියතාවේ වැඩිවීමක් පෙන්නුම් කරයි. වඩාම කැමති සතුන් දහදෙනා අතුරෙන් මධ්‍යම ප්‍රමාණයේ සත්තු වයස වැඩිවීමක් සමඟ මෙවැනි පැහැදිළි වෙනසක් නොපෙන්වති.

මූලධර්ම දෙකක් මඟින් මෙම කරුණු සියල්ලම සම්පිණ්ඩනය කිරීමට අපට පුළුවන. සත්වයන් ගේ සිත් ඇද ගැනීමේ ලක්ෂණය පිළිබඳ පළමුවැනි නියමය වන්නේ "සතකුගේ ජනප්‍රියතාව ඌට ඇති මානවරූපී ලක්ෂණ ගණනට සරල සම්බන්ධයක් පෙන්වයි " යන්නයි. දෙවැනි නියමයෙන් කියැවෙන්නේ "ළමයකු ගේ වයස ඔහු වඩාම කැමති සතාගේ ප්‍රමාණයට ප්‍රතිලෝම සම්බන්ධතාවක් දක්වන බවයි."

දෙවැනි නියමය පැහැදිළි කළ හැක්කේ කෙසේද? මෙම කැමැත්තට ඇත්තේ සංකේතාත්මක පදනමක් බව සලකන විට මෙයට දිය හැකි සරලම පැහැදිළි කිරීම වන්නේ, කුඩාම දරුවන් සතුන් දකින්නේ දෙමාපිය ආදේශයක් ලෙස වන අතර, වැඩිමහල් ළමයින් සතුන් සලකන්නේ ළමා ආදේශයක් ලෙස බවයි. සත්වයා, අපේ වර්ගය මතක් කරදීම පමණක් ප්‍රමාණවත් නොවේ. විශේෂ ගුණාංග ද උන් නිසා අපට මතක් විය යුතුය. දරුවා ඉතා කුඩා කාලයේ, දෙමාපියෝ ඉතා වැදගත් ආරක්ෂකයෝ වෙති. දරුවාගේ සියලුම කටයුතු ඔවුන් වටා සකස් වී තිබේ. දරුවාට ඔවුන් විශාල මිත්‍ර සතුන් වන අතර, මේ නිසා විශාල මිත්‍ර ලීලාවක් දක්වන සතුන් දෙමාපියන්ට සම කිරීමට දරුවා පුරුදු වේ. ක්‍රමයෙන් වයස් ගතවීමත් සමඟ දෙමාපියන් සමඟ තරහ කොට තම ආධිපත්‍යය තහවුරු කිරීමට දරුවා තැත් කරයි. තමා පාලකයා ලෙස සිතන්නට පුරුදු වන මහුට, අලියකු හෝ ජිරාෆ් වැනි සතකු පාලනය කිරීම අපහසු බව පෙනීයයි. මේ නිසා, ඔහු කැමති වන්නේ, ඔහුට හසුරුවා ගත හැකි ප්‍රමාණයේ කුඩා සතුන්ටයි. දරුවා ප්‍රෞඩමාකාර ලෙස වයසට වඩා පැහුණු බවක්

දක්වමින් දෙමාපියන් ලෙස ක්‍රියා කිරීමට පටන් ගනී. සත්‍ය සංකේතාත්මක දරුවකු බවට පත්වෙයි. දරුවා නියම දෙමාපියන් වීමට ළාබාල වන නෙයින්, ඔහු සංකේතාත්මක දෙමාපියන් බවට පත්වෙයි. සතුන් අයිනිකර ගැනීම වැදගත් වන අතර සුරතල් සතුන් තබා ගැනීම "ළදරු දෙමාපිය" ස්වරූපයක් ගනී. සුරතල් සතුන් ඇනිකිරීමේ ආශාව අපට ළමා කාලය තෙක් ඇති නොවන බව මෙහිදී දෙමාපියන්ට අවවාදයක් ලෙස දන්වා සිටිය යුතුය. ඉතාම ළාබාල ළමයින්ට සුරතල් සතුන්දීම විශාල වරදක් වෙයි. ඔවුන් මෙම සතුන් සලකන්නේ කඩා බිඳ දමා ගවේෂණය කළ යුතු වස්තුවක් ලෙස හෝ කරදරයක් ලෙසයි.

සත්වයන්ට කැමැත්ත දැක්වීම පිළිබඳ දෙවෙනි නියමයට වෙනස් වන එක් අවස්ථාවක් ඇති අතර, එය අශ්වයා පිළිබඳව වේ. මෙම සතාට දක්වන ප්‍රතිචාරය දෙයාකාරයකින් අස්වාභාවික වෙයි. ළමයින්ගේ වයස වැඩිවීම අනුව මෙම ප්‍රතිචාරය විශ්ලේෂණය කළ විට පෙනී යන්නේ, ජනප්‍රියතාව ක්‍රමයෙන් වැඩි වී නැවතත් ක්‍රමයෙන් අඩුවන බවයි. මෙම සතාගේ ජනප්‍රියතාව ඉහළම මට්ටමට නගින්නේ ළමයින් වැඩිවියට පත්වන කාලයේ දීය. පිරිමි හා ගැහැණු ළමයින් අශ්වයාට දක්වන ප්‍රතිචාරයන් වෙන වෙනම ගෙන විශ්ලේෂණය කළ විට පෙනී යන්නේ, ඌ ගැහැණු ළමයින් අතර පිරිමි ළමයින්ට වඩා තුන් ගුණයක් පමණ ජනප්‍රිය බවයි. වෙනත් කිසිම සත්ව ආදරයක් මේ හා සමාන ලිංගික වෙනසක් නොපෙන්වයි. මේ නිසා අශ්වයාට දක්වන ප්‍රතිචාරයේ පැහැදිළි වශයෙන්ම යම්කිසි අසාමාන්‍ය බවක් ඇති බැවින්, ඒ ගැන වෙනම සැළකිල්ල යොමු කළයුතු වෙයි.

අශ්වයා තුළ දක්නට ඇති අද්විතීය ලක්ෂණ තම්, උගේ පිට උඩ නැගී යා හැකිවීමයි. වඩාම කැමති සතුන් දහදෙනා අතුරෙන්, වෙන එකම සතකු සම්බන්ධයෙන්වත් මෙය සත්‍ය නොවේ. ළමයින් අතර මෙම සතාගේ ජනප්‍රියතාව ඔවුන් වැඩිවියට පත්වීමත් සමඟ ඉතා ඉහළ යෑමත්, ඌට ඇති කැමැත්ත පිරිමි හා ගැහැණු ළමයින් අතර වෙනස්වීමක් නිසා,

Scanned by TapScanner

අශ්වයාට දක්වන ප්‍රතිචාරයේ ප්‍රබල ලිංගික ලක්ෂණයක් ඇති බව නිගමනය කළ හැකිවෙයි. අශ්වයාගේ පිට උඩ නැගීමත්, ලිංගික ක්‍රියාවන් සඳහා පිට උඩ නැගීමත්, සංකේතාත්මකව සමකළහොත්, මෙම සතාට ගැහැණු ළමයින් වඩා කැමති වන්නේ මන්ද යන්න පුදුමයට කරුණක් වෙයි. නමුත් අශ්වයා ප්‍රබල ශක්තිමත් සතකු වන බැවින්, පිරිමියකු ලෙස සැලකීමට වඩා සුදුසු වේ. අශ්වයා පිටයැම කකුල් පළල් කොට සත්වයාගේ සිරුරට ගෑවී කෙරෙන රිද්මයානුකූල චලනයන් මාලාවකින් සමන්විත වේ. ගැහැණු ළමයින් අශ්වයාට වඩා කැමති වීමට හේතුව උගේ පුරුෂ ලක්ෂණයන් හා ඉරියව්වේ මෙන්ම චලනවල ස්වභාවය වේ. අප මෙහිදී කථා කරන්නේ සියලුම ළමයින් සම්බන්ධයෙන් බව මෙහිලා සඳහන් කළ යුතුය. සෑම ළමයින් එකොලහකින් එකෙක් අන් සියලුම සතුන්ට වඩා අශ්වයාට කැමති විය. මේ අතුරෙන් අශ්වයන් අයිතිකර ගත හැක්කේ ඉතා සුළු ප්‍රමාණයකට පමණි. එවැනි අය ඉක්මණින්ම මෙම කටයුත්තෙන් ලැබෙන තෘප්තිය හේතුකොට ගෙන අශ්වයන් පිටයැමට පුරුදු වෙති. අපේ සාකච්ඡාව සම්බන්ධයෙන් නම් මෙය එතරම් වැදගත් නොවේ.

වැඩිවියට පත්වීමත් සමඟ අශ්වයාගේ ජනප්‍රියතාව අඩුවෙයි. ලිංගික වර්ධනයත් සමඟ එහි ජනප්‍රියතාව වැඩිවිය යුතු යයි බලාපොරොත්තු විය හැකි නමුත්, සිදුවන්නේ එයට හාත්පසින් විරුද්ධ දෙයකි. මෙයට හේතුව ලිංගික හැඟීම්වල වර්ධනයත් සමඟ ඒවා රහසිගත දේ ලෙස සැලකීමට පුරුදුවීම නිසා අශ්වයන් පිළිබඳ ආශාව අඩුවීමයි. බොහෝ වඳුරන්ට ඉතා හොඳින් පෙනෙන ලිංගික ඉන්ද්‍රිය තිබේ. වයසින් මුහුකුරා නොගිය ළමයෙකුට මේවා එතරම් වැදගත් නොවන අතර, ඔහුගේ වැඩි අවධානය යොමු වන්නේ උගේ මානව ලක්ෂණයන්ටයි. නමුත් වැඩිහිටි ළමයින්ට මෙම ලිංගික ඉන්ද්‍රියයන් ඔවුන් තුළ ලජ්ජාවක් ඇතිකරන අතර, මේ නිසා මෙම සතුන්ගේ ජනප්‍රියතාව අඩුවෙයි.

ළමයින්ගේ සත්ව ආලය පිළිබඳ තත්වය මෙයයි. වැඩිහිටියන් ගේ සත්ව ප්‍රතිචාරයන් මීට වඩා පැසුණු

විවිධත්වයක් පෙන්වන නමුත්, මුලික වශයෙන් මානවරූපී ලක්ෂණවලට ප්‍රධාන තැනක් ලැබේ. මෙවැනි සංකේතාත්මක ප්‍රතිචාරයන් මඟින් සත්වයාගේ නියම ස්වභාවය ගැන කිසිවක් නොකියැවෙන නමුත්, ඒවා අපේ හැඟීම් පිට කර ගැනීමට අවස්ථාවක් ලබාදෙයි.

මෙම ප්‍රශ්නයේ අනික් පැත්ත වන, සත්ව වෛරයන් ගැන සැළකිල්ල යොමු කිරීමට පෙර පිළිතුරු දියයුතු තවත් එක් ප්‍රශ්නයක් තිබේ. ඉහත විස්තර කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵල සමස්තයක් වශයෙන් අපේ වර්ගයා සම්බන්ධයෙන් සත්‍ය නොවේයයි කිසිවෙකුට තර්ක කළ හැකියි. ඒ ඒ නම් වලින් හැඳින්වෙන විවිධ සත්ව වර්ග සම්බන්ධයෙන් මෙය සත්‍ය වේ. පැන්ඩා ගැන කැමැත්තක් හෝ අකමැත්තක් පෙන්විය හැක්කේ ඌ ගැන දන්නා කෙනෙකුට පමණි. උත්පත්තියෙන්ම පැන්ඩා පිළිබඳ ප්‍රතිචාරය දැක්විය හැකි නොවේ. නමුත් වැදගත් වන්නේ එය නොවේ.

පැන්ඩා තෝරා ගැනීම සංස්කෘතික වශයෙන් තීරණය කෙරෙන්නක් වුවද, ඌ තෝරා ගැනීමට හේතුව ඊට වඩා ගැඹුරු ජීව ක්‍රියාවලියකි. මෙම සමීක්ෂණය වෙනස් සංස්කෘතියක කරන ලද්දේ නම්, වඩාම කැමැත්ත දක්වන සත්ව වර්ගය මෙයට වඩා වෙනස් විය හැකියි. නමුත් ඔවුන් ද තෝරාගනු ලබනු ඇත්තේ අපේ මූලික සංකේතාත්මක අවශ්‍යතාවන්ට අනුවයි. සත්ව ආකර්ෂණයන් පිළිබඳ "නියම දෙක" මෙහිදී ක්‍රියාත්මක වනු ඇත.

සත්ව "වෛරයන්" පිළිබඳ සංඛ්‍යාවන් ද මෙයටම සමාන විශ්ලේෂණයකට භාජනය කළ හැකිවේ. වැඩියෙන්ම අකමැති සතුන් දහදෙනා මෙසේය. (1) නයා (27%) (2) මකුළුවා (9.5%) (3) කිඹුලා (4.5%) (4) සිංහයා (4.5%) (5) මීයා (4%) (6) හිකැනලා (3%) (7) ගෝරිල්ලා (3%) (8) රයිනෝසිරස් (3%) (9) හිපපොටේමස් (2.5%) (10)

Scanned by TapScanner

කොටියා(2.5%)

මෙම සියලුම සතුන්ට පොදු එක් ලක්ෂණයක් වේ. ඔවුහු සියලු දෙනාම අන්තරාදායකය. කිඹුලා, සිංහයා හා කොටියා සතුන් මරා කන මාංශභක්ෂකයන් වන අතර ගෝරිල්ලා, රයිනෝසිරස් හා හිපපොටේමස්ට අවශ්‍ය නම් ඉතා පහසුවෙන් අප මරා දැමිය හැක. පළිබෝධයකු වන මීයා රෝග පතුරුවයි. නයාත්, මකුළුවාත් විසකුරු සත්තු වෙති.

වැඩියෙන් කැමැත්ත දක්වනු ලැබූ සතුන් තුළ වූ මානවරූපී ලක්ෂණ මෙම සතුන් තුළ දක්නට නොලැබේ. මෙය සත්‍ය නොවන්නේ, සිංහයා හා ගෝරිල්ලා සම්බන්ධයෙන් පමණි. සිංහයා මෙම ලැයිස්තු දෙකේම දක්නට ලැබෙන එකම සතා වේ. මෙම සත්වයාට දක්වන උභයගුණිය ප්‍රතිචාරයට හේතුව, උගේ දක්නට ඇති ආකර්ෂණීය මානවරූපී ලක්ෂණ හා සාහසික විලෝපීය හැසිරීමයි. ගෝරිල්ලා ගේ ප්‍රබල මානවරූපී ලක්ෂණ දැකිය හැකි නමුත්, අවාසනාවකට මෙන් උගේ මුහුණේ ව්‍යුහය නිසා ඌ ඉතා චණ්ඩ, බියජනක බවක් පෙන්වයි. මෙය උගේ අස්ථීවල ව්‍යුහය නිසා ඇති වූවක් වන අතර එය උගේ නියම ස්වභාවයට කිසිම සම්බන්ධකමක් නොපෙන්වයි. නමුත් උගේ දක්නට ඇති අතිවිශාල ශරීරික ශක්තිය හේතු කොට ගෙන, ඌ අපට පෙනෙන්නේ ම්ලේච්ඡ, කෲර බලයක සංකේතයක් ලෙසයි.

සත්ව වෛරයන් අතර දක්නට ඇති ඉතාම සිත් ඇද ගන්නා සුලු ලක්ෂණයක් නම්, නයා හා මකුළුවාට දක්වන ප්‍රබල ප්‍රතිචාරයයි. මෙය මෙම සතුන්ගේ අන්තරායදායක බව මත පමණක් පැහැදිළි කළ නොහැක. මෙයට හේතුව එක්කෝ උන්ගේ ප්‍රබල සංකේතාත්මක වැදගත්කමක් තිබීම හෝ මහහැරීමට බලවත් සහජ ප්‍රතිචාරයන් තිබීම හෝ වේ.

නයා ඉතා ඈත කාලයේ සිටම ලිංගික සංකේතයක් ලෙස සලකනු ලැබීය. විෂ සහිත වීම නිසා එයින් නියෝජනය වන්නේ පිළි නොනැගෙන කාමය බැවින්, උගේ ජනප්‍රියතාව

අඩුවීමට මෙය එක් හේතුවක් විය හැකියි. මෙයට වෙනත් හේතු ද තිබේ. වයස හතර හා දහහතර අතර ළමයින් නයාට දක්වන ප්‍රතිචාරය විමසිල්ලට ලක් කළ විට පෙනී යන්නේ, අකමැත්තේ ඉහළම මට්ටම දක්නට ලැබෙන්නේ වැඩිවියට පත්වීමට බොහෝ කාලයකට පෙර බවයි. වයස හතරේදී සියයට 30ක් පමණ වන මෙය, වයස හයේදී ඉහළම තත්වයට වැඩිවෙයි. මෙතැන් සිට ක්‍රමයෙන් අඩුවන මෙම අකමැත්ත වයස දහහතර වන විට සියයට 20 දක්වා පහත බසී. පිරිමි හා ගැහැණු ළමයින් ගේ ප්‍රතිචාරයන්හි දක්නට ලැබෙන්නේ සුළු වෙනසක් වන අතර ගැහැණු ළමයින් ගේ ප්‍රතිචාරය පිරිමින්ට වඩා මදක් ප්‍රබල වේ. වැඩිවියට පත්වීම මෙම ප්‍රතිචාරය මත කිසිම බලපෑමක් නොකරන බව පෙනේ.

මේ අනුව නයා ප්‍රබල ලිංගික සංකේතයක් ලෙස සැළකීම අපහසු බව පෙනේ. නයා වැනි සත්වයන්ට අපේ වර්ගයා තුළ සහජ පිළිකුලක් ඇතැයි සැළකීම වඩා නිවැරදි වෙයි. මෙම ප්‍රතික්‍රියාව ඉතා මුල් කාලයේම දියුණුවීම මෙන්ම, අනික් සත්ව ආලයන් හා වෛරයන් සමඟ සසඳන විට, එය ඉතා ඉහළ මට්ටමක පැවතීම ද මෙයින් පැහැදිළි කළ හැක. අපේ කිට්ටුම නෑයන් වන චිම්පන්සි, ගෝරිල්ලා හා ඔරන්ඔටන් වැනි සතුන්ගේ ප්‍රතිචාරයන් සමඟ ද එය ගැළපෙයි. මෙම සත්වයන්ද නයාට විශාල බියක් දක්වන අතර එය ළදරු කාලයේ සිටම දක්නට ලැබේ. ඉතා බාල වානරයන් ගේ මෙවැන්නක් දක්නට නොලැබෙන නමුත්, අවුරුදු කීපයක් වයස්ගත වූවන්ගේ එය ඉතා හොඳින් දියුණු වී තිබේ. නයාට දක්වන මෙම පිළිකුල, නොනැසී පැවතීමද වැදගත් වන අතර එය අපේ පැරණි මුතුන් මිත්තන්ටද ඉතා ප්‍රයෝජනවත් වන්නට ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රතිචාරය සහජයෙන් ඇති වූවක් නොවේ යැයිද, ඉගෙනීමේ ප්‍රතිඵලයක් වශයෙන් `ඇතිවන සංස්කෘතික සංසිද්ධියක් යැයිද, යනුවෙන් තර්ක ඉදිරිපත් වී තිබේ. අස්වාභාවික ලෙස තනිකොට ඇති කරන ලද තරුණ චිම්පන්සි, නයින් දුටුවිට බිය පිළිබඳ ප්‍රතිචාරයක් පෙන්වීමට අසමත් විය. නමුත් මෙම පරීක්ෂණ ගැන එතරම් විශ්වාසයක් තිබිය හැකි නොවේ. සමහර අවස්ථාවන්හි දී පරීක්ෂාවට ලක්

Scanned by TapScanner

කළ විම්පන්සි ඉතාම ළාබාල සතුන් විය. අවුරුදු කිහිපයකට පසුව ඔවුහු නැවතත් පරීක්ෂා කරන ලද්දෝ නම්, මෙම ප්‍රතිචාරය දක්නට නොලැබෙනු ඇත. අනිත් අතට, තනිකොට ඇතිදැඩි කිරීම නිසා, ඔවුන් මානසික රෝගීන් බවට පත්වන්නට ඇත. මෙවැනි පරීක්ෂණවලට පදනම් වී ඇත්තේ සහජ ප්‍රතිචාරයන් පිළිබඳ වැරදි අවබෝධයකි. තරුණ විම්පන්සියා ගේ ජීවිතයේ මුල් කාලයේදී බියජනක වස්තුවලට ප්‍රතිචාර දැක්වීමට ඉගෙන ගතහොත්, නයකු දුටු විට අන් දේට වැඩියෙන් නයාට ප්‍රතිචාර දැක්වීමට හැකිවනු ඇත. නයාට දක්වන බිය අනිත් දේවලට දක්වන බියට වඩා ඉතා වැඩිවේ. සහජ සාධකයන් මෙයට හේතුවන බව පෙනේ. නයකු දුටුවිට තරුණ විම්පන්සියා තුළ ඇතිවන භීතියත්, අපේ වර්ගයා නයින්ට දක්වන පිළිකුළත්, වෙනත් ආකාරයකින් පැහැදිළි කළ නොහැක.

ළමයින් මකුළුවන්ට දක්වන ප්‍රතික්‍රියාව මෙයට වඩා වෙනස් ආකාරයක් ගනී. මෙහිදී පිරිමි හා ගැහැණු ළමයින් අතර පැහැදිළි වෙනසක් දක්නට ලැබේ. වයස හතරේ සිට දහහතර දක්වා පිරිමි ළමයින් මකුළුවන්ට දක්වන අකමැත්ත වයසත් සමඟ ක්‍රමයෙන් වැඩිවෙයි. එහෙත් එය ඉතා සුළු වශයෙනි. ගැහැණු ළමයින් සම්බන්ධයෙන්ද වැඩිවිය පැමිණෙන තෙක් මෙය ඒ ආකාරයටම සිදුවේ. නමුත්, වැඩිවියට පත්වීමත් සමඟ මෙම අකමැත්ත ඉතා සියුම් ලෙස වැඩි වීමෙන් වයස දාහතරේ දී එය පිරිමි ළමයින් ගේ මෙන් දෙගුණයක් වෙයි. මෙහිදී වැදගත් සංකේතාත්මක සාධකයන් ක්‍රියාත්මක වන බව පෙනේ. විසකුරු මකුළුවන්, ගැහැණු පිරිමි දෙකොටසටම එකම තරමට අනතුරුදායක වේ.

ගැහැනුන් වැඩිවියට පත්වීමත් සමඟ මකුළුවන්ට දක්වන වෛරය වැඩිවීමට හේතුව ලෙස දැක්විය හැක්කේ, ගැහැනුන් තම සිරුරේ රෝම ඇතිවීමට දක්වන අකමැත්තයි. සිරුරේ රෝම ඇතිවීම පුරුෂ ලක්ෂණයක් ලෙස ළමයින්ට පෙනෙනු ඇත. මේ නිසා සිරුරේ රෝම ඇතිවීම නිසා ගැහැණු ළමයකු පිරිමි ළමයෙකුට වඩා කැළඹිල්ලට පත්වනු

නොඅනුමානය. මකුළුවාගේ දිග කකුල් රෝම මෙන් පෙනෙන අතර මෙය රෝමවලට තමා තුළ ඇති අකමැත්ත දැක්වීමට ඉතා සුදුසු සංකේතයක් වෙයි.

අප අනිකුත් සතුන්ට දක්වන ආදර හා වෛර මේවායි. ආර්ථික විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක ආකල්පයන්ද සමඟ එක්වූ විට, මෙය අද්විතීය හා සංකීර්ණ අන්තර් - විශේෂ සම්බන්ධතාවක් බවට පත්වෙයි. අප වයසට යෑමත් සමඟ මෙය වෙනස් වේ. අන්තර් විශේෂ ප්‍රතික්‍රියාවන් වයස අනුව අවස්ථා හතරකට බෙදා දැක්විය හැකිය. මුල් අවස්ථාව වන්නේ අප සම්පූර්ණයෙන්ම දෙමාපියන් මත යැපෙමින් විශාල සතුන්, දෙමාපිය සංකේතයක් ලෙස යොදා ගනිමින්, උන්ට ඉතා ප්‍රබල ලෙස ප්‍රතිචාර දක්වන ළදරු අවධියයි. දෙවැන්න ළදරු දෙමාපිය අවධිය ලෙස දැක්විය හැක. දෙමාපියන් සමඟ තරහ කිරීම ආරම්භ කරන මෙම අවධියේදී ළමයින් වෙනුවට යොදාගත හැකි කුඩා සතුන්ට අපි ඉතා තදින් කැමැත්තක් දක්වමු. සුරතල් සතුන් ඇති කරන්නේ මේ කාලයේදීය. තුන්වැන්න වන්නේ පූර්ව - වැඩිහිටි අවධියයි. මෙහිදී විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක ගවේෂණය මුල් තැනට එයි. සමනලයන් එකතු කරන්නේත්, විද්‍යාත්මකව සතුන් පිළිබඳව හදාරන්නේත් මේ අවධියේයි. හතරවැනි අවස්ථාව වන්නේ තරුණ වැඩිහිටි අවධියයි. මෙම අවධියේදී ඉතාම වැදගත්වන්නේ තම වර්ගයේ විරුද්ධ ලිංගික සතුන්ය. වාණිජමය හෝ ආර්ථික අතින් හැර මෙහිදී අනිකුත් සත්ව වර්ග පිළිබඳ උනන්දුවක් දක්වනු නොලැබේ. පස්වැන්න වැඩිහිටි දෙමාපිය අවධියයි. මෙහිදී නැවත වරක් සංකේතාත්මකව සත්තු අපේ ජීවිතයට එක්වන නමුත්, ඒ අපේ දරුවන් ගේ සුරතලුන් ලෙසයි. හයවැන්න වන්නේ අපේ දරුවන් අප හැර යෑමෙන් පසුව ඔවුන්ගේ තැන ගැනීමට නැවතත් සතුන් ඇතිකරන පශ්චාත් - දෙමාපිය අවධියයි. (දරුවන් නැති වැඩිහිටියන් ගේ මෙම අවධිය බොහෝ කලින්ම ආරම්භ විය හැකියි.) අවසානයේ අපි හත්වෙනි අවස්ථාව වන වියපත් අවධියට පත්වෙමු. මෙහිදී වැඩි අවධානය යොමු වන්නේ නැතිවී යාමේ තර්ජනයට මුහුණ පා ඇති සතුන් කෙරෙහිය.

Scanned by TapScanner

අනිකුත් අංගවලින් ඔවුන් සිත් ඇද ගන්නා සුළු ද නැද්ද යන්න මෙහිදි වැදගත් නොවේ. බොහෝ ළමයින් කැමැත්තක් නොදක්වන දුර්ලභ ගෝරිල්ලාත්, රයිනෝසිරස් වැනි සතුන්, මෙම අවස්ථාවේ දැඩි අවධානයට ලක්වෙති. ඔවුන් රැකගත යුතුය. මෙහි ඇති සංකේතාත්මක සමීකරණය ඉතා පැහැදිලිය. පුද්ගලයකු වශයෙන් නැතිවී යාමට ඉතා ආසන්න වෘද්ධයා මෙම දුර්ලභ සතුන් තම අවසානය පෙන්වන සංකේතයන් ලෙස යොදා ගනී. මෙම සතුන් නැතිවී යා නොදී රැක ගැනීමට ඔහු දරන වෑයමෙන් පිළිබිඹු වන්නේ, තමා ද නොනැසී පැවැතීමට ඔහු තුළ ඇති ආශාවයි. ඈත කාලයේ සිට සතුන් රැක ගැනීමේ උනන්දුවක් වෙනත් වයස කණ්ඩායම් වලද දක්නට ලැබේ.

මෙයට හේතුව අති භයානක න්‍යෂ්ටික ආයුධ දියුණු වීම වන්නට පුළුවන. ඒවායේ විනාශකාරී බලය නිසා අප කවුරුත්, විනාශ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති බැවින් දුර්ලභ සංකේතයන් ලෙස යොදා ගත හැකි සතුන්ගේ අවශ්‍යතාව වැඩි වී තිබේ.

වන සතුන් රැක ගැනීමේ එකම හේතුව මෙය ලෙස සැලකිය යුතු නොවේ. අසාර්ථක වී විනාශ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති සතුන්ට ආධාර කිරීමට අප පොළඹවන විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක හේතු ගණනාවක්ම වේ. තවදුරටත් සත්ව ලෝකයේ සංකීර්ණත්වයෙන් විනෝදවීමටත්, වන සතුන්, විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක ගවේෂණය සඳහා යොදා ගැනීමටත් අපට අවශ්‍ය නම්, අප ඔවුනට ආධාර කළ යුතුමය. ඉතා තියුණු ගවේෂණාත්මක බවකින් යුත් අපට අපේ පරිසරයේ ඇති මෙම වටිනා දේ විනාශ වී යනු බලා සිටිය හැකි නොවේ.

සතුන් ආරක්ෂා කර ගැනීමේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන විට, ආර්ථික සාධකයන් ගැනද සඳහන් කැරේ. ලෝකයේ සමහර පෙදෙස්වල ප්‍රෝටීන හිඟකමෙන් පෙළෙන ජනයාට අවශ්‍ය දෑ සැපයීමට මෙම සතුන් යොදා ගත හැකි යයි පෙන්වා දී තිබේ. කෙටිකාලීන පදනමක් මත මෙය සත්‍ය

වුවත්, දීර්ඝකාලීන වශයෙන් සලකා බලන විට, මෙහි අනාගතය අඳුරු බව පෙනේ. අපේ වර්ගයා දැනට දක්නට ඇති, ශීඝ්‍ර වේගයෙන්ම වැඩි වුවහොත්, අවසානයේදී එය සත්තු හෝ අපි යන දෙකෙන් එකක් තෝරා ගැනීමේ ප්‍රශ්නයක් වනු ඇත. අපට ඔවුන් සංකේතාත්මක, විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක වශයෙන් කෙතරම් වැදගත් වුවත්, ආර්ථික කරුණු ඔවුන්ට විරුද්ධව කටයුතු කරනු ඇත. අපේ වර්ගයා එක්තරා ප්‍රමාණයකට වැඩිවීමෙන් පසුව අනෙක් සතුන්ට මේ ලෝකයේ ඉඩක් නැතිවනු ඇත. අවාසනාවකට මෙන් සතුන් ආහාර ලබා ගැනීමේ හොඳම මගක්ය යන්න සත්‍ය නොවන බව පෙනේ. පැළෑටි ආහාර සත්වයන්ට කවා, සත්ව මස් ආහාරයට ගැනීමට වඩා, පැළෑටි ආහාර කෙළින්ම කෑම වඩා වාසිදායක බව පෙනේ. ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නය උග්‍රවීමත් සමඟ අපට තවත් උග්‍ර පියවර ගැනීමට සිදුවී අවසානයේදී ආහාර කෘත්‍රිම ලෙස නිපදවීමට පවා සිදුවනු ඇත. වෙනත් ග්‍රහලෝක ජනාවාස කොට වැඩි ජනගහනය ඒවාට යැවීමෙන් හෝ අපේ ජනගහනයේ වැඩිවීම පාලනය කිරීමට හෝ නොහැකි වුවහොත් අපට නුදුරු අනාගතයේදී ම අනිකුත් සියලුම සත්ව වර්ග මිහිපිටින් අතුගා දැමීමට සිදුවනු ඇත.

මෙය තරමක් උද්වේගකාරී අදහසක් ලෙස ඔබට පෙනේ නම් සංඛ්‍යා දෙස බලන්න. දහහත් වෙනි සියවස අවසානයේ ලෝකයේ සිටි නිරුවත් වානර සංඛ්‍යාව කෝටි 50කි. දැන් එය කොටි 300 දක්වා වැඩිවී ඇත. සෑම පැය විසි හතරකදී මෙය තවත් 150,000 කින් වැඩිවේ. මේ වේගයෙන්ම ජනගහනය දිගටම වැඩි වුවහොත් තව අවුරුදු 260 කදී ලෝක ජනගහනය කෝටි 40,000ක් වනු ඇත. මේ අනුව පොළොව මතුපිට ගොඩබිම් සෑම වර්ග සැතපුමකට මිනිසුන් 11,000 කට වාසය කිරීමට සිදුවේ. වෙනත් ආකාරයෙන් කිවහොත් දැනට අපේ ප්‍රධාන නගරවල දක්නට ලැබෙන තදබදය ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑරම දක්නට ලැබෙනු ඇත. මේ නිසා, වනසතුන්ට මුහුණ පෑමට සිදුවන තත්වය ඉතා පැහැදිළිය. අනිත් අතට එය අපේ වර්ගයා කෙරෙහි ඇතිකරන බලපෑම ද

Scanned by TapScanner

එතරම්ම බේදජනකය.

නමුත් මේ ව්‍යසනය ගැන අප සිත වෙහෙසිය යුතු නොවේ. එය සත්‍යයක් බවට පත්වීමට ඇති ඉඩ කඩ ඉතා අඩුය. මම මේ පොත පුරාම පෙන්වාදී ඇති පරිදි අපේ ශ්‍රේෂ්ඨ ශිල්පීය දියුණුව මැද, අපි තවමත් සරල ජීව විද්‍යාත්මක ව්‍යුහයක් පමණි. අපේ අතිමහත් උදාර අදහස් මැද අපි තවමත් සත්ව වර්යාවේ මූලික නියමයන්ට අනුව ක්‍රියාකරන සත්ව වර්ගයක් වෙමු. ඉහත දැක්වූ මට්ටමට අපේ ජනගහනය වැඩිවීමට පෙර, අපේ ජීව ස්වභාවය පාලනය කරන නීති රීති අප විසින් කඩා බිඳ දමන බැවින්, අප ප්‍රමුඛ සත්ව වර්ගයක් ලෙස තවදුරටත් දක්නට නොලැබෙනු ඇත.

මෙවැන්නක් පොළොව මත කිසිදාක සිදුවිය නොහැකි යන පුදුම හැඟීම අප තුළ ඇති බව පෙනේ. අප සතු යම්කිසි විශේෂත්වයක් ඇතැයිද, අපි පෙව පාලනයට යටත් නැතැයිද, අප සිතන බව පෙනේ. නමුත්, අපේ එවැනි විශේෂත්වයක් නැත. බොහෝ චිත්තාකර්ෂණීය සත්ව වර්ග අතීතයේදී විනාශ වී ගොස් ඇති අතර, අපට ද එසේ නොවීමට කිසිම හේතුවක් නොපෙනේ. කවදා හෝ තවත් සත්ව වර්ගයකට ඉඩ දෙමින් අපට ඉවත්වීමට සිදුවෙයි.

එය එසේ නොවීමට නම්, අපි ජීව විද්‍යාත්මක ආදර්ශයක් ලෙස අපේ සීමාවන් අවබෝධ කරගත යුතු වෙමු. මා මේ පොත ලියුවේත් අපට සාමාන්‍යයෙන් භාවිත කරන නම වෙනුවට "නිරුවත් වානරයා" යයි කීමෙන් අපට අවමන් කොට ඇත්තේත් මේ සඳහායි. අපේ ජීවිතවල මතුපිටට යටින් ඇත්තේ කුමක්දැයි බැලීමටත්, අපේ නියම තත්වය අවබෝධ කරගැනීමටත් එය පිහිට වනු ඇත. මගේ උද්යෝගය හේතුකොටගෙන සමහර විටක මේ මතය අවශ්‍ය තරමට වැඩියෙන් හුවා දක්වා තිබෙන්නට පුළුවන. මට බොහෝ ජයග්‍රහණයන් හා දක්ෂකම් ගැන ලියන්නට තිබුණි. ඒවා අත්හැරීමෙන් මා මෙහිදී දක්වා ඇත්තේ එක් පැත්තක් පමණි. අප අති විශේෂ සත්ව වර්ගයක් බව මම පිළිගනිමි. එසේම,

අපේ වර්ගයා සුළු කොට තැකීම මගේ බලාපොරොත්තුව නොවේ. එහෙත් කාසිය උඩ දමන හැමවිටම එකම පැත්තක් උඩ අතට වැටෙනු බව පෙනේ. එය හරවා අනෙක් පැත්ත දෙස බැලීමට කාලය පැමිණ ඇති බව මගේ හැඟීමයි. අවාසනාවකට මෙන් අනිත් සතුන් සමඟ සසඳන විට, අප ඉතා සාර්ථක වන බැවින් හා ඉතා බලවත් වන බැවින්, අපේ නිහතමානී ආරම්භය ගැන කථා කිරීම අපේ අමනාපයට හේතුවෙයි. මෙහිදී කර ඇති දේ ගැන ප්‍රශංසා කිරීමක් මම බලාපොරොත්තු නොවෙමි. අපේ ඉහළට නැගීම ඉතා මැතදී ඉක්මණින් සිදුවී ඇති දෙයක් බැවින්, ළඟ දී පොහොසත් වූ අය මෙන් අපිද, අපේ අතීතය සිහි කරනවාට එතරම් කැමැති නොවෙමු.

ඉතා ප්‍රබල ගවේෂණාත්මක ආශාවන් හා උසස් මට්ටමේ බුද්ධියක් අප තුළ පරිණාමය වී ඇති බැවින්, ඕනෑම තත්වයක් අපේ වාසියට හරවා ගත හැකියයි සිතන අයද අප අතර වෙති. සත්ව විශේෂයක් ලෙස අපේ තත්වය ඉහළ යෑමත් සමඟ, අවශ්‍යවන ඕනෑම ආකාරයකට අපේ ජීවන ක්‍රමය හැඩ ගස්වා ගැනීමට හැකිවන බව මේ මතයයි. අවශ්‍යතාව පැන නැගුණ විට ජනගහනය වැඩිවීමේ ප්‍රශ්නය විසඳා ගැනීමට අපට හැකිවනු ඇත. විශාල කුහුඹු ගණාවාසයක් මෙන් අපේ ජීවන රටාවන් වෙනස් කිරීමට අප සමත් වනු ඇත.

අපේ චණ්ඩ හැඟීම්, අපේ ලිංගික ආශාවන් හා අපේ දෙමාපිය නැමියාවන් පාලනය කර ගැනීමට අපට හැකිවනු ඇත. අපට අවශ්‍ය නම්, අපේ සියලුම ජීවමය ආශාවන් බුද්ධියෙන් යටපත් කළ හැකි යයි මෙම මතයෙන් කියැවේ. මේ අදහස් සියල්ල තේරුමක් නැති වල්පල් බව මගේ අදහසයි. අපේ අමු සත්ව ස්වභාවය එයට කිසිදාක ඉඩ නොදෙනු ඇත. අප අවස්ථාවාදීන් බවත්, නම්‍ය බවත්, සත්‍ය නමුත්, ඒ සියල්ල කළ හැක්කේ යම් සීමාවන් තුළ පමණි. අපේ ජීවමය ලක්ෂණ හුවා දැක්වීමෙන් මෙම සීමාවන්හි ස්වභාවය පෙන්වීමට මම තැත්කොට ඇත්තෙමි. ඒවා පැහැදිළිව අවබෝධ කර ගැනීමෙන් අපට නොනැසී පැවතීමට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩිවෙන බව

Scanned by TapScanner

මගේ විශ්වාසයයි. මා මෙයින් අදහස් කරන්නේ ආපසු කැලෑ වැදීමක් නොවේ. මෙයින් අදහස් කරන්නේ අපේ බුද්ධිමත් අවස්ථාවාදී දියුණුව මූලික වර්යාත්මක අවශ්‍යතාවන්ට අනුව හැඩ ගසා ගත යුතු බව පමණි. අප කෙසේ හෝ ප්‍රමාණාත්මකව නොව, ගුණාත්මකව දියුණු විය යුතුය. අපට මෙය කළ හැකි නම්, අපේ පරිණාමීය දායාදයන් යටපත් නොකොට විස්මයජනක තාක්ෂණික දියුණුවක් ලැබිය හැකි වේ. අපට මෙය කළ නොහැකි වූවහොත්, අපේ යටපත් වූ ජීවමය ආශාවන් ක්‍රමයෙන් උත්සන්න වී අප සතු සියල්ල විනාශ කරමින් පුපුරා යනු නොඅනුමානයි.

පදමාලාව

අග්‍රේශයා - වඳුරන්, වානරයන් හා මිනිසා අයත්වන සත්ව විද්‍යාත්මක ගෝත්‍රයේ සතුන් හැඳින්වීම සඳහා මෙපදය යොදා ගැනේ.

අනුවර්තනය - ජීවීන් යම්කිසි පරිසරයක අවශ්‍යතාවන්ට අනුව හැඩ ගැසීමේ දී සිදුවන වෙනස්කම්

අනුවේගී ස්නායු පද්ධතිය - ස්වයං සාධක ස්නායු පද්ධතියේ කොටසකි.

ආඝ්‍රාණ සංවේදය - ගඳ සුවඳ දැන ගැනීමේ සංවේදිතාවයි.

උත්තේජය - සත්වයෙකු ගේ ක්‍රියාවන්හි වෙනසක් ඇතිකිරීමට හේතුවන පරිසරයේ සිදුවන ඕනෑම විපර්යාසයකි.

උභයජීවියා - ජලයේ හා ගොඩබිම යන දෙකේම ජීවත්විය හැකි සත්වයෙකි.

කලලය - සංසේචනය වූ ඩිම්බයෙන් ඇතිවන සත්වයා ගේ මුල් අවස්ථාව.

ක්ෂීරපායින් - මවගෙන් කිරි උරා බී වැඩෙන, කොඳුඇටය සහිත සතුන්

කෘමිභක්ෂක - කෘමීන් පමණක් ආහාරයට ගන්නා සතුන්.

ගණාවාසය - එකම සත්ව විශේෂයක් එකම කණ්ඩායමක් ලෙසට ජීවත්වීම.

ගර්භාෂය - ක්ෂීරපායි මවගේ සිරුර තුළ කලල වර්ධනය වන කොටස .

ඩිම්බ - ඩිම්බ කෝෂයෙන් නිකුත් වන ස්ත්‍රී ලිංගික ජන්මාණු සෛලය.

විරශිශුකතාව - වර්ධනයේ මුල් අවස්ථාවල ලක්ෂණයක් වැඩිහිටි අවස්ථාව දක්වා පැවතීම.

Scanned by TapScanner

ජාන - ප්‍රවේණි ලක්ෂණ පරම්පරාවෙන්, පරම්පරාවට ගෙන යන මූලික ඒකකය වන මේවා පිහිටා ඇත්තේ සෛල න්‍යෂ්ටියේ දක්නට ඇති වර්ණදේහ තුලය.

ධාරකයා - පරපෝෂිතයා ජීවත්වන්නේ මේ සත්වයා තුලය

පරපෝෂිතයා - වෙනත් ජීවියෙකු තුළ ජීවත්වෙමින් තම ආහාර එම ධාරකයාගෙන් ලබාගන්නා ජීවියා.

පරිණාමය - පරම්පරා ගණනාවක් තිස්සේ විවිධ අනුවර්තනයන්ට භාජනය වීමෙන්, අළුත් සත්ව වර්ග ඇතිවීමේ ක්‍රියාවලිය.

ප්ලිහාව - කුඩා අන්ත්‍රය මැද දක්නට ඇති, රුධිරයට රතු රුධිරාණු සපයන ග්‍රන්ථිය.

පාෂාණීභූත ද්‍රව්‍ය - පාෂාණවල ආරක්ෂා වී ඇති ජීවීන් ගේ විවිධ කොටස් මේ නමින් හැඳින්වේ.

ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය - ස්වයංසාධක ස්නායු පද්ධතියේ එක් කොටසකි.

ප්‍රතිචාරය - උත්තේජයක් හේතු කොට ගෙන ජීවියෙකු ගේ හෝ ජීවියෙකු ගේ කොටසක සිදුවන විපර්යාසය.

ප්‍රවේණි විද්‍යාව - ආවේණික ලක්ෂණ හා ඒවායේ වෙනස්වීම් පිළිබඳ අධ්‍යයනය.

භගමණ්ඩය - ස්ත්‍රීලිංගික ක්ෂීරපායින් ගේ දක්නට ඇති, පුරුෂ ලිංගික ශිශ්නයේ සමප්‍රභවය.

මාංශභක්ෂක - මස් පමණක් කා ජීවත්වන සතුන්

යෝනිය - ස්ත්‍රී ලිංගික ක්ෂීරපායින් ගේ දක්නට ඇති ගර්භාෂය පිටතට විවෘත වන කුඩා නාලයයි. සංසර්ගයේදී පුරුෂ ශිශ්නය ඇතුළු කරනු ලබන කොටස මෙය වේ.

වරණ බෝකිරීම - අවශ්‍ය ලක්ෂණ වැඩිදියුණු කරමින්, ඒවා තෝරා උවමනා ආකාරයට සතුන් බෝ කිරීම.

වදෑමහ - කලලය හා මවගේ පටක ඉතා ළඟින් සම්බන්ධ කරන, කලලයට පෝෂණය සපයන, ගර්භාෂයට සවි වී ඇති මෙම ඉන්ද්‍රිය, දරුවා බිහිවීමෙන් පසු පිටතට දමනු ලැබේ.

වෘෂණ - පිරිමි සත්වයා ගේ ශුක්‍රාණු නිපදවන ග්‍රන්ථිය.

විලෝපියා - සතුන් මරා තම ආහාරය සඳහා ගන්නා සතුන්.

විශේෂය- සත්ව වර්ගීකරණ යේ යොදා ගන්නා කුඩාම ඒකකයයි. ප්‍රජනනය සිදුවන්නේ එක සත්ව විශේෂයක් තුළ පමණි.

ශිශ්නය - ස්ත්‍රී ලිංගික සත්වයා ගේ යෝනියට ශුක්‍රාණු ඇතුළු කිරීමට යොදා ගන්නා පුරුෂ ලිංගික ඉන්ද්‍රිය.

ශුක්‍රාණු - කශිකා සහිත පුරුෂ ජන්මාණුව.

ශ්‍රෝණිය - ශ්‍රෝණි මේඛලාවට අපර ගාත්‍රා සවිවන අස්ථිවලින් වට වූ උදරයේ පහළ කොටස.

සමප්‍රභවය - මූලික ව්‍යුහය අතින් සමාන වූ, විශේෂයෙන්ම කලල අවස්ථාවේදී අනිකුත් ග්‍රන්ථිවලට සාපේක්ෂව එකම ස්ථානයේ පිහිටන,එහෙත් කාර්යය අතින් වෙනස් වන ග්‍රන්ථි හෝ ඉන්ද්‍රියයන්.

සබුරයා.- කුර සහිත ක්ෂීරපායින් වේ. ගවයා වැනි සතුන් අයිති වන මෙම ගෝත්‍රයේ සතුන් ශාක භක්ෂකයන් වේ.

සමලිංගිකතාව - සමලිංගික සතුන් අතර ඇතිවන ලිංගික සම්බන්ධතාව.

ස්වේද ග්‍රන්ථි - ක්ෂීරපායින්ගේ දක්නට ලැබෙන, තනුක ලුණුද්‍රාවණයක් ස්‍රාවය කරනු ලබන සමේ පිහිටා ඇති ග්‍රන්ථි වර්ගයකි.

ස්වභාවික වරණය - චාල්ස් ඩාවින් විසින් ඉදිරිපත් කරන ලද මතයට අනුව පරිණාමය සිදුවන ප්‍රධාන ක්‍රමය මෙය වේ. යම් කිසි පරිසරයකට හොඳින් අනුවර්තනය වූ සතුන්ට වාසිදායක තත්වයක් ලැබෙන හෙයින්, එය වඩා දියුණු වීමෙන් අලුත් සතෙක් බිහිවෙයි.

Scanned by TapScanner